




දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත
தினமின




දේශයේ පාලන මාවත
අද පත්‍රය සමඟ

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ අධි වප් අව පෑළවිය ලත් කිවි දින | කාණ්ඩය 111 | පත්‍රය 247 | පිටු 44 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2020 ඔක්තෝබර් 02 සිකුරාදා




# කටුනායක ගුවන්තොටුපොළේ දෙවැනි පර්යන්තයේ ඉදිකිරීම් වසර 3කින් නිම කරන්න

## ජනපති උපදෙස් දෙයි

ධනුෂ්ක ගොඩකුඹුර

බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන්තොටුපොළේ දෙවැනි පර්යන්තයේ ඉදිකිරීම් 2023 අවසන් වීමට පෙර නිම කරන ලෙස ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ඉදිරි සැලසුම් පිළිබඳ සාකච්ඡාවේදී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

දෙවැනි පර්යන්තයේ ඉදිකිරීම් අවසන් වීමත් සමඟ වසරකට ගුවන් මගීන් මිලියන 15කට අධික සංඛ්‍යාවකට සේවා සහ මෙහෙයුම් පහසුකම් සැපයේ. පිට වීමේ සහ පැමිණීමේ පර්යන්ත අංශ දෙකක් ලෙස ක්‍රියාත්මක වීම ද ඒ සමඟම ඇරඹේ. පිට 06

# ජාතික ආරක්ෂාව අනතුරේ හෙළන ඕනෑම රටකට එහි ප්‍රතිවිපාකවලට මුහුණ දීමට සිදු වෙනවා

## ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයට අවධාරණය කරයි

මහින්ද අලුත්ගෙදර

අන්තවාදී කණ්ඩායම්වල උපායමාර්ගයන් හි නවීනත්වය මධ්‍යයේ සිය ජාතික ආරක්ෂාව අනතුරේ හෙළන ඕනෑම රටකට බිහිසුණු ප්‍රතිවිපාකවලට මුහුණ දීමට සිදු වන බව ශ්‍රී ලංකා රජය එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය වෙත දැනුම් දී තිබේ. පිට 06

## සුරාබදු දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යූහගත කිරීමට අගමැතිගෙන් කමිටුවක්

මහින්ද අලුත්ගෙදර

සුරාබදු දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යූහගත කිරීම සඳහා ඒකාබද්ධ කමිටුවක් පත් කිරීමට පියවර ගන්නැයි අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා උපදෙස් දී තිබේ. පිට 06

## ඉන්දියාවේ මත් ජාවාරම මෙහෙයවන්නේ ශාරුක් - රන්බීර් - අර්ජුන් - ඩිනෝ

ඉන්දීය මාධ්‍ය වාර්තා කරයි පිට 06

## ආනයනිත කන්ටේනරයක මත්පැන් බෝතල් ඉවත් කර වතුර බෝතල් පටවලා

රජයේ තීරුබදු ගාස්තුවලින් නිදහස්ව දේශීය වෙළඳපොළට නිකුත් කිරීමේදී හෝ ප්‍රතිඅපනයනයේදී තීරුබදු ගැනීමේ පදනම මත මාලදිවයිනේ සිට මෙරටට ආනයනය කර තිබූ විදේශ මත්පැන් ලීටර් 11,257ක් අඩංගු කන්ටේනරයක තිබූ මත්පැන් බෝතල් ඉවත් කර ඒ වෙනුවට පානීය ජලය පිරවීමේ සිද්ධියක් සම්බන්ධයෙන් රේගු නිවාරණ අංශය පරීක්ෂණ ආරම්භ කර ඇත. පිට 06

## ගාලු කොටුවේ කළුකොටුවේ ගල්අඟුරු ස්තරයක්

ඉමදුව සමූහ ලංකින්ද නානායක්කාර

ලෝක උරුමයක් ලෙස සැලකෙන ගාලු කොටුවේ සංරක්ෂණ කටයුතු සිදු කරන අතරතුර කළුකොටුව තුළ තිබී ගල්අඟුරු ස්තරයක් හමු වී ඇති බැව් ගාලු කොටුව සංවර්ධන හා සංරක්ෂණ උපදේශක හා වාස්තු විද්‍යාඥ ආචාර්ය නිලාන් කුරේ මහතා පවසයි. පිට 06

## කලට වේලාවට පාරවල් හදන්න බැරි කොන්ත්‍රාත්කරුවන් වහාම ඉවතට



පිට 06

කියවා සොඳින් පතපොත නුවණින් නිතිනා
ලැබ ගනු මැනවි බුද්ධිය ලෝකය දිනනා
උගත මනා ශිල්පයමයි මතු රැකෙනා
මගෙ දරු පැටව් මට මහමෙර සේ වටිනා

සංකල්පනාව - රත්නසිරි පතිරණ



## ජාතික ආරක්ෂාවට ප්‍රතිපත්තියක් සැකසූ බව දන්නේ නෑ



සුභාෂිණී සේනානායක

ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය (INSSSL) වසර 2016 දී පිහිටුවූ බව තමන් දන්නේ නැතැයි හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා පාස්කු කොමිසම හමුවේ ඊයේ (01) කියා සිටියේය.

ජාතික ආරක්ෂාව පිළිබඳ ප්‍රතිපත්තියක් සකස් කළ බව ඔබ දන්නවාද යන්න පාස්කු කොමිසමේ සාමාජික විනිසුරුවරයකු විමසා සිටි අතර, ඒ බවද තමන් දැන නොසිටි බව ඒ මහතා පැවසීය. පිට 06

## වත්මන් ආණ්ඩුවට රටේ ආර්ථිකය පාලනය කළ නොහැකියි



වත්මන් ආණ්ඩුවට රටේ ආර්ථිකය පාලනය කළ නොහැකි තත්ත්වයකට පැමිණ ඇතැයි විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා මැද කොළඹ දී පැවැති ජනහමුවකදී ඊයේ (01) ප්‍රකාශ කළේය.

තිඹිරිගස්යායේ පොල් ගෙඩි විකුණන වෙළඳසලක එක පුද්ගලයකුට දෙන්නේ ගෙඩි පහයි. අද ටයර් හිඟයක් තිබෙනවා. ටයර් ආනයනය නවත්තලා. පිට 06

## කටානේ කෝටි තුනේ කොල්ලයට පැමිණි සැකකරුවන් හඳුනා ගැනීමට පරීක්ෂණ

පිට 06

## ජේආර්ගේ 5/6ට වඩා ගෝඨාභයගේ 2/3 බලවත්



ඉන්ද්‍රාණි තෝරදෙණිය

ජේ. ආර්. කේවල ක්‍රමය යටතේ හිමි කර ගත් 5/6 ජනවරමට වඩා ගෝඨාභය සමානුපාතික ක්‍රමය යටතේ ලැබූ 2/3 ජනවරම බලවත් යැයි ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන සභික කේ.ඩී. ලාල්කාන්ත මහතා පෙරේදා (30) පස්වරුවේ මහනුවර තැපැල් ශ්‍රවණාගාරයේ පැවති ජවිපෙ විස්ස කාගේද? විස්ස කාටද? යන සම්මන්ත්‍රණ මාලාවේ මහනුවර දිස්ත්‍රික් සමුළුව අමතමින් පැවසීය. පිට 06

## හෙරොයින් ළඟ තබාගත් දෙදෙනෙක් නුගේගොඩදී කොටු වෙති

පිට 06

## කෝටි 6ක් වටිනා වාලම්පුරි දෙකක් අත්අඩංගුවට

ගාල්ල දිසා සමූහ, කරන්දෙණිය සමූහ සහ ඉමදූව සමූහ

රුපියල් කෝටි 06ක් පමණ වටිනා ටයිටන් වර්ගයේ වාලම්පුරි දෙකක් සමඟ සැකකරුවන් 04 දෙනකු අද (01) අලුයම ඉමදූව පොලිස් වසමේ කෝදාගොඩ ප්‍රදේශයේදී අත්අඩංගුවට ගත් බව කළුතර පොලිස් විශේෂ කාර්ය බළකා බුද්ධි ඒකකය පවසයි. අත්අඩංගුවට ගත් වාලම්පුරි 02 හා සැකකරුවන් සිවුදෙනා වැඩි දුර පරීක්ෂණ කටයුතු සඳහා ඉමදූව පොලීසියට භාර දී ඇත. පිට 06

## ඉන්දියාවේ සිට මෙහෙයවන මත් ජාවාරමක 2ක් දැලේ

පිට 08

## මන්නාරම සුළං බලාගාරයේ විදුලි ජනනය ඔක්තෝබර් අග සිට

පිට 06

## 20න් ගිණුම් කාරක සභාවට බලපෑමක් නෑ

ඇමැති ලසන්ත අලගියවන්න පිට 06

## ශිෂ්‍යත්ව සිසුන්ට ප්‍රවේශ පත්‍රයක්

පිට 06







# ලෝක ළමා දිනය දා සෙනෙහස රැගෙන ජනපති බිරිය සෙනෙහස කේන්ද්‍රයේ...

**බුද්ධි කරුණාරත්න**

ලෝක ළමා දිනය නිමිත්තෙන් සෙනෙහස කේන්ද්‍රයේ දූදරුවන්ගේ දස්කම් එළිදැක්වීමේ උත්සවය ඊයේ (01) ජනාධිපති බිරිය අයෝමා රාජපක්ෂ මහත්මියගේ ප්‍රධානත්වයෙන් නාරාහේන්පිට පිහිටි කේන්ද්‍ර පරිශ්‍රයේදී පැවැත්විණි. දරු දැරියන්ගේ නැටුම් ගැයුම්වලින් වර්ණවත් වූ මේ උත්සවයේදී රාජපක්ෂ මහත්මිය අතින් සෙනෙහස වෙබ් අඩවිය විවෘත කිරීම ද සිදු විය.

ගායන ශිල්පී ළහිරු පෙරේරා දූදරුවන් පිරිස සමඟ ගීත ගායනා කරමින් පිරිස රසගැන්වීමේ නිරත විය. ත්‍රිවිධ හමුදාපතිවරු සහ ඔවුන්ගේ භාර්යාවන්, සිවිල් ආරක්ෂක බළකායේ අධ්‍යක්ෂ සහ බිරිය, රණවිරු සේවා අධිකාරියේ සභාපති සහ බිරිය, ත්‍රිවිධ හමුදා මාණ්ඩලික නිලධාරීන්, ආරක්ෂක ලේකම්වරයාගේ බිරිය ඇතුළු සම්භාවනීය ආරාධිත අමුත්තෝ රැසක් මේ අවස්ථාවට සහභාගි වූහ. මේ උත්සවයේ දස්කම් පෑ දූ දරුවන් වෙනුවෙන් ත්‍යාග බෙදාදීම පැමිණි ආරාධිත අමුත්තන් අතින් සිදු විය.

**ඡායාරූප - නිශංක ද සිල්වා**



# ශ්‍රී ලංකා - පාකිස්තානු පදනමෙන් ඉදිරි වසර පහට
## ශ්‍රී ලාංකික සිසුන්ට උසස් අධ්‍යාපන අමතර ශිෂ්‍යත්ව 1000ක්

ඉදිරි වසර පහ ඇතුළත ශ්‍රී ලංකා - පාකිස්තානු පදනම යටතේ මෙරට සිසුන් වෙනුවෙන් උසස් අධ්‍යාපනය සඳහා අමතර ශිෂ්‍යත්ව 1000ක් ලබාදීමට පාකිස්තාන මහ කොමසාරිස් මේජර් ජෙනරාල් (විශ්‍රාමික) මුහම්මද් සාද් ඛට්ටක් මහතා අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා හමුවේ එකඟත්වය පළ කරයි.

අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා සහ පාකිස්තානයේ මහ කොමසාරිස් මේජර් ජෙනරාල් (විශ්‍රාමික) මුහම්මද් සාද් ඛට්ටක් මහතා අතර විශේෂ හමුවක් පසුගියදා (28) පැවැත්වූ අතර, එහිදී මහ කොමසාරිස්වරයා මේ බව පැවැසීය.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ අන්‍යෝන්‍ය සහයෝගීතාව පිළිබඳ පොදු උනන්දුවක් දක්වන මාතෘකා කීපයක් එහිදී සාකච්ඡාවට බඳුන් විය. උසස් හා කාර්මික අධ්‍යාපනයේ විවිධ ක්ෂේත්‍රයන්හි ද්විපාර්ශ්වික සහයෝගීතාව ශක්තිමත්ව පවත්වා ගතයුතු බවට අධ්‍යාපන ඇමැතිවරයා සහ මහ කොමසාරිස්වරයා එකඟ වූහ.

පසුගිය මහමැතිවරණයෙන් 2/3ක විශිෂ්ට ජනවරමක් සහිතව ජයග්‍රහණය කිරීමට හැකිවීම පිළිබඳ වර්තමාන ජනාධිපති ප්‍රමුඛ ශ්‍රී ලංකා රජයට සුබපැතුම් එක් කළ මහ කොමසාරිස්වරයා, නව රජය යටතේ ජනතා අපේක්ෂා ඉටු වනු ඇතැයි තමා විශ්වාස කරන බව ද සඳහන් කළේය.

පාකිස්තානයත් ශ්‍රී ලංකාවත් අතර දිගුකලක් පුරා පවත්නා සමීප සම්බන්ධතාව තවදුරටත් ශක්තිමත් කිරීමට ඉදිරියේ දී පියවර රැසක් ක්‍රියාවට නංවන බව ද මහකොමසාරිස්වරයා පැවසීය. මෙරට ප්‍රථම වතාවට පාකිස්තාන් ආදි විද්‍යාර්ථීන්ගේ දිනය ඔක්තෝබර් මස 07 වැනි දින කොළඹ ෂැන්ග්‍රිලා හෝටලයේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇති අතර, එහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගීවීමට අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී. එල්. පීරිස් මහතාට ඇරයුම් කරන ලද බව ද මෙහි දී සිහිපත් කළේය.



පකිස්තාන සිසුන් තුළ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ප්‍රචලිත කිරීමට කටයුතු යොදන බව ද, කොවිඩ් තත්ත්වයෙන් පසු මෙරට සංචාරක ව්‍යාපාරය නැවත යථා තත්ත්වයට පත්කිරීම සඳහා ජනාධිපතිගේ සහ අගමැතිගේ ප්‍රමුඛ අවධානය යොමුව ඇති බැවින් විශේෂයෙන් ආසියානු කලාපයේ රටවල් අතර ඒ සඳහා මනා සහයෝගිතාවක් ගොඩනැංවීමට පියවර ගත යුතු බව ද මෙහිදී සාකච්ඡා විය.

එමෙන්ම, ඉදිරියේ දී මෙරට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම සමඟ ද මනා සම්බන්ධතාවක් පවත්වා ගනිමින් දෙරට අතර සහයෝගිතාව වැඩිදුරටත් ශක්තිමත් කිරීමට පියවර ගන්නා ලෙස ද අධ්‍යාපන ඇමැතිවරයා, පාකිස්තානු මහකොමසාවරයාගෙන් ඉල්ලා සිටියේය.

පාකිස්තානු - ශ්‍රී ලංකා නියෝජ්‍ය මහ කොමසාරිස් ටන්වීර් අහ්මඩ් (Tanvir Ahmad), මාධ්‍ය සම්බන්ධීකාරක කල්සූම් කයිසර් (Kalsoom Qaiser), උප ලේකම් අයේෂා අබුබකර් ෆාහඩ් (Ayesha Abu Bakr Fahad), මුහම්මඩ් අක්‍රම් (Muhammad Akram), අධ්‍යාපන අමාත්‍යාංශයේ මාධ්‍ය ලේකම් බුද්ධික වික්‍රමාදර මහත්වරුන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට සහභාගි වූහ.

# ‘විජය ගුරු උපහාර උලෙළ’ 5දා මාතලේ ගාන්ධි උත්සව ශාලාවේදී

මාතලේ විජය ජාතික පාසලේ ආදි ශිෂ්‍ය සංගමය විසින් සංවිධාන කරන ‘විජය ගුරු උපහාර උලෙළ’ මේ මස 5දා පස්වරු 5.30ට මාතලේ ගාන්ධි උත්සව ශාලාවේදී පැවැත්වීමට කටයුතු සංවිධාන කර ඇත.

විජය ජාතික පාසලේ සේවය කොට විශ්‍රාම ගොස් සිටින ගුරුවරුන් වෙත උපහාර පිදීම මෙහි අරමුණ වී තිබෙන අතර උපහාර උලෙළ මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලලිත් යූ. ගමගේ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ. ඒ අනුව මෙහිදී විද්‍යාලයේ හිටපු විදුහල්පතිවරුන්, නියෝජ්‍ය විදුහල්පතිවරුන් ඇතුළු ගුරුවරුන් 40 දෙනෙකු වෙත උපහාර පිරිනැමීමට නියමිතව තිබෙන අතර එළඹෙන 5දාට යෙදෙන ලෝක ගුරු දිනය නිමිත්තෙන් විජය විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය විසින් මෙය සංවිධාන කරයි. ශ්‍රී ලංකාවේ ජනප්‍රිය කලාකරුවෝද මේ අවස්ථාවට සහභාගි වෙති.විජය ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මේ අවස්ථාවට සහභාගි වන ලෙස ද ඉල්ලීමක් කරයි.

# ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 25 වැනි දිස්ත්‍රික් ඒකකය කිලිනොච්චියේදී අද ඇරේ

## උතුරු පළාත කේන්ද්‍රව වැඩසටහන් රැසක්

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 25 වැනි දිස්ත්‍රික් ඒකකය කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ජනමාධ්‍ය ඇමැති කෙහෙලිය රඹුක්වැල්ල සහ තැපැල් සේවා හා ජනමාධ්‍යවේදී වෘත්තීය සංවර්ධන රාජ්‍ය ඇමැති එස්. වියාලෙන්ද්‍රන් මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් අද (02) විවෘත කෙරේ.

මෙයට සමගාමීව උතුරු පළාත කේන්ද්‍රව අද (02) වැඩසටහන් රැසක් ඇමැතිවරු දෙපළගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

ලේක්හවුස් ආයතනයේ තිනකරන් පුවත්පතේ ප්‍රවර්ධන වැඩසටහනක් ද යාපනය විශ්වවිද්‍යාලය කේන්ද්‍රව පැවැත්වෙන අතර යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී දමිළ මාධ්‍ය පාසල් ජනමාධ්‍ය වැඩමුළුවක්, යාපනය දිස්ත්‍රික් මාධ්‍යවේදීන් හමුවක් ද, යාපනය දිස්ත්‍රික් මාධ්‍ය ඒකකයේ නිරීක්ෂණ චාරිකාවක් ද පැවැත්වේ. එමෙන්ම එදින සවස 2.00ට යාල් එෆ්.එම්. ගුවන්විදුලි සේවාව නිරීක්ෂණය කිරීම සඳහාත් ඇමැතිවරු එක්වෙති. එමෙන්ම වව්නියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී වව්නියාව දිස්ත්‍රික් මාධ්‍යවේදීන් හමුවක් ද සංවිධාන කර තිබෙන අතර වව්නියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී වව්නියාව දිස්ත්‍රික් මාධ්‍ය ඒකකය සහ වව්නියාව දිස්ත්‍රික් මාධ්‍ය ප්‍රකාශක අංශය නිරීක්ෂණය කිරීමටද ඇමැතිවරු එක්වීමට නියමිතය.






# මහනුවර නගර සීමාවේ කඳු සහිත ස්ථානවල විශාල ගොඩනැඟිලි ඉදි කිරීමට ඉඩ දෙන්න එපා කීවත් අවසර දීලා

## මහනුවර පුරපති කේසර සේනානායක

**අසේල කුරුළුවංශ**

මහනුවර නගර සීමා බල ප්‍රදේශයට අයත් කඳු සහිත ස්ථානවල විශාල ගොඩනැඟිලි ඉදි කිරීමට අවසර නොදෙන ලෙස ඉල්ලීම් කර තිබියදී ඒ සම්බන්ධව කිසිදු තැකීමක් නොකර නාගරික සංවර්ධන අධිකාරිය විසින් එවැනි අවදානම් සහිත ස්ථානවල ගොඩනැඟිලි සැලසුම් අනුමත කර තිබෙන බව මහනුවර පුරපති කේසර සේනානායක මහතා පවසයි.

ගොඩනැඟිලි සැලසුම් අනුමත කරන සැලසුම් කමිටුවට නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජිතයකු අනිවාර්යයෙන්ම සහභාගි විය යුතු බවත් සාමූහික තීරණ මත සැලසුම් අනුමත කර පසුව සියලු වැරදි නගර සභාව මත පැටවීම කනගාටුවට කරුණක් බවත් ඒ මහතා කීය.

මහනුවර මහ නගර සභාවේ මාසික රැස්වීම පසුගියදා (29) නගර සභාවේදී පැවැති අවස්ථාවේ නගරාධිපතිවරයා මේ බව ප්‍රකාශ කළේය.

පස් මහල් ගොඩනැගිල්ල කඩා වැටීමේ සිද්ධිය සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය හා තවත් පාර්ශ්ව කීපයක්ම නගර සභාවට ඇඟිල්ල දිගු කර අතපිසදා ගැනීමට යන බවත් මේ පිළිබඳ තමන් අතිශයින් කනගාටුවට පත් වන බවත් නගරාධිපතිවරයා කීය.

නගර සීමාවේ යම් ඉදිකිරීමක් කිරීමට පෙර ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ අනුමැතිව සහිතව සැලසුම හා අදාළ අනෙකුත් ලියකියවිලි නගර සභාවට ඉදිරිපත් කළ යුතු බවත් ඒවා නිවැරැදි බවට තහවුරු කර ගැනීමෙන් පසු තාක්ෂණ නිලධාරියකු අදාළ ස්ථානය පරීක්ෂා කර බලන බවත් හෙතෙම පැවසීය.


නගර සභාවට ඉදිරිපත් කිරීමට පෙර සැලසුම සකස් කරන වරලත් වාස්තු විද්‍යාඥයන්ට මෙන්ම සැලසුම අනුමත කිරීමෙන් අනතුරුව ඉදිකිරීම් කරනු ලබන කොන්ත්‍රාත්කරුවන්ටද ඊට අවශ්‍ය උපදෙස් ලබාදෙන ඉංජිනේරුවරුන්ටද ගොඩනැඟිලි ප්‍රමිතියෙන් යුතුව ඉදිකිරීම සම්බන්ධයෙන් වගකීමක් පැවරෙන්නේ යැයිද නගරාධිපතිවරයා කීය.

ඇතැම් පිරිස් සැලසුම අනුමත කිරීමෙන් පසු අනවසරයෙන් එම ගොඩනැගිල්ලට තවත් කොටස් එකතු කරමින් ඉදිකිරීම් කරන බවත් ස්වභාවික ජල මූලාශ්‍රය මෙන්ම කානු පද්ධතිද හරස්කර ඉදිකිරීම් කළ අවස්ථා තිබෙන බවත් සේනානායක මහතා පැවසීය.

# චාමර අධිකාරිආරච්චි ලියූ ‘උතුවන්කනදේ සරදියෙල්’ අද දොරට වඩී

නීතිඥ තිරසර චාමර අධිකාරිආරච්චි මහතා විසින් රචිත ‘උතුවන්කනදේ සරදියෙල්’ ග්‍රන්ථය දොරට වැඩීමේ උත්සවය අද (02) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල ශ්‍රවණාගාරයේදී පැවැත්වේ.

මේ උත්සවයට සරදියෙල් ගම්මානයේ ප්‍රවර්ධන නිලධාරි අශෝක සමරජීව මහතා ඇතුළු විද්වත් මණ්ඩලයක් සහභාගි වීමට නියමිතය.



# මොරටුව එගොඩඋයන වැඩිහිටි දින සැමරුම 4 දා

'මා පිය වැඩිහිටි සෙනෙහස රඳවමු' යන තේමාව යටතේ මෙවර ලෝක වැඩිහිටි දිනය වෙනුවෙන් මොරටුව සරසි ප්‍රමෝෂන් සංවිධානත්වයෙන් හා සම්බන්ධීකරණයෙන් ව්‍යාපාරික ප්‍රජාවගේ අනුග්‍රාහක දායකත්වයෙන් වාර්ෂිකව සිදු කරනු ලබන මොරටුව එගොඩඋයන වැඩිහිටි දින සැමරුම මේ මස 04 වැනිදා පෙ.ව. 10.00 සිට එගොඩඋයන සණස උත්සව ශාලාවේදී පැවැත්වේ. ගල්කිස්ස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී රොහාන් ප්‍රේමරත්න, මොරටුව සහකාර පොලිස් අධිකාරි ප්‍රගති ලක්මිණි අබේසිංහ, එගොඩඋයන පොලිස් ස්ථානාධිපති අනිල් මාසකෝරාල, අලියා මැස්කනයිට් ව්‍යාපාර අධ්‍යක්ෂවරුන් වන හැරී සත්‍යමූර්ති, හැරී දර්ශන මහත්වරුන්ගේ සහභාගීත්වයෙන් උත්සවය පැවැත්වේ.

කොරළවැල්ල, කටුකුරුන්ද, එගොඩඋයන, මෝදර ප්‍රදේශවල පදිංචි තෝරාගත් දිළිඳු ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් සහල් වියළි ආහාර ධාන්‍ය වර්ග ඖෂධ ලබාදීම ඔවුනගේ සහජ දක්ෂතා එළිදැක්වීම හා ඒ වෙනුවෙන් තිළිණ පිරිනැමෙන බැව් සරසි ප්‍රමෝෂන් අධිපති උත්සව සංවිධායක මාධ්‍යවේදී කපිල බන්දුසේන මහතා පවසයි.



මහපොළ ආධාර යටතේ කොළඹ තර්ස්ටන් විද්‍යාලයේ ඉදි කළ දෙමහල් ගොඩනැගිල්ලේ කොටස් ගැලවීම හේතුවෙන් සිසුහු තාවකාලිකව ඉදි කළ මඩුවක ඉගෙනුම් කටයුතු සිදු කළහ. ඒ පිළිබඳ සොයා බැලීමට වෙළෙඳ ඇමැති බන්දුල ගුණවර්ධන මහතා එහි නිරීක්ෂණ චාරිකාවකට එක් වූ අයුරුයි මේ.

**ඡායාරූපය - කැලුම් ලියනගේ**

# රෝගීන්ගේ වාර්තා වීම අඩු වුවත් කොවිඩ් අවදානම තවමත් එහෙමමයි

## විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර

**සන්ධ්‍යා කරුණාරත්න**

ශ්‍රී ලංකාවෙන් කොවිඩ්-19 රෝගීන්ගේ වාර්තා වීම අවම වුවත් මේ අවදානම ලෝකයෙන් තුරන් වී නැති නිසා මෙරට ජනතාව ද රෝගය කෙරෙහි අවධානයෙන් සිටිය යුතු බව වසංගත රෝග විද්‍යා අංශයේ අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර මහතා පැවැසීය.

කොවිඩ් ව්‍යාප්තිය පාලනය කිරීම සම්බන්ධයෙන් ලෝකයේ දෙවැනි ස්ථානයට ශ්‍රී ලංකාව නම් කර පැවැතියත්, ඉදිරි කාලයේදී රෝගීන්ගේ වර්ධනය වීමක් සිදු නොවීමට නම් කොවිඩ්-19 වැළැක්වීමේ සෞඛ්‍ය උපදෙස් අනිවාර්යයෙන්ම අනුගමනය කළ යුතු බව ද ඒ මහතා පැවැසීය.

පසුගිය මාර්තු මස 11 වැනිදා සිට මේ දක්වා කොවිඩ්-19ට ගොදුරු වූ රෝගීන් 3377 ක් වාර්තා වී ඇති අතර ඉන් 3230ක් පූර්ණ සුවයට පත්ව තිබේ. රෝගීන් 134ක් රෝහල්වල ප්‍රතිකාර ලබයි.

මුඛ ආවරණ පැළැඳීම, මීටරයක දුරින් සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීම ඇතුළු කොවිඩ්-19 මර්දන සෞඛ්‍ය උපදෙස් පිළිපැදීමෙන් වයිරසය ව්‍යාප්ත වීමේ අවදානමක් පැවැතියහොත් එය වළක්වා ගත හැකි බව ද වෛද්‍ය සමරවීර මහතා පැවැසීය.



ලෝක ළමා දිනය නිමිත්තෙන් කොළඹ මහ නගර සභාවේ පුණ්‍ය කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මෙහෙයවීමෙන් පීටර්සන් මාවතේ අඩු පහසුකම් මත පවත්වාගෙන ගිය ළදරු පාසල අභිනවයෙන් උද්‍යාන පාරේ ගොඩනැගිල්ලක ස්ථාපිත කෙරිණි.කොළඹ පුරපතිනී රෝසි සේනානායක, ජී. එම්. ඩී. තුෂාර, අර්ෂාඩ් මොහොමඩ් නාගරික මන්ත්‍රීවරු ද, නාගරික පුණ්‍ය කොමසාරිස් ශාලිකා රණවීර මහත්ම මහත්මීන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක් වූහ.

**ඡායාරූපය - මැද කොළඹ සමූහ ආරියරත්න ගනේගොඩ**

# ශ්‍රී ලාංකිකයෝ 331ක් යළි මව්බිමට

**මහින්ද අලුත්ගෙදර**

කොවිඩ්-19 වසංගතයේ ව්‍යාප්තිය හේතුවෙන් ශ්‍රී ලංකාවට පැමිණීමට නොහැකිව අමෙරිකා එක්සත් ජනපදයේ සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ රැඳී සිටි ශ්‍රී ලාංකිකයන් 331ක් යළි මෙරටට පැමිණ තිබේ. ඒ අනුව ඔවුන් ඊයේ (01) පෙරවරුවේ කටුනායක බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපොළ වෙත පැමිණි බව ගුවන් තොටුපොළ පවසයි. මේ පිරිස අතරින් පුද්ගලයන් 312ක් අමෙරිකා එක්සත් ජනපදයේ සිට මෙරටට පැමිණ තිබෙන අතර අනෙක් 19 දෙනා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සිට පැමිණ තිබේ. මේ පිරිස ගුවන් තොටුපොළට පැමිණීමෙන් අනතුරුව සියලු දෙනාට පීසීආර් පරීක්ෂණ සිදුකර තිබෙන අතර අනතුරුව නිරෝධායනයට මාරවිල ක්ලබ් ෆාම් බේ හෝටල්වලට ද අක්කරෙයිපත්තුවේ පිහිටි රජයේ නිරෝධායන මධ්‍යස්ථානය වෙත ද යොමු කර ඇත.

# ඒදඬු, වැල්පාලම් හා කුඩා පාලම් වෙනුවට ග්‍රාමීය පාලම්

## රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා



නිමල් ලන්සා මහතා ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය ආරම්භ කළ අයුරු.

**නිමල් රාජපක්ෂ**

දිවයින පුරා ඇති ඒදඬු, වැල්පාලම් හා කුඩා පාලම් වෙනුවට ග්‍රාමීය පාලම් ඉදිකිරීමට රජය තීරණය කොට ඇතැයි ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා මහතා පවසයි. ඇමැතිවරයා මේ අදහස් පළ කළේ ග්‍රාමීය පාලම් ව්‍යාපෘතියේ පළමු අදියර රත්නපුර දිස්ත්‍රික්කයේ ඊයේ (01) ආරම්භ කළ අවස්ථාවේදීය.

ඒ අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ කලවාන හපුගොඩ පාලමේ ඉදිකිරීම් කටයුතු මාර්ග සංවර්ධන අධිකාරියේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා පොදුජන ඉංජිනේරු පෙරමුණේ දායකත්වය ඇතිව ආරම්භ කරනු ලැබීය.

කුඩා වැව්, වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති ජානක වක්කුඹුර මහතාගේ ඉල්ලීමකට අනුව හපුගොඩ පාලමේ ඉදිකිරීම ආරම්භ කෙරිණි. මේ ග්‍රාමීය පාලම් ව්‍යාපෘතියේ පළමු අදියර රත්නපුර, බදුල්ල,කෑගල්ල සහ කුරුණෑගල දිස්ත්‍රික්ක කේන්ද්‍ර කොටගෙන ක්‍රියාත්මක වේ.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ඉදිරිපත් කළ රට හදන සෞභාග්‍යයේ දැක්ම අනුව යමින් ග්‍රාමීය ආර්ථිකය නඟා සිටුවීම, සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සහ ජනතාවගේ දෛනික කටයුතු පහසු කරලීමේ අරමුණින් මේ වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. මේ වැඩසටහන ආර්ථික පුනර්ජීවනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායේ ප්‍රධානී බැසිල් රාජපක්ෂ මහතාගේ උපදෙස් පරිදි ක්‍රියාත්මක කෙරේ. ප්‍රාදේශීය දේශපාලන අධිකාරියේ නියෝජිතයෝ, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ඉංජිනේරු සංගමයේ නියෝජිතයෝ, මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීහු සහ ගම්වාසීහු පිරිසක් මේ අවස්ථාවට සහභාගි වූහ.

# ත්‍රිරෝද රියකින් කුඩු අදිද්දී තිදෙනෙක් අත්අඩංගුවට

**මහින්ද අලුත්ගෙදර**

ත්‍රිරෝද රථයකින් හෙරොයින් ප්‍රවාහනය කරමින් සිටි කාන්තාවන් දෙදෙනකු ඇතුළු පුද්ගලයන් තිදෙනකු අක්කරපත්තු, ඔළුවිල් ප්‍රදේශයේ දී අත්අඩංගුවට ගෙන තිබේ.

අක්කරපත්තු පොලිස් ස්ථානයේ නිලධාරින්ට ලද තොරතුරක් මත සිදු කළ වැටලීමක දී සැකකරු සහ සැකකාරියන් දෙදෙනා අත්අඩංගුවට ගෙන ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය පවසයි.

එහිදී ඔවුන් සතුව තිබී හෙරොයින් ග්‍රෑම් 25ක් සහ හෙරොයින් ජාවාරමෙන් උපයාගත් බවට සැක කෙරෙන රුපියල් 19,000ක මුදල් පොලීසිය විසින් සොයාගෙන තිබෙන අතර මෙහිදී අත්අඩංගුවට ගන්නා ලද කාන්තාවන් දෙදෙනා අදාළ ජාවාරමට අනුබල දී තිබෙන බවට අනාවරණය කරගෙන තිබේ.

ශ්‍රීකාන්තගේ ප්‍රියදර්ශන



### ඇනැත්ත

වැඩිහිටි දින - ළමා දින යෙදුණේ ඊයේ
ඊයේ නැවත හමුවන්නේ නැත ආයේ
නැන්දම්මේ - මාමෙ - අත්අම්මේ සීයේ
සඳසේ දිලේවා පසළොස්වක පෝයේ

දරු මුනුපුරන් අතරේ නැති විට බේදේ
යහපත් ජීවිතේකට මංපෙත් පෑදේ
වැඩිහිටි නිවෙස් වෙත කෙනෙකුට මං සෑදේ
ඔබ හැම හටම පතනෙමු ආසිරිවාදේ

රටේමුල්ලේ මුදන්නායක

### ගැමි කවිය

ගන්නට අසුන නොගොසින් මැති සබය වෙත
පොත පත ලියන්නට යොමු කරනවලු හිත
එහෙමයි රනිල් පැවසුවෙ සිය පිරිස වෙත
ලිවුවට මොකෝ පෙරළන්නේ නැතුව පොත





The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත
35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341
2020 ඔක්තෝබර් 02 සිකුරාදා

# නොබැඳි පිළිවෙත අපට වැදගත්

අපේ විදේශ ප්‍රතිපත්තිය, ආර්ථික සහයෝගිතාව හා ඉන්දීය සාගර කලාපයේ තත්ත්වය සම්බන්ධයෙන් ජනාධිපතිවරයා දක්වන අදහස් කෙරෙහි කාගේත් අවධානය යොමු වීම වැදගත්ය. අපේ විදේශ ප්‍රතිපත්තිය නොබැඳි එකකි. ශ්‍රී ලංකාව කිසිදු බල කඳවුරකට අයත් නැත. අමෙරිකාවේ, චීනයේ පමණක් නොව, අසල්වැසි ඉන්දියාවේ වුව මතවාදයට ගැති වී කටයුතු කිරීමේ වුවමනාවක් ශ්‍රී ලංකාවට නැත. අන්‍යොන්‍ය ප්‍රතිලාභ සහිත ආර්ථික සහයෝගිතාවක් පවත්වා ගැනීම අපේ ක්‍රමය වී ඇත. ඒ අනුව ඕනෑම රාජ්‍යයක් සමග ආර්ථික කටයුතු පුළුල් කර ගැනීමට ශ්‍රී ලංකාව සූදානම්ය. ඉන්දීය සාගරය විවෘත හා නිදහස් කලාපයක් සේ පවත්වා ගැනීම ශ්‍රී ලංකාවේ අපේක්ෂාව වෙයි.

ජනාධිපතිවරයා ඉහත සඳහන් ලෙස අපේ අන්තර්ජාතික කටයුතු විග්‍රහ කරන්නේ නව තානාපතිවරුන් සිව්දෙනකු අක්ත පත්‍ර භාර දෙන උත්සවයකදීය. ජර්මනිය, කොරියානු ජනරජය, ස්විට්සර්ලන්තය හා වතිකානය නියෝජනය කරමින් නව තානාපතිවරු එලෙස අක්ත පත්‍ර භාර දුන්හ. ජනාධිපතිවරයා, සිය අදහස් දක්වමින් තවත් වැදගත් සාධක කිහිපයක් ගැන සඳහන් කළේය. හම්බන්තොට නව වරාය ඉදි කළේ චීනයේ ණය ගනිමින්ය. එය ආර්ථික සහයෝගිතා වැඩසටහනකි. මෙය හඳුනා නොගත් අය විවේචන දෙකක් ඉදිරිපත් කළහ. පළමු විවේචනය වන්නේ ශ්‍රී ලංකාව ණය උගුලක සිර කර තිබේ යන්නය. දෙවන විවේචනය වන්නේ චීනයේ බල කඳවුර නියෝජනය කිරීමට ශ්‍රී ලංකාව ඉදිරිපත් වී ඇත යන්නය. මේ දෙක ම පදනම් විරහිත චෝදනා ලෙස ජනාධිපතිවරයා හඳුන්වයි.


දියුණු රටවල් විදේශීය ණය ගැනීමට බිය වන්නේ නැත. ණය මුදල් කළමනාකරණය කර ගැනීමේ හැකියාව ඒ රටවලට තිබේ. ණය ආර්ථික ව්‍යාපෘති සඳහා යොදාගෙන ඒවා සාර්ථක ආදයම් මාර්ග බවට පත් වූ විට ණය උගුලක් ඇති වන්නේ නැත. ලෝක බැංකුවේ හිටපු සභාපතිවරයකු වූ රොබට් මැක්නමාරාට අනුව ණය යනු සංවර්ධනයේ ලක්ෂණයකි. මැක්නමාරාගේ කාලය තුළ දුප්පත් රටවලට විශාල වශයෙන් ණය දී ඇත. ඇතැම් රටවල් ඉලක්ක ජය ගත්තේය. ඇතැම් රටවල් අමාරුවේ වැටුණේය. ණය ගැනීම නොව, ණය මුදල් ආයෝජනය කිරීම තුළ ගැටලුවක් ඇත්තේය. හම්බන්තොට වරාය යනු ඉතා බුද්ධිමත් ආයෝජනයකි. එහෙත් ඇතැම් දේශපාලන නායකයන් ඒ බව වටහාගෙන නැත.

චීනය සමග ආර්ථික ගනුදෙනු කිරීම වැරදියට වටහාගත් පිරිසක් අපේ රටේ සිටිති. චීන - ශ්‍රී ලංකා ආර්ථික සහයෝගිතාව ඔවුන්ගේ විග්‍රහයට අනුව චීන කඳවුර නියෝජනය කිරීමකි. මේ අනුව ශ්‍රී ලංකාව චීනයට සමීප වී ඉන්දියාව තරහ කරගෙන ඇතැ'යි තර්කයක් ඉදිරිපත් වී ඇත. මෙය අසත්‍ය දේශපාලන ප්‍රචාරයකි. ශ්‍රී ලංකාව ඉන්දියාව සමග මෙන්ම චීනය සමග ද මිත්‍රත්වයෙන් කටයුතු කරයි. එහෙත් චීනය නියෝජනය කිරීමට හෝ ඉන්දියාව නියෝජනය කිරීමට හෝ ශ්‍රී ලංකාව ඉදිරිපත් වන්නේ නැත. බල කඳවුරුවලට යටත් නැති නොබැඳි විදේශ ප්‍රතිපත්තියේ අර්ථය එයයි.

ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීමේ වැදගත්කම හා එහි ආර්ථික වාසිය අපේ නායකයන් හඳුනා ගෙන තිබුණේ නැත. කෙනකු එය හඳුනා ගෙන තිබුණ ද ඊට අදාළ ආයෝජන සිදු කිරීමට ඉදිරිපත් වූයේ නැත. හම්බන්තොට වරාය ඉදි කිරීම අපේ භූගෝලීය පිහිටීමේ වැදගත්කම හඳුනා ගැනීමකි. එය අභියෝගයක් වූ අතර, මහින්ද රාජපක්ෂ පාලනය අභියෝගය ජය ගැනීමට සමත් විය. හම්බන්තොට වරාය ආශ්‍රිත අනෙකුත් ව්‍යාපෘති සාර්ථක කර ගැනීම සඳහා අන්තර්ජාතික සබඳතා ඉතා වැදගත් වෙයි. ජනාධිපතිවරයා පෙන්වා දෙන්නට උත්සාහ කරන්නේ එම තත්ත්වය යැයි කිව හැකිය. තානාපතිවරුන් සමග ඒවා සාකච්ඡා කිරීම සාධනීය ලක්ෂණයකි. ලෝකයේ දියුණු රටවල් ශ්‍රී ලංකාවේ වැදගත්කම වටහා ගැනීම මේ මොහොතේ අත්‍යවශ්‍ය සාධකයක් ලෙස පවතී.

නව තානාපතිවරුන් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වැදගත් අදහස් කිහිපයක් පළ කර තිබේ. ඉන් එක අදහසක් වන්නේ කොවිඩ් 19 වසංගතය මර්දනය කිරීමේදී ශ්‍රී ලංකාව සාර්ථක වී ඇති බව හා ලෝකයට ආදර්ශයක් සපයා ඇති බවය. ශ්‍රී ලංකාවට දියුණු වීම සඳහා විභවතා ඇති බව හා තම රටවල සහයෝගය ඒ සඳහා නිරන්තරයෙන්ම දීමට සූදානම් බව දෙවන අදහසය. ජර්මනිය, ස්විට්සර්ලන්තය මෙන්ම කොරියානු ජනරජය ද කාර්මික වශයෙන් දියුණු තත්ත්වයක පවතින, ආර්ථික වශයෙන් බලවත් රාජ්‍යය. වතිකානය ලෝකයේ ගෞරවයට පාත්‍ර වූ කුඩා රාජ්‍යයකි. මේ සෑම රාජ්‍යයකම සහයෝගය හා මිත්‍රත්වය අපේ රටේ ඉදිරි ගමනට තීරණාත්මකය.

ලෝකය බල කඳවුරු දෙකකට බෙදී ආර්ථික හා දේශපාලනික වශයෙන් සිදු කළ සටන අවසන් වී ඇත. බලවත් රාජ්‍ය වෙන වෙනම ආර්ථික සටනක නිරත වී සිටින්නේ වුව ශ්‍රී ලංකාව ඊට මැදිහත් විය යුතු නැත. අමෙරිකාව, චීනය, ඉන්දියාව යන කුමන රාජ්‍යයක් සමග වුව ආර්ථික ගනුදෙනුවලට ප්‍රවේශ වීම වැදගත්ය. එහිදී එක් රාජ්‍යයකට වඩාත් සමීප වීම කාලෝචිත නැත. ආර්ථික හා දේශපාලනික වශයෙන් ස්වාධීන ලෙස කටයුතු කිරීම රජයේ ප්‍රතිපත්තිය වී ඇත. එය වැදගත් තීරණයකි. ඉන්දීය සාගර කලාපයේ වැදගත්ම ආර්ථික කේන්ද්‍රයක පිහිටි ශ්‍රී ලංකාව එබඳු විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමෙන් සියලු බලවත් රටවල සහයෝගය ලද හැකිය.




| | |
|---|---|
| ලැබ දෙන්නට සමාජය වෙත | වින්දනය |
| නළුකම අගෙයි සොඳුරුයි මන | නන්දනය |
| දැන් එය යොදනවා පිණිස ද | හිංසනය |
| හොරකමටත් කදිම අවියකි | රංගනය |



# ජනපතිට විලංගු දැමූ 19 උප්පරවැට්ටි

විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අභියෝගයට ලක් කරමින් පෙත්සම් තිස් නවයක් ඉදිරිපත්ව තිබේ. මෙම පෙත්සම් විභාග කර ඊට අදාළ තීන්දුව දින 21 ක් තුළ ලබාදීමට නියමිතය. පෙත්සම් ඉදිරිපත් කළ පිරිස අතර විපක්ෂයේ දේශපාලන පක්ෂත් පාර්ලිමේන්තුවේ ජාතික ලැයිස්තු මන්ත්‍රී ධූරයක් පමණක් හිමිකරගත් එක්සත් ජාතික පක්ෂයත් ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයකු ඇතුළු පිරිසක් සිටිති. ආණ්ඩුව පවසන්නේ ජනමත විචාරණයකට යායුතු කාරණා විසිවන ව්‍යවස්ථා සංශෝධනයේ නොමැති බවයි. එසේ වුවත් පෙත්සම් ඉදිරිපත් කළ අයගේ මතය වන්නේ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයකින් නොව ජනමත විචාරණයකට යායුතු කරුණුද මෙම සංශෝධනයේ තිබෙන බවය. ඒ සම්බන්ධ තීණ්දුව අධිකරණයට බාරය. එය එසේ වුවත් රට කඩිනමින් සංවර්ධන මාවතට යොමුවිය යුතුව ඇත. රටම දන්නා පරිදි 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් විධායක ජනපතිගේ දෑත් බැඳ තිබේ. වත්මන් ජනපතිවරයාගේ ධූර කාලයෙන් වසරක් මෙම නොවැම්බර් මාසය වන විට ගෙවී යයි. මාර්තු මාසයේදී කොවිඩ් අසාදිතයන් සමාජයෙන් සොයා ගැනීම නිසා රට දින පනහක පමණ කාලයක් වසා තිබිණි. පාර්ලිමේන්තුවක් නොමැතිව ගෙවීගිය අදාළ කාලය තුළ ජනපතිවරයා රට අර්බුදයේ ගිලී යා නොදී තබා ගැනීමට දැඩි වෙහෙසක් ගත්තේය. ඒ සියල්ල ඔහු විසින් කරනු ලැබුවේ ප්‍රමාණවත් පරිදි බලතල නොමැතිව බව අප තේරුම්ගත යුතුව තිබේ.

විසිවන ව්‍යවස්ථා සංශෝධනය සඳහා ආණ්ඩුවට තුනෙන් දෙකක ජනවරමක් මේ රටේ ජනතාව දී තිබේ. එවැනි ජනවරමක් 19 වැනි සංශෝධනය සඳහා යහ පාලන ආණ්ඩුවට ජනතාව ලබා නොදුන්හ. යහ පාලන ආණ්ඩු සමයේ ජනපති හා අගමැති පත් වූයේ පක්ෂ දෙකකිනි. මහින්ද රාජපක්ෂ මහතාට එරෙහිව 2015 ජනපතිවරණයේදී ජනපති සටනට පැමිණි මෛත්‍රිපාල සිරිසේන මහතා ඔහුගෙන් පසු විධායක ජනපති ධූරය අහෝසිකරන බවට පොරොන්දුවක් දුන්නේය. ඉන් නොනැවතුණු ඔහු තම පාලන කාලයේදී එම ධූරයේ බලතල කප්පාදු කරන බවද පැවසුවේය. මේ රටේ සමස්ත ඡන්ද දායකයන්ගේ බහුතරය දිනා ජනපති ධූරයට පත් විය නොහැකි බව රනිල් වික්‍රමසිංහ මහතා පැහැදිලිව දැන සිටියේය. එවකට මෙරට ප්‍රධාන පක්ෂ දෙකින් එකක නායකයා වූ රනිල් වික්‍රමසිංහ මහතා 2010 දී හා 2015 ජනපතිවරණවලට ඉදිරිපත් නොවීමෙන් එය පැහැදිලි කර ගැනීමට පුළුවන. මේ නිසා ඔහු කළේ බළලුන් ලවා කොස් ඇට බෑවිම හා සමාන දෙයකි. ජනපති වීමට පූර්ණ සහාය මෛත්‍රිපාල සිරිසේන මහතාට දුන් ඔහු ජනපතිවරණයෙන් පසු ජනපතිවරයා සතු බලතල තමන් වෙත ගැනීමට යෙදූ උප්පරවැට්ටියක් ලෙස 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය හැඳින්වීමට පුළුවන. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහලේකම්ව සිටි තමන්ට ජනපති වෙන්නට පාර කැපූ පුද්ගලයාට එරෙහි වන්නට මෛත්‍රිපාල සිරිසේන මහතාට නොහැකි වීමේ අවසන් ප්‍රතිඵලය වූයේ තමන් විසින්ම තමන්ගේ දෑතට විලංගු දාගැනීමේ තත්ත්වයට ජනපතිවරයා පත්වීමය.

ජනපති හා අගමැති එකම පක්ෂයකින් 2015 වසරේදී බිහිව තිබුණේ නම් මේ ආකාර විකාර රූපි සංශෝධනයක් ව්‍යවස්ථාවට එක්වන්නේ නැත. ජනපති සතු බලතල අඩුකර ඒ සියල්ල තමන් යටතට ගැනීම සඳහා රනිල් වික්‍රමසිංහ යෙදූ උපාය මෛත්‍රිපාල සිරිසේන මහතාට වැටහුණේ තම ධූර කාලය අවසන් වීමට වසර දෙකක් තිබියදීය. අනෙක් පැත්තෙන් එම ව්‍යවස්ථා සංශෝධනය තුළ රාජපක්ෂවරුන් මැතිවරණවලින් ඉවත් කර තැබීමේ අරමුණක්ද ක්‍රියාත්මක විය. විධායක ජනපති ධූරය දෙවරකට වඩා දැරිය නොහැකි බවට හා ද්විත්ව පුරවැසි භාවය ඇති අයෙකුට ජනපති ධූරයට හා ව්‍යවස්ථාදායකට පත්විය නොහැකි බවට යෝජනා ගෙනාවේ ඒ සඳහාය.කැබිනට් මණ්ඩලය උපරිම 30කට සීමා කිරීම 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ යහපත් යැයි සිතිය හැකි යෝජනා තමන්ගේ වාසියට හරවා ගනිමින් යහ පාලන ආණ්ඩුව කළේ පාර්ලිමේන්තුව නියෝජනය කරන පක්ෂ දෙකක හෝ ඊට වැඩි ගණනක නියෝජිතයින් එකතුවී ජාතික ආණ්ඩුවක් ගොඩ නගන්නේ නම් කැබිනට් අමාත්‍ය ධූර 49ක් දක්වා ඉහළ ගෙන යාහැකි බවට වගන්තියක් ඇතුළත්කර ගැනීමය. ජනපතිවරණ ප්‍රතිඵලයෙන් පසු අනිවාර්යයෙන්ම ශ්‍රී ලනිපයේ කණ්ඩායමක් තම පක්ෂය හා එක්ව ජාතික ආණ්ඩුවක් පිහිටුවන බව එජාප නායක රනිල් වික්‍රමසිංහ මහතා දැන සිටියේය.

මේ සියල්ලේ අවසන් ප්‍රතිපලය වූයේ ජාතික ආරක්ෂාව සම්බන්ධ වගකීම පැවරෙන්නේ කාටද යන්න පිළිබඳව පවා ප්‍රශ්නකාරී තත්ත්වයක් ඇතිවීමය. පාස්කු ප්‍රහාරයේදී ජනපති හා අගමැති කටයුතු කළ ආකාරය සම්බන්ධවත් එය වළක්වා ගැනීමට නොහැකි වූයේ ඔවුන් දෙදෙනා අතර පැවැති බල අරගලයේ ප්‍රතිඵලයක් නිසා බවත් එම ප්‍රහාරය සම්බන්ධයෙන් පත්කළ ජනපති කොමිසමේදී කදිමට හෙළිදරව් වන්නේය. විධායකය හා ව්‍යවස්ථාදායකය අතර පැවැති විරසකය ඔඩුදුවත්දීත් විධායක ජනපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට නොහැකි තත්ත්වයක් ඇතිවීම නිසා රට අර්බුද රැසකට පත් වුණේය. එක් පැත්තකින් ආරක්ෂාව බින්දුවට වැටෙද්දී අනෙක් පැත්තෙන් ආර්ථිකය කඩා වැටුණේය. දහනව වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් ඇතැම් වගකීම් විධායකයටද නැතහොත් ව්‍යවස්ථාදයකයටද යන්න පැහැදිලිව තේරුම්ගත නොහැකි වාතාවරණයක් ඇතිවිය. ස්වාධීන කොමිෂන් සභා,තොරතුරු දැන ගැනීමේ පනත එක්තරා අන්දමකින් 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය නැමැති කොකෝ බනිසයට තවරන ලද සීනිය. ඒවාද පසුකාලීනව දිය වී වැටෙන තත්ත්වයට පත්වූයේ ස්වාධීන කොමිෂන් සභාවල ඇතැම් නියෝජිතයන්ගේ පක්ෂග්‍රාහි හැසිරීම් එළිපිට දක්නට ලැබීමත් සමගය. වංචා දූෂණවලට තිත තබන බව පැවසුවත් යහ පාලන ආණ්ඩු සමයේ සිදුවූ මහ බැංකු බැඳුම්කර කොල්ලය මෙරට සිදු වූ විශාලතම දූෂණවලින් එකක් ලෙස ඉතිහාසයට එක්ව තිබේ. දහනවයෙන් ඇති කළ ස්වාධීන කොමිෂන් සභා ක්‍රියාත්මක වෙද්දී මෙම වංචාව සිදු කළ බව අප අමතක නොකළ යුතුය.

> ගෝඨාභය රාජපක්ෂ මහතාට මේ රටේ ජනතාව අතිවිශාල ජනවරමක් දුන්නේ ඔහු කෙරෙහි විශාල බලාපොරොත්තු තබාගෙනය. මහ මැතිවරණයේදී එය තවත් ඉදිරියට ගෙන යමින් අගමැති මහින්ද රාජපක්ෂ මහතා ඉහළින්ම ඔසවා තබා පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට ජනතාව දුන්නේ දහසක් බලාපොරොත්තු දල්වාගෙනය. එම අපේක්ෂා ආණ්ඩුව විසින් ඉටු කරනු ඇතැයි ජනතාව විශ්වාස කරති.

පසුගිය ජනපතිවරණය වන විට මේ රටේ ජනතාවට 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව පැහැදිලි අවබෝධයක් තිබිණි. එමගින් නිර්මාණය වූ අර්බුදවල පීඩාවන් ජනතාව හොඳින් අත්විඳ සිටියහ. මේ නිසාම එය අහෝසි කළ යුතු බවට මතයක් ජනතාව වෙතින්ම පිබිදී අවේය. ජනපති ගෝඨාභය රාජපක්ෂ මහතා මැතිවරණ සමයේදී 19 ය අහෝසිකර නව සංශෝධනයක් ව්‍යවස්ථාවට ගෙන එන බවත් අනතුරුව පූර්ණ ව්‍යවස්ථා වෙනසකට යන බවත් පැවසුවේය. ජනතාව එය අනුමත කරමින් අති විශාල ජනවරමකින් ඒ මහතා ජනපති ධූරයට පත් කළේය. මහ මැතිවරණයේදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ තුනෙන් දෙකක බලයක් තමන්ට ලබාදෙන ලෙස ඉල්ලා සිටියේ ව්‍යවස්ථා සංශෝධනය පහසුවෙන් කරගැනීමේ අභිලාෂය ඇතිවය. වත්මන් විපක්ෂය නියෝජනය කරන කණ්ඩායම එවැනි බලයක් පොහොට්ටුවට නොදෙන ලෙස මහ මැතිවරණ සමයේදී පැවසුවත් ජනතාව එයට කන් දුන්නේ නැත.එය එක්තරා අන්දමකින් 20 වැනි ව්‍යවස්ථා සංශෝධනය සඳහා ලබාදුන් ජනවරමක් ලෙස අර්ථකතනය කිරීමට පුළුවන. මේ ගෙන එන්නේ නව ව්‍යවස්ථාවක් නොව පවතින ව්‍යවස්ථාවට සංශෝධනයකි. පවතින ව්‍යවස්ථාව වෙනුවට නව ව්‍යවස්ථාවක් ගෙන ඒම එක රැයකින් කළ නොහැකිය.ඒ සඳහා සැලකිය යුතු කාලයක් ගත වෙයි. එතෙක් රට ඉදිරියට ගෙනයෑම සඳහා ජනපතිට අවශ්‍ය තීන්දු තීරණ ගැනීමට පසුබිම තිබිය යුතුය. ඒ සඳහා ව්‍යවස්ථාවෙන් ඇති කර තිබෙන බාධා ඉවත් කිරීම ජනතාවගේද අපේක්ෂාවය. මෙය ඉක්මනින් කළ යුතුය. ඒ සඳහා නිකරුණේ කාලය ගත කිරීම මේ මොහොතේ අවශ්‍ය දෙයක් නොවන්නේය.රට ඇත්තේ බරපතළ තත්ත්වයකය. ඊට මුහුණ දීමට නම් මේ සංශෝධනය ඉක්මනින් කර 19 ව්‍යවස්ථාවෙන් බැඳ දමා තිබෙන ජනපති දෑත් ලිහා දැමිය යුතුය.



පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන විද්‍යා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කථිකාචාරිනී
**මාධවී හේරත්**

නව ව්‍යවස්ථාවකට ඇතුළු කළ යුතු දේවල් විසිවන ව්‍යවස්ථා සංශෝධනය තුළට ඇතුළු කිරීමට කවුරුන් හෝ උත්සාහ කරන්නේ නම් ඉන් ඇති වන්නේ අවුලකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින්ම විධායක ජනපතිවරයාට රටේ ආරක්ෂාව සහතික කිරීමේ වගකීම පැවරී තිබේ. එසේ තිබියදී ජනපතිවරයාට ආරක්ෂක ඇමැතිධූරය දැරීමට ඇති හැකියාව 19 මගින් අහුරා ඇත.විස්ස මගින් විගණනයට බාධා ඇතිකර තිබෙන බවට තවත් මතයක් තිබේ. රාජ්‍ය ආයතනවල වංචා දූෂණ අවම කිරීමට විගණනය අවශ්‍යය බවට තර්කයක් නැත. විගණනය තුළින් අප අපේක්ෂා කරන්නේ මුදල් අවභාවිතය වළක්වා ගැනීමය. ඇතැම් අවස්ථාවල විගණනය රාජ්‍ය ආයතනවල කකුළෙන් අදින අවස්ථාද තිබේ.රටේ ඉදිරි ගමනට අවශ්‍ය තීන්දු තීරණ ගැනීමට ඇතැම් ප්‍රධානීන් මැළිවන අවස්ථා විගණනය හේතුවෙන් නිර්මාණය වී ඇත. මේවා සම්බන්ධව මධ්‍යස්ථව කල්පනා කර බැලිය යුතුය. විගණනය විගඩමක් නොවී රටේ අභිවෘද්ධිය වෙනුවෙන් ක්‍රියාත්මක විය යුතුය. රථවාහන වැරැද්දක් අල්ලා ගැනීමට ගහකට මුවා වී බලාසිටින පොලිස් රථවාහන අංශ නිලධාරියකු මෙන් විගණනය ක්‍රියාත්මක වන්නේ නම් පලක් නැත. රාජ්‍ය ආයතන පාලනයට යටත් කළ යුතු අතර ඒවාට අවශ්‍ය අවස්ථාවේ ඉක්මනින් ක්‍රියාත්මක වීමට පසුබිම තිබිය යුතුය. වඩා වැදගත් වන්නේ විගණනයේ බලපෑම යහපත් දිශානතියටකට රට යොමු කිරීමට හේතු වීමය.

අමාත්‍ය මණ්ඩලය නඩත්තු කිරීමට මහජන මුදල් විශාල ලෙස වැයවීම කලක පටන් අපේ රටේ ජනතා විවේචනයට ලක්වූ කාරණයකි. මේ නිසා ඒ සඳහා සීමාවක් පවත්වා ගැනීමට හොඳය. වත්මන් ආණ්ඩුවට ජනතාව තුනෙන් දෙකක බලයක් ලබාදී තිබෙන බැවින් ආණ්ඩුව අස්ථාවර වීමක් සිදුවීමේ ඉඩක් නැත. මේ නිසා සීමාව ඉක්මවා ඇමැති ධූර පිරිනැමීමට යෑම ජනතා අපේක්ෂාවලට පිටින් යෑමක් බව ආණ්ඩුව තේරුම්ගත යුතුය. වරක් කැබිනට් ඇමැතිවරයෙකු වූ අයකු සදාකාලිකවම කැබිනට් ඇමැතිවරයකු ලෙසම කටයුතු කළ යුතු යැයි මහජන මතයක් තිබේ. කැබිනට් ඇමැතිකමක් දැරුවෙකු ඊළඟ මැතිවරණය ජයගෙන පාර්ලිමේන්තු පැමිණි පසු ඔහුට යළිත් කැබිනට් ඇමැතිකමක් ලබාදිය යුතු යැයි නියමයක් නැත. එසේ වුවත් එවැනි නියමයක් ඇතැමුන් හදාගෙන තිබෙන බවක් පෙනෙන්නට ඇත.කැබිනට් ඇමැති ධූර සංඛ්‍යාව 30 කට සීමා වන්නේ නම් ඊට සුදුසු අය මිස කැබිනට් මණ්ඩලය නියෝජනය කළ අයට ප්‍රමුඛතාව දී අනෙක් අය පසුව සලකා බැලීමේ ක්‍රමය බැහැර කළ යුතුව තිබේ. අප කෙසේ පැවසුවත් මෙය ප්‍රශ්නයකි. ඇමැති ධූර පිරිනමන අවස්ථාවල කැබිනෙට්ටුවට පත් නොකළ හොත් ජ්‍යෙෂ්ඨයන්ගේ මුහුණ ඇඹුල් වන්නේ මේ නිසාය.කලින් කළ වැරදි ඒ ලෙසම පවත්වාගෙන යාමේ අවශ්‍යතාවක් නැත. එය කවුරුන් හෝ කොතනින් හෝ නිවැරදි කළ යුතුය. මෙවර එය යම් ප්‍රමාණයකට නිවැරදි වී තිබෙන බව පෙනෙන්නට තිබේ. ජනතාවට අවශ්‍ය වන්නේ වැඩ කර ධූරය බබළවන ඇමැතිවරුන් මිස වැඩ නොකර ධූරයෙන් බැබළෙන්නට හදන ඇමැතිවරු නොවේය.

ගෝඨාභය රාජපක්ෂ මහතාට මේ රටේ ජනතාව අතිවිශාල ජනවරමක් දුන්නේ ඔහු කෙරෙහි විශාල බලාපොරොත්තු තබාගෙනය. මහ මැතිවරණයේදී එය තවත් ඉදිරියට ගෙන යමින් අගමැති මහින්ද රාජපක්ෂ මහතා ඉහළින්ම ඔසවා තබා පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට ජනතාව දුන්නේ දහසක් බලාපොරොත්තු දල්වාගෙනය. එම අපේක්ෂා ආණ්ඩුව විසින් ඉටු කරනු ඇතැයි ජනතාව විශ්වාස කරති. විසිවන ව්‍යවස්ථා සංශෝධනය හා සම්බන්ධ කතිකාව දැන් මාස ගණනක් තිස්සේ ඇදෙමින් තිබේ. මේ ගතව යමින් තිබෙන්නේ ජනතාවට වැඩ කිරීමට ඇති කාලය බල අප තේරුම් ගත යුතුව ඇත. කොවිඩ් වසංගතයත් සමග ලෝක ආර්ථිකය කඩා වැටී තිබේ. අසල්වැසි ඉන්දියාව පුරා වයිරසය ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් යෑම සුළුවෙන් තැකිය හැකි කාරණයක් නොවන්නේය.එහි බලපෑම අපටද එල්ල වනු නොඅනුමානය. දශක ගණනාවක් පුරා අප ආවේ ඉබි ගමනිනි. ගෝඨාභය රාජපක්ෂ මහතාට අවශ්‍ය වී තිබෙන්නේ ආර්ථික වශයෙන් විශාල පිම්මක් ඉදිරියට පනින්ටය. ඒ සඳහා අවශ්‍ය තීන්දු තීරණ ගැනීමට ඔහුට හැකියාව තිබිය යුතුය. ඒ හැකියාව විස්ස මගින් නිර්මාණය කර දීමට ගන්නා උත්සහයට ජනතා ආශිර්වාදය හිමිව තිබේ. විස්ස සම්බන්ධයෙන් ගොඩ නැගෙන මතවාද සියල්ල නව ව්‍යවස්ථාවක් සකස් කර ගැනීමේ වැඩපිළිවෙළට ආශිර්වාදයකි. මේ නිසා මේ ඇතිව තිබෙන සංවාදය රටට ප්‍රයෝජනවත්ය.එසේ වුවත් විස්ස සම්බන්ධයෙන් මතුව තිබෙන අර්බුදයේ තවත් එල්ලී සිටීමෙන් සිදු වන්නේ රටට අගතියක් බව තේරුම් ගැනීමද වැදගත්ය.

**අසේල කුරුළුවංශ**

“භාර්යාවන් නිසා දේශපාලකයින් පිරිහෙනවා” - අගමැති මහින්ද





# වසංගත හමුවේ වැඩිහිටි අභියෝග



මහාචාර්ය **ලක්ෂ්මන් දිසානායක**
හිටපු උපකුලපති කොළඹ විශ්ව විද්‍යාලය

වැඩිහිටි වියට පා තැබීමත් සමඟ පුද්ගලයන් මානසික, සමාජීය සහ පාරිසරික අවධානම් තත්ත්වයන්ට මුහුණ දීමට ඇති ඉඩකඩ බොහෝය. වයස්ගත වීමත් සමඟ ඇති වන ශාරීරික දුබලතා නොයෙකුත් ආකාරයේ බෝ වන රෝග ආසාදනයට ඇති අවදානම වැඩි කරන අතර එයට ප්‍රධාන වන්නේ ඔවුන්ගේ ප්‍රතිශක්තිය පහළ යැමේ ප්‍රවණතාව මතයි. වයස්ගත වැඩිහිටියන්ට දැනටමත් හෘදයවාහිනී රෝග, දියවැඩියාව හෝ ශ්වසන රෝගාදිය තිබීම හේතුවෙන් වසංගත රෝග බෝ වීමේ ඉඩකඩ බෙහෙවින් වැඩියි. මේ නිසා වසංගත, වැඩිහිටියන්හට කරන බලපෑම අති විශාලයි. ලෝක සෞඛ්‍ය සංවිධානයේ දත්තවලට අනුව කොවිඩ් -19 මරණ වලින් 95% වැඩි ප්‍රමාණයක් වයස අවුරුදු 60ට වැඩි පුද්ගලයින් වන අතර මරණ වලින් අඩකට වඩා සිදු වී ඇත්තේ අවුරුදු 80 ට වඩා වයස්ගත පුද්ගලයින්ටයි.

ලෝක තත්ත්වය එසේ වුවත්, වාසනාවකට ශ්‍රී ලංකාවේ තත්ත්වය වැඩිහිටියන්ට කොවිඩ් -19 වසංගතයේ බලපෑම හානිකර නොවුණේ නිසි ලෙසට, නිසි වේලාවට රාජ්‍ය ප්‍රතිපත්ති සකස් වීමත්, තීරණ ගැනීමත් නිසාය. ඒ සම්බන්ධයෙන් අප සියලු දෙනාම ජනාධිපතිතුමාටත්, සෞඛ්‍යය ඇමතිනි ඇතුළු මුළු සෞඛ්‍යය ක්ෂේත්‍රයටත්, ආරක්ෂක අංශ පොලිසිය ඇතුළු සියලුම දෙනාටත් බෙහෙවින් කෘතඥ විය යුතුය.රජය ගත් ක්‍රියාමාර්ග නිසා ආසාදනයට පත්වීම මෙන්ම මරණ ද, දහස් ගණනකින් වළකාලීමට ශ්‍රී ලංකාව සමත් වී ඇති බව කිව යුතුය.

මේ තාක් කර ඇති පර්යේෂණ අනුව පැහැදිලි වී ඇත්තේ කොවිඩ් -19 රෝගය අසාදනය වීමත්, එමගින් මරණයට පත්වීමට වැඩිහිටියෙකුට ඇති අවදානම තරුණයෙකුට ඇති අවධානමට වඩා තුන් ගුණයකින් වැඩි බවයි. තවත් පර්යේෂණවලින් හෙළි වී ඇත්තේ කොවිඩ් -19 සමඟ ඇතිවන නිවුමෝනියා රෝගය නිසා නොව වෙනත් රෝග, විශේෂයෙන්ම ලේ විෂවීම හෝ හෘදය දුර්වල වීම වැනි රෝග තත්ත්වයන් උඩ මරණයට පත්වීමයි. එමෙන්ම ශාරීරික සචලතාවය හීන වීම ද, වසංගත නිසා මරණයට පත්වීම ශීඝ්‍ර කරයි. මීට අමතරව වැඩිහිටියන්ට ඇති සංජානන සංවේදන ඌණතා ද, වසංගත තත්ත්වයෙන් මරණයට පත්වීම තීව්‍ර කරයි. එයට හේතු වන්නේ තමන්ට වසංගත රෝගයක් වැලඳී ඇති බව අවබෝධ නොවීමයි.

## මානසික සෞඛ්‍යයට ඇති බලපෑම

වසංගත විශාල වශයෙන් වැඩිහිටියන්ට මනෝ සමාජීය බලපෑමක් ඇති කරයි. සෞඛ්‍යය කාංසාව (Health Anxiety) සංත්‍රාසය (Panic) ගැළපීම් ආබාධ (Adjustment Disorders) නිදන්ගත මානසික අවපීඩනය (Chronic Disorders) නිදන්ගත ආතතිය (Chronic stress) නින්ද නොයෑම (insomnia) යනාදිය මේ සම්බන්ධව ප්‍රධාන හේතු කාරක හැටියට හැඳින්විය හැකිය. මේ සම්බන්ධයෙන් කර ඇති පර්යේෂණ වලින් අවබෝධ වනුයේ වැඩිහිටියන් සම්බන්ධයෙන් නිරන්තරව දකින සමාජ හුදෙකලාව (Social isolation) බරපතළ මහජන ගැටලුවක් ලෙස හඳුන්වා දී ඇති බවයි. එය ජෛව මනෝ සමාජයීය අවදානම් (biopsychosocial vulnerability) තත්ත්වයක් නිසා නිර්මාණය වේ. මේ තත්ත්වයන් වැඩිහිටියන් තුළ තීව්‍ර වන්නේ ඔවුන් විශේෂයෙන් වැඩිහිටි නිවාසවල සිටින විටයි. වසංගත නිසා සමාජ දුරස්ථභාවය තබා ගැනීම අනිවාර්ය හෙයින් වැඩිහිටි නිවාස වල සිටින වැඩිහිටියන්ට තනිකමක් දැනෙන හෙයින් ඒ නිසා මානසික අවපීඩනය, කාංසාව හා සියදිවි හානි කර ගැනීම වැනි තත්ත්වයන්ට සංජනය වීමට ඇති සම්භාවිතාව ඉතා ඉහළයි. මහජන සෞඛ්‍ය තත්ත්වයන් වසංගත තත්වයකදී බිඳවැටීමට ඇති අවකාශය වැඩි නිසා සමාජ සම්බන්ධතා ශක්තිමත් කර ගැනීම ඉතා වැදගත් වන නමුත් 'වයස්ගත වීම' මානසික එළඹුම වැඩිහිටියන් සමාජයෙන් දුරස්ථ වීමට ඇති ප්‍රවණතාව වැඩි කරයි. මීට අමතරව වැඩිහිටියන්ට වසංගත තත්ත්වයන් ආසාදනය වීමට ඇති ඉඩකඩ නිසා ඔවුන්ව ආශ්‍රය කිරීමට සමාජයේ අනෙකුත් අය බිය වීමයි.

වැඩිහිටියන් බොහොමයකට වසංගත සම්බන්ධයෙන් කරන්නට නියමිත වත් පිළිවෙත් සම්බන්ධ තොරතුරු ස්මාර්ට් ජංගම දුරකතන හෝ මාධ්‍ය භාෂාව සමඟ අවබෝධ කරගැනීම පහසු කරුණක් නොවේ. එබැවින් වසංගතයක් සඳහා පූර්වාක්ෂාවකින් ඔවුන්ගේම සරල වචනවලින් ඔවුන්ට පැහැදිලි කිරීම අත්‍යවශ්‍ය වේ. සංජානන දුර්වලතා, සහ ඉබාගාතේ යාම නුරුස්සන බව, යන මානසික රෝග ලක්ෂණ වැනි ගැටලු භීතිකාව උග්‍ර කළ හැකි අතර දුරස්ථභාවය සහ අත් සනීපාරක්ෂාව පිළිබඳ පූර්වාරක්ෂාවන් අනුගමනය කිරීම ඔවුන්ට අපහසු වේ. තවද, මානසික ආබාධ සහිත වැඩිහිටියන් වඩාත් අවදානමට ලක් වන අතර එවැනි අර්බුදයකදී එය තවත් උග්‍ර වීමට ඉඩ ඇත. කොවිඩ්-19 වසංගතය ව්‍යාප්ත වීමේ දී වැඩිහිටියන් සඳහා ඇති සත්කාරක සේවා මෙන්ම සෞඛ්‍ය සේවා නිසියාකාරව උපයෝගී කර ගැනීමට ඇති නොහැකියාව ද දක්නට හැකිය. එමෙන්ම වැඩිහිටියන් මත අධික වශයෙන් වසංගත සම්බන්ධයෙන් තොරතුරු පැටවීම ද, ඔවුන්ගේ ආතතිය තවත් තීව්‍ර කරන අතර සෞඛ්‍යය සත්කාරක සේවා සම්බන්ධව සැක සහිතව බැලීමට උත්සාහ ගැනීමත් ඒ නිසා නිරෝධායන කටයුතු නිසියාකාරයෙන් නොකර සිටීම පෙලඹීමත් නිසා අනිසි මහජන සෞඛ්‍ය ගැටලු නිර්මාණය වීමට ඉඩ ඇත. වැඩිහිටියන්ගේ මානසික සෞඛ්‍ය මහජන සෞඛ්‍යය ශක්තිමත් පදනමක් වේ. බොහෝ විට වසංගත තත්ත්වයන් නිසා මතු වන ප්‍රතිකාර විධි ක්‍රම මානසික සෞඛ්‍ය තත්ත්වය වැදගත්කම ඉක්මවා යන හෙයින් හා එය සමාජයේ වැඩිහිටියන් අතර ඇති භීතිකාව වැඩි කිරීමට පාදක වේ. නිත්‍ය දුරකතන උපදේශන සැපයීම, පවුලේ අය සමග හොඳ සෞඛ්‍ය සම්පන්න සබඳතා අදාළ හා යාවත්කාලීන තොරතුරු සාමාන්‍ය වෛද්‍ය හා මානසික අවශ්‍යතා සපුරාලීම සහ ඔවුන්ගේ පෞද්ගලික අවකාශයන් ගෞරවනීය තත්ත්වයන්ට ගරු කිරීම, මානසික සෞඛ්‍යය රැකවරණයේ වැදගත් අංගයන් බව සැළකිය යුතුය. වැඩිහිටියන්ගේ මානසික සෞඛ්‍ය අවශ්‍යතා කල්තියා හඳුනා ගැනීම සඳහා සෑම මට්ටමකින් ම ඒ සඳහා සංවේදීව කටයුතු කිරීම අවශ්‍ය වන අතර විශේෂයෙන් අවදානමට ලක් විය හැකි වැඩිහිටි ජනගහනය සඳහා සුදුසු මැදිහත්වීම් සැලසුම් කිරීම ද අත්‍යවශ්‍ය වේ.

## අවම කරගත යුතු අභියෝග

අප අවම කරගත යුතු අභියෝග මොනවාද? වසංගත නිසා අභියෝග මාලාවක් පැනනගී. ඒවා නම් ආර්ථික පසුබෑම, අහිතකර සෞඛ්‍ය හා යහපැවැත්ම බලපෑම් ය. ඊට අමතරව වයස්ගත වීම හා ලිංගිකත්වයයි.

## ආර්ථික පසුබෑම

වැඩිහිටියන්ට ශ්‍රම බළකායට ඇතුළු වීමට ඇති අපහසුතාව මින් මූලික තැනක් ගනී. වසංගත නිසා ව්‍යාපාර වසා දැමීම හේතුවෙන්, වැඩිහිටි වයස් කාණ්ඩයේ රැකියා අහිමි වීම අපේක්ෂා කළ හැකියි. එයට හේතු වන්නේ ව්‍යාපාර ව්‍යාපාරිකයන්ද ආර්ථික වශයෙන් අවපාතයකට භාජනය වීමයි. සමහර ව්‍යාපාර වසාදැමීමට පවා සිදු වේ. ඒ අනුව විශේෂයෙන්ම විරැකියා අනුපාතය ඉහළ යන අතර එය වඩාත් දැඩිව වැඩිහිටි ජනතාවට බලපෑ හැකිය. වැඩිහිටි ජනතාවගෙන් වැඩි ප්‍රතිශතයක් අවිධිමත් අංශයේ රැකියාවල නිරත වීමත් නිසා ඒ අවදානම තවත් වැඩිවේ. එයට හේතුව සමසේ අවිධිමත් රැකියා වල නිරත වීමට නොහැකි වීමත් ඒ හේතුවෙන් විශේෂයෙන් දුප්පත් වැඩිහිටියන් විශේෂයෙන්ම දුප්පත් වැඩිහිටි ගෘහමූලික කාන්තාවන් ඉතා අසීරු තත්ත්වයකට පත්විය හැකියි.

## වැඩිහිටියන්ගේ විශ්‍රාම ඉතිරි කිරීම් අහිමි වීම

වසංගත ඇති වීමත් සමඟ වැඩිහිටියන් මුහුණ දෙන තවත් අභියෝගයක් වන්නේ තමන්ගේ විශ්‍රාම ඉතිරිකිරීමේ අහිමි වී යැමයි. ආර්ථික වශයෙන් රටක ආදායම් හීන වීමත් මූල්‍ය වෙළෙඳපොළ පහත වැටීමත් විශ්‍රාමික ඉතිරි කිරීම්වලට බලපෑම් ඇති කළ හැකිය. එයට හේතුව විශ්‍රාමික ඉතුරුකිරීම් ගිණුම්වල මුදල් ශීඝ්‍රව වැඩි වශයෙන් භාවිත කිරීමට සිදු වීම යි. මේ අපට දකින්නට පුළුවන් කරුණක් වන්නේ කලින් විශ්‍රාම යන්නට සැලසුම් කර සිටි අය විශ්‍රාම වීම කල් දැමීමත් විශ්‍රාමික අය නැවත ශ්‍රම බළකායට එකතු වීමට උත්සාහ කිරීමත්ය. ව්‍යාපාර සම්බන්ධයෙන් සලකා බලන විට පෙනී යන්නේ, ක්‍රමයෙන් නිමාවනවිට ව්‍යාපාර ව්‍යාපාරවලට ඉහත තිබුණාට වඩා වැය පක්ෂය අඩුකර මූල්‍ය පදනම ස්ථාවර කරගැනීමට උත්සාහ දැරීමයි. මෙහිදී විශේෂයෙන් බලපෑමට ලක් වන්නේ වැඩිහිටි ශ්‍රමිකයන් එනම් විශ්‍රාම වයසට ළං වී සිටින ශ්‍රමිකයන් ඔවුන්ට රැකියාවේ ඉහළ යෑමට ඇති අවස්ථා අහිමි වන හෙයින් ඔවුන් විශ්‍රාම වයසට ළඟා වීමට ප්‍රථම විශ්‍රාම ගැනීමට උත්සාහ කිරීමයි. මේ අනුව සේවා ස්ථානයේ ගන්නා ක්‍රියාමාර්ග නිසා වැඩි ශ්‍රමිකයන්ට අසතුටුදායක පරිසරයක් නිර්මාණය වනවා සේම මානසික අවපීඩනයත් ඉහළ යෑමයි.

## සෞඛ්‍යය හා යහපැවැත්මේ බලපෑම

වැඩිහිටියන්ට සපයන සුපුරුදු සේවාවන්හි බාධා ඇති වීම ස්වාභාවිකයි. වසංගත අර්බුදයන් තුළ නවාතැන් ස්ථාන, සත්කාර සේවය සපයන සංවිධාන වසා දැමීම නිසා වැඩිහිටියන් බොහෝ දෙනෙකුට ඔවුන්ගේ පෙර පැවති ශාරීරික චිත්තවේගීය හා වයස්ගත මෙන්ම වයස්ගත ජාල සේවා සහ සෞඛ්‍ය සේවා පද්ධතිය හරහා සපුරාලූ සමාජ අවශ්‍යතා ද අකර්මණ්‍ය වේ. වැඩි සේවා සඳහා කැපවුණු සංවිධාන මෙවැනි අවස්ථා උන්නුවන්ගේ වැඩිහිටියන්ට වන හානිය අවම කර ගැනීමටයි. උදාහරණයක් හැටියට කොවිඩ්-19 වසංගත සමයේ අප දුටුවේ විවිධ සංවිධාන, රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතන, මාධ්‍ය ආයතන සියල්ලක්ම පාහේ වැඩිහිටි නිවාස මෙන්ම දුප්පත් වැඩිහිටියන් සිටින ස්ථාන සොයා බලා ඔවුන්ට ආහාර පාන හා අනෙකුත් පහසුකම් ලබාදීමට ගත් උත්සාහයයි. කෙසේ නමුත් විශේෂ ආහාර වට්ටෝරු හා විශේෂ සෞඛ්‍ය තත්ත්වයන් යටතේ ජීවත් වන වැඩිහිටියන්ගේ අවශ්‍යතා සපුරාලීම පූර්ණ වශයෙන් සිදු නොවීමට බෙහෙවින් ඉඩකඩ ඇති නිසා එවැනි වැඩිහිටියන්ගේ තත්ත්වය අවදානමට ලක් වනු ඇත. මෙහිදී විශේෂ අවධානයක් යොමු කළ යුතු වැඩිහිටි කණ්ඩායම වන්නේ දිගුකාලීන සත්කාර අවශ්‍ය පුද්ගලයින් ය. වසංගත තත්ත්වය උත්සන්න වන විට සෞඛ්‍යය සේවා හා අනෙකුත් සත්කාරක සේවා සැපයීම මුළු ජනගහනය ම පොදුවේ සැලකිය යුතු නිසා බොහෝ අවස්ථාවල වැඩිහිටියන්ට ඇති අවධානය අඩු විය හැකිය.

> වසංගත ඇති වීමත් සමඟ වැඩිහිටියන් මුහුණ දෙන අභියෝගයක් වන්නේ තමන්ගේ විශ්‍රාම ඉතිරිකිරීම් අහිමි වී යැමයි. ආර්ථික වශයෙන් රටක ආදායම් හීන වීමත් මූල්‍ය වෙළෙඳපොළ පහත වැටීමත් විශ්‍රාමික ඉතිරි කිරීම්වලට බලපෑම් ඇති කළ හැකිය. එයට හේතුව විශ්‍රාමික ඉතුරුකිරීම් ගිණුම්වල මුදල් ශීඝ්‍රව වැඩි වශයෙන් භාවිත කිරීමට සිදු වීම යි. මේ අපට දකින්නට පුළුවන් කරුණක් වන්නේ කලින් විශ්‍රාම යන්නට සැලසුම් කර සිටි අය විශ්‍රාම වීම කල් දැමීමත් විශ්‍රාමික අය නැවත ශ්‍රම බළකායට එකතු වීමට උත්සාහ කිරීමත්ය.



## වසංගත ආසාදනය වූ වැඩිහිටියන් වැඩි සෞඛ්‍යය අවදානමකට ලක්වීම

වර්තමානයේ විශේෂයෙන් ම කොරෝනා වයිරසය ව්‍යාප්තිය සමග අපට ඇති දත්ත අනුව පැහැදිලි වන්නේ කොරෝනා ආසාදනය වී පූර්ණ වශයෙන් පුද්ගලයන් සුව අතට පත්වන්නට හැකි බවයි. කෙසේ තත්වය දීර්ඝකාලීනව ඇති බොහෝ අතුරු විපාක ගැන අප තවමත් නොදනී. මෙය විශේෂයෙන් ම බලපා ඇත්තේ දැඩි සත්කාර අවශ්‍ය වැඩිහිටියන් සම්බන්ධයෙන් වයිරසය ආසාදනය නිසා ඇතිවන සංකූලතා වයෝවෘද්ධ වැඩිහිටියන් මිය යාමට ඇති සම්භාවිතාව වැඩි කරයි. විශේෂයෙන්ම පෙණහලු ආශ්‍රිත රෝග ඇති වැඩිහිටියන්ට පෙණහලුවලට හානිදායක තත්ත්වක් ඇති කළ හැකි අතර වසංගත තත්ත්වයෙන් සුව අතට පත්වීමට දීර්ඝ කාලයක්ද යනු ඇත. සමහර විට ඔවුන්ගේ චර්යා රටාවන් පෙරසේ පූර්ණ ක්‍රියාකාරීත්වයට නොපැමිණෙන්නට පුළුවන. දැනට කොවිඩ්-19 වසංගත තත්ත්වය ආශ්‍රිතව කර ඇති සමහර පර්යේෂණ අනුව ආසාදිත වැඩිහිටියන් පෙර හෘද රෝග නොමැති වුවත් ආසාදිත තත්ත්වයෙන් පසු හෘද රෝග ඇති වීමට ඉඩ ප්‍රස්ථා තිබෙන බවයි.

## වැඩිහිටියන් වයස් භේදයට පත් වීමේ ඉඩකඩ වැඩිවීම

වයස්ගත තත්ත්වයන් හමුවේ වැඩිහිටියන් ඔවුන්ගේ වයස නිසා සමාජය තුළ වෙනස්කමට භාජනය වීමට ඉඩ ඇත. එයට හේතුව කොවිඩ්-19 වැනි වසංගත වැඩියෙන් ආසාදනය වීමට හැකියාවක් ඇත්තේ වැඩිහිටියන්ට වීමත්, මරණයට පත්වීමේ සම්භාවිතාව වැඩි වීමත් ය. එමගින් වැඩිහිටියන්ට ඇති සැලකිල්ල හා වටිනාකම පෙරට වඩා අඩු වී අනෙකුත් ඵලදායි වයස් කාණ්ඩ කෙරෙහි අවධානය වැඩි විය හැකියි. බොහෝ රටවල තත්වය නිරීක්ෂණය කිරීමේදී අපට ගම්‍ය වන්නේ වැඩිහිටියන්ගේ රෝගී තත්ත්වයන් හා අනෙකුත් අවශ්‍යතා සඳහා ප්‍රතිචාර දැක්වීම ප්‍රමාද වීමයි. ශ්‍රී ලංකාවේ මේ තත්ත්වය දක්නට නොමැති වුවත්, තොරතුරු වාර්තා වන ආකාරයට සමහර රටවල ළමයින්ට හා තරුණයන්ට ප්‍රමුඛතාවක් සමහර රෝහල්වල ලබාදී ඇති බව දක්නට ලැබේ. ඊට හේතුව ලෙස ගම්‍ය වන්නේ වයස්ගත පුද්ගලයන්ගේ ජීවිත බේරා ගැනීමට වඩා ආර්ථිකය ගලවා ගැනීමට ප්‍රමුඛත්වයක් දී ඇති බවයි. ශ්‍රී ලංකාවේ තත්ත්වය මෙයට පූර්ණ වශයෙන් වෙනස් වුවත්, ලෝකයේ බොහෝ රටවල මහලු විය යනු දුර්වල හා අඩු අවදානමක් ඇති තත්ත්වයක් ලෙස සිතීමයි. සමහරවිට වැඩිහිටියෝ ම තමා දුර්වල අවදානම් සහිත කොටසක් ලෙස පිළිගැනීම දැකිය හැකියි. මෙහිදී සිදුවිය යුතුවන්නේ වැඩිහිටියන් තම අයිතිවාසිකම් වෙනුවෙන් පෙළ ගැසීමක් වයස අනුව තමාගේ අයිතිවාසිකම් හැල්ලුවට ලක්කිරීම වළක්වාලීමට වැඩිහිටිවියේ ඇති වටිනාකම පිළිබඳව සමාජයට අවබෝධ කර දීමත් ය. මෙහිදී මා විසින් බොහෝ විට සාකච්ඡා කර ඇති 'අනාගත වයස්' යන සංකල්පය භාවිතා කළ යුතු වේ. සාමාන්‍යයෙන් වර්තමානයේ එක් එක් වයස් කාණ්ඩ එනම් පාසල් යන වයසේ ළමයින්, ශ්‍රම බලකායේ සිටින අය, හා වැඩිහිටියන් නිර්වචනය කිරීමට භාවිතා කරන්නේ කාලානුක්‍රමික වයසයි. එහෙත් ප්‍රායෝගික කරුණ වන්නේ ජීවත්වීමේ සම්භාවිතාව නිරන්තරයෙන් ඉහළ යමින් සිටින නිසා පසුගිය සියවසේ මැද භාගයේ අවුරුදු 60 පිරි පුද්ගලයෙක් වර්තමානයේ 60 පිරි පුද්ගලයෙකුගේ ක්‍රියාකාරීත්වයට සම කළ හැකි ද යන්නයි. එනිසා වර්තමානයේ වයස්ගතවීම යන්න නැවත නිර්වචනය කිරීමට කාලය පැමිණ තිබේ. උදාහරණයක් හැටියට 1946 වසරේදී වයස අවුරුදු 60 ඉක්මවූ පිරිමියෙකුගේ ආයු කාලය තව අවුරුදු 13.4 කි. නමුත් 2012 දී 13.4 ආයුකාලයක් ඇත්තේ වයස අවුරුදු 67.03 වන පිරිමින්ටයි.අවුරුදු 60ක් පිරි ස්ත්‍රියකගේ 1946 දී ආයු කාලය වූයේ අවුරුදු 13.8කි. එහෙත් එවැනි ආයුකාලයක් 2012දී ඇත්තේ අවුරුදු 70.1ක් පිරි ස්ත්‍රියකට ය. මේ අනුව අප තර්ක කළ යුතු වන්නේ දැනට අවුරුදු 67 ක පුරුෂයකුගේ වයස අවුරුදු 60ක් බවයි. අවුරුදු 70ක ස්ත්‍රීයකගේ නව වයස අවුරුදු 60ක් බවයි. මෙයින් රටටත් වැඩිහිටි පුද්ගලයන්ටත් ඇති වාසිදායක තත්ත්වයන් අපමණය. එක් උදාහරණයක් නම්, ශ්‍රම බළකාය ක්‍රමයෙන් හීන වීමේ තර්ජනයකට මුහුණ පාන රටවල් හැටියට වයස නැවත නිර්වනය කිරීමෙන් ආගමනික ශ්‍රමය වෙනුවට ක්‍රියාකාරී වැඩිහිටි ජනගහන ශ්‍රම බළකාය තුළ රඳවා ගැනීමෙන් ඵලදායි ආර්ථිකයක් තිරසර තත්ත්වයෙන් පවත්වා ගත හැකිය.

## වෛද පරපුරක
# වික්‍රමාන්විතය

නැදුන්ගමුව යන නම කී පමණින්ම කෙනෙකුට සිහිවන්නේ වෙද පරපුරකි. නැදුන්ගමුවේ වෙද පරපුරට අයත් වෛද්‍යවරුන් අතර වෙළුන් පෙරේරා වික්‍රමාරච්චි වෙද රාලහාමි රටේ කීර්තිමත් වෛද්‍යාචාර්යවරයෙක් විය. එම වෛද්‍යතුමාට හා එම මැතිනියට දාව 1889 සැප්තැම්බර් 28 වන දින සියනෑ කෝරලයේ නැඳුන්ගමුවේදී ගේබ්‍රියල් පෙරේරා වික්‍රමාරච්චි මහතා උපත ලැබීය.

උපතින්ම වෙද පරපුරකට හිමිකම් කියූ මොහු ජීවත් වූයේ ද හැදී වැඩුණේ ද සිය නිවෙස වූ වෙදගෙදර ගුරු හරුකම් ලබමින්ය. වෙදුන්ගේ වෙදකු වූ පියකුට පුත්ව උපන් වික්‍රමාරච්චි මහතාට තවත් සොහොයුරෝ සතර දෙනෙක් වූහ. පළමු වැන්නා පළාතේ ඉඩම් හිමි ධනවතෙක්ය. පවුලේ දෙවැන්නා වූයේ අපගේ කතානායකයා වන පියාගේ අඩිපාරේ වෙද ශාස්ත්‍රය රැගෙන ගිය ජී. පී. වික්‍රමාරච්චි මහතාය, තුන්වැන්නා පළාතේ නම ගිය ශ්‍රෙෂ්ඨාධිකරණයේ නීතිඥයෙකි. හතර වැන්නා පළාතේ නම ගිය ප්‍රසිද්ධ නොතාරිස්වරයෙක් වූ අතර ඔහු නොතාරිස්වරුන්ගේ සංගමයේ සභාපති ද වූවා පමණක් නොව දේශීය සමාජ සේවකයෙකි. පස්වැන්නා මෝල් හිමි වෙළෙඳ ව්‍යාපාරිකයෙකි. මේ සහෝදරයෝ පස්දෙනාම කෙතරම් උසස් තැන් කරා පත් වූව ද "ගැමිකම" අත් නොහැරියෝය. මේ එකතුවට එදා ඇතැම් ගම්වැසියන් විසින් 'පංච සහෝදර සමිතිය" යන නම තබාගෙන සිටි බවද ප්‍රසිද්ධය. ජී. පී. වික්‍රමාරච්චි මහතා ගම්වැසියන් විසින් හඳුන්වන ලද්දේ "පණ්ඩිත රාලහාමි" යන චාම් නමින්ය. එය ආදරයත්, භක්තියත්, ගෞරවයත් එකට ගැබ් වූ ගමේ ගැමියන් අතර උපන් ගැමි ඌරුවේ නමකි. වික්‍රමාරච්චි මහතා මූලික අධ්‍යාපනය ලැබුවේ හේනේගම රජයේ පිරිමි පාසලෙන්ය. එහිදී ගණිතය, කියවීම හා ලිවීම උගත් අතර ශතක පොත්, ව්‍යාසකාරය, වෘත්තමාලාව, අමරසිංහය දක්වා ගෙදරදී තම පියාගෙන් උගත්තේය. ඉන් අනතුරුව අගනුවර විද්‍යෝදය මහ පිරිවනෙහි ශාඛාවක් වූ ගොඩගෙදර උත්තර මූල පිරිවෙනෙහි අධිපති ධුරය දැරූ රඹුක්පොත ශ්‍රී ප්‍රඥාසාර නාහිමියන් යටතේ අධ්‍යාපනය ලැබීම සඳහා කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනට ඇතුළත් විය. උත්සාහය, විනීතකම, බුද්ධි කුසලතාවය හා කාර්යක්ෂමතාව නිසා මෙම ශිෂ්‍යා ගුරුන් සිත්ගෙන එහි කැපී පෙනෙන ශිෂ්‍යයකු බවට පත් විය. පිරිවෙන තුළ මොහු හැඳින්වූයේ "ශ්‍රේබ්‍රියෙල් පෙරේරා" යන නමිනි. සිංහල, පාලි, සංස්කෘත භාෂා ශාස්ත්‍ර හා ඡන්දොමංකාරාදී ශාස්ත්‍ර ද චරක සුශ්‍රැතාදී වෛද්‍ය ග්‍රන්ථ ද හදාරා ඒවායේ ප්‍රවීණතා ලැබුවේ එදා වූ පිරිවෙන් අධ්‍යාපනයෙහි මහිමය කෙබඳුදැයි පැහැදිලි කරමිනි. ප්‍රාචීණ භාෂා ශාස්ත්‍ර හදාළ ශිෂ්‍යයන්ගේ දැනීම ක්‍රමවත්ව හැඩගැසීම සඳහා සකස් වූ විභාග ක්‍රමයකි ප්‍රාචීණ විභාගය. ප්‍රාරම්භ, මධ්‍යම, අවසාන වශයෙන් මෙම විභාගයට පිළිවෙළින් පෙනී සිටිය යුතු කොටස් තුනකි. අවසාන කොටසින් සමත් වන්නවුන්ට පණ්ඩිත උපාධිය හිමි විය. ග්‍රේබ්‍රියෙල් පෙරේරා වික්‍රමාරච්චි ශිෂ්‍යා ද එම විභාගය සමත්ව 1913 දී පණ්ඩිත උපාධිය හිමිකර ගත්තේය. එයට අදාළ සන්නස 1915 ශ්‍රීමත් රොබට් චාමස් එදා සිටි ලංකාණ්ඩුකාරවරයා අතින් හිමිකර ගත්තේය. මේ පඬිතුමා පිරිසුදුව මැද සකස් කරන ලද සුදෝ සුදු රෙදි කෝට් ඇඳ සීරුවට හිස පීරා කොණ්ඩය බැඳ නැමි පනාවකින් හිස සැරසූ කඩිසර තරුණයෙකි. මෙම පඬිවරයා අනගාරික ධර්මපාලතුමා විසින් ආරම්භ කරන ලද සිංහල බෞද්ධයා පත්‍රයෙහි 1914 සිට 1917 දක්වා කාලයෙහි කර්තෘ පදවිය ද උසුලා ඇත. 1917 වර්ෂයේදී මෙතුමා නොතාරිස් විභාගයෙන් සමත් විය.

කෙතරම් විභාග සමත් වූවද එතුමා අගය කළේ පරම්පරා උරුමය වූ සහජ දායාදය වූ චක්‍රවර්තීත්වයෙහි තැබුවා වූ වෙදකමයි. එකල රටේ ආයුර්වේද විද්‍යාල නොතිබුණ ද වෙදපොත් කියවා ලබන ලද විශාල දැනුම හා පණ්ඩිතෝපාධියෙන් ලද භාෂා ශාස්ත්‍රයන්හි දැනුමැතිව සිටි මොහුට ප්‍රායෝගික දැනුම ගැනීමට වෛද්‍යරාජයෙක් වූ තම පියා ගෙදරම සිටියේය. තම පියා සමඟ උදෑසනම වෙදගෙදරට පිවිසෙන පඬිතුමා සිය පියා සමඟ හරි හරියට වෛද්‍ය ශාස්ත්‍රයෙහි වැඩකටයුතුවල නිරත විය. ඉන් අනතුරුව ශිෂ්‍යත්වයක් ලැබ කල්කටාවට ගිය මොහු අවුරුදු හතරක් පමණ සුප්‍රසිද්ධ ජාමිනි භූෂණ පඬිතුමාගේ ආයුර්වේද විද්‍යාලයෙහි වෛද්‍යශාස්ත්‍රය උගත්තේය. එහිදී මෙතුමා වංග භාෂාව ද උගත්තේය. එකල කල්කටාවේ සිට "විවිධප්‍රසංග" යන මාතෘකාව යටතේ හා වෙනත් මාතෘකාවලින් 'දිනමිණ" පත්‍රයට ද ලිපි ලියන ලදි. 1921 වර්ෂයේදී භිෂග්රත්න, එල්. ඒ. එම්. එස් (ගෞරව) උපාධි ගත්තේය. ඒ සමගම කල්කටා ආයුර්වේද භවන්හි "කවිරන්ජන්" යන උපාධිය ද හිමි කර ගත්තේය. ගමේ කළ හැකි ගොවිතැන් ගැන ද ඔහු නොයෙක් ක්‍රම සොයා රටට කියා දුන්නේය. එමෙන්ම පේෂකර්මය සඳහා ද ස්වකීය ජීවිතයෙන් කොටසක් කැප කර තිබුණු අතර වයඹ පළාතෙන් ඔහු ලොකු ඉඩමක් මිලට ගෙන කපු වැවීම පිළිබඳව අත්හදා බැලීමක් කළ අතර එය ද සාර්ථක විය.

කලක් සිය පියා සමඟ නැදුන්ගමුවේ සිය නිවෙසෙහිම වෛද්‍යකර්ම කරමින් සිට පසුව ගම්පහ බැණ්ඩියමුල්ලෙහි සිය ප්‍රථම වෛද්‍යාගාරය විවෘතකොට ස්වප්‍රභූත්වය ඇතිව එහි වෙදකම් කිරීම ආරම්භ කළේය. ඉන්පසු 1929 දී ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය ආරම්භ කරන ලදි. පසුව ගම්පහ

වික්‍රමාරච්චි ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය ඉන් අනතුරුව කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය බවට පත් විය. විශ්වවිද්‍යාලයට වර්ෂයෙන් වර්ෂයට ඇතුළු කරගනු ලබන ශිෂ්‍යයන් පස් අවුරුදු කාලයක් ගෙවා මෙම ආයතනයෙන් උගෙන, පර්යේෂණාත්මක පුහුණුව ද ලැබ වෙදකම් කිරීමේ වරම් ඇතිව පිටව යයි. විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙහි පැවැත්වුණු ප්‍රථම උපාධි ප්‍රදානෝත්සවයේ දී ආයුර්වේද චක්‍රවර්තී නමැති සම්මාන උපාධිය එතුමාට හිමි වූයේ ඔහුගේ පාණ්ඩිත්‍යයටත්, ඔහුගේ ශාස්ත්‍රඥානයටත්, ඔහුගෙන් ආයුර්වේද වෛද්‍ය ශාස්ත්‍රයට සිදු වූ අති විශාල සේවයට උපහාරයක් වශයෙනි. ආයුර්වේදාචාර්ය රාමරක්ෂ පාඨක ශර්මන් පඬිතුමා විසින් වික්‍රමාරච්චි මහතා "පීයූෂපාණී" යනුවෙන් හඳුන්වයි. "පීයූෂ" යනු අමෘතයයි. "පීයූෂපාණි" යනු "අමෘත හස්ත" යනුයි. අමරණීයත්වයක් ගෙන දෙන අතක් ඇත්තා යනුවෙන් එයින් කියැවේ.

ආයුර්වේද වෛද්‍ය ශාස්ත්‍රය සිය ජීවිතය කරගත් එතුමාට වෛද්‍ය වෘත්තියෙහි නියැළීමට වෙලාවක් කලාවක් නොවීය. ආයුර්වේද වෛද්‍ය විද්‍යාව වෙනුවෙන් සිය ජීවිතයම කැප කළ ආයුර්වේද චක්‍රවර්තී පණ්ඩිත ජී. පී. වික්‍රමාරච්චි ශ්‍රීමතාණෝ 1975 මාර්තු මස 28 වන දින සිය ජීවිතයෙන් සමුගත්හ.

**කුසලා සජීවනී**
සහකාර පුස්තකාලයාධිපති
ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
කැලණිය විශ්වවිද්‍යාලය

# කොටුගොඩ ධම්මාවාස නාහිමියන්ට සෙත් පතන
# බෝධි පූජා පින්කමට ජනපතිත් එක් වෙයි

ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ උත්තරීතර මහානායක අග්ගමහා පණ්ඩිත මහෝපාධ්‍යාය අතිපූජ්‍ය කොටුගොඩ ධම්මාවාස නා හිමියන්ට සෙත් පතා ගල්කිස්ස, ධර්මපාලාරාම විහාරස්ථානයේ පෙරේදා (30) පැවැති බෝධි පූජාමය පින්කමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ද එක් විය.

රෝගාතුරව වැඩ වෙසෙන කොටුගොඩ ධම්මාවාස නාහිමිපාණන් බැහැදැක සුව දුක් විමසු ජනාධිපතිවරයා උන්වහන්සේට නිදුක්, නිරෝගි සුව ප්‍රාර්ථනා කළේය.

අමරපුර චූලගන්ධි පාර්ශ්වයේ මහානායක පූජ්‍ය ගංතුනේ අස්සජි, අමරපුර ශ්‍රී සම්බුද්ධ ශාසනෝදය මහා නිකායේ මහානායක පූජ්‍ය වස්කඩුවේ මහින්දවංශ, අමරපුර ධර්මරක්ෂිත නිකායේ මහානායක පූජ්‍ය තිරිකුණාමලයේ ආනන්ද, අමරපුර සංඝ සභාවේ ලේඛකාධිකාරී පූජ්‍ය පල්ලේකන්දේ රතනසාර යන හිමිවරු ඇතුළු මහා සංඝරත්නයේ ප්‍රධානත්වයෙන් පින්කම සිදු කෙරිණ.

සිවිල් ආරක්ෂක බළකාය සංවිධාන කළ බෝධි පූජාව විචිත්‍ර ධර්ම කථික ගම්පහ මහානාම ස්වාමීන් වහන්සේ විසින් මෙහෙයවනු ලැබීය.

ධම්මාවාස නාහිමියන්ගේ උපන් ගම වන ගම්පහ, කොටුගොඩ ගම්මානය ආශ්‍රිත රන්නක්කා වැව ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස ගොවි සමිතියේ නියෝජිතයන් කළ ඉල්ලීම නාහිමියෝ ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළහ.

සිවිල් ආරක්ෂක බළකායේ අධ්‍යක්ෂ ජනරාල් රියර් අද්මිරාල් ආනන්ද පීරිස් මහතා සහ විහාරස්ථ දායක සභාවේ සාමාජිකයන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.







# ‘බුදුපුත් සුරක්ෂා’ සෞඛ්‍ය ආරක්ෂණ හිමිකම් ප්‍රදානය අගමැති ප්‍රධානත්වයෙන්

**මහින්ද අලුත්ගෙදර**

බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු ආමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක බෞද්ධ ස්වාමීන් වහන්සේලා 15,000ක් ආවරණය වන 'බුදුපුත් සුරක්ෂා' සෞඛ්‍ය ආරක්ෂණ හිමිකම් ප්‍රදානය ආරම්භ කිරීමට ආණ්ඩුව පියවර ගෙන තිබේ.

ඒ අනුව මෙම සෞඛ්‍ය ආරක්ෂණ හිමිකම් ප්‍රදානය කිරීමේ සමාරම්භක උත්සවය අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේ දී ඊයේ (1) පැවැත්විණි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන්, බුද්ධශාසන අරමුදලෙන් සහ පරිත්‍යාගශීලීන්ගේ පරිත්‍යාග මත මෙම හිමිකම් ප්‍රදානය අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙන යෑමට අපේක්ෂා කරන අතර මෙම වැඩසටහනෙහි සමාරම්භය සංකේතවත් කරමින් භික්ෂූන් වහන්සේලා කිහිප නමක් උදෙසා අගමැතිවරයාගේ සුරතින් හිමිකම් ප්‍රදානය කෙරිණි.

ඒ අනුව මෙහිදී නිකපොත චන්ද්‍රජෝති, දඹගහහේනේ ජිනානන්ද, කටුවන සෝමරතන, වැලිකඩමුල්ලේ ජිනරතන සහ ඌරලියේ විමලවංශ හිමිවරුන් “බුදුපුත් සුරක්ෂා” සෞඛ්‍ය ආරක්ෂණ හිමිකම ලැබූහ.

මෙම භික්ෂූන් වහන්සේලාගේ හිමිකම් ප්‍රදානය සඳහා ආචාර්ය බෝදාගම චන්දිම නාහිමි සහ විශේෂඥ වෛද්‍ය සර්ධා හේමප්‍රිය, විශේෂඥ වෛද්‍ය ප්‍රභා සමරකෝන්, ශ්‍රියානන්ද විජේකෝන්, විශේෂඥ වෛද්‍ය විමලසිරි අබේකෝන්, මහාචාර්ය වසන්ති පිංටෝ, විශේෂඥ වෛද්‍ය නිර්මලා ගුණවර්ධන මහත්ම මහත්මීන් ඇතුළු පරිත්‍යාගශීලීන්ගේ දායකත්වය ලැබිණි.

බුදුපුත් සුරක්ෂා සෞඛ්‍ය ආරක්ෂණ වැඩසටහනට බුද්ධශාසන අරමුදලෙන් රුපියල් මිලියන 40 ක මුදලක් ආරම්භයේ දී ප්‍රදානය කිරීමට අගමැති මහින්ද රාජපක්ෂ මහතා උපදෙස් දී තිබෙන අතර ඒ සඳහා රජයෙන් තවත් රුපියල් මිලියන 50ක දායකත්වයක් ලැබේ. මේ දක්වා පරිත්‍යාගශීලීන්ගෙන් රුපියල් ලක්ෂ 73 ක මුදලක් පරිත්‍යාග වශයෙන් ලැබී තිබේ.

ගෝණදූවේ ගුණානන්ද හිමි ඇතුළු මහා සංඝරත්නය, රාජ්‍ය ඇමැති පියල් නිශාන්ත, බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යංශ ලේකම් මහාචාර්ය කපිල ගුණවර්ධන, බුද්ධශාසන අරමුදලේ ලේකම් ඩබ්ලිව්.ටී.එච්. රුචිර විතාන මහත්වරුන් ඇතුළු උසස් නිලධාරීහු රැසක් මෙම අවස්ථාව සඳහා එක්ව සිටියහ.

# ලෝක ළමා දින සැමරුමට එක් වෙමින් ජනපති දිස්ත්‍රික්ක 5ක පාසල්වලට පුස්තකාල පරිත්‍යාග කරයි



දිස්ත්‍රික්ක 5ක පාසල් සඳහා පුස්තකාල පරිත්‍යාග කරමින් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ලෝක ළමා දිනය සැමරීමට එක් වෙයි.

සෑම පාසලකටම පුස්තකාල සහ ක්‍රීඩා පහසුකම් දීමෙන් දරුවාගේ මානසික සහ ශාරීරික නිරෝගීකම රැකගත හැකි බව තමා පසුගිය දිනවල දිවයින පුරා කළ චාරිකාවලදී වඩාත් පැහැදිලි වූ බව ජනාධිපතිවරයා සඳහන් කළේය.

ඉතා දුෂ්කර ප්‍රදේශ රැසක දරුවන්ගේ ඉල්ලීම පරිදි ක්‍රීඩා පිටි රැසක් සංවර්ධනය කෙරෙමින් පවතින අතර දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය කෙරෙන පරිදි තෝරාගත් පාසල් 25ක් සඳහා පුස්තකාල පහසුකම්දීම ආරම්භ කෙරිණ.

'ලෝක ළමා දිනය' සැමරෙන ඔක්තෝබර් 1 වැනිදායින් 'කියවීමේ මාසය' ද ඇරඹෙන අතර අනාගත පරපුර පොත පතට නැඹුරු කරවීම ලෝක ළමා දිනයට සමගාමීව අරඹමින් ඊයේ (1) පෙරවරුවේ පාසල් 5ක දරුවන් ජනාධිපති කාර්යාලයට කැඳවූ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පුස්තකාල පරිත්‍යාග කෙළේය.

පුත්තලම, ලුණුවිල අනුරුද්ධ මධ්‍ය මහා විද්‍යාලය, ගම්පොළ, දොළොස්භාගේ කනිෂ්ඨ විද්‍යාලය, ධර්මපුරම් රජයේ දෙමළ මිශ්‍ර පාසල, කුරුවිට විජය කුමාරතුංග විද්‍යාලය සහ ගාල්ල, පිලාන විද්‍යාර්ථෝදය මහා විද්‍යාලය සඳහා සංකේතාත්මකව පුස්තකාල පරිත්‍යාග කෙරිණ.

ධාවනයෙන් ඉවත් කළ පැරණි බස් රථ අලුත්වැඩියා කර දරුවන්ගේ සිත් ගන්නා පරිදි පුස්තකාල සකස් කර තිබෙන අතර අංග සම්පූර්ණ එක් පුස්තකාලයක් සඳහා වැයකර ඇති මුදල රුපියල් මිලියනයකට ආසන්න වේ.

මොබිටෙල් ආයතනය ඊ-පුස්තකාල පහසුකම් සපයා තිබෙන අතර ඒ ඔස්සේ සිසුන්ට තොරතුරු අධ්‍යයනය කිරීමේ සහ ඊ-ග්‍රන්ථ පරිශීලනය කිරීමේ හැකියාව ලැබේ. ලංකා ගමනාගමන මණ්ඩලය, ශ්‍රී ලංකා ටෙලිකොම් හා මොබිටෙල්, මනුසත් දෙරණ සහ ජාතික පුස්තකාල ප්‍රලේඛන මණ්ඩලය පුස්තකාල ව්‍යාපෘතියට අනුග්‍රහකත්වය සපයයි.

කොළඹ අන්තර්ජාතික පොත් ප්‍රදර්ශනයේ දී ප්‍රකාශකයන් විසින් පරිත්‍යාග කරන ලද ග්‍රන්ථ ද පුස්තකාල වෙත භාර දෙනු ලැබිණ. දරුවන් සමඟ පොත පත පිළිබඳ තොරතුරු සාකච්ඡා කරමින් කතාබහක නිරත වූ ජනාධිපතිවරයා ජනාධිපති කාර්යාලය නැරඹීමට ද ඔවුන්ට ආරාධනා කෙළේය.

# ‘අමාදම් සිසිලස’ ධර්ම දේශනාව අගමැති සහභාගීත්වයෙන් අරලියගහ මැඳුරේදී



202 වැනි 'අමාදම් සිසිලස' ධර්ම දේශනා මාලාව අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ සහභාගීත්වයෙන් අරලියගහ මන්දිරයේ දී ඊයේ (1) පැවැත් විණි.

බුදු දහමේ සිසිලස සකළ ලෝ වැසියන්ට බෙදා දීමේ උදාර අරමුණ පෙරදැරිකර ගෙන අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ සංකල්පයෙන් ආරම්භ කළ මෙම ධර්ම දේශනා මාලාව මෙවර ධර්ම දේශනාව පැවැත් වූයේ බළන්ගොඩ බෙලිහුල්ඔය අරණ්‍ය සේනාසනවාසී ත්‍රිපිටකාචාර්ය කථිකාචාර්ය රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති බළන්ගොඩ රාධ ස්වාමීන් වහන්සේ විසිනි.

මේ වගේ බණ මඩුවක මිනිස්සු එක්කෙනෙක් දෙන්නෙක්වත් දකින්න නැති යුගයක් අපිට තිබුණා. මිනිස්සු පණ බයේ ගෙයින් එළියට බහින්න බැරි, ලෙයින් මහ පොළව තෙත් වූ වෙසක් පෝය, පොසොන් පෝය දවසේ එළියට බහින්න බැරි ඉතිහාසයක් අපිට තිබුණා. 30 වසරක මහා යුද්ධයකින් මේ රටේ සියලු ජාතීන්ගේ සමගිය නැති වෙලා ගියා. ඒ අවාසනාවන්ත යුගය නිමා කරන්න අපේ ජාතියේ පිනට පහළ වූ පින්වත් අගමැති මහින්ද රාජපක්ෂ මැතිතුමාට එදා ජනාධිපතිතුමා හැටියට අභීත තීරණ අරගෙන, වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සමඟ එකතු වෙලා ත්‍රිවිධ හමුදාව හා පොලීසියේ සහය ඇතිව සටන් කරලා අපේ ජාතියට, අපේ රටට නිදහස ලබා දීම අපි කෘතවේදීත්වයෙන් සිහිපත් කරනවා. අඳුරු ඉතිහාසය මකා දමා ලංකා ධරණිතලය එක් සේසත් කළ පින්වත් අගමැතිතුමාට නිදුක් නිරෝගී සුවය ලැබේවායි බළන්ගොඩ රාධ ස්වාමීන් වහන්සේ පැවසූහ.

අමාදම් සිසිලස ධර්ම දේශනාව ශ්‍රවණය කිරීමට අගමැති මහින්ද රාජපක්ෂ මහතා, ශිරන්ති රාජපක්ෂ මහත්මිය ඇතුළු මැති ඇමැතිවරු, සැදැහැවත්හු රැසක් එක්ව සිටියහ.

# ස්වාභාවික සම්පත් රැක ගැනීමටත් තිරසර කළමනාකරණයටත් ශ්‍රී ලංකා රජය තරයේ කැප වී සිටිනවා

## එක්සත් ජාතීන්ගේ ජෛව විවිධත්වය පිළිබඳ රාජ්‍ය නායක සමුළුවට වීඩියෝ තාක්ෂණය ඔස්සේ එක් වෙමින් ජනපති කියයි



**නුවන් කොඩිකාර**

ස්වාභාවික සම්පත් රැක ගැනීමට සහ තිරසර කළමනාකරණයට ශ්‍රී ලංකා රජය තරයේ කැපවන බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා එක්සත් ජාතීන්ගේ ජෛව විවිධත්වය පිළිබඳ රාජ්‍ය නායක සමුළුවට වීඩියෝ තාක්ෂණය ඔස්සේ එක්වෙමින් පවසයි.

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 75 වැනි සැසිවාරයට සමගාමීව, නිව්යෝර්ක් නුවර එක්සත් ජාතීන්ගේ මූලස්ථානය කේන්ද්‍ර කොටගෙන සංවිධාන කළ ජෛව විවිධත්වය පිළිබඳ රාජ්‍ය නායක සමුළුව වීඩියෝ තාක්ෂණය භාවිතයෙන් ශ්‍රී ලංකා වේලාවෙන් පෙරේදා (30) රාත්‍රී 7.30 ට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ඇමැතීය.

තවදුරටත් ජනාධිපතිවරයා මෙසේද පැවසීය.

යුනෙස්කෝව ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරය හා සිංහරාජ වැසි වනාන්තරය ස්වාභාවික උරුමයන් ලෙස නම් කර තිබෙනවා. තවත් ස්ථාන 6ක් තෙත් භූමි පිළිබඳ 'රැම්සා ප්‍රඥප්තියෙන්' පිළිගෙන තිබෙනවා. අද්විතීය සහ සාරවත් ජෛව විවිධත්වයකට දායක වන මේ ස්වාභාවික සම්පත් ආරක්ෂා කිරීමේ භාරකරු ලෙස වගකීමෙන් ක්‍රියා කරනවා. පාලකයා කිසිවිටෙකත් දේශයේ හිමිකරු නොව හුදෙක් තම රටවැසියන් සහ සියලුම ජීවීන් වෙනුවෙන් එහි භාරකරු පමණක්ය යන සංකල්පය මත ශ්‍රී ලංකාවේ පුරාණ පාලන ක්‍රමය ගොඩනැගී තිබුණු බවත් සංවර්ධන න්‍යාය පත්‍රය තුළ තම ආණ්ඩුව අනුගමනය කරනුයේ එම මූලධර්මයයි.

පෘථිවියෙහි සහ එහි සම්පත්වල හුදු භාරකරුවන් වශයෙන් හැකි උපරිමයෙන් තම ආරක්ෂාව යටතේ ඇති දෑ රැක ගනිමින් අනාගත පරපුරට භාරදීමට අධිෂ්ඨාන කර ගතයුතුයි.

'තිරසර සංවර්ධනය සඳහා ජෛව විවිධත්වය පිළිබඳ ඉක්මන් ක්‍රියාමාර්ග' සමුළුවේ තේමාව වූ අතර මහා මණ්ඩල සැසිවාරයේ සභාපති වොල්කන් බොස්කීර් මහතා ප්‍රථම දේශනය සිදු කළා.

ජෛව විවිධත්වය පරිහානියට යෑමෙන් මානව වර්ගයා මුහුණ දෙන විපත් සහ තිරසාර සංවර්ධනය අත්කර ගැනීමට ජෛව විවිධත්වය පිළිබඳ කඩිනම් පියවර ගැනීමේ අවශ්‍යතාව සමුළුව අවධාරණය කළා. 2021 දී පැවැත්වෙන ජෛව විවිධත්වය පිළිබඳ සම්මුතියේ පාර්ශ්වකරුවන්ගේ 15 වැනි සමුළුවේදී සම්මත කර ගැනීමට නියමිත, 2020 පශ්චාත් ගෝලීය ජෛව විවිධත්ව රාමුව වැඩිදියුණු කර ගැනීම සඳහා අදහස් හුවමාරු කර ගැනීමට ලෝක නායකයන්ට අවස්ථාව සලසා තිබෙනවා.

2030 තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයේ හරය විය යුත්තේ ජෛව විවිධත්වය පිළිබඳ සංකල්පය බව පෙන්වාදුන් ජනාධිපතිවරයා මෑත දශක කිහිපය තුළ ගෝලීය ජෛව විවිධත්වයේ ඇති වූ සීඝ්‍ර පරිහානිය මධ්‍යයේ වුවද ජෛව විවිධත්වය පිළිබඳ සම්මුතියේ විස්තීර්ණ ජීව ගුණය රැක ගැනීමට ශ්‍රී ලංකාව දැඩිව කැප වෙනවා.

සොබා දහම, මිනිසුන් අතර සබඳතාවය සහ සමකාලීන ගෝලීය පාරිසරික පාලනය අතර පරිවර්තනීය වෙනසක් සිදු කිරීම තීරණාත්මක අවශ්‍යතාවක්.

පොදු රාජ්‍ය මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ශ්‍රී ලංකාව පොදු රාජ්‍ය මණ්ඩලීය ‘නිල් ප්‍රඥප්තිය’ 2018 දී පිළි ගත්තා. ඒ අනුව කඩොලාන පරිසර පද්ධති සහ ජීවනෝපාය පිළිබඳ පොදු රාජ්‍ය මණ්ඩලීය ‘නිල් ප්‍රඥප්තියේ’ ක්‍රියාකාරී කණ්ඩායමට නායකත්වය සැපයේ. තිරසර නයිට්‍රජන් කළමනාකරණය පිළිබඳ කොළඹ ප්‍රකාශනය පසුගිය වසරේදි සම්මත වුණා.

ලෝක නායකයන් වශයෙන් මානව වර්ගයාගේ තිරසාර පැවැත්ම තහවුරු කරමින් වඩා ප්‍රශස්ත අයුරින් නයිට්‍රජන් කළමනාකරණය කළ යුතු වෙනවා.

ශ්‍රී ලංකාවේ පුරාණ පාලන ක්‍රමය ගොඩනැගී තිබුණේ, පාලකයා කිසි විටෙකත් දේශයේ හිමිකරු නොව හුදෙක් තම රටවැසියන් සහ සියලුම ජීවීන් වෙනුවෙන් එහි භාරකරු පමණක්ය යන සංකල්පය මතයි. මේ පෘථිවියෙහි සහ එහි සම්පත්වල හුද භාරකරුවන් වශයෙන් අපට හැකි උපරිමයෙන් අපගේ ආරක්ෂාව යටතේ ඇති දෑ රැකගනිමින් අනාගත පරපුරට භාර කිරීමට අප අධිෂ්ඨාන කරගත යුතුයි.

ජෛව විවිධත්වය පිළිබඳ රාජ්‍ය නායක සමුළුවේදී ශ්‍රී ලංකාවේ ජනතාව නියෝජනය කිරීමට ලැබීම මට මහත් ගෞරවයක්. 2030 තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයේ හරය විය යුත්තේ ජෛව විවිධත්වය පිළිබඳ සංකල්පයයි. මෑත දශක කිහිපය තුළ ගෝලීය ජෛව විවිධත්වයේ ඇති වූ ශීඝ්‍ර පරිහානිය මධ්‍යයේ වුව ද ජෛව විවිධත්වය පිළිබඳ සම්මුතියේ විස්තීරණ ජීව ගුණය රැක ගැනීමට ශ්‍රී ලංකාව දැඩිව කැප වී සිටිනවා. සොබාදහම සහ මිනිසුන් අතර සම්බන්ධතාව සහ සමකාලීන ගෝලීය පාරිසරික පාලනය අතර පරිවර්තනීය වෙනසක් කිරීමෙහි තීරණාත්මක අවශ්‍යතාවක් පවතිනවා.

පොදු රාජ්‍ය මණ්ඩලයේ සාමාජිකයෙක් වශයෙන් ශ්‍රී ලංකාව පොදු රාජ්‍ය මණ්ඩලීය 'නිල් ප්‍රඥප්තිය' (Blue Charter) 2018 දී පිළිගත් අතර ඒ අනුව කඩොලාන පරිසර පද්ධති සහ ජීවනෝපාය පිළිබඳ පොදු රාජ්‍ය මණ්ඩලීය 'නිල් ප්‍රඥප්තියේ' ක්‍රියාකාරී කණ්ඩායමට නායකත්වය සපයනවා.

තවද, තිරසර නයිට්‍රජන් කළමනාකරණය පිළිබඳ කොළඹ ප්‍රකාශනය පසුගිය වසරේදී සම්මත වුණා. ලෝක නායකයන් වශයෙන්, මානව වර්ගයාගේ ස්ථිරසාරත්වය තහවුරු කරමින් වඩා ප්‍රශස්ත ආකාරයෙන් අප නයිට්‍රජන් කළමනාකරණය කළ යුතු වන්නෙමු.

ශ්‍රී ලංකාව යුනෙස්කෝ ස්වාභාවික උරුමයන් දෙක මධ්‍යම කඳුකරයට හා සිංහරාජ වැසි වනාන්තර රක්ෂිතයට නිජ භූමිය වෙයි. අපේ තවත් ස්ථාන හයක් තෙත් භූමි පිළිබඳ රැම්සා ප්‍රඥාප්තියෙන් පිළිගැනීමට ලක්ව තිබෙනවා.

නගර සහ නාගරික ප්‍රදේශ ප්‍රතිනිර්මාණය කිරීමේදී පවා හැකි උපරිම ආකාරයට පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීම කෙරෙහි අපි සැලකිලිමත් වී සිටිනවා. නගර මධ්‍යයේ කුඩා වැසි වනාන්තර අත්දැකීමක් ජනිත කරමින් නගරවල විශේෂයෙන් අපගේ අග නගරය වන ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ හා ඒ අවට අප විසින් නිර්මාණය කර ඇති තෙත් බිම් උද්‍යාන විවිධ පැළෑටි හා සත්ව විශේෂ රාශියක නිජ භූමිය ක් ද වෙනවා.

අපේ අද්විතීය සහ සාරවත් ජෛව විවිධත්වයට දායක වන මේ ස්වභාවික සම්පත් ආරක්ෂා කර ගැනීමට හා තිරසර ලෙස කළමනාකරණයට ශ්‍රී ලංකාව තරයේ කැප වී සිටිනවා.

ආණ්ඩුව නිල වශයෙන් විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම නිමිති කොට ගනිමින් එම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ අධිකරණ අමාත්‍ය, ජනාධිපති නීතිඥ අලි සබ්රි මහතා සමග ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ 'සුභාරතී සංවාද මණ්ඩපය' වෙනුවෙන් ඉන්දික ජයරත්න කළ සංවාදය ඇසුරෙනි.



# 20 ගේන්නේ 19යේ විකෘතිය ඉවත් කරන්නයි

## අධිකරණ අමාත්‍ය, ජනාධිපති නීතිඥ අලි සබ්රි



**19යෙන් කැබිනට් මණ්ඩලය තිහකටත් කැබිනට් නොවන ඇමතිවරුන් 40කටත් සීමා කළා. තවත් තැනක සඳහන් වී තිබෙනවා පක්ෂ හෝ සන්ධාන දෙකක් එකතු වී ආණ්ඩුවක් පිහිටුවනවා නම් යෝජනා සම්මතයෙන් තව ඇමැති තනතුරු දිය හැකි බව. මෙය සම්පූර්ණයෙන්ම ජනතාව රැවටීමක්.**

**■ අමාත්‍යතුමනි, විසි වන ආණ්ඩුකම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒමේ අවශ්‍යතාව කුමක්ද?**

අප ජනාධිපතිවරණයට යන විට සහ මහ මැතිවරණය අවස්ථාවේදී දිගින් දිගටම ජනතාවට දුන් ප්‍රතිඥාවක් තමයි දහනව වන ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරන බව. ජනාධිපතිතුමාට තිබෙන ධූර කාලය වසර 5 යි. මේ වන විට එයින් වසරක් ගෙවී අවසන්. ජනතාවට අප පොරොන්දු වුණේ වැඩ කරන විරුවෙක් ඔවුන්ට ලබාදෙන බව. ඒ නිසා ජනාධිපතිතුමාට වැඩ කරන්න සිදු වනවා.

මෙහිදී එකිනෙක කරුණු පිළිබඳව විමසා බලමින් සාකච්ඡා කරමින් පසුවන විට තවත් වසරක් ඉදිරියට යයි. එවිට ජනාධිපති තුමාගේ ධූර කාලයෙන් වසර දෙකක් අවසාන වනවා. එනිසා එතුමාට වැඩ කිරීම සඳහා වහාම අවස්ථාව ලබාදීමටත්, 19න් සිදුවූ විකෘතිය ඉවත් කර දමා 19 ට පෙර තිබූ තත්ත්වයට නැවත රැගෙන යන්නටත් තමයි 20 සම්මත කරන්නට සූදානම් වන්නේ. නමුත් මෙය තාවකාලික පිළියමක් පමණයි. 20හි සැබෑ අවශ්‍යතාව දහනවයෙන් සිදු වූ විකෘතියෙන් රට මුදා ගැනීමයි.

**■ පාර්ලිමේන්තුවේ දී කතාබහට ලක් වූ ආකාරයට යළිත් මේ රට ඒකාධිපතිත්වය කරා ගෙන යන ගමනට ද ඔබ මේ සූදානම් වන්නේ?**

එය සම්පූර්ණයෙන්ම වැරදි අර්ථ දැක්වීමක්. අපි දැක්කා ඒ පිළිබඳව අදහස් දැක්වූ වත්මන් විපක්ෂ නායක තුමාගේ පියා වසර හතරක් මෙම රට පාලනය කළ ආකාරයයි.

ව්‍යවස්ථා සංශෝධනය දෙස ආපසු හැරී බලන විට පෙනී යන්නේ 78දී ව්‍යවස්ථා සංශෝධනය ගෙන ආවේ සමගි ජනබලවේගයේ මව් පක්ෂය වන එක්සත් ජාතික පක්ෂයයි. ආර්. ප්‍රේමදාස මහතා ඇතුළු පිරිස තමයි එහි සැබෑ අයිතිකරුවන්. ලංකාවේ බලගතුම ව්‍යවස්ථාව වන්නේ එයයි. විධායක ජනාධිපති ක්‍රමය ආරම්භ වෙන්නේ එතනදී. විධායක ජනාධිපති ක්‍රමය තුළ විවිධ අය විවිධ ප්‍රමාණවලින් ක්‍රියාත්මක වුණා. ජේ.ආර්. ජයවර්ධන මහතාට එතුමාට ආවේණික ලක්ෂණ තිබුණා. ප්‍රේමදාස මහතාටත් එසේමයි. ඔවුන් විවිධ විවේචනවලට ලක් වුණා. කිසිම දවසක ජනාධිපති වරයෙක් ලෙස ජයග්‍රහණය කරන්න බැරි රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපති බලතල ඔහු වෙත ගන්නට තමයි 17 ව්‍යවස්ථා සංශෝධනය රැගෙන ආවේ. 17 සංශෝධනය රැගෙන ආ විට එහි ඇති ගැටලු සහගත තැන් මහින්ද රාජපක්ෂ මහතා පසුකාලීනව හඳාගත්තා. දාහත සංශෝධනයත් සමගම වැඩ කරන්නට ඇති අපහසුව නිසා ඔහු 18වන සංශෝධනය රැගෙන ආවා. දාහතේ තිබුණ ගැටලුව ජනාධිපතිවරයාට සහ පාර්ලිමේන්තුවට ඉහළින් ඡන්දයෙන් තේරීපත් නොවූ කිහිපදෙනෙක් තීන්දු තීරණ ගන්නා බවයි. ඔවුන් වග කියන කෙනෙක් සිටියේ නැහැ. නමුත් ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට සහ ජනතාවට වගකිව යුතුයි. යළිත් ගැටළු සහගත තත්වයක් උදා වීම නිසා ඔහු නැවතත් 19 ව්‍යවස්ථා සංශෝධන රැගෙන ආවා. එය නැවත නිවැරදි කිරීම සඳහායි 20 රැගෙන එන්නේ. 19ට පෙර ලංකාවේ විගණනය තිබුණේ නැතිද? ප්‍රසම්පාදනය තිබුණේ නැතිද? ස්වාධීන මැතිවරණ කොමිසමක් තිබුණෙ නැද්ද? 2015දිත් ඡන්දය කිසිම ගැටුමකින් තොරව ඉවර වී ජයග්‍රහණය කලේ කවුද? එතකොට ස්වාධීන නිදහස් මැතිවරණයකින් තොරව එවැනි ප්‍රතිඵලයක් ලැබෙන්න පුළුවන් ද?

ව්‍යවස්ථාවට අනුව 69 ලක්ෂයක් ජනතාව ජනාධිපතිතුමාට එම බලය ලබාදී තිබෙනවා. ඔවුන් ජනාධිපතිතුමා තෝරා පත්කරගෙන තිබෙනවා. ඒ බලය වෙනත් කෙනකුට ලබා දෙන්න පුළුවන්ද? එවන් බලයක් ලබා ගත් ජනාධිපතිතුමා වෙනත් අය පවසන පුද්ගලයන් ඔවුන් කියන තනතුරුවලට පත් කළ යුතුයි කියා පැවසීම සාධාරණ ද? එසේ සිදු කරන පත්කිරීම්වලට එතුමාට වග කියන්න පුළුවන් ද? මේවා බරපතළ ගැටලු.

**■ දහනව වැනි ව්‍යවස්ථා සංශෝධනයේ යම් යම් සාධනීය ලක්ෂණ පවතිනවා. කුමන ආකාරයක විවේචන පැවතුණත් එම කාරණා බැහැර කරන්න බැහැ. 19 ව්‍යවස්ථා සංශෝධනයෙහි පවතින සාධනීය ලක්ෂණ පිළිබඳ අධිකරණ අමාත්‍යවරයා ලෙස රජයේ ස්ථාවරය පිළිබඳ පවසන්න ඇත්තේ කුමක් ද ?**

ඇත්ත වශයෙන්ම සාධනීය දේවල් රාශියක් තිබෙනවා. ඒ සාධනීය දේවල් ආරක්ෂා කර ගැනීමට අප කොහොමත් බලාපොරොත්තු වෙනවා. නමුත් 20 ගෙන ඒම තුළ විපක්ෂය ඇතුළු පිරිසක් පවසන තරම් විකෘතියක් වන්නේ නෑ. 20 සම්මත කිරීම තුළ විගණන කොමිසම ඉවත් කරනවා කියා ඔවුන් පවසනවා. එයින් අදහස් වන්නේ නෑ විගණනය කිරීම නවත්වනවා කියන එක. විගණකාධිපතිවරයාට බලය ලැබෙනවා සේම දෙපාර්තමේන්තුව පවතිනවා. වසර 200කට පෙර සිටම ලංකාවේ විගණනය සිදු වුණා. 19යෙහි යම් යම් ගැටලු තිබෙනවා. ඒ නිසා

**19 ගෙනෙන්නට මූලික වූ සිව් දෙනෙක් සිටිනවා. ජනතාව විසින් ප්‍රතික්ෂේප කර ගෙදර යැවූ රනිල් වික්‍රමසිංහ එයින් පළමුවැන්නා. දෙවැන්නා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා. ජයම්පති වික්‍රමරත්න මහතා තුන්වැනි පුද්ගලයා. සිව්වන පුද්ගලයා සුමන්තිරම් මැතිතුමා.**



මෙය ඉවත් කළ යුතුයි. 19 ගෙනෙන්නට මූලික වූ සිව් දෙනෙක් සිටිනවා. ජනතාව විසින් ප්‍රතික්ෂේප කර ගෙදර යැවූ රනිල් වික්‍රමසිංහ එයින් පළමුවැන්නා. දෙවැන්නා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා. මෙය මහා ව්‍යසනයක් බවත් එක බස් එකට රියැදුරන් දෙදෙනකු සිටිය නොහැකි බවත් එතුමාම පවසනවා. ජයම්පති වික්‍රමරත්න මහතා තුන්වෙනි පුද්ගලයා. එතුමාගේ වචනවලින් පවසන්නේ මේක මෙච්චර නරක් වෙයි කියලා මම හිතුවේ නැහැ කියලා. එතුමා රටෙනුත් පිට වී යන්නට ගියා. සිව්වන පුද්ගලයා සුමන්තිරම් මැතිතුමා. එතුමාත් මේක තාවකාලික ප්‍රතිකර්මයක් පමණක් බව පවසනවා. මෙය අලුත් වී නිවැරදි විය යුතුයි කියා එතුමා පවසනවා. මේ සියලු දෙනා පිළි අරගෙන තිබෙනවා නම් 19 අසාර්ථක බව. මේ සියල්ලටම අනුව විසි වන ව්‍යවස්ථා සංශෝධනය නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතුයි කියා මම අදහස් කරනවා. පසුගිය කාලයේ ගැටලු රාශියක් අප දැක්කා ඒ සියල්ල නිවැරදි කරන්නට අවශ්‍යයි.

**■ මෙතෙක් කල් සිදු වූ සෑම සංශෝධනයක්ම නංගි පෙන්වා අක්කා දීමක්. මෙතැන දී එසේ නොවන බවට ඔබතුමාට දෙන්න පුළුවන් සහතිකය කුමක්ද?**

නව ව්‍යවස්ථාවක් ගෙන ඒමට නෛතික රාමුවක් තිබෙනවා. 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාවෙන් 42 වගන්තිය තිබෙනවා රජයේ ප්‍රති-

**78දී ව්‍යවස්ථා සංශෝධනය ගෙන ආවේ සමඟි ජනබලවේගයේ මව් පක්ෂය වන එක්සත් ජාතික පක්ෂයයි.**



පත්ති තීරණය කළ යුත්තේ කැබිනට් මණ්ඩලය විසින් බව. එතැනදී වෙනත් කිසිවකුට තනි තීරණ ගැනීමට අවස්ථාවක් නැහැ. ජනාධිපතිවරණය පවත්වා දැනටමත් වසරක් ගෙවී අවසන් වීමට ආසන්න නිසා ජනතාව වෙනුවෙන් ජනතා යහපත උදෙසා තීන්දු තීරණ ගැනීමට ජනාධිපතිතුමා බලගැන්වීමටයි මෙය සිදුකරන්නේ. ජනාධිපතිතුමා බලගැන්වීම තුළ එතුමාට වාසියක් ලබා ගැනීම නෙවෙයි මෙහි අරමුණ. එතුමා දැනටත් ලැබිය යුතු වරප්‍රසාද පවා අතහැර ජීවත් වන කෙනෙක්. නමුත් යම් යම් තීන්දු තීරණ ගැනීම සඳහා එතුමාට බලය අවශ්‍යයි. ජනතාවගේ අපේක්ෂාව රටක් වශයෙන් ආර්ථිකව ශක්තිමත්වීම, මත්ද්‍රව්‍ය සහ අපරාධ තුරන් කිරීම, ජාතික ආරක්ෂාව තහවුරු වීම

යන කරුණු. මේ සඳහා ආයතන සහ ගොඩනැගිලි පමණක් තිබී සෑහෙන්නේ නැහැ. ජනාධිපතිතුමාට අවශ්‍ය කරන බලය තිබිය යුතුයි. මුලින් සඳහන් කළාක් මෙන් මේ නැවතත් 19 ට පෙර තිබූ ස්ථානයටයි අප ගමන් කරන්නේ. 19 රාජපක්ෂවරු අඩපණ කිරීමට සැකසූ ව්‍යවස්ථාවක් මිස රට වෙනුවෙන් කළ එකක් නොවෙයි.

ද්විත්ව පුරවැසිභාවය පිළිබඳ කතාබහක් ගොඩ නැගී තිබෙනවා. මෙය ගැටලු සහගත තත්ත්වයක් බවයි පැවසෙන්නෙ.

**■ මහ බැංකුවට සම්බන්ධ මෙරට දැවැන්තම මූල්‍ය වංචාවට වගකිව යුතු පුද්ගලයා මෙරට පුරවැසියෙක් නොවෙයි. මෙවැනි කාරණා පිළිබඳව නව ව්‍යවස්ථාවෙන් සලකා බලනවා ද?**

සුදුසු පුද්ගලයන් තෝරා පත් කිරීම අනිවාර්යයෙන් කළ යුතුයි. දෙදහස් දෙක, තුන වසරවල සිදු වූ දැවැන්ත වැට් බදු වංචාවට අදාළ පුද්ගලයාට වසර සියයකට අධික කාලයක සිර දඬුවමක් නියම වී තිබෙනවා. ඔහු මුළුමනින්ම ශ්‍රී ලාංකික පුරවැසියෙක්. නමුත් දඬුවම ලබාදීමට මේ වන විට ඔහු සොයා ගැනීමට වත් නැහැ. එසේ බලන විට ද්විත්ව පුරවැසි සහ ඒක පුරවැසි භාවය පිළිබඳව සලකා බැලීම ඇතැම්විට හාස්‍යජනකයි.

මේ ගැටලුව ඇවිත් තිබෙන්නේ බැසිල් රාජපක්ෂ මහතා සම්බන්ධයෙන්. ඔහු ශ්‍රී ලංකාවට විශාල වැඩ කොටසක් කළ, දැවැන්ත පක්ෂයක් ගොඩ නැගූ පුද්ගලයෙක්. නීතිඥවරයකු ලෙස මට පවසන්න තිබෙන්නේ ද්විත්ව පුරවැසියකුට අනිත් සාමාන්‍ය පුරවැසියකු ට ඇති අයිතිවාසිකම් තිබෙන බවයි.

**■ වෙනත් පක්ෂවල ද්විත්ව පුරවැසි බව ඇති අය පාර්ලිමේන්තුවේ සිටියාද?**

මේ කාරණය පිළිබඳව මම පෞද්ගලිකව දන්නේ නැහැ. නමුත් දැනටත් පාර්ලිමේන්තුවේ එවැනි පුද්ගලයින් සිටින බවත්, මෙයට පෙර පෙර සිටි බවත් බොහෝ දෙනා පවසනවා.

**■ පාර්ලිමේන්තුවේ උසස් නිලතලවලට පුද්ගලයින් පත්වීම පිළිබඳ සොයා බැලීම සඳහා පාර්ලිමේන්තුවේ කමිටුවක් තිබෙනවා. පසුගිය කාලයේ වංචාවලට සම්බන්ධ වූ පුද්ගලයින් පිළිබඳව ඔවුන් සොයා බලා නැද්ද?**

එවකට සිටි අගමැතිවරයා ඔහුට අවශ්‍ය දේවල් කළා. එයට අනිත් පුද්ගලයොත් වගකිව යුතුයි. නමුත් දැන් පිරිසක් පව් සෝදා ගැනීමට හොඳ දේවල් පමණක් තමන් කළ බවත් ඉතිරි සියල්ල රනිල් වික්‍රමසිංහ පමණක් සිදුකළ බවත් පවසනවා ඇසෙනවා.

**■ විසිවන සංශෝධනය සමග විවේචනයට ලක්වන ඊළඟ කාරණය අමාත්‍යවරුන් පත් කිරීමේ සීමාව. මෙයින් තමාගේ අභිමතය පරිදි අමාත්‍යවරු පත් කරන්නට ජනාධිපතිතුමාට අවස්ථාවක් හිමිවෙනවාද?**

නාම මාත්‍රිකව 19යෙන් කැබිනට් මණ්ඩලය තිහකටත් කැබිනට් නොවන ඇමතිවරුන් 40කටත් සීමා කළා. නමුත් තවත් තැනක සඳහන් වී තිබෙනවා පක්ෂ හෝ සන්ධාන දෙකක් එකතු වී ආණ්ඩුවක් පිහිටුවනවා නම් යෝජනා සම්මතයෙන් තව ඇමති තනතුරු දිය හැකි බව. එසේ බලන විට මෙය සම්පූර්ණයෙන්ම ජනතාව රැවටීමට ලක් කිරීමක්. අපට දැනට ඇමති තනතුරු තිහක් ලබාදිය හැකි වුවත් විසි හයයි සිටින්නේ. මේ සීමාව වගේම තවත් එකක් තමයි ආරක්ෂාව සහ සේනාධිනායක ධුරය ජනාධිපති තුමා සතු විය යුතුයි යනුවෙන් සඳහන් කර තවත් තැනක ජනාධිපතිතුමාට අමාත්‍යධූර දරන්න බෑ කියා තබා තිබෙන සටහන. එයත් මෙහි තවත් එක් විකෘතියක්.

**■ ජනමත විචාරණයකට නොගොස් තුනෙන් දෙකකින් මෙය සම්මත කරගත හැකිද?**

නීතිපතිතුමා තුනෙන් දෙකක් පමණයි අවශ්‍ය යන සහතිකය ලබා දී තිබෙනවා. ඉදිරි තීරණය ඇත්තේ ශ්‍රේෂ්ඨාධිකරණය සතුවයි. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් පවසන දෙයක් සිදු කරන්නට අප බලා සිටිනවා

**■ නව ව්‍යවස්ථාවක් කරා යන ගමනට 20 උත්ප්‍රේරණයක් වන්නේ කොහොමද?**

පළමුවන කාරණය 20 පිළිබඳ මේ වනවිටත් සමාජය තුළ පවතින කතිකාව. එයට එක්විය යුතු සහ නොවිය යුතු දේවල් පිළිබඳව හොඳ සාකච්ඡාවක් මේ වන විටත් ගොඩනැගී තිබෙනවා. රටේ ආර්ථිකය ගොඩ නැගීමට ශක්තිමත් ආණ්ඩුවක අවශ්‍යතාවයක් ජනාධිපතිතුමාට තිබෙනවා. මේ සියල්ල කළමනාකරණය කරගෙන යන ගමනක් ලෙස 20වන අලුත් ව්‍යවස්ථාව හඳුන්වන්නට පුලුවන්. අවසාන වශයෙන් වැදගත් වෙන්නේ අවසාන ඉලක්කවලට යන්නට පුළුවන් ද යන කාරණාව. උදාහරණයක් වශයෙන් ස්වාධීන පොලිස් කොමිසමක් පත් කිරීමේ අදහස උසස් පොලිස් සේවාවක් ලබාදීමයි. උසස් පොලිස් සේවාවකින් සිදුවන්නේ අපරාධ අඩුවීමක්. නමුත් 19 සංශෝධනයෙන් පසු අපරාධ අඩු වී තිබෙනවාද? රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත පසුගිය වසර කිහිපයේ පැමිණ පරීක්ෂණ නියැදිවල දිගින් දිගටම වර්ධනයක් දක්නට ලැබෙනවා. ඒ අනුව බලන විට මෙම ක්‍රියාවලියේ වරදක් තිබෙනවා. අපි දුටුවා වසර හතරහමාරක් මෙරට පාර්ලිමේන්තුව විසුරුවා හරින්නට බැරි ව ඇති වූ අර්බුදය. ජනාධිපතිතුමාට තබා පාර්ලිමේන්තුවටවත් ඒ පිළිබඳව කළ හැකි දෙයක් තිබුණේ නැහැ. එය ලෝකයේ කිසි තැනක සිදු නොවූ ආකාරයේ විකෘතියක්. දේශපාලනයේ සදාකාලික මිතුරන් හෝ සතුරන් නැහැ. මේ සියල්ල වෙනස් වනවා. ආණ්ඩුවට තවදුරටත් ඉදිරියට යන්න බැරිතරම් බිඳ වැටීමක දී නැවත ජනමතය වෙත යොමු වෙන්නට අවස්ථාව තිබිය යුතුයි. පසුගිය ආණ්ඩුව තුළ විශාල ගැටුම් තිබුණා. හිටපු ජනාධිපතිතුමා විවිධ ක්‍රියාමාර්ග ගත්තා. නමුත් 19හි පැවති විකෘතිය නිසා දික්කසාද වන්නට අවස්ථාව නොදුන් දෙදෙනකු අකමැත්තෙන් එකට ජීවත් වනවා මෙන් සිටින්නට සිදු වුණා. පාස්කු ප්‍රහාරයේ සාක්ෂිවලින් එහි අවසන් ප්‍රතිඵලය ඇති භයානක බව පෙනෙනවා.



සටහන -
**දිල්රූ ජයසේකර**



# සිරි දළදා යල් අස්වනු පූජාව - 2020

## මහා වාරිමාර්ග ව්‍යාපාරවල ගොවිඳුන්ගේ අගසස් පූජා මංගල්‍යය

## වාරිමාර්ග කළමනාකරණ අංශය හා ජාතික ඒකාබද්ධ ගොවි සංවිධානය එක්ව සංවිධානය කරනු ලබන 'සිරි දළදා යල් අස්වනු පූජාව - 2020' ශ්‍රී දළදා මාලිගාව - මහනුවර

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සහ ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආශිර්වාදයෙන් ග්‍රාමීය කුඹුරු අශ්‍රිත වැව් ජලාශ හා වාරිමාර්ග සංවර්ධන ගරු රාජ්‍ය අමාත්‍ය නීතිඥ අනුරාධ ජයරත්න මැතිතුමාගේ සංවිධානයෙන් ගරු වාරිමාර්ග කැබිනට් අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ මැති ඇමැතිවරුන්ගේ සහභාගීත්වයෙන් 2020-10-02 සහ 03 දින වලදී ශ්‍රී දළදා මාලිගා පරිශ්‍රයේදී පැවැත්වේ**

### වාරිමාර්ග කැබිනට් අමාත්‍ය සහ අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය



ශ්‍රී ලාංකික ස්වදේශික උරුමය තහවුරු වන ප්‍රධාන සාධකය වන්නේ කෘෂිකර්මාන්තයයි. මානව ශරීරයක ලේ නහර පද්ධතිය මෙන් රට පුරා පැතුරුණු විධිමත් ලෙස ජාලගත වුණු වාරිමාර්ග පද්ධතිය, ඒ ස්වදේශික උරුමයට තිරසර ආරක්ෂාවක් ලබා දී තිබේ. එමෙන්ම වෙනත් කවර රටකටත් වඩා දේශීය කෘෂිකාර්මික වත් පිළිවෙත් බුදු දහමේ ගැඹුරු සිද්ධාන්තයන් හා බැඳී පවතී. වී ගොවිතැන ප්‍රධාන කොටගත් ගොවි ජනතාව සිය අස්වැන්නේ අග්‍රඵලය ශ්‍රී දළදා වහන්සේට පූජා කරන්නේ ගොවිතැන හා බුදු දහම අතර ඇති එකී ශක්තිමත් බැඳීම නිසාය. කුඹුරේ වුව ද ජෛව විවිධත්වයට ගරු කරමින් ස්භාවික පාලන උපක්‍රම යොදා ගනිමින්, පරිසර සිද්ධාන්ත සලකමින් වී ගොවිතැනේ යෙදෙන ගොවියා සිය යල් කන්නයේ අස්වන්නේ අග්‍රභාගය ශ්‍රී දළදා වහන්සෙ වෙත පුද කරමින් ඊළඟ කන්නය සාර්ථක කර ගැනීමට ප්‍රාර්ථනා කරන මෙම සිරි දළදා යල් අස්වනු පූජාව සාර්ථක කර ගැනීමට දායක වූ සියලු පාර්ශවවලට දළදා සමිඳු පිහිට ප්‍රාර්ථනා කරමි.

**චමල් රාජපක්ෂ**

### ග්‍රාමීය කුඹුරු ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමාගේ සුභාශිංසන පණිවිඩය



සිරි දළදා යල් අස්වනු පූජනීය මංගල්‍යය සංකේතවත් කරමින් සුභාශිංසන පණිවිඩයක් නිකුත් කිරිමට ලැබීම මා ලද ඉහළම භාග්‍යයක් කොට සලකමි.
සත්‍ය වශයෙන්ම සලකා බලන විට අප උතුම් මාතෘභූමියේ මුතු මැණික් සම්පත් ඉක්මවා ගිය මහානර්ඝ අග්‍රගණ්‍ය සම්පත ලෙස භෞතික වශයෙන් සලකා බැලූ විට මෙරට වාරි සම්පත හා සරු පස හඳුන්වා දිය හැකිය.
වසර 2500ක ලේඛනගත ඉතිහාසයට උරුමකම් කියන ප්‍රෞඪ ජාතියක් ලෙස නැගුණු හැම අභියෝගයක් හමුවේම පෙරට යැමට අහරින් ස්වයංපෝෂිත ජාතියක් ලෙස අපට හැකි වූ බව හැම දෙනා පිළිගන්නා සත්‍යයකි.
මේ හා සමානව, මහින්දාගමනයෙන් පසු උතුම් වූ බෞද්ධ දර්ශනය මත "වැවයි, දාගැබැයි, ගමයි, පන්සලයි" නම් වූ නොබිඳිය හැකි පදනම මත අප රට ජාතිය, සංස්කෘතිය ගොඩනැගුණු බවද අප සියල්ල දන්නා වූ සත්‍යයකි.
ඒ අනුව බෞද්ධයන්ගේ මුදුන් මල්කඩ වූ ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ උදෙසා යල් අස්වැන්නේ අග්‍රගණ්‍ය කොටස පුද කෙරෙන සිරි දළදා යල් අස්වනු පූජනීය මංගල්‍යය, අපගේ සංස්කෘතිය, සෞභාග්‍යය හා අධ්‍යාත්මික දියුණුව පිළිබිඹු කරන්නා වූ අපරිමිත වටිනාකමක් සහිත වූ හෙළයේ උතුම් පූජනීය උත්සවයක් සේ මම දකිමි.
එහි වටිනාකමට නිසි ගෞරවය දැක්වීමට ඓතිහාසික කන්ද උඩ රටට සැපත් වන ගරු චමල් රාජපක්ෂ අමාත්‍යතුමන්ට මාගේ විශේෂ ගෞරවය පුද කරන අතර මෙම උත්සවයේ සාර්ථකත්වය සඳහා කැපව කටයුතු කළ අමාත්‍යාංශ ලේකම්තුමා, වාරිමාර්ග කළමනාකරණ අංශයේ අධ්‍යක්ෂතුමිය ඇතුළු කාර්ය මණ්ඩලයට සේම ඒකාබද්ධ ගොවි සංවිධානයේ සියළුම මහත්ම මහත්මීන්ට මාගේ ප්‍රණාමය පුද කිරිමටද මෙය අවස්ථාවක් කරගනිමි.
මාගේ රට දළඳා සමිඳුන්ගේ ආශිර්වාදයෙන් සශ්‍රීක සෞභාග්‍යමත් දේශයක් ලෙස මතු මතු වැජඹේවා!

**නීතිඥ අනුරාධ ජයරත්න**

### මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමාගේ පණිවිඩය



ශ්‍රී ලාංකේය කෘෂි ඉතිහාසයේ චිරාත් කාලයක් පටන් පැවැත්වෙන්නා වූ අතිශය වැදගත් උත්සවයකි අලුත්සහල් මංගල්‍යය. ජය ශ්‍රී මහ හාමුදුරුවන් අබියස පැවැත්වෙන්නා වූ මෙම ශතවර්ෂාධික ඉපැරණි චාරිත්‍රය "යල්" අස්වනු නෙළීමෙන් පසුව ගොවි ප්‍රජාව විසින් අලුත් සහල් මංගල්‍යය ලෙස ඉටු කරනු ලබන්නකි . එහෙත් පැරණි හෙළ ගොවියාට මහ කන්නය අවසන් වීමෙන් පසුව එවැනි චාරිත්‍රයක් ඉටුකිරීමට අමතක වූවා සේය. මහකන්නය අවසානයේදීත් එවන් පූජාවක් කිරීමට අදිටන් කරගත් මැද රට ගොවියෝ 2016 වසරේ සිට දළදා හමුදුරුවන් අබියස අලුත් සහල් මංගල්‍ය පැවැත්වීම ආරම්භ කළහ. මෙය ජාතික උත්සවයක් ලෙසින් පැවැත්වීමට ජාතික ඒකාබද්ධ ගොවි සංවිධානය ඔවුන්ගේ මහ ගොවි සමුළුවේදී ඉල්ලා සිටියහ. උභය පාර්ශ්වීය මහනායක හිමිපානන් වහන්සේලාගේ හා රාජ රාජ මහා මාත්‍යාදීන්ගේ අනුබලයෙන් සහ පිටුබලයෙන් වාරිමාර්ග කළමනාකරණ අමාත්‍යාංශය වෙතින්, "සිරි දළදා යල් අස්වනු පූජාව" මෙවරද කල එළි දකී. සර්ව කාලීනව කෘතවේදී ජාතියක් වන අපට මෙය අරුමයක් නොවේ. "සිරි දළදා යල් අස්වනු පූජාව" ශ්‍රී මහ බෝසමිඳුන් අබියස පැවැත්වෙන අලුත් සහල් මංගල්‍යය සේම, අපේ හෙළ උත්සව අතරට එක් වී සර්වකාලීන චාරිත්‍රයක් ලෙසින් තිරසරව සමාජගත වේවායි ඉතසිතින් පතමි.

**නීතිඥ ලලිත් යූ ගමගේ**

### දියවඩන නිලමේතුමාගේ පණිවිඩය



ග්‍රාමීය කුඹුරු ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ, වාරිමාර්ග කළමනාකරණ අංශය මගින් ගොවිතැන ගොවියාගේ ජීවනෝපාය මෙන්ම සංස්කෘතිය බව හා වස විසෙන් තොර කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම අරමුණු කොට, මහා වාරිමාර්ග ව්‍යාපාරවල ගොවීන් හා වාරි කෘෂි කර්මාන්තයට සම්බන්ධ සියලු රාජ්‍ය ආයතන එක්ව වගාකර ලබාගත් යල් අස්වැන්නේ අග්‍ර ඵලය ශ්‍රී දළදා වහන්සේට පූජා කිරීමේ සිරි දළදා පූජාව මෙවරත් පැවැත්වීමට කටයුතු සංවිධානය කිරීම අගය කොට සලකමි.

**ප්‍රදීප් නිලංග දෑල බණ්ඩාර**

### ග්‍රාමීය කුඹුරු ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය



වාරිමාර්ග බලප්‍රදේශවල සංවිධිත ගොවි ප්‍රජාවගේ වී ගොවිතැන හා වෙනත් ආහාර භෝග වගාව ආදායම් මාර්ගයක් පමණක් ම නොව ඔවුන්ගේ අභිමානය මෙන්ම සංස්කෘතිය ද වේ. එම අභිමානය සුරකිමින් යල් කන්නයේ අස්වැන්නේ අග්‍ර භාගය දළදා සමිඳුන් උදෙසා පූජා කොට කෘතවේදීත්වය පළ කිරීම සිරි දළදා යල් අස්වනු පූජාවේ අරමුණ වේ. මෙම කටයුත්ත සියලු ගොවිජනතාවගේ එකමුතුවෙන් සිදු කිරීම මගින් ඉපැරණි ගොවි සංස්කෘතියට ගරු කිරීම මෙන්ම අනාගත පරපුරට වාරි සංස්කෘතියේ අගය වටහා දීම ආරක්ෂා කිරීමේ අගය ද සිදු වේ.
මෙම ඓතිහාසික කාර්යය සාර්ථක කිරීම සඳහා කැපවීමෙන් කටයුතු කළ නිලධාරීන් මෙන්ම ගොවි සංවිධාන නියෝජිත මහතුන්ටත් මෙම අවස්ථාවට සහභාගී වන ගරු අමාත්‍ය තුමන්ලා ඇතුළු සියලු බැතිමතුන්ටත් අපගේ කෘතඥතාව පිරිනමන අතර, මෙම කාර්යය සංවිධානය කිරීමට අවස්ථාව සලසා දෙන දියවඩන නිලමේ තුමා ඇතුළු දළදා මාලිගාවේ සියලු කාර්යය මණ්ඩලයට ද අපගේ ගෞරවනීය ස්තුතිය මෙයින් පුද කරමි.

**ඩී.ඩී. ආරියරත්න**

### ජාතික ඒකාබද්ධ ගොවි සංවිධානයේ සභාපතිතුමාගේ පණිවිඩය



රජ රටට දියවර සපයන මධ්‍යම කඳුකරයේ වැඩ සිටින ශ්‍රී දළදා මාලිගාවේ උතුම් දළදා වහන්සේ ඉදිරිපිට අලුත් සහල් සහ අෂ්ට ධාන්‍ය පූජාව ශ්‍රී ලාංකීය ගොවින්ගේ දායකත්වයෙන් ඔක්තෝබර් 03 දින සිදු කෙරෙන බව මා සඳහන් කරන්නේ ඉමහත් භක්තියෙනි.
තව ද දේශීය ආහාර උත්පාදනය වැඩි කිරීම අරමුණු කරගත් මහා වාරිමාර්ග ආශ්‍රිත ගොවි සංවිධාන එකමුතුව හා අනෙකුත් ගොවි සංවිධානවල සහාය ද ඇතුව සිදු කරන මෙම උතුම් පූජනීය පින්කම පස්වන වරටත් සාර්ථකව සිදු කිරීමට ලැබීම සැබවින්ම රටේ ගොවි ජනතාව ලබාගත් ජයග්‍රහණයකි.
මේ උතුම් පූජාවේ ආනුභාවයෙන් සියලු ගොවින්ගේ කෙත්වතු සරුසාරවත් වී අටු කොටු පිරී ඉතිරේවා යි යන්න මාගේ ප්‍රාර්ථනයයි.
ගොවීන් තමන්ගේ ගොවිතැන් කටයුතු සිදු කර ලබා ගන්නා අස්වැන්නේ අග්‍ර කොටස ශ්‍රී දළදා වහන්සේට පිදීම සඳහා උපකාර කළ සියලු දෙනාට මාගේ හෘදයංගම ස්තුතිය පළ කර සිටිමි.

**ඒ.ජී.වී.ජී.එස්. ගමගේ**

### සංවිධාන දායකත්වය - ජාතික ගොවි සංවිධානය/ දිස්ත්‍රික් ගොවි සංවිධානය/ ව්‍යාපාර ගොවි සංවිධාන සමඟ පහත මහා වාරිමාර්ග ව්‍යාපාරවල ගොවි සංවිධාන

1. දිඹුලාගල ඇළ
2. බතලගොඩ
3. හක්වටුනාඔය
4. අබකොළ වැව
5. අතරගල්ල
6. පාළුකඩවල
7. උස්ගලල/ සියඹලන්ගමුව
8. ඉහිණිමිටිය
9. රදවිබැඳි ඇළ
10. නීලබැම්ම
11. තබ්බෝව
12. රාජාංගණය
13. පදවිය
14. හුරුලුවැව
15. මහකනදරාව
16. නාච්චාදුව
17. මහවිලච්චිය
18. නුවර වැව
19. වාහල්කඩ
20. තිසා වැව
21. හාල්පාතු ඇළ
22. බසවක්කුලම
23. පරාක්‍රම සමුද්‍රය
24. මින්නේරිය
25. කවුඩුලු වැව
26. ගිරිතලේ
27. මිණිපේ
28. මුරපොළ ඇළ
29. දේවහුව
30. බදුලුඔය
31. බත්මැඩිල්ල
32. සොරබොර
33. දම්බරාව
34. මාපාකඩ වැව
35. නාගදීප
36. මුතුකණ්ඩිය
37. වේලිඔය
38. ලුණුගම්වෙහෙර
39. පන්නෙගමුව
40. යෝධකණ්ඩිය
41. තිස්ස වැව
42. වීරවිල
43. දෙබර වැව
44. බදගිරිය
45. රිදියගම
46. මුරුතවෙල
47. ගල්ඔය වම් ඉවුර
48. ගල්ඔය දකුණු ඉවුර අක්කරපත්තුව
49. ගල්ඔය දකුණු ඉවුර දමන
50. කන්තලේ
51. වෙන්ඩ්රායසන්
52. වාත් ඇළ
53. ඇල්ල
54. මොරවැව
55. මහදිවුල් වැව
56. යෝධ වැව

### වැඩසටහන් විස්තරය

**2020 ඔක්තෝබර් මස 02 වන දින**

ප.ව. 4.30 - 6.00 - වැල් බෝධි පරිශ්‍රයේදී පවත්වන බෝධි පූජා පින්කම.
නෙළාගත් අස්වැන්නේ අග්‍රඵලය පූජා කිරීමේ වැදගත්කම පිළිබඳ අනුශාසනාව. ඔසුපැන් හා සමපෝෂ දන්සල
ප.ව. 6.30 - 6.45 - ශ්‍රී දළදා වහන්සේ උදෙසා සිදු කරන ගිලන්පස පූජාව

**ඔක්තෝබර් මස 03 වන දින**

පෙ.ව. 4.30 - 5.00 - ශ්‍රී දළදා වහන්සේ උදෙසා සිදු කරන කිරි ආහාර පූජාව
පෙ.ව. 4.00 - 6.00 - අලුයම කැඳ හා ආහාර දන්සල.
පෙ.ව. 5.00 - 6.30 - සතර මහා දේවාල සඳහා මුරුතැන් පූජා
- විෂ්ණු - වාහල්කඩ ව්‍යාපාරයේ මූලිකත්වයෙන්
- නාථ - හක්වටුනාඔය ව්‍යාපාරයේ මූලිකත්වයෙන්
- කතරගම - කිරිඳිඔය ව්‍යාපාරයේ මූලිකත්වයෙන්
- පත්තිනි - මින්නේරිය ව්‍යාපාරයේ මූලිකත්වයෙන්

පෙ.ව. 6.30 - 7.00 - සහල් පිරවූ පාත්‍ර, අනෙකුත් ධාන්‍ය, රන් කරල්, නෙළුම් මල් රැගත් බැතිමතුන් පේළි පෙරහරින් මාලිගාවේ දෙරටුව අබියසට පිවිසීම.
පෙ.ව. 7.00 - 8.00 - අස්ගිරි පාර්ෂවයේ මහානායක හිමියන් ප්‍රමුඛ මහා සංඝරත්නයේ පිරිත් සජ්ඣායනය මධ්‍යයේ ගරු වාරිමාර්ග අමාත්‍යතුමා, ගරු වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා. දියවඩන නිලමේ තුමා ඇතුළු ආරාධිත අමුත්තන් සහ ගොවීන් විසින් සහල් පාත්‍රය පිරවීම.
පෙ.ව. 9.20 - 10.00 - ශ්‍රී දළදා වහන්සේ උදෙසා සිදුකරන බුද්ධ පූජාව
පෙ.ව. 11.00 - 12.30 - 100 නමක් විෂයහිලා සපිරිකර සංඝගත දක්ෂිණාව, අනුශාසනාව සහ වැව් අමුණු තැනූ රජවරුන්, ප්‍රමුඛ වාරි ව්‍යාපාර සංවර්ධනයට දායක වූ සියලු ඇත්තන් සිහි කර පැන් වඩා පින් පැමිණවීම.
ප.ව. 12.30 - 1.30 - බැතිමතුන් සඳහා දිවා ආහාරය (දන්සල)
- දේව වීදිය කෙළවර ඇති වතුර මල අසල
ප.ව. 2.30 - 3.00 - මීරා මක්කම් පල්ලියට අලුත් සහල් හා අනෙකුත් ධාන්‍ය ප්‍රදානය කිරීම හා මුස්ලිම් ආගමික වතාවත් සිදු කිරීම.
ප.ව. 3.00 - 3.30 - සාන්ත අන්තෝනි දෙව් මැදුරට අලුත් සහල් හා අනෙකුත් ධාන්‍ය ප්‍රදානය කිරීම සහ ක්‍රිස්තියානි ආගමික වතාවත් සිදු කිරීම
ප.ව. 3.30 - 4.00 - පුල්ලෙයාර් කෝවිලේ අලුත් සහල් හා අනෙකුත් ධාන්‍ය පූජාව සහ හින්දු ආගමික වතාවත් ඉටු කිරීම.







**වාරිමාර්ග කළමණාකරණ අංශය**
**වාරිමාර්ග අමාත්‍යංශය**

වර්ෂ 2020 ක්වූ ඔක්තොබර් මස 02 වැනිදා සිකුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

# ජනතා මණ්ඩපය

■ ජනතා මණ්ඩපය, දිනමිණ, ලේක්හවුස්, කොළඹ 10
■ ෆැක්ස් 2429220 ■ ඊ මේල් - janathamadapayaancl@gmail.com

## කොළඹ මහා නගර සභාව කුලියට ගත් නිවෙස



කොළඹ මහ නගර සභාවේ සේවය කරනු ලබන නිලධාරින් හට නිල නිවාස ලබාදීම අනිවාර්යය යැයි කිසිදු නීතියක් අනුමත වී නැත. උපලේඛන ගත නිල නිවාස ද වෙන් කර නැත. නිල නිවාස කිහිපයක් වර්තමානයේ හිස්ව පවතී. එම නිල නිවාසවලින් එකක් වර්තමාන කොමසාරිස්ට ලබා ගැනීමට හැකියාව තිබේ. එසේ තිබියදී නිල නිවසක් කුලියට ගැනීම සඳහා මාසිකව රු. 410,000.00ක වියදමක් නගර සභාවට දැරිය හැකිද යන්න සිතියයුතු කාරණාවකි. මාස හයක කුලියක් අත්තිකාරම් ලෙස මිලියන 2.5කට ආසන්න මුදලක්ගෙවා ඇත. මෙසේ මුදල් වියදම් කිරීමට මුදල් කමිටු දෙකකින් අනුමත කර නැත. මහා සභාවෙන් අනුමත කර නැත. එසේම ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර නැත. මේ හිතුවක්කාරී වියදම් පිළිබඳ සොයා බලා පරීක්ෂණයක් කර වැරදි කර ඇති අයවලුන් වෙනුවෙන් දඬුවම් ලබා දෙන ලෙස ඉල්ලා සිටිමු. නාගරික භාණ්ඩාගාරිකට මෙවැනි ගෙවීමක් කළ හැකිද යන්න සොයා බැලීම වටී. දැනටමත් කුලී නිවසේ නාගරික කොමසාරිස් පදිංචියට පැමිණ ඇත. රාජ්‍ය නිලධාරිනියකට මෙවැනි හිතුවක්කාර තීරණයක් ගෙන රජයේ මුදල් විනාශ කළ හැකිද? මේවාට අනුබල දෙන නගරාධිපතිනිය තවදුරටත් මේ ධුරයේ තබා ගත යුතුද? නගරාධිපතිට විරුද්ධව දැඩි විනය ක්‍රියාමාර්ගයක් නොගෙන සිටින්නේ මන්ද? කොළඹ නගරයේ බදු ගෙවන ජනතාවට සාධාරණයක් ඉටු කර ගැනීම පිණිස කටයුතු කිරීම අදාළ බලධාරින්ගේ වගකීමකි.

**නාගරික මන්ත්‍රීවරු පිරිසක්**

## දරුවන් දේශපාලන වැඩවලට ගන්න එපා

පාසල් දරුවන්ට ඡන්දය හිමි නැත. පාසල් දරුවන් මැතිවරණ ව්‍යාපාරයට සම්බන්ධ කරගැනීම පවා මැතිවරණ නීතියට පටහැනිය. එමෙන්ම මැතිවරණ නීති උල්ලංඝනය කිරීමකි. පාසල් දරුවන්ගේ පාසල් අධ්‍යාපනය සිඳ බිඳ දමමින් ඡන්ද වැඩවලට දරුවන් යොදා ගැනීම බරපතළ වරදකි.

රැස්වීම පිළිබඳව දැන්වීම් මෙන්ම අපේක්ෂකයන්ගේ හා පළාතේ පක්ෂයේ බලවතාගේ රුව සහිත විශාල පෝස්ටර් ඇලවීම සිදු කරයි.

මේ වැඩකටයුතු සඳහා පාක්ෂිකයන්ගේ සහාය ලබා ගනී. සමහර ඡන්ද බලය හිමි නැති තරුණ පාසල් දරුවන්ද, මෙම කටයුතුවලට සහභාගි වන බව පෙනේ. එසේම දැන්වීම් අලවන අතර මත්පැන් සිගරට් හා සංග්‍රහ ලැබෙන්නේ සංවිධායකවරයාගේ උපදෙස් මතය. මැතිවරණ රැස්වීම්වලට මහ පිරිස් ඒකරාශී කරගන්නට සංවිධායකවරු බලවත් පරිශ්‍රමයක් ගනිති. මැතිවරණ කතා වගේ රැස්වීමට පැමිණ සිටින පිරිසද අපේක්ෂකයාට වැදගත්ය.

දරුවන්ගේ පාසල් වැඩ නතර කර මෙසේ දේශපාගනයට සහභාගි කරවීම ඉතා වැරදිය. මව්පියන් තරුණ දරුවන් ගැන මීට වඩා විමසිලිමත් විය යුතුය. පසුගියදාක කොහුවල මංසන්ධිය අසල දී ත්‍රිරෝද රථයක් හා යතුරු පැදියක් ගැටී මධ්‍යම රාත්‍රියේදී සිදු වූ අනතුරින් යතුරු පැදියේ ගමන් කළ තරුණ පාසල් දරුවන් දෙදෙනා මියගොස් සිට ඇත. පරීක්ෂණවලදී හෙළි වී ඇත්තේ නුගේගොඩ පැවැත් වූ දේශපාලන ඡන්ද රැස්වීමකට ගොස් එන අතරතුරදී අනතුර සිදුව ඇති බවය. එම දරුවන් දෙදෙනාට ඡන්ද බලය නැත. පාසල් දරුවන්ට ඡන්ද රැස්වීමක බලන්න - අසන්න දෙයක් නැත. දේශපාලනය කිරීමට වයසක් ඇත. දරුවන් දේශපාලනයට ගාව ගැනීම නොකළ යුත්තකි.



**චන්ද්‍රසිරි ගෝමිස්**
**කළුබෝවිල වස්කඩුව**

## ගෙල සිරකරන කේවියට් තොණ්ඩුව



මේ අවනඩුවේ වඩාත්ම බලපෑමට ලක් වන කණ්ඩායම වන්නේ සහාධිපත්‍ය දේපළ සංවර්ධකයින්ය. මන්දයත් එක් කේවියට් ලියාපදිංචියකින් සමහර විට නිරවුල්ව අයිතිය ලබා දිය හැකි දේපළ 10ක් 15ක් හෝ 100ක් 200ක් හෝ සමහර විට ඊටත් වැඩියෙන් එකතැන සිරගත වන බැවිනි. සහාධිපත්‍ය දේපළක් ඉදිකිරීම පිණිස දේපළ සංවර්ධකයෙකු කටයුතු කරගෙන යද්දී ඔහු බියවද්දා මුදල් ලබා ගැනීමට කටයුතු කිරීම තම වෘත්තිය කරගත් පෙළැන්තියක් මේ වන විට බිහිව තිබේ. එවැන්නෙකුගේ ප්‍රමුඛ අවිය වනුයේ අදාළ ඉඩමට කේවියට් තහනමක් ලියාපදිංචි කිරීමයි.

දේපළ සංවර්ධකයා විසින් නාගරික සංවර්ධන අධිකාරියේ ද පළාත් පාලන ආයතනයේ ද සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ ද තවත් බොහෝ ආයතන ගණනාවක ද අනුමැතීන් සහ නිෂ්කාශනයන් විශාල ප්‍රමාණයක් ලබාගෙන අවසානයේ සහාධිපත්‍ය ප්‍රකාශන ඔප්පුව ලියාපදිංචි කිරීමට ඉදිරිපත් කරන විට, ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අදාළ පත්‍රිරු අරා වැජඹෙන "කේවියට් තහනම් බාධාව" හමුවන අවස්ථා සුලබ වෙමින් පවතී.

එහෙත් අස්සන් කරන ලද විකිණීමේ ගිවිසුම් සියල්ල ඵල රහිත කරමින් ලියාපදිංචි කර ඇති මේ කේවියට් තහනම නිසා විකුණුම් කර සියල්ල වහාම එක තැන නතර වේ. බැංකු ණය මඟින් ඉතිරි මුදල් ගෙවා සහාධිපත්‍ය ඒකක මිලදී ගැනීමට කටයුතු කරන බහුතරයකගේ ගමන ද වහා නතර වේ. දේපළ සංවර්ධකයා විසින් බැංකුවලින් ගත් ණය ආපසු ගෙවීමේ කාර්යය ද කරගත නොහැකි තත්ත්වයට දේපළ සංවර්ධකයා පත් වන අතර, ඔහුගේ වරදක් නොවන හේතුවක් නිසාවෙන් අනවශ්‍ය පොලී එකතු වීමකට මුහුණ දෙන්නට දේපළ සංවර්ධකයාට සිදු වේ. ඒ වන විටත් දේපළෙහි මිල පිළිබඳ එකගතාවයකට පැමිණ ඇති බැවින් දේපළෙහි මිල ඉහළ නැංවීම හරහා අදාළ අමතර පිරිවැය ඒකකයන් අතර, බෙදාහැරීමට ද හැකියාවක් නොලැබේ.

මේ තත්ත්වය ඇති වී තිබෙනුයේ ඉතා පහසුවෙන් කේවියට් තහනමක් ලියාපදිංචි කිරීමට ඕනෑම කෙනෙකුට ඉඩ සැලසී තිබීම හේතුවෙනි. ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 26 වන වගන්තියට අනුව ලියාපදිංචිය සඳහා ඉදිරිපත් වන කේවියට් තහනම් නිසි පරීක්ෂා කිරීමකින් පසුව ලියාපදිංචි කළ යුතුව ඇති නමුත් ප්‍රායෝගික දුෂ්කරතා හේතුවෙන් එසේ නොකරන බව රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් නීතිපතිවරයා වෙත යවන ලද 2020-02-19 දිනැති ලිපියෙන් ද පිළිගෙන තිබේ. නමුත් ඒ සම්බන්ධයෙන් ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් දැනුවත් කර ඇති බවක් එම ලිපියේ සඳහන් වුවද මේ වනතුරුත් ප්‍රායෝගිකව එවැනි පරීක්ෂාවක් සිදු වන බවක් නොපෙනේ.

තවද මේ දක්වා ලියාපදිංචි කර ඇති කේවියට් තහනම් නිසා දැනටමත් දේපළ පැවරීම අතරමග නතර වී ඇති දේපළ කිහිපයක් ද වේ. රුපියල් දෙදහස් පන්සියයක් පමණ වියදම් කර සිදු කරන ලද මේ අවහිරය හේතුවෙන් සහාධිපත්‍ය දේපළ සංවර්ධනයකින් මුහුණ දෙන අලාභය ගණනය කළ හැක්කේ මිලියන ගණනිනි. එසේම අදාළ වරද නිවැරදි කිරීම පිණිස ලැබෙන සරල උපදෙස වනුයේ දිසා අධිකරණය හමුවේ නඩුවක් ගොනු කිරීමයි. ඒ තවත් අවසානය නොපෙනෙන ක්‍රියාවලියකි. ඒ සෑම දිනක් පාසාම දේපළ සංවර්ධකයින් ණයකරුවන් බවට පත්වේ. ඔවුනට පොලිය එකතුවීම නොකඩවා සිදු වේ.

ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 35 වන වගන්තිය මඟින් දෝෂ සහගතව ලියාපදිංචි වී ඇති කේවියට් දැන්වීමේ ලියාපදිංචි සටහන අවලංගු කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට බලය ඇති බව රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාම පිළිගෙන ඇති නමුත් මේ වනතුරුත් ඒ බලය භාවිතා කිරීමට රෙජිස්ට්‍රාර්වරුන් කටයුතු කරන බවක් දැනගැනීමට නොමැත. ඒ සම්බන්ධයෙන් නීතිපතිවරයාගෙන් මතය විමසා ඇති අතර, නීතිපති මතය තවමත් ලැබී නොමැත. ගතවන සෑම දිනක් පාසාමත් දේපළ සංවර්ධකයින් විසින් අනවශ්‍ය පොලියක් ගෙවීමත් දේපළ මිලදී ගැනීමට බලාපොරොත්තු වන්නන්ට ඒ සඳහා තවත් කාලයක් බලා සිටීමට සිදුවීමත් නොකඩවාම සිදු වේ.

**නීතිඥ කපිල ගමගේ**
**සහාධිපත්‍ය උපදේශක**
**සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ**
**හිටපු සභාපති**

## ලූනු ගොවියාගේ කඳුළු



අප එදිනෙදා පරිභෝජනය කරන බහුවිධ පරිභෝජන භාණ්ඩ අතර ලූනුවලට හිමිවන්නේ වැදගත් ස්ථානයකි. අපගේ ආහාර රසවත් කර ගැනීමට ලූනු බෙහෙවින් උපකාර වෙයි. ලූනු තරමටම වැදගත් වන ලූනුවල පසුබිම කතාව නම් එතරම් රසවත් නොවේ. අපේ රටේ ලූනු වගා කරන ප්‍රධානම කේන්ද්‍රස්ථානය වන්නේ දඹුල්ල ප්‍රදේශයයි. ප්‍රදේශයටම ආවේණික වූ බෝගයක් වශයෙන් ලූනු ගොවිතැන තම ජීවනෝපාය කරගෙන ජීවත් වන පිරිස අති විශාලය. එහෙත් ඔවුන් හැම විටම මුහුණ දෙන බරපතළම ප්‍රශ්නය වන්නේ අස්වැන්නට සරිලන මිලක් නොලැබීමය. ලූනු වගා කිරීමේදී පවා යන වියදම අති මහත්ය. නොයෙක් දිලීර රෝගාබාධ ඇතුළු ජලය නිසි කලට නොලැබීම යන කරුණු මත ගොවිතැන ඔවුන්ට එපා වී තිබේ.

දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට දිනකට ලැබෙන ලූනු තොග ප්‍රමාණය අති විශාල වන අතර ඇතැම් විට ගොවියාට සාධාරණ මිලක් නොලැබෙන්නේ අතිරික්ත ලූනු ප්‍රමාණය වැඩි නිසාදැයි අපට සැක සිතෙයි. ප්‍රවාහනය ඇතුළු නොයෙකුත් දේශගුණික විපර්යාස නිසා දිනකට අපතේ යන ලූනු ප්‍රමාණයද ඉහළ අගයක් ගනී.

මේ අතරවාරේ රජය මගින් ලූනු පිටරටින් ආනයනය කළහොත් ගොවියාට දෙවියන්ගේම පිහිටය. අනන්ත අප්‍රමාණ වූ දුක්ඛ දෝමනස්සයන් රැසක් මැද දිවි ගෙවනා ලූනු ගොවියාගේ කඳුළු කතාව නිමා වෙන්නේ කවදාද යන්න අපට සිතා ගත නොහැකිය.

**චන්දන වන්නිආරච්චි**
**දෙහිඅත්තකණ්ඩිය.**

## වැලිගම හෙට්ටි වීදියේ තදබදය

වැලිගම නගර සභා බල ප්‍රදේශයේ වැලිගම හෙට්ටි වීදියට යන පාරේ සතියේ දිනවල පෙ.ව. 7.00 සිට ප.ව. 6.00 දක්වා පවතින තදබදය නිසා පා ගමනින් යන එන පාසල් සිසුන්ට මව්පියන්ට සහ පොදු මහජනතාවට සිදු වී ඇති අපහසුතාව ඉමහත්ය.

දැනට සමහර අවස්ථාවලදී රථ දෙකක් මාරුවීමේදී පදිකයන්ට රැඳී සිටීමට හෝ මැත්වීමට බොහෝ ස්ථානවල ඉඩක් ඇත්තේම නැත.

මේ පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරියේ වගකිව යුතු බලධාරින්ගේ අවධානය යොමු වී නොපමාව නිසියාකාර වැඩ පිළිවෙළක් සකස් කිරීමට කටයුතු කරන මෙන් අවධාරණයෙන්ම දන්වා සිටිමි.

**වැලිගම නගරවැසියෙක්**

## තහනම් නොවන නීතිය

මෙරට තුළ "තහනම්" කර ඇති සමහර නීතිරීති පසු විපරමකින් තොර වීම නිසාදෝ දියාරු වන බවත් පෙනෙන්නට ඇත.

"දුම්රිය හා බස්රිය තුළ සිගමන් යැදීම තහනම් කර ඇත. එසේ වුවද දුම්රිය හා බස් රිය තුළ යාචකයෝ කිසිදු තහංචියකින් තොරව සිගමන් යදිති. සමහරු මෙය ඉතා පහසුම රැකියාව බවට පත් කරගෙන ඇති අයුරක් පෙනෙන්නට ඇත.

පාලන මිලට වඩා අලෙවි කිරීම තහනම් කර ඇතත් සමහර පාරිභෝගික භාණ්ඩ ප්‍රසිද්ධියේ මිල ගණන් ප්‍රදර්ශනය කරමින් වෙළෙන්දෝ වැඩි මිලට අලෙවි කරති. සහල්, සීනි, විවිධ මස් වර්ග, පාන් ආදිය මෙයින් සමහරකි.

ඉඳහිට මිල පාලන නිලධාරීන් වැටලීම් කර නීති මඟට ගෙන යාම් වාර්තා වෙතත් මේ නීතිරීති කැඩීම කිසිසේත් අවම වී නැත.

බස් රථවල ගමනාගමනයේ යෙදෙන මඟීන්ට ප්‍රවේශ පත්‍ර නොදීම තහනම් කර ඇත. එහෙත් එම නීතිය හොඳටම බාල්දු වී ඇත. ශ්‍රීලංගම බස් රථවල ප්‍රවේශ පත්‍ර දෙන නමුත් පෞද්ගලික අංශය එය බොහෝ දුරට ගණන් නොගන්නා නීතියක් බවට පත්ව ඇත.

පොදු වාහනවල ගමන් කරන කාන්තා පක්ෂයට හිංසා කිරීම තහනම්ය. වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගත හැකි වරදක් බවද කියති. එහෙත් පොදු වාහනවලදී පිරිමින්ගෙන් හිංසාවට පත්වන කාන්තාවෝ තවමත් වෙති.

මේ "තහනම්" නීති යොදා ඇති උදාහරණ කීපයක් පමණි. මෙම නීතිරීති ප්‍රායෝගික වන්නේ නම් එය යහපත් සමාජයකට මං කැපීමකි. අදාළ රාජ්‍ය අංශවල අවධානය මෙම කරුණු කෙරෙහි යොමු විම යහපත්ය.

**ඩික්සන් කොංගනීගේ**
**රාගම**

## ජපන් පොහොර නිසා ගොවියෝ අතරමං




වසර කීපයක සිට ජපන් පොහොර යැයි හැඳින්වෙන රසායනික පොහොර වර්ගයක් යෙදීම නිසා කුඹුරුවල ගොවිතැන නිසරු තත්ත්වයක පවතී.

ජපානයෙන් අඩු වශයෙන් අවුරුදු 10 කට වරක් කුඹුරුවල උඩ පස් තට්ටුව මෙන්ම ඉන් යට ඇති දළ කළු වැලි තට්ටුව ඩෝසර් යොදා ඉවත් කරනු ලැබේ. ඉක්බිති අලුත් පස් යොදා ඒවා සරුකරනු ලැබේ.

මේ රටේ මෙතෙක් කුඹුරුවල ඇති කළු වැලි තට්ටුව ඉවත් කිරීමක් සිදු වී නැත. රටට සරු වී අස්වැන්නක් ලබා ගැනීමටත් කීඩෑ උවදුර තුරන් කිරීමටත් ඉහත කී පස් රක්ෂණය සිදු කළ යුතුය. එහිදී පිදුරු ආදිය යෙදීමෙන් කාබනික පොහොර සාදා ගැනීම ඵලදායී වේ. මෙය එක්වරම සිදු කළ යුත්තේ රජය මඟිනි. අසරණ මෙරට දුප්පත් ගොවීනට එම ක්‍රියාවලිය සිදු කිරීම මහත් අපහසුය. මේ ගැන වගකිවයුත්තන්ගේ අවධානය යොමු වේවා.

**සරත් යටවර - කෑගල්ල**

## බෝක්කුවක් නිසා රුග්ගහවිල අසීරුවට



අත්තනගල්ල ප්‍රාදේශීය සභාවට අයත් රුග්ගහවිල - තිහාරිය ප්‍රධාන මාර්ගයේ උඩුගොඩ තපෝදාරාමය අසල මාර්ගයේ බෝක්කුව අසල්වැසියන් වසා දමා ඇත. මෙය අත්තනෝමතිකව වැසීම නිසා වැසි දිනවලදී මාර්ගය ප්‍රයෝජනයට ගන්නා ජනතාව මහත් අපහසුතාවට පත් වේ.

වැසි දිනවලදී ප්‍රධාන මාර්ගය දිගේ ගලා එන ජලයෙන් මේ ස්ථානය පිරී යයි. එසේම ඒ දිනවලදී පාරේ ගමන් ගන්නා ජනතාවට සහ පාසල් දරුවන්ට ජලයේ බැස පාරේ ගමන් කිරීමට සිදුව ඇත.

එසේම ඒ අසල විවීම් මාවතේ පේෂ කර්මාන්ත පාසල අසල (රෙදි ඉස්කෝලෙ) මාර්ගය දෙපස පදිංචිව සිටින නිවැසියන් ද මාර්ගයට වඩා උසින් දෙපසින් වැටි දමා තිබේ. මේ නිසා එම මාර්ගය ද ජලයෙන් යටවී ගමනාගමනයට බාධා එල්ල වේ.

මේ පිළිබඳව අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාගේ ඇතුළු මන්ත්‍රීතුමන්ලාගේ අවධානය යොමු වී ජනතා හිතවාදී පිළියමක් ලබා දෙනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

**නුවන් අමරසිංහ - රුග්ගහවිල**

## විහාරස්ථානයේ අපිරිසුදුකම



සෑම විහාරස්ථානයක් වෙතම පැමිණෙන සැදැහැවතුන් තම ආගමික කටයුතුවල යෙදීමේදී මල් පූජා කිරීම, පහන් දැල්වීම, හඳුන්කූරු දැල්වීම යනාදී පුණ්‍ය ක්‍රියාවල යෙදෙන අතර, සමහරු මල් ගෙන එන පොලිතීන් බෑග්, පොල්තෙල් ගෙන එන කුඩා ප්ලාස්ටික් බෝතල් සහ හිස් හඳුන්කූරු පෙට්ටි නියමිත කසළ බඳුන්වලට නොදමා පන්සල් භූමියේ තැන් තැන්වල දමති.

එයින් විහාරස්ථානය හා අවට අපිරිසුදු වන අවස්ථා ද ඇත. එසේම යම් යම් අවස්ථාවලදී තම නිවෙස්වල තිබෙන බුදුරුවවල සිරස් කැඩී ඇති හා වෙනත් කැඩී බිඳීම් සිදු වූ අවස්ථාවල එම අබලන් වූ බුදුරුව රැගෙනවිත් තබන්නේද විහාරථානයේ බෝමළුව අසලය. මෙවැනි ක්‍රියාවලින් විහාරස්ථානය තුළ සිදු කිරීමෙන් වැළකී සිටිය යුතුය.

විහාරස්ථාන හා අවට පිරිසුදුව පවත්වාගෙන යාම තම තමන්ගේ වගකීමක් බැවින් එය නිවැරදි ලෙස ක්‍රියාත්මක කිරීමට අදාළ අය කටයුතු කළ යුතු බව මාගේ අදහසය.

**එම්. ඒ. ජයවීර**
**ඕකන්ද - අම්බලන්ගොඩ**

## උසස්වීමක් නැති පුස්තකාල සේවකයෝ



2006 වසරේ අනියම් පදනම මත බඳවාගත් පුස්තකාල සේවකයන් 2007 වසරේදී ස්ථිර පදනම මත බඳවාගත් අතර, මේ දක්වා වසර 15 ක් අඛණ්ඩව සේවය කළත් කිසිදු උසස්වීමක් ලැබී නොමැත.

එහෙත් වැටුප් කප්පාදුවකට ලක්වී ඇති අතර වැටුප් ද අහුරා ඇත. මෙපමණ කලක් සේවය කළත් සේවයට ගෞරවයක් ලබා නොදී විදුහල්පතිවරුන්ගේ අභිමතය පරිදි කම්කරු සේවයේ පවා යොදවන ලදී.

පාසලක හදවත බඳු වූ පුස්තකාලයේ සේවය කරන පුස්තකාල සේවකයන් හට සාධාරණයක් ඉටු කර ඔවුන්ගේ ගරුත්වය ආරක්ෂා වන පරිදි මෙම ගැටලු විසඳා දෙන මෙන් අදාළ නිලධාරීන්ගෙන් ඉල්ලා සිටිමු.

**අසාධාරණයට ලක්වූ**
**පුස්තකාල සේවක පිරිස**

## ගම්පොල පොලිසියේ දඩ කොළය



ගම්පොළ පොලිසියේ රථවාහන අංශයේ නිලධාරීන් කිසිම වරදක් නොමැතිව දඩ කොළ ලියා උසාවි දමන පුරුද්දක් ඇත. මෙය සම්බන්ධව පොලිස් අධිකාරි මධ්‍යම පළාත් පොලිස්පති දැනුවත් කළත් අද වන තුරු ප්‍රතිඵල නැත.

අද රටේ පවතින තත්ත්වය අනුව රථවාහන පදවන රියැදුරන් වන අපට ගම්පොල පොලිසියේ නිලධාරීන්ට නඩු නොමැති නිසා හා හවසට නිවෙසට ගෙන යන්න බඩු ගන්න මුදල් සොයාගන්න මුදල් ඉල්ලූ පසු නොදුන් විට අනවශ්‍ය වැරදි දමා නඩු දමති. මේ සම්බන්ධයෙන් අදාළ නිලධාරීන්ගේ අවධානය යොමු වේවා.

**එන්. ජී. ඥානරත්න**
**සිංහපිටිය, ගම්පොළ**

## මිරිස්ස සුන්දර නගරයක් කරන්න

වැලිගම සංචාරක කලාපයට අයත් මිරිස්ස නගරය වැලිගම ප්‍රාදේශීය සභාවෙන් පාලනය වේ. එහි සංවර්ධන කටයුතු නිසි ලෙස සිදු නොවීමෙන් මහජනයාට විවිධ දුෂ්කරතා විඳීමට සිදුව ඇත. මිරිස්ස නගරය තුළ සෑම පාරිභෝගික භාණ්ඩයක්ම ඇති සුපිරි වෙළෙඳසල් ඇත.

නගරය දෙපස පදික වේදිකාවක් නොමැති නිසා විදේශීය සංචාරකයන් මෙන්ම පොදු මහජනතාව ද මහත් අපහසුතාවලට මුහුණ දීමට සිදුව ඇති අතර, පොදු ජල කරාමයක් හෝ පොදු වැසිකිළි, කැසිකිළි නොමැති වීම නිසා විදේශීය සංචාරකයන් මහත් අපහසුතාවන්ට මුහුණ දෙති.

අතුරු මාර්ග සඳහා කානු පද්ධතියක් නොමැති නිසා වැසි දිනවලදී පොදු මහජනතාවට මහත් අපහසුතාවලට මුහුණ දීමට සිදුව තිබේ. එසේම ගාල්ල දෙසට තිබෙන මිරිස්ස සහ උඩුපිල හන්දියේ තිබෙන බස් නැවතුම් ස්ථාන සඳහා මගී ආවරණයක් නොමැති වීම බලවත් අඩුපාඩුවකි.විදේශීය සංචාරකයන් රැඳී සිටින සහ නිතරම විදේශීය සංචාරකයන් පැමිණෙන මිරිස්ස නගරය සුන්දර නගරයක් කිරීමට සියලු වගකිවයුතු බලධාරීන්ගේ වගකීමකි.

**වසන්ත ද සිල්වා- වැලිගම**



## කුරුණෑගල ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ අඩුපාඩු

කුරුණෑගල දිස්ත්‍රික්කයේ රියදුරු බලපත්‍ර ගන්නා සෑම කෙනෙකුම සිය වෛද්‍ය පරීක්ෂණ සිදු කර ගැනීමට කුරුණෑගල නගරයේ පිහිටි ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයට පැමිණීම අනිවාර්ය වේ. කුරුණෑගල නිශ්ශංක මහා විද්‍යාලය ඉදිරිපිට ප්‍රධාන මාර්ගය ආසන්නයේ පිහිටි මෙම වෛද්‍ය මධ්‍යස්ථානය වෙත සාමාන්‍යයෙන් දිනකට තුන්සියයකට අධික පිරිසක් පැමිණෙති. විශේෂයෙන්ම වෛද්‍ය පරීක්ෂණ සඳහා පැමිණෙන අයගේ යතුරුපැදි හෝ වෙනත් වාහන නවතා තැබීමට සුදුසු ස්ථානයක් නොමැතිවීම නිසා දැඩි දුෂ්කරතාවට ලක් වෙති.



මහාමාර්ගය දෙපස හෝ වෛද්‍ය මධ්‍යස්ථානය ඉදිරිපිට වාහන නැවතීම හේතුවෙන් මධ්‍යස්ථානයට පැමිණෙන අයට මෙන්ම මෙම මාර්ගයේ ධාවනය වන වාහනවලට ද බාධා පැමිණීම නිරතුරුවම දක්නට ලැබේ.

වෛද්‍ය මධ්‍යස්ථානය තුළ විශාල කාර්ය භාරයක් එක දිගට සිදුවනු පෙනුණ ද ඊට අවශ්‍ය කාර්ය මණ්ඩලයේ අඩුවක් ද දැකිය හැකිය. අවශ්‍ය තරම් කාර්ය මණ්ඩලයක් සිටී නම් වෛද්‍ය පරීක්ෂණ මීට වඩා කාර්යක්ෂමව කඩිනමින් සිදු කර ගැනීමට ජනතාවට ඉඩකඩ ලැබෙනු ඇත. ප්‍රවාහන ඇමැතිවරයාගේ අවධානය යොමු කර කඩිනම් විසඳුමක් ලබා දෙනු ඇතැයි ජනතාවගේ අපේක්ෂාවයි.

**ආර්. පතිරණ**
**කුරුණෑගල**



# තොටුපොළ අයිනේ ආදර ජීවිත



## මිනිස්සු

### අහම්බෙන් මුණගැහුණු ජීවිත

ඉර නැඟෙමින් තිබෙන තවත් එක් උදෑසනකි. මාළු වාඩි පෙළට ඉහළින් ඉර සුදු වැලි තලයට එබෙමින් තිබුණි. සිසිකඩ විසිරෙන ඉර එළිය කැබලිති පොල් අතු වහලින් බිමට වැටෙන මොහොතේ වාඩියේ නිදසිටි ඇගිලස් අම්මා එකවරම අවදිවූයේ කාක්කන්ගේ කඨෝර නාදයෙනි.මාළු ඔළුවක් අල්ලාගනිමින් හබ කරන කාක්කන්ට ඇගිලිස් අම්මාගේ හෝ පීටර මාමාගේ නින්ද ගැන නිනව්වක් නැත. උන් රණ්ඩුවකට වඩා වැල්ලේ සෙල්ලමකි. කල්පිටි කලපු දියවර පිස හමන ලවණ මුඩු වියළි සුළං රැළි අනාරාධිතව වාඩියට එබෙයි.ඒ සුළඟින් පෙණහලු පුරවා ගන්නා ඇගිලස් අම්මා දවසේ බලාපොරොත්තුව කලපු දියවරට භාර කරයි.ඇගිලස් අම්මාට සහ පීටර මාමාට ඇත්තේ අද දවසේ බලාපොරොත්තු පමණි.උදෑසන සිටම වාඩිය කායිබහුල වන්නේ නැන්දගේ ජීවන අරගලයෙනි.මේ ඇගිලිස් අම්මා සහ පීටර මාමා අපට අහම්බෙන් හමුවන්නේ කල්පිටිය සංගුමාලවත්ත තොටුපළේදීය. ඔවුන් දෙදෙනා මේ වාඩියට පදිංචියට එන්නේ මීට අවුරුදු තුනකට පෙරය.එය නීරස දිගු බැරෑරුම් කතාන්දරයකි.අප වැලි තලයේ එරමිනියා ගොතා ගනිමින් සූදනම ඒ කටුක කතාව අසන්නටය.කතාව පැහැදිලිව කීමට තරම් මාමාට මතකයක් නැත.නමුත් නැන්ද ඒ කතාන්දරය හොඳින් කීමට තරම් ශක්තිමත් ය.

"ඇත්තටම ඒ තමා අපේ ජීවිතේ ගෙවුණු සුන්දරම දවස් ගොඩ.පීටර් එක්ක විවාහ වෙලා අපි පදිංචිවුණේ ආනවාසල කියන ගමේ.ඒ කාලේ අපේ එක්කෙනා මහන්සියෙන්ම වැඩ කළා. ටෝලර්වල ගිහිං හොඳට සල්ලි හෙව්වා.ධීවර රස්සාවෙන් තමා ජීවිතේ රැක ගත්තේ.සමහර දවස්වල කලපුවේ රස්සාව. මමත් කරට කර උදවු කරනවා. ඔහොම කාලයක් ගතවුණාම ලොකු පුතා හම්බවුණා.ඊට පස්සේ දෙවෙනියා.අපි හරිම සන්තෝෂයෙන් ජීවිතය ගෙවාගෙන ගියා.ගෙදර සතුටින් පිරිලයි තිබුණේ. කිසිම කරදරයක් තිබුණේ නෑ.කාලයක් ගතවෙද්දී රස්සාවෙන් ලැබෙන සල්ලි ජීවත්වෙන්න මදිවුණා අපි හොඳටම අසරණවෙලා කරකියාගන්න දෙයක් නැතිවුණා.මේ කරදරවලින් මිදෙන්න ණයවුණා.එදවේලට සල්ලි නැතිවුණාම වටේත් පිටින් ණය ගත්තා.දරුවන්ට කන්න බොන්න දෙන්න මහන්සි වුණා.අන්තිමේ ණය බර එන්න එන්නම වැඩිවුණා.අපිට කියල තිබුණේ ගේ පොඩියක් විතරයි.අන්තිමට අපි මුළු ජීවිතේ ම දිය කරල හදපු ගේ විකුණල ණය බර හැල්ලු කරගන්න තීරණය කළා.ලක්ෂ හතරයි දහයට තමා ගේ විකුණ්නේ".

ඇගිලස් අම්මාගේ ඇස කඳුලකින් පෙඟෙයි.ඇ චීත්ත කෙළවරකින් ඇස පාදයි.පීටර මාමාට මේ කිසිවක් ගණනක් නැත.බලාගත්වනම කලපුව දෙසත් පටු රතු දිගු ගුරුපාර දෙසත් වරින් වර බලන මාමා එකවරම බිම බලාගනී. ගෙවුණු අතීතය ගැන ඇගිලිස් කියන ඉමිහිරි කතාන්දරත් වර්තමානයේ දුක පිරුණු අන්දරයත් අසන්නට පීටර් මාමාට නොහැකිය.මාමාට ඇසෙන්නේ තරමක් අඩුවෙනි.දැන් නැන්දගේ පළමු රාජකාරිය මාමා බලාගැනීමය.

"ගෙදර විකුණන්න අපට ඉන්න හිටින්න තැනක් නැතිවුණා. කාලයක් තැන් තැන්වල ඇවිද්දා.හැබැයි කොයිම වෙලාවකවත් අපි වෙන් වෙන්න උත්සහ කළේ නෑ.කොහොමහරි ජීවිතේ ගැට ගහ ගන්න තමා උත්සහ කළේ. මේ අතරෙදි ලොකු පුතා පිළිකාවක් හැදිල නැතිවුණා.ජීවිතේ තවත් දුක්බර වුණා.පොඩි පුතා එදවේල හම්බ කරන් ජීවිතේ ගෙවනවා. අපි කාටවත් බරක් නොවී සතුටින් ජීවිතේ ගෙවනවා.හැමදේම නැතවුණත් සන්තෝෂය තාමත් අපි ළඟ."

ඇගිලස් අම්මා නැවතත් කට කොනකින් සිනා සලයි.ඒ අතර දීප්තිමත් කඳුළු බිඳුවක් කම්මුල පසුකොට ඇවිද යයි.ඇයට එය ගණනක් නැත.

දැන් ඇගිලිස් අම්මා සහ පීටර මාමා ජීවත් වන්නේ කලපුවේ අයිනේ සුන්දර නිවෙසකය.එය ධීවර සමිතිය සතු ඉඩම් කැබැල්ලකි.මීට වසර තුනකට ඉහත දී මෙතැනට පැමිණි ඇගිලස් නැන්ද සහ පීටර මාමාට මෙම නිවෙස ඉදිකොට දී ඇත්තේ සංගුමාලවත්ත ධීවර සමිතියේ සාමාජිකයන් විසිනි.මෙම ධීවර සමිතිය සතු ඉඩම තුළ තනාගත් කුඩා පැල් කොටයේ මෙම වියපත් ප්‍රේමවන්තයන් ජීවිතේ ගෙවන්නේම සතුටිනි.

"ධීවර සමිතියේ සභාපති හියුමත් පුතා තමයි අපට මේ ඉඩම දුන්නේ ගේ කෑල්ලක් හදගෙන ජීවිතය ගෙවන්න. හැමෝම උදවු කරනවා අපට .ඒත් අත පාල ජීවත් වෙන්න බෑ අපට.ඒක නිසා තොටුපලේ හැම දේටම අපි උදවු කරනවා. මෙයාට කතා කරන්න ,ඇවිදින්න අමාරුයි. ඒක නිසා මම තමා වැඩ පළ කරන්න යන්නේ.හැමදම උදේට අපි දෙන්න නැගිටිනවා.පස්සේ දෙන්න එක්ක ටිකක් නිවිසැනසිල්ලේ කතා කරනවා. අපේ ගෙදර කොච්චර පුංචිවුණත් ඒ ගේ ඇතුලේ ලොකු සතුටක් තිබෙනවා.ගෙදර වත්තේ පුංචි ගෙවතුවගාවකුත් අපි හදල තියෙනවා.දෙන්න එක්ක එතනට වෙලා ටිකක් ඉන්නවා.මෙයාට වැඩ කරන්න තරම් දැන් ශක්තියක් නැහැ. ඒක නිසා ගෙදරම තමා ඉන්නේ.ඉස්සර යාලුවන්ට ගොඩක් උදවු කරපු කෙනෙක් මෙයා.මම මොනවහරි කරල එයාව ජීවත් කරවනවා".



හියුමත්

ඇගිලස් අම්මා ශක්තිවන්ත ගැහැනියකි. ඇගේ කතාව ඊට කදිමට නිදසුන් සපයන අතර ඒ කුඩා නිවෙස ඉතා පිළිවෙළ එකකි. පැලේ එක් පැත්තක් කඩොලානවලින් සමන්විත කලපුව පිහිටා ඇති අතට අනෙක් පසින් කෙළවර නොපෙනෙන කරවල වාඩි රැසකි.ඇගිලස් අම්මාගේ ප්‍රධාන රාජකාරිය කරවල සඳහා මාළු සුද්ද කිරීමයි.ඉන් සොයා ගන්නා සොච්චම් මුදල ඔවුනට ජීවත්වීමට ප්‍රමාණවත් ය.ඒ දෙදෙනාටම ජීවිතේ සිහින නැත.ඔවුන්ගේ එකම සිහිනය මියැදෙන තුරු එකිනෙකාට ආදරයෙන් ජීවිතය ගෙවා දැමීමය.



"අපට වතුර නැනේ.සල්ලි දීල තමයි ගන්නේ.කැමතම් ඕන තරම් ලැබෙනවා.ඒ හැමදේම අතර අපි හොයන සතුට මෙතන තියෙනවා".

ඇගිලස් අම්මා එවර සිනාවකින් වත සරසා ගන්නීය.ඇත්තටම සතුට තියෙන්නේ ජීවිතයේ කොතැනදැයි ඒ සිනහව අපට ඉඟි කරන්නේය.මෙම ආදරණීය යුවළ සඳහා තාවකාලික නිවෙසක් ඉදි කර ගැනීමට ඉඩම ලබාදුන්නේ හියුමත් අයියා ප්‍රමුඛ ධීවර ප්‍රජාව විසිනි.මේ දෙදෙනා බලාගන්නේද ඔවුන් විසිනි.හියුමත් අයියා මනුස්සකම උපරිමයෙන් පිරුණු මිනිසෙකි.

"පීටර් මාමා කළේ ධීවර රස්සාව.මේ දෙන්නා හරිම ආදරෙන් ජීවිතේ ගෙවනවා. ඉස්සරත් එහෙමයි.ණය ගෙවාගන්න බැරුව ගේ විකුණල දැම්මා.ඊට පස්සේ යන්න තැනක් නැතිවුණා මිනිහෙක් අසරණ වෙනවා කියන්නේ කොයි වෙලාවෙද දන්නෙ නෑ.ඒක නිසා අපි මේ සමිතිය සතු ඉඩම ඔවුන්ට තාවකාලිකව පදිංචියට දුන්නා.ඒ අය කවදහරි ජීවත්වෙන තාක් කල් මෙතන ඉන්න පුළුවන්.මේ අයට උදවු කරන්න කැමති අය ඉන්නවනම් ඒකටත් අවශ්‍යතාව තියෙනවා. පීටර මාමට බැරිවුණාම නැන්ද තමයි හැමදේම කරට ගත්තේ".

හියුමත් නැවතත් කතා කරන්නට තැන ලබාදෙන්නේ නැන්දටය.

"ගෙදර පොඩ්ඩක් හදගන්න ඕන.මේකේ මීයෝ පිරිල.මේ මගේ අතකාලා ගිහිං හැම තැනම". නැන්ද තැන තැන වළ ගොඩැලි පිරි අත්ල අපට දිගු කරයි.ඒ අත්ල මත රේඛාවලින් කිව නොහැකි බොහෝ තතු පිරී පවතී.මේ ඔවුන් ගෙවා දමන්නේ ජීවිතයේ සැඳෑ සමයයි.අහම්බෙන් හමුවන මිනිසුන් ගැන අප තබන සටහන් පෙළ හරහා මේ දෙදෙනා ගැන ලියා තබන්නේම සියල්ල නැතිවූ තැන ආදරය ඉතිරිව ඇති නිසාමය.දබර කර ගනිමින් ගැටෙමින් ජීවිතයෙන් වන්දිගෙවන, එකිනෙකා පිටුදකින සමාජයක ඇගිලස් අම්මා සහ පීටර මාමා අපට කියාදෙන්නේම ජීවිතය සහ මනුස්සකමම නොවේද?

**චතුර ගීතනාත් බණ්ඩාර**
ඡායාරූප - සමන්ත වීරසිරි



# මන්නාරම සුළං බලාගාර ව්‍යාපෘතිය මෙරට බලශක්ති ක්ෂේත්‍රයේ නව හැරවුම් ලක්ෂ්‍යයක්

## ඇමැති ඩලස් අලහප්පෙරුම



**මහින්ද අලුත්ගෙදර, මන්නාරම සිට**

පුනර්ජනනීය බලශක්තියෙන් නැඟිටින ශ්‍රී ලංකාවේ ආර්ථිකයට දැවැන්ත ශක්තියක් එකතු කරන මන්නාරම සුළං බලාගාර ව්‍යාපෘතිය මෙරට බලශක්ති ක්ෂේත්‍රයේ නව හැරවුම් ලක්ෂ්‍යයක් බව විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම මහතා ප්‍රකාශ කරයි.

ඇමැතිවරයා මේ බව සඳහන් කළේ මන්නාරම ප්‍රදේශයේ ඉදි වන මෙරට විශාලතම සුළං විදුලි බලාගාරයේ වත්මන් ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් සොයා බැලීමට පෙරේදා (30) එහි නිරීක්ෂණ චාරිකාවකට එක්වූ අවස්ථාවේ මාධ්‍ය වෙත අදහස් දක්වමිනි.

ආසියානු සංවර්ධන බැංකුවේ ණය ආධාර මත ක්‍රියාත්මක මේ සුළං බලාගාර ව්‍යාපෘතිය මෙරට විශාලතම සුළං බලාගාර ව්‍යාපෘතිය වන අතර එම සමස්ත ව්‍යාපෘතියට ඇස්තුමේන්තු ගත මුදල අමෙරිකානු ඩොලර් මිලියන 200කි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද කීය.

'මීට වසර 70කට පමණ පෙර මේ රටේ හැරවුම් ලක්ෂ්‍යයක් බවට පත් කරමින් ජල විදුලි බලාගාරයක් ඉදි කළා. ශිෂ්ටාචාරයක් යටපත් නොකර පරිසරයත්, ආර්ථිකයත් රැකගෙන මන්නාරම සුළං බලාගාරය ඉදි කර තිබෙනවා. පුනර්ජනනීය බලශක්තියෙන් නැඟිටින රටක් ලෙස මේ බලාගාරය ඉතිහාසයට එක් වෙනවා.

සුළං සහ සූර්ය බලය ශ්‍රී ලංකාවේ විදුලිය ජනනය කිරීමට ප්‍රධාන විභවයන් ලෙස උපයෝගී කරගැනීම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබෙන මූලික කරුණක්. ඒ අනුව ඒ මහතා ජාතියට, රටට, දේශපාලනඥයන්ට යම්කිසි ඉලක්කයක් ලබාදී තිබෙනවා. එළැඹෙන 2030 වන විට මේ රටේ සමස්ත විදුලිය ජනනයෙන් සියයට 70ක් පමණ පුනර්ජනනීය බලශක්තිය මත රැඳිය යුතුයි. ඒ අනුව අප අමාත්‍යාංශයක් සහ මණ්ඩලයක් ලෙස මේ ඉලක්කය හඹා යමින් ඉන්නවා. ඒ අනුව මන්නරාම ක්‍රියාත්මක සුළං විදුලි බලාගාරය එම ගමනේ හැරවුම් ලක්ෂ්‍යයක් වෙනවා. අපේ රටට මහා පරිමාණ ජල විදුලි බලාගාරයක් 1950 දශකයේ දායාද වෙනවා. එය ශ්‍රී ලංකා විදුලබල ක්ෂේත්‍රයේ පරිවර්තනීය ලක්ෂණයක් බවට පත් වුණා. 1912 ගෑස්වලින් කොළඹ නගරය ආලෝකමත්ව තිබෙනවා.

එයින් වසර 70කට පසුව මන්නාරම සුළං බලාගාරය ජාතියට තවත් හැරවුම් ලක්ෂ්‍යයක් වෙනවා. ඒ නිසා රටක් වශයෙන් වාසනාවන්තයි. මෙය සුළං කපොල්ලක පිහිටා තිබෙනවා. පුනර්ජීවනය සම්බන්ධයෙන් මෙය ජාතියට පණිවිඩයක් නිකුත් කරනවා. මෙයින් මෙගා වොට් 103ක ධාරිතාවක් ජාතික විදුලිබල පද්ධතියට එකතු කරනවා. ශිෂ්ටාචාරයක් යටපත් කර විශාල මුදලක් වැය කර තමයි අප බලාගාර ඉදි කර තිබෙන්නේ. මෙයට සම්බන්ධ වු සියලු දෙනාම සිහිපත් කරනවා. ලබන මාසය අවසාන වන විට මෙහි පළමු පියවර ලෙස යම්කිසි මෙගා වොට් ප්‍රමාණයක් ජාතික විදුලිබල පද්ධතියට එකතු කරන්න අපේක්ෂා කරනවා. සමස්තයක් ලෙස මාස තුනක් ඇතුළත මේ සම්පූර්ණ පද්ධතියම ජාතික විදුලිබල පද්ධතියට එකතු කරන්න හැකි වෙයි.

සුළං බලයෙන් විදුලිය නිපදවන්න ඒකකයකට රුපියල් 8ක් පමණ වැය වෙනවා. සම්ප්‍රේෂණ පද්ධතියටත් රුපියල් තුනක් පමණ එක් කළ විට උපරිම වශයෙන් රුපියල් 12ක් පමණ වැය වෙනවා. දැනට විදුලිබල මණ්ඩලය දරණ සාමාන්‍ය වියදම එක් ඒකකයකට රුපියල් 23ක්. එය ඩීසල්වලින් බලන විට රුපියල් 30කට ආසන්නයි. ඒ



2030 වන විට සියයට 70ක් පමණ පුනර්ජනනීය බලශක්තියෙන් විදුලිය නිපදවන්න වෙනම අමාත්‍යාංශයක් ස්ථාපිත කර තිබෙනවා.

### මේ ඉලක්කය කරා යෑම අපේ අරමුණයි

**——— රාජ්‍ය ඇමැති දුමින්ද දිසානායක**

අනුව වියදම පැහැදිලියි. අපේ ඉලක්කය ඉතාම පැහැදිලිව සඳහන් කර තිබෙනවා. අප මේ සම්බන්ධයෙන් තීන්දු තීරණ ගෙන තිබෙනවා. ඩීසල් යොදා ගනිමින් විදුලිය නිෂ්පාදනය සියයට 30ක් පමණ වෙනවා. නමුත් මේ තත්ත්වය තවත් වසර පහකදී පමණ සියයට 5ක් දක්වා අවම කිරීම අපේ අරමුණ වී තිබෙනවා. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ අගමැති මහින්ද රාජපක්ෂ මහත්වරුන් අපේ රට බලශක්තිය අතින් ඉතාම නිවැරැදි දිසාවට නාභිගත කර තිබෙනවා.

මෙය රටේම ජයග්‍රහණයක්. ආර්ථික පුනර්ජීවනයට එය හේතුවක්. යම් යම් අවස්ථාවල විදුලිබල මණ්ඩලය විශාල වශයෙන් පාඩු ලබනවා. නමුත් ඇතැමුන් විදුලිබල මණ්ඩලයට යම් යම් චෝදනා එල්ල කරනවා. විදුලි පාරිභෝගිකයන් නිෂ්පාදකයෙක් බවට පත් කර ගන්නට හැකි සැලසුමක් ජනාධිපතිවරයාගේ පළමු අය-වැයෙන් ඉදිරිපත් කරයි කියා විශ්වාස කරනවා. ඩීසල්වලින් දහනය වන අපේ පරිසරය මෙන්ම ආර්ථිකය ද රැකගෙන ජන ජීවිතට කිසිදු බාධාවක් නොවන පරිදි මේ බලාගාරය ඉදි කර තිබෙනවා.'

**සූර්යබල, සුළං හා ජල විදුලිජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය ඇමැති දුමින්ද දිසානායක මහතා**

'පුනර්ජනනීය බලශක්තියෙන් රටක් ස්වයංපෝෂිතව විදුලිය නිපදවන රටක් තමයි ශ්‍රී ලංකාව. පසුගිය කාලයේ අප මේ වෙනුවෙන් ඩීසල් භාවිත කළා. නමුත් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා තීන්දුවක් ගෙන තිබෙනවා 2030 වන විට සියයට 70ක් පමණ පුනර්ජනනීය බලශක්තියෙන් විදුලිය නිපදවන්න. ඒ වෙනුවෙන් වෙනම අමාත්‍යාංශයක් ස්ථාපිත කර තිබෙනවා. 2030 වසර වන විට මේ ඉලක්කය කරා යෑම අපේ අරමුණයි. මේ වන විට කලාප තුනක් අප හඳුනාගෙන තිබෙනවා. මේ ස්ථානයේම තවත් මෙගා වොට් 300ක සුළං බලයෙන් විදුලිය නිෂ්පාදනය කිරීමේ හැකියාව තිබෙනවා. පුනරීන් ප්‍රදේශයේ මෙගා වොට් 400ක් සුළං බලයෙන් සහ සූර්ය බලයෙන් ලබා ගන්න පුළුවන්. ඒ වගේම සබරගමුව පළාතෙන් තවත් මෙගා වොට් 100ක් සූර්ය බලයෙන් ලබා ගන්න පුළුවන්. ඉදිරි කාලය වන විට මේ කලාපයේ පුනර්ජනනීය බලශක්තිය අතින් ශ්‍රී ලංකාව බලවතෙක් බවට පත් වෙයි. ඉන්දියාව සමඟ විදුලිය සම්බන්ධයෙන් කතා කරනවා.

මුහුදේ කුලුනු ස්ථාපිත කර විදුලිය ලබා ගන්නත් අප අපේක්ෂා කරනවා. පරිසර හානිය ඉතාම අඩුයි. අපේ ඊළඟ අදියර වන්නේ ඒ සඳහායි. ඒ වෙනුවෙන් සැලසුම් සකස් කරනවා. මේ ව්‍යාපෘතියම ඩීසල්වලින් ක්‍රියාත්මක කළේ නම් වසරකට කාබන්ඩයොක්සයිඩ් මෙට්‍රික් ටොන් 285,000ක් පමණ පරිසරයට මුදා හරිනවා. නමුත් සුළං බලාගාරය හේතුවෙන් එවැනි කිසිවක් පරිසරයට එකතු වන්නේ නෑ. මේ ගැන අප සතුටු වෙන්න පුළුවන්. පුංචි රටක් වශයෙන් අපට සතුටු වෙන්න පුළුවන්.'

ලංකා විදුලිබල මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ) ආචාර්ය සුසන්ත පෙරේරා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (උතුරු පළාත) ප්‍රියන්ත ගුණතිලක, මන්නාරම සුළං බලාගාර ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ උපුල් දොම්පගේ, ව්‍යාපෘති කළමනාකාර අනුරුද්ධ තිලකරත්න මහත්වරුන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

# 20ට එරෙහිව පෙත්සම් 6ක් ශ්‍රේෂ්ඨාධිකරණයට

**ලංකා ගුරු සංගමයේ ප්‍රධාන ලේකම් ජෝසප් ස්ටාලින්**

**මානෙල් පුෂ්ප කුමාරි**

20 වැනි ව්‍යවස්ථා සංශෝධනයට එරෙහිව වෘත්තීය සමිති නායකයන් 06 දෙනකුගේ පෙත්සම් ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමේ පත්‍රිකා බෙදාදීම හෙට (03) උදේ 7.00 සිට උදේ 9.00 දක්වා කොටුවෙන් ආරම්භ කරන බවත් ලංකා ගුරු සංගමයේ ප්‍රධාන ලේකම් ජෝසප් ස්ටාලින් මහතා පැවැසීය.

ඒ මහතා මේ බව පැවැසුවේ පෙරේදා (30) කොළඹ 02, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවතේ පිහිටි ගුරු මැදුරේදී 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳව පැහැදිලි කිරීමට පැවති මාධ්‍ය සාකච්ඡාවේදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය.

'20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනයෙන් වැඩ කරන ජනතාව භුක්ති විඳින අයිතිවාසිකම් උදුරා ගැනීමට එරෙහිව වෘත්තීය සමිති ගණනාවක්, ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් කිහිපයක් ගොනු කර තිබෙනවා. ඊට අමතරව ඉදිරි දින කිහිපයේ මේ සංශෝධනවලට එරෙහිව වෘත්තීය සමිති ක්‍රියාමාර්ග කිහිපයක් ද ආරම්භ කිරීමට දිවයිනේ ප්‍රධාන වෘත්තීය සමිති ගණනාවක් තීරණය කර තිබෙනවා.'

එක්සත් කම්කරු සම්මේලනයේ සභාපති ලීනස් ජයතිලක, ලංකා වෙළෙඳ කාර්මික හා පොදු කම්කරු සංගමයේ ප්‍රධාන ලේකම් සිල්වෙස්ටර් ජයකොඩි, 20 වැනි ව්‍යවස්ථා සංශෝධනයට එරෙහි ව්‍යාපාරයේ කැඳවුම්කරු කේසර කෝට්ටේගොඩ, 20 වැනි ව්‍යවස්ථා සංශෝධනයට එරෙහි ව්‍යාපාරයේ ජාතික වෘත්තීය සමිති පෙරමුණේ කැඳවුම්කරු රවී කුමුදේශ්, වෘත්තීය සමිති සම්මේලනයේ ප්‍රධාන ලේකම් ධර්මසිරි ලංකාපේලි මහත්වරු ද මෙහිදී අදහස් දැක්වූහ.

## පාස්කු ඉරු දින ප්‍රහාරය ගැන සොයන ජනපති කොමිසම

# ප්‍රහාරයෙන් පසු එහි වරද තමන්ට යොමු කිරීම ඉතාම අසාධාරණයි

## හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු

**සුභාෂිණී සේනානායක**

පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන මහතා විසින් යුද හමුදා බුද්ධි ප්‍රධානියාට සහ ත්‍රස්ත විමර්ශන කොට්ඨාසයේ අධ්‍යක්ෂවරයාට කතා කර 'මොනවා හරි වෙන්න පුළුවන්' යනුවෙන් ප්‍රහාරයක අවදානමක් පිළිබඳ දැනුවත් කර තිබුණද තමන්ව එලෙස දැනුවත් නොකළ බවත්, ප්‍රහාරයෙන් පසු එහි වරද තමන්ට යොමු කිරීම ඉතාම අසාධාරණ බවත් හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා පාස්කු කොමිසම හමුවේ කියා සිටියේය.

හිටපු ආරක්ෂක ලේකම්වරයා මේ බව සඳහන් කළේ පසුගියදා (29) පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනය කරන ජනාධිපති විමර්ශන කොමිසන් සභාව හමුවේ සාක්ෂි ලබා දෙමිනි.

එහිදී වැඩිදුරටත් සාක්ෂි ලබා දෙමින් හිටපු ආරක්ෂක ලේකම්වරයා මෙසේ ද කීය.

මා එලෙස දැනුවත් කළේ නම් කෙසේ හෝ ජනාධිපතිවරයා සම්බන්ධ කරගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැන දැනුවත්වීමක් ලබාගැනීමට අවස්ථාව තිබුණා. ඇඳිරි නීතිය පැනවීමට, පොලීසිය සහ හමුදාව කැඳවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කඩිනමින් මැදිහත්වීමට අවස්ථාව තිබුණා. ඒ සම්බන්ධයෙන් අගමැතිවරයා දැනුම්වත් කරනවා ද? රාජ්‍ය ආරක්ෂක ඇමැති දැනුම්වත් කරනවා ද? කියන දේත් විමසීමට තිබුණා.

ඒක ඇහුවා නම් දෙන උත්තරයත් මා දන්නවා. නමුත් එය දැනුම්වත් කරන්න පුළුවන්නේ.

අප්‍රේල් මස 20 වැනිදා ඉදිරි පැය 24ක කාලයේ නිශ්චිතව ප්‍රහාරයක් එල්ල වන බවට තොරතුරු ලැබුණු පසු මොහොතකට පෙර පැවසූ ආකාරයට ජනාධිපතිවරයාව දැනුවත් නොකළේ ඇයිද යන්න පිළිබඳව සාක්ෂි මෙහෙයවූ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය හිටපු ආරක්ෂක ලේකම්වරයාගෙන් ප්‍රශ්න කළේය.

**එහිදී හේමසිරි ප්‍රනාන්දු මහතා මෙසේ පැවැසුවේය.**

'ඒ මොහොත වන විටත් ප්‍රමාද වී තිබෙන බව මගේ හිත පැවැසුවා. කෙසේ වෙතත් ප්‍රහාරයට සහරාන් ඇතුළු කණ්ඩායම කොළඹට පැමිණ ඇත්තේ අප්‍රේල් මස 20 වැනිදාට දින තුනකට පෙර. එහෙත් කිසිදු බුද්ධි අංශයකට ඔවුන් සොයාගැනීමට නොහැකි වුණා.

නමුත් මට නිලන්ත කියූ වෙලාවේ මා ඇහුවා මොකක් ද නිලන්ත දැන් කරන්න ඕනේ කියලා. මොකද මේ තොරතුරේ අයිතිකාරයා ඔහු. ඒ වෙලාවේ ප්‍රහාරය වළක්වා ගන්න හැකි වෙයි ද කියන එක ගැන ප්‍රශ්නයක් තිබුණත් යුද හමුදා බුද්ධි ප්‍රධානියාට සහ ත්‍රස්ත විමර්ශන කොට්ඨාසයේ අධ්‍යක්ෂවරයාට පැවැසූ මොහොතේ මටත් එය දැනුම්දීමට තිබුණා. ප්‍රහාරයේ හානිය අවම කර ගන්න හරි උත්සාහ කරන්න තිබුණා.'

**අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන මහතා අප්‍රේල් මස 20 වැනිදා ඔබව දුරකතන ඇමතුමකින් සම්බන්ධ කරගෙන තිබෙනවා නේද?

**සාක්ෂිකරු:**

ඔව් මට මතකයි. හවස 04න් පස්සේ වගේ කතා කළේ.

**අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

කතා කරලා මොනවා ද ඔහු කිව්වේ?

**සාක්ෂිකරු:**

සර්, මම වට්ස්ඇප් පණිවිඩයක් එව්වා කියෙව්වාද කියලා ඇහුවේ. මම කිව්වා නෑ මම බලලා ගන්නම් කියලා.

**අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

ඔබට එය එවා තිබුණේ 16.53ට නේද?

**සාක්ෂිකරු:**

ඔව්.

**අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

20 වැනිදා රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂවරයා කතා කළාට පසුව නේද ඔබ වට්ස්ඇප් පණිවිඩය බැලුවේ ?

**සාක්ෂිකරු:**

ඔව්.

**අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

ඔබේ දුරකතන වාර්තා අනුව ඔබ 20 වැනිදා රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂවරයා සමඟ සම්බන්ධ වෙලා තිබෙනවා පැය 18යි විනාඩි 2යි. තත්පර 16ට. තත්පර 202ක කාලයක් දක්වා ඇමතුම තිබෙනවා කිව්වොත් නිවැරැදි ද?

**සාක්ෂිකරු:**

වාර්තාවේ සඳහන් වෙනවා නම් නිවැරැදියි.

**අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

වට්ස්ඇප් පණිවිඩය ඔබ හොඳින් කියෙව්වා ද?

**සාක්ෂිකරු:**

ඉතා හොඳින් කියෙව්වා. තුන් හතර වතාවක් කියෙව්වා.

**අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

ඒ පණිවිඩය කියවද්දී මුල් තොරතුර ඔබට මතක් වුණා ද?

**සාක්ෂිකරු:**

ඔව් මතකයට ආවා. මුල් තොරතුර නිශ්චිත බැවින් අඩු වුවත් දෙවෙනි තොරතුර නිශ්චිත බව වැටහුණා. රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂවරයාව දුරකතනයෙන් සම්බන්ධ කර ගන්න උත්සාහ කළත් ඔහුගේ දුරකතනය කාර්යබහුල වෙලා තිබුණේ. පස්සේ මම well recieved කියලා මැසේජ් එකක් යැව්වා.

**අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

20 වැනිදා පණිවිඩය කියවද්දී ප්‍රහාරයක් ඉතා ඉක්මනින් විය හැකි බව වැටහුණා ද ?

**සාක්ෂිකරු:**

විය හැකි බව වැටහුණා ස්වාමීනි.

**අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

ස්ථාන ගැන අවබෝධයක් ලැබුණා ද ?

**සාක්ෂිකරු:**

ඔව්. මීට කලින් තිබුණ තොරතුරේ සඳහන්ව තිබූ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය දෙවෙනි පණිවිඩයෙන් ඉවත් වෙලා තිබුණා.

**අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

මෙය විශ්වාසදායක තොරතුරක් බවට ඔබට විශ්වාසයක් ඇති වුණා ද ?

**සාක්ෂිකරු:**

ඔව්.

**අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ සහරාන් හෂීම් සහ ඔහුගේ අනුගාමිකයන් ප්‍රහාරයක් එල්ල කිරීමට කුමන්ත්‍රණයක් කරන බවට ඔබ සෑහීමකට පත් වුණා ද?

**සාක්ෂිකරු:**

ඔව්.

**අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

18 වැනිදා ඔබ සමඟ රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂවරයා සාකච්ඡා කළ තාලම්කුඩා බයිසිකල් බෝම්බය පිපිරීම මේ ප්‍රහාරයට පෙරහුරුවක් බවට ඔබ සෑහීමකට පත් වුණා ද?

**සාක්ෂිකරු:**

ඔව්.

**අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

මේ ප්‍රහාරය අප්‍රේල් මස 21 හෝ ඊට පෙර කුමන හෝ වේලාවක සිදු විය හැකි බවට වැටහුණා ද ?

**සාක්ෂිකරු:**

ඒ පිළිබඳ මට උත්තරයක් දෙන්න අපහසුයි. කොච්චර නිශ්චිත වුණත් අවසන් මොහොතේ එය නොවෙන්නට පුළුවන්. කුච්චිවේලි නාවික කඳවුරට ගහනවා කියලා පළමු නිශ්චිත තොරතුර ආ දවසේ ගැහුවේ නෑ. ඊට දවස් පහකට පස්සේ ගැහුවේ. නමුත් මෙතැනදී ප්‍රහාරයක් වෙයි කියලා වැටහුණා.

**ජාතික බුද්ධි ප්‍රධානියා මඟින් තමන්ට තොරතුරු ලැබිය යුතු අතර එවකට ජාතික බුද්ධි ප්‍රධානී ලෙස කටයුතු කළ සිසිර මෙන්ඩිස් මහතා තමන් වෙත වාර්තා යොමු කර නැති බව හිටපු ආරක්ෂක ලේකම්වරයා අවධාරණය කර සිටියේය.**

**අතිරේක සොලිසිටර් ජනරාල්වරිය :**

මෙවන් තොරතුරක් සාමාන්‍ය සිවිල් පුරවැසියෙක් කියවනවාට වඩා ක්ෂේත්‍රයේ අත්දැකීම් ඇති පුහුණුව ලත් නාවික හමුදාවේ නිලධාරියෙක් මෙය කියවන විට බරපතළ බවක් වැටහෙනවා නේද?

**සාක්ෂිකරු:**

ඔව් වෙනසක් තිබෙනවා.

**අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

ඒ අනුව ඊළඟට ගත් පියවර කුමක් ද?

**සාක්ෂිකරු:**

නිලන්තට දුරකතනයෙන් කතා කරන්න උත්සාහ කළා. නමුත් බැරි වුණා. මා කම්පනයට පත් වෙලා හිටියේ. මේ තොරතුර අනුව යමක් සිදුවුවහොත් කොතරම් බරපතළ තත්ත්වයක් ඇති වෙයි ද කියලා.

**අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

සමා වෙන්න හේමසිරි ප්‍රනාන්දු මහත්මයා මම ඔබතුමාට බාධා කරනවා. 04 වැනිදා මුල් තොරතුර 08 වැනිදා ඔබ දැන ගත්ත වෙලාවේ ඔය වගේ කම්පනයක් ඔබට දැනුණේ නැහැනේ?

**සාක්ෂිකරු:**

ඔව්. මෙතැනදී තත්ත්වය වෙනස් ස්වාමීනි. මම ඒ වෙලාවේ නිලන්තට කතා කරන්න උත්සාහ කළාට බැරි වුණා. ටිකකින් මට වට්ස්ඇප් පණිවිඩයක් ආවා නිලන්තගෙන්. IGට සහ CNIට කතා කරලා මේක කිව්වා කියලා. පස්සේ මම නිලන්ත එක්ක කතා කළා. මට මතකයි මම එක ප්‍රශ්නයයි ඇහුවේ 'නිලන්ත මොනවා ද දැන් කෙරෙන්න ඕනේ' කියලා. සර්, මම IGPට කතා කළා. සර්ත් කතා කරන්න කියලා තමයි කිව්වේ.

**අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

පොලිස්පතිතුමාට එතුමා කතා කළා නම් ඇයි ඔබට කතා කරන්න කියන්නේ?

**සාක්ෂිකරු:**

ඒක එතුමාගෙන් අහන්න ඕනේ.

**අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

හේමසිරි ප්‍රනාන්දු මහත්මයා රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂවරයා එහෙම නෙවෙයි නේද කිව්වේ? ඔහු කිව්වේ සර් මම IGට කිව්වා ඒත් IG ගණන් ගන්නේ නෑ වගේ සර් කතා කරලා කියන්න කියලා නේද කිව්වේ?

**සාක්ෂිකරු:**

මට එහෙම මතකයක් නෑ. මට මතක අර විදිහට.

පසුව මා පොලිස්පතිවරයාට කතා කළා. ඒ වන විටත් පූජිත් ජයසුන්දර මහතා සිය පහළ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට කතා කරමින් උපදෙස් දෙමින් සිටියා. ඔහු එම පණිවිඩය බරපතළ ලෙස ගෙන තිබුණ බව මට හැඟී ගියා.

'සර්, මම දැනටමත් කතා කරනවා. මට දැන් වෙන කරන්න දෙයක් නෑ. මම පුළුවන් දේ කරනවා. කතා කරලා අවශ්‍ය උපදෙස් දෙනවා ඇරෙන්න වෙන කරන්න දෙයක් දැන් නෑ' යනුවෙන් පූජිත් ජයසුන්දර මහතා පැවැසුවා.

ඒ වන විටත් රාත්‍රී 09.00ත් පසු වී තිබුණා. මා අද යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් පසු නොවන නමුත් දුරකතනය මා අසල පවතින අතර අවශ්‍ය ඕනෑම වේලාවක කතා කරන ලෙස පොලිස්පතිවරයාට පැවැසුවා.

මේ අතර යුද හමුදා බුද්ධි අංශය වෙතින් ආරක්ෂක ලේකම්වරයා වෙත යොමු කර තිබුණු වාර්තා සම්බන්ධයෙන් කොමිසම හේමසිරි ප්‍රනාන්දු මහතාගේ අවධානයට යොමු කළේය.

එම වාර්තාවල ඉස්ලාම් අන්තවාදය පිළිබඳව, සහරාන් හෂීම් සහ එම අනුගාමිකයන් පිළිබඳවත්, ජාතික තවුහිද් ජමාත් සංවිධානය සමඟ සිට එයින් වෙන් වූ සිලෝන් තවුහිද් ජමාත් සංවිධානය සහ ඔවුන්ගේ හැසිරීම්, සමාජ ජාලා, වෙබ් අඩවි තුළ හැසිරෙන ආකාරයත්, ඔවුන් IS මතවාදය අනුව යමින් සිටින බවට වන තොරතුරු සවිස්තරාත්මක ඉදිරිපත් කර තිබුණි.

එහෙත් එම වාර්තා කිසිවක් ප්‍රහාරයට පෙර තමන් වෙත ලැබී නැති අතර ඒවා දකින්නේ ද මේ කොමිසමේදී බවයි හේමසිරි ප්‍රනාන්දු මහතා කියා සිටියේ.

ජාතික බුද්ධි ප්‍රධානියා මඟින් තමන්ට තොරතුරු ලැබිය යුතු අතර එවකට ජාතික බුද්ධි ප්‍රධානී ලෙස කටයුතු කළ සිසිර මෙන්ඩිස් මහතා තමන් වෙත වාර්තා යොමු කර නැති බව හිටපු ආරක්ෂක ලේකම්වරයා අවධාරණය කර සිටියේය.

මෙහිදී සාක්ෂි මෙහෙයවූ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය පැවැසුවේ යුද හමුදා බුද්ධි අධ්‍යක්ෂවරයාගේ එම වාර්තා නොලැබුණ ද රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ විසින් ආරක්ෂක ලේකම් වෙත යොමු කර තිබෙන වාර්තාවල ද එම තොරතුරු අඩංගුව පවතින බවයි.

# වැඩිහිටියන්ට සලකන සංස්කෘතියක් ඇති කිරීම ආණ්ඩුවේ ප්‍රතිපත්තියයි

## ඇමැතිනී පවිත්‍රාදේවි වන්නිආරච්චි

වැඩිහිටියන්ට සලකන සංස්කෘතිය නැවතත් රට තුළ ඇති කිරීම වත්මන් ආණ්ඩුවේ ප්‍රතිපත්තිය බව ලෝක වැඩිහිටි දින සැමරුම් දින උත්සවය අමතමින් සෞඛ්‍ය ඇමැතිනී නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය පවසයි.

'වසංගත හමුවේ වැඩිහිටි අභියෝග' යන තේමා කරගත් ලෝක වැඩිහිටි දිනය ඊයේ (1) යෙදී තිබුණ අතර ලොව පුරා වැඩිහිටි දිනය සමරා වැඩසටහන් පැවැත්වේ. ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය සංවිධානය කළ ජාතික වැඩිහිටි දින සැමරුම් උත්සවය සෞඛ්‍ය ඇමැතිනියගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පැවැත්විණි.

මෙම උත්සව අවස්ථාවට එක්වෙමින් සෞඛ්‍ය ඇමැතිවරිය මෙසේද පැවසීය.

ජනාධිපතිතුමා ඇතුළු නව ආණ්ඩුව වැඩිහිටියන් ඉලක්ක කරගෙන ඔවුන්ට කායික සහ මානසික සහනදායි වටපිටාව හදන ප්‍රතිපත්තියක පිහිටලයි කටයුතු කරන්නේ. වැඩිහිටියෝ කියන්නේ තමන්ගේ තරුණ කාලයේ මාතෘ භූමියට විශාල කැප කිරීමක් කළ අය. අපි තාම වැඩිහිටියන්ට පරාදයි. ඔවුන් අවම පහසුකම් යටතේ කැපකිරීම් සිදුකර තරුණ පරපුර ඉදිරියට ගෙන ආවා. අපේ දරුවෝ භෞතික වටිනාකම් මත යැපෙන පිරිසක් බවට පත්වෙලා.

අපේ පළමු කර්තව්‍ය විය යුත්තේ වැඩිහිටියන්ට සළකන සංස්කෘතියක් අපේ රටේ තුළ නිර්මාණය කිරීමයි. අපේ රටේ එහෙම සංස්කෘතියක් අතීතයේ තිබුණා. ලෝකයේ වෙනත් රටවල එම සංස්කෘතිය නැහැ. අපේ රටේ මව්පියෝ තාමත් දරුවන්ට කියලා ඉතිරි කරනවා. දරුවා වෙනුවෙන් කැපවෙනවා. අපේ රටේ තිබුණ පැරණි සංස්කෘතිය වන වැඩිහිටියන් සහ දරුවන් අතර සම්බන්ධතාවය, වැඩිහිටියන්ට සළකන සංස්කෘතිය, මනෝභාවය නිර්මාණය කළ යුතුයි. එය නව පරම්පරාවේ වගකීමක් වෙනවා. මාධ්‍ය තුළ සමාජ මාධ්‍ය තුළ මෙන්ම වැඩිහිටි ලේකම් කාර්යාලය සහ ආයතනවල ද එය ප්‍රධාන වගකීමක් වෙනවා. අපේ රාජ්‍ය ප්‍රතිපත්තිය එයයි.

ශ්‍රී ලංකාව තුළ වැඩිහිටි ජනගහනය අර්ථ දක්වන්නේ වයස අවුරුදු 60 සහ ඊට වැඩි අය ලෙසයි. වර්ෂ 2050 වන විට වැඩිහිටි ජනගහනය මුළු ජනගහනයෙන් සියයට 30 කට ආසන්න වනු ඇතැයි තක්සේරු කර තිබෙනවා. වැඩිහිටියන් අතර බහුල සෞඛ්‍ය ගැටලු වන්නේ බෝ නොවන රෝග, මානසික ආබාධ සහ දිගුකාලීන රෝග වේ. මෙම ගැටලු මගහැරවීම දෙස බලන විට විශේෂයෙන් බෝ නොවන රෝග වැළැක්වීම සඳහා නිසි පෝෂණය සහ සෞඛ්‍ය සම්පන්න ජීවන රටා ජීවිත කාලය පුරාම වැදගත්.


වැඩිහිටියන්ගේ සෞඛ්‍ය සඳහා වන ජාතික වැඩසටහනේ කේන්ද්‍රස්ථානය වන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ තරුණ, වැඩිහිටි හා ආබාධ ඒකකයි. දිවිය පුරා ක්‍රියාශීලී වයස්ගතවීම පිළිබඳ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම ඇතුළු වැඩිහිටියන්ගේ සෞඛ්‍ය තත්ත්වය නඟා සිටුවීම සඳහා බොහෝ වැඩසටහන් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මේ වනවිටත් දියත් කොට ඇත. තවදුරටත් ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා වැඩිහිටි සෞඛ්‍ය ප්‍රතිපත්තිය සහ සෞඛ්‍ය සේවා බෙදා හැරීමේ සැළැස්මට සමගාමීව පස් අවුරුදු සැළැස්මක් ද ක්‍රියාත්මක වෙනවා.

මෙහිදී වැඩිම දරුවන් සිටින මව්වරුන් පිදීම, ආදරයයි කරුණාවයි කෘතිය පිළිගැන්වීම, වැඩිහිටි නිවාස සඳහා මුදල් ආධාර සහ ලියාපදිංචි සහතික පිරිනැමීම, වැඩිහිටි හරසර ක්‍රීඩාවෙන් ජයගත් වයස්ගතම වැඩිහිටි ක්‍රීඩකයා සහ ක්‍රීඩිකාව වෙත උපහාර පිදීම ද සිදු විය. එහිදී වැඩිම දරුවන් දැයට දායාද කළ මාතාව ලෙස දරුවන් 18 දෙනෙක් දැයට දායාද කළ නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පදිංචි ඩී.එම්. මැණික්හාමි මාතාව සෞඛ්‍ය ඇමැතිතුමිය විසින් ඇගයීමට ලක්කර තිළිණයක් ප්‍රදානය කරන ලදි.



මෙම අවස්ථාවට වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සමාජික මහාචාර්ය කෝන්ගස්තැන්නේ ආනන්ද හිමි ඇතුළු සර්වාගමික පූජකතුමන්ලා, දේශීය වෛදකම ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය ඇමැති සිසිර ජයකොඩි, සෞඛ්‍ය ලේකම් මේජර් ජනරාල් වෛද්‍ය සංජීව මුණසිංහ, කොළඹ දිස්ත්‍රික් ලේකම් ප්‍රදීප් යසරත්න, ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ චන්දන රණවීරආරච්චි මහත්වරු, ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ තුමා, කොළඹ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මහතා, දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකම වැඩිහිටි බලමණ්ඩල සාමාජිකයන් ඇතුළු වැඩිහිටි ප්‍රජාව එක්ව සිටියහ.

## රාමඤ්ඤ මහා නිකායේ නියෝජ්‍ය මහ ලේඛකාධිකාරී ධුරය අකරැල්ලේ ඤාණවංස හිමියන්ට



රත්නපුර ශ්‍රී ඤාණසීහ තපෝවන විහාරාධිපති අකරැල්ලේ ඤාණවංස හිමියෝ ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ නියෝජ්‍ය මහ ලේඛකාධිකාරී තනතුරට පත්කර ඇත. එම නිකායේ කාරක මහ සංඝ සභාව මගින් මේ පත්වීම සිදු කර තිබේ.

මෙතෙක් නියෝජ්‍ය මහ ලේඛකාධිකාරී තනතුර දැරූ නැදගමුවේ විජයමෛත්‍රී නාහිමියෝ අනුනායක පදවියට පත්වීම නිසා ඇති වූ පුරප්පාඩුවට මෙසේ ඤාණවංස හිමියෝ පත්කරනු ලැබූහ.

ඤාණවංස හිමියෝ 1995 වසරේ සිට රත්නපුර ප්‍රාදේශිය සංඝ සභාවේ ලේකම්වරයකු වශයෙන් කටයුතු කළහ. 2005 වර්ෂයේ රාමඤ්ඤ මහ නිකායේ පාලක සභාවටත්,2008 වර්ෂයේ කාරක සංඝ සභාවටත් පත්වූ උන් වහන්සේ 2012 වසරේදී නියෝජ්‍ය පටිපත්ති සංවර්ධන ලේඛකාධිකාරී ධූරයට පත්වූහ.2018 දීවෙල මහින්ද නාහිමියෝ අනුනායක පදවියට පත්වීමෙන් පසු පටිපත්ති සංවර්ධන ලේඛකාධිකාරී ධූරයට ඤාණවංස හිමියෝ පත්වූහ. උන් වහන්සේ ශ්‍රී ලංකා රාමඤ්ඤ මහ නිකායේ අනුනායක හා සබරගමුව විශ්ව විද්‍යාලයේ කුලපති පදවිය දැරූ මඩිතියවෙල විජිතසේන මාහිමිපාණන් වහන්සේගේ ශිෂ්‍යයෙකි.

## සියලු වැඩිහිටි නිවාස ප්‍රමිතිගත කර නැවත ලියාපදිංචි කිරීමට යයි

**සන්ධ්‍යා කරුණාරත්න**

මෙරට පිහිටි සියලු වැඩිහිටි නිවාස ප්‍රමිතිගත කර නැවත ලියාපදිංචි කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය තීරණය කරයි. රට පුරා වැඩිහිටි නිවාස 300ක් පමණ ස්ථාපිතව ඇති බවත් එම නිවාස ප්‍රමිති ගත කර ලියාපදිංචි කිරීමට සැලසුම් කර ඇති බවත් ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී මධුසංඛ ජයලාල් මහතා පැවැසීය.

සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ පැවැති මාධ්‍ය හමුවට සහභාගි වෙමින් ඒ මහතා මේ බව පෙරේදා (30) ප්‍රකාශ කළේය. රාජ්‍ය අංශයට අයත් වැඩිහිටි නිවාස හයක් ඇති අතර පෞද්ගලික අංශයට අයත් වැඩිහිටි නිවාස 294ක් ඇති බවත් ඇතැම් වැඩිහිටි නිවාසවල ප්‍රමිතිය සම්බන්ධයෙන් කිසිසේත්ම සෑහීමකට පත් විය නොහැකි බවත් ඔහු කීය.

## බන්ධනාගාරවල තදබදය අඩු කිරීමට ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලිය පිටිවහලක් කරගත හැකියි

### රාජ්‍ය ඇමැතිනී සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ



**බුද්ධිකා ඉඹුලාන**

බන්ධනාගාරවල පවතින අධික තදබදය අවම කිරීමට ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලිය මනා පිටිවහලක් කර ගත හැකි බව ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තු නිලධාරීන් හමුවේ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය ඇමැතිනි විශේෂඥ වෛද්‍ය සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය පැවැසුවාය..

බන්ධනාගාරගත වූවන්ගෙන් වැඩි පිරිස රිමාන්ඩ් සිරකරුවන් වන අතර ඔවුන්ගෙන් වැඩිපිරිසක් මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් අත්අඩංගුවට පත්වූවන් වන අතර ඉදිරි රස පරීක්ෂක වාර්තා අනුව ඔවුන් විශේෂ පුනරුත්ථාපන ක්‍රියාවලියකට යොමු කිරීමට සැලසුම් සකස් කරමින් සිටින බවත් ඒ සම්බන්ධයෙන් ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුවට විශාල කාර්ය භාරයක් පැවරෙන බවත් ඇමැතිනිය මෙහිදී වැඩිදුරටත් අවධාරණය කළාය.

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ ඉදිරි සැලසුම් පිළිබඳ අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ පැවැති සාකච්ඡාවකදී ඇමැතිනිය මේ බව සඳහන් කළාය.

කුමන හෝ හේතුවක් මත වරදකට යොමු වූ වැරැදිකරුවන්ගේ වරදකාරී චර්යාවන්ට හේතු සොයා ඊට පිළියම් යෙදීම මගින් නැවත නැවත වරදට යොමුවීම වළක්වා ඔවුන් සමාජයට වැඩදායි යහපත් පුද්ගලයන් ලෙස සමාජගත කිරීමට උත්සාහ ගන්නා ප්‍රජා පාදක විශෝධන නිලධාරීන්ගේ සේවය අගය කළ රාජ්‍ය ඇමැතිනිය ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලිය පිළිබඳ මීට වඩා සමාජය, ප්‍රජාව දැනුවත් කළ යුතු බව සඳහන් කළාය. ඒ සඳහා දිස්ත්‍රික් සංවර්ධන කමිටු, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මෙන්ම පළාත් පාලන ආයතන ආයතනවලද සහයෝගය ලබාගෙන පුළුල් ජනතා අවධානයකට යොමු කිරීම වැදගත්විය හැකි බවද ඇමැතිනිය මෙහිදී කීවාය.

බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යාං ශයේ ලේකම් ගීතාමනී කරුණාරත්න, ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ආර්.පී.එස්.සමන් කුමාරි, සහකාර කොමසාරිස්, ජ්‍යෙෂ්ඨ ප්‍රජා පාදක විශෝධන නිලධාරීන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක්වූහ.

## රාජ්‍ය ඇමැති කනක හේරත් නිරීක්ෂණ චාරිකාවක...



වැවිලි රාජ්‍ය ඇමැති කනක හේරත් මහතා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ නිරීක්ෂණ චාරිකාවකට පෙරේදා (30) එක් විය. එහිදී කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සියලු ප්‍රාදේශීය කාර්යාලවල කළමනාකාර නිලධාරීන් හා සභාපතිවරයා ඇතුළු විධායක ශ්‍රේණියේ නිලධාරීන් සමග හමුවක් අධිකාරියේ ප්‍රධාන කාර්යාල ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. රාජ්‍ය ලේකම් තිලකරත්න බණ්ඩා මහතා ද මේ අවස්ථාවට සහභාගි වූ අතර එහිදී තේ වතු හිමියන්ගේ ජීවන මට්ටම නගාසිටුවීමට ගත හැකි ඉදිරි පියවර, තේ දලු නිෂ්පාදනය ඉහළ දැමීම, තේ දලුවල ගුණාත්මක භාවය ඉහළ දැමීම හා තේ නිෂ්පාදනයේ නිවැරැදි හා නව ක්‍රමවේද කුඩා තේ වතු හිමියන්ට හඳුන්වාදීම, සහනාධාර ලබාදීම තේ සමිති ප්‍රතිසංවිධාන කිරීම ආදී කරුණු රැසක් සම්බන්ධයෙන් සාකච්ඡා කෙරිණි.

# 'මෝඩීස්' තොරතුරු දැනගෙනයි අපේ රටේ ණය අවදානම ගැන පූර්වකථනය කරන්නේ

## අපේ රටේ ආර්ථිකය බලාගෙන සිටියදී කඩා වැටෙනවා

### පාර්ලිමේන්තු මන්ත්‍රිනී රෝහිණී කවිරත්න



**උකුවෙල සංචාරක**
**ප්‍රියන්ත සුමනසේන**

අපේ රටේ ආර්ථිකය බලාගෙන සිටියදී කඩාවැටෙමින් තිබෙනවා. ලෝකයේ ණය ශ්‍රේණිගත කිරීමේ කීර්තිමත් ආයතනයක් වන ණය ශ්‍රේණිගත කිරීම් අනුව, ලංකාව B 2 සිට Caa 1 දක්වා පල්ලම් බැහැලා තියෙනවා. මේ අවුරුද්දේ ලංකාවේ එක් පුරවැසියෙක් රු. 37,000කින් දුප්පත් වෙනවායැයි සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රිනී රෝහිණී කවිරත්න මහත්මිය රත්තොටදී පැවැසුවාය.

ලංකාවේ ආර්ථික සමෘද්ධිය ගැන ආණ්ඩුව පම්පෝරි ගහනවා. 2019 අවසන් වෙනකොට ලංකාවේ සමස්ත ආර්ථකයේ වටිනාකම අමෙරිකානු ඩොලර් බිලියන 84යි. 2020 අවසන් වෙනකොට ලංකාවේ සමස්ත ආර්ථකයේ වටිනාකම අමෙරිකානු ඩොලර් බිලියන 78ක් දක්වා අඩු වෙනවා .2019 වසරේ, ලංකාවේ ඒක පුද්ගල ආදායම, අමෙරිකානු ඩොලර් 3800යි. 2020 දී එය ඩොලර් 3600 දක්වා, ඩොලර් 200කින් පහත වැටෙනවා. එක පුද්ගලයෙක් ඩොලර් 200 කින් දුප්පත් වෙනවා.

අන්තර්ජාතික ණය වර්ගීකරණය පිළිබඳ MOODY'S ආයතනය මේ කතාව ආර්ථික විද්‍යාවේ භාෂාවෙන් B 2 සිට Caa 1 දක්වා පල්ලම් බස්සලා තියෙනවා. දැන් අප ඉන්නේ, මොසැම්බික්, කියුබාව, බෙලීස්, බාබඩෝස්, වෙනිසියුලාව වගේ රටවල් එක්කයි. එයින් කියවෙන්නේ, ලෝකයේ කිසිම රටක්, සංවිධානයක් අපට තවදුරටත් ණය දෙන්න කැමති වෙන්නේ නෑ. බංකොළොත් තත්ත්වයට පත් වෙමින් තිබෙන රටක් බවට අප පත් වෙනවා කියන එකයි.

මෝඩීස් ආයතනය කියන්නේ වසර 111 ක් පැරණි, ලොව පිළිගත් ජාත්‍යන්තර බැඳුම්කර ශ්‍රේණිගත කිරීමේ ආයතනයක්. රටේ ආර්ථික තත්ත්වය, ප්‍රතිපත්ති හා දේශපාලන කරුණු සැලකිල්ලට අරගෙන තමයි ඔවුන් ණය අවදානම ගැන පූර්වකතනය කරන්නේ. මීට කලින්, ලංකාව FITCH RATING ආයනය විසින් පහළ ශ්‍රේණියකට ඇදලා දැම්මා. එයින් රටේ ආර්ථිකය බිඳවැටෙමින් තිබෙන බවට පැහැදිලි අනතුරු ඇඟවීමක් ලෝකයට ලැබුණා.

ලංකාවේ ණය ප්‍රමාණය දළ ජාතික නිෂ්පාදිතයේ මට්ටමට ළඟාවෙලා තිබෙනවා. අය වැය හිඟය 8% ඉක්මවීමට ආසන්න වෙලා තියෙනවා. රටේ උද්ධමනය පැහැදිලිව පේනවා.

ඉදිරි වසර පහේ ලංකාව ණය හා ණය වාරික විදිහට ඩොලර් බිලියන 4ක් ගෙවිය යුතුයි. ලබන මාසයේ භාණ්ඩාගාරය sovereign bond අමෙරිකානු ඩොලර් බිලියනයක් පියවිය යුතුයි. නව තත්ත්වය යටතේ කිසිවෙකුත් ලංකාවට ණය ආධාර ලබාදීමට ඉදිරිපත් වෙන්නේ නෑ. එයින් රටේ ආර්ථිකය තවදුරටත් ප්‍රපාතයට ඇඳ වැටෙනවා.

ආනයන නතර කිරීම නිසා රටට දිගු කාලීන ගැටලු මතුවිය හැකියි. අප අමෙරිකාව, යුරෝපා සංගමය, එංගලන්තය කියන මෙරට අපනයන ආදායමෙන් 65% කට වැඩි පංගුවක් සම්පාදනය කරන රටවල් සමග වෙළෙඳ අරියාදුවක් ඇති කර ගනිමින් සිටිනවා. මෙය දේශපාලනික අර්බුදයක් දක්වා වර්ධනය වෙන්නට පුළුවන් යැයි ද කවිරත්න මහත්මිය පැවසුවාය.

මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් ආණ්ඩුවේ ප්‍රතිපත්ති තීරකයෝ එක්ක ගැටෙනවා. නිලධාරීන් කලින් විශ්‍රාම යනවා. එළිපිටම මුදල් අමාත්‍යාංශයේ ලේකම් විවේචනය කරනවා අප දැක්කා. ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ගනුදෙනු නොකර චීනය සමග ගනුදෙනු කිරීමේ ප්‍රතිඵල අප විඳිමින් සිටිනවායැයි ද කවිරත්න මහත්මිය පැවසුවාය.

## ජනපති ගෝඨාභය ආරක්ෂක ලේකම්ව සිටියදී

# කොළඹ කුණු කසළ ගැන කිසිම ගැටලුවක් තිබුණේ නෑ

### පොලිතීන් නිෂ්පාදනය හා ප්‍රතිචක්‍රීය කරන්නන්ගේ සංගමයේ සභාපති අනුර විජේතුංග

**අනුර ප්‍රේමලාල්**

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ආරක්ෂක ලේකම්ව කටයුතු කළ සමයේ සිදුකළ ආකාරයට යළි කුණු කසළ කළමනාකරණය කිරීමට වර්තමාන නිලධාරීන් ක්‍රියාත්මක වුණොත් මේ රටේ කුණු කසළ ගැටලුවක් මතු නොවන බව සමස්ත ලංකා පොලිතින් නිෂ්පාදනය කරන්නන්ගේ හා ප්‍රතිචක්‍රීකරන්නන්ගේ සංගමයේ සභාපති අනුර විජේතුංග මහතා ප්‍රකාශ කරයි.

ඒ මහතා මේ බව සඳහන් කළේ පසුගියදා (29) රාජගිරියේ පිහිටි එම කාර්යාලයේ පැවැති මාධ්‍ය හමුවකට එක්වෙමිනි. එහිදී වැඩිදුරටත් සභාපතිවරයා මෙසේද කීය. පොලිතින් නිෂ්පාදනය කරන සෑම නිෂ්පාදකයෙක්ම ප්‍රතිචක්‍රීකරණය කළ යුතුයි. පොලිතින් නිෂ්පාදනය කරන ආයතන අටසීයක්,නවසීයක් පමණ තිබෙනවා. ඉන් අපේ සංගමයේ සාමාජිකයන් එකසිය පනහක් පමණ සිටිනවා. පුද්ගලයන් ලෙස ගත්තොත් මේ ක්ෂේත්‍රයේ සෘජු රැකියාවල හතළිස් දහසක් පමණ නිරතව සිටිනවා. මේ කර්මාන්තශාලාවල විසිපහේ සිට සීය එකසිය පනහ දක්වා රාජකාරි කරන සේවක පිරිස් සිටිනවා. අපේ බඩු අරගෙන ගිහිල්ලා බෙදාහැරීමේ කටයුතු කරන අයත් සමග සලකා බැලුවොත් මේ ක්ෂේත්‍රයේ ලක්ෂ තුනක් පමණ යැපෙන පිරිස් සිටිනවා.

### ඒ කාලයේ මේවා සිදු වුණේ කොහොමද කියා අධ්‍යයනයක් කරන්නවත් නිලධාරීන් උත්සාහ කරන්නේ නෑ

වසර 2006දී නීතියක් ගෙනාවා මයික්‍රෝ විස්සට අඩු පොලිතින් භාවිතය තහනම් කියලා. කියන්න කනගාටුයි ඒ නීතිය අදටත් හරියට ක්‍රියාත්මක වෙන්නේ නැහැ.ඒ නීති හරියට ක්‍රියාත්මක කරගන්න වැඩපිළිවෙළක් නැතිව තියෙද්දි යළි 2016දී පරිසර අධිකාරිය හා පරිසර අමත්‍යාංශය එක්වී යළි තවත් නීතිරීති හඳුන්වාදීමක් කළා. ඒ නීතිරීති සකස් කළේ අපව සම්බන්ධ කරගන්නේ නැතිවයි. ඒ නිසා මහමඟට බැහැලා අප විරෝධතා පවා පැවැත්වුවා. එහිදී පොලිතින්වලින් නිෂ්පාදනය කරන ලන්ච් ෂීට් එක සම්පූර්ණයෙන් තහනම් කළා. එහිදී ඒ සඳහා විකල්ප තීරණයක් ලබා දුන්නා, ජෛව හායනයට ලක්කරන අමුද්‍රව්‍යවලින් ලන්ච් ෂීට් නිෂ්පාදනය කරන්න කියලා. එය හොඳ තීරණයක්. ඒක මාස තුනක් පමණ වනවිට සම්පූර්ණයෙන්ම දිරාපත් වී පොළොවට පස්වෙනවා. ඒ නීතිය වැඩිම වුණොත් මාස තුනක් ක්‍රියාත්මක වෙන්න ඇති. එහෙත් තවමත් වෙළෙඳපොළේ 99%ක් තියෙන්නේ දිරන්නේ නැති පොලිතින්වලින් නිෂ්පාදනය කළ ලන්ච් ෂීට් බව කියන්න ඕනෑ. එහිදී හඳුන්වා දුන් දෙවන නීතිය වන්නේ එච්.ඩී.පි.නම් ඝනත්වයෙන් වැඩි ලෝකයේ මෑත කාලයේ හඳුන්වා දුන් අමුද්‍රව්‍ය භාවිතයට ගැනීමට තීරණය කිරීමයි. ඒ අමුද්‍රව්‍යයෙන් තමයි බෑග් නිෂ්පාදනය කළේ. ඊට පසු තීරණයක් ගෙනාවා එල්.ඩී.පි. කියලා ඝනත්වයෙන් අඩු ද්‍රව්‍යයකින් බෑග් නිෂ්පාදනය කරන්න කියලා.

ඒ නිසා අද වෙළෙඳසලකට ගිහිල්ලා භාණ්ඩ මිලදී ගත්තාම බෑග් එකක් නොවේ දෙක තුනක් යොදාගෙනයි භාණ්ඩ දමා දෙන්නේ. බෑග්වල සවි ශක්තිය නැති නිසා. ඒ නිසා දැන් ලංකාවට ගෙන්වන අමුද්‍රව්‍ය ප්‍රමාණය සීයට සීයකින්ම වැඩිවෙලා තියෙනවා.

නීති ප්‍රතිපාදන ශක්තිමත් නැහැ. ඒ නිසා නීති නිසිලෙස ක්‍රියාත්මක නොවෙන බව තමයි අප දකින්නේ. කසළ නිසි ලෙස කළමනාකරණය කළා නම් අද කසළ හෝ පොලිතින් ප්‍රශ්නයක් නැහැ. වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ආරක්ෂක ලේකම් ලෙස කටයුතු කරන සමයේ කොළඹ කුණුකසළ ගැන කිසිම ගැටලුවක් තිබුණේ නැහැ. ඒ සමයේ මේවා සිදුවුණේ කොහොමද කියලා අධ්‍යයනයක් කරන්නවත් නිලධාරින් උත්සාහයක් ගන්නේ නැහැ. නිලධාරින් කරන්නේ ආණ්ඩුවක් පැමිණි විගස ලිපිගොනුවක් අරගෙන ඇමැති හමුවට ගිහිල්ලා කියනවා කසළ කළමනාකරණ කිරීමට තහනම් කළ යුතු භාණ්ඩ ලැයිස්තුවක් ඉදිරිපත් කරනවා. භාණ්ඩ තහනම් කර කසළ කළමනාකරණය කරනවානම් අපට පරිසර අධිකාරිය අවශ්‍ය නැහැ.




නිලානි රත්නායක කටාර් ආසියානු මලල ක්‍රීඩා ශූරතාවලියේදී

# වසර 2ක මලල ක්‍රීඩා ව්‍යාපෘතිය වෙනුවෙන්

# ජගත් සංගමයෙන් ශ්‍රී ලංකාවට ඩොලර් 80000ක්

**ප්‍රින්ස් ගුණසේකර**

වසර 2024 ඔලිම්පික් උලෙළ ඉලක්ක කරගනිමින් ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමය සැලසුම් කළ වසර 2ක මලල ක්‍රීඩා ව්‍යාපෘතිය වෙනුවෙන් ශ්‍රී ලංකාවට අමෙරිකානු ඩොලර් 80000ක් ලබාදීමට අන්තර්ජාතික මලල ක්‍රීඩා සම්මේලනය කැමැත්ත පළ කරයි. තරග ඉසව් 3ක ක්‍රීඩක ක්‍රීඩිකාවන් 15ක් පමණ ඉලක්ක කොට දියත් කරන මෙම වැඩ සටහනට මුල් වසර දෙකේදී අන්තර්ජාතික මලල ක්‍රීඩා සම්මේලනය මුදල් ලබා දෙන අතර ඉදිරි වසර දෙකක කාලය සඳහා ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමය අනුග්‍රාහකයන් හා රජයේ සහයෝගය මත ඉලක්ක සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ.

මීටර් 3000 කාන්තා බාධක දිවීම, මීටර් 400 පිරිමි හා කාන්තා සහය දිවීමේ කණ්ඩායම් මෙම වසර 2ක මලල ක්‍රීඩා ව්‍යාපෘතිය වෙනුවෙන් සම්පූර්ණයෙන් ඉලක්ක ගත වන අතර ඔවුන්ගේ විටමින් හා පෝෂණය, පුහුණු කටයුතු වෙනුවෙන් වැයවන මුදල්, පුහුණුකරු දීමනා හා ක්‍රීඩා උපකරණ සැපයීම ව්‍යාපෘතියට ඇතුලත් වේ. මේ සඳහා වසරකට අමෙරිකානු ඩොලර් 40000ක් ජාත්‍යන්තර මලල ක්‍රීඩා සම්මේලනය ලබාදේ.

මීටර් 3000 කාන්තා බාධක දිවීමේ ඉසව්වේ ඉදිරියෙන්ම සිටින ශ්‍රී ලංකා වාර්තාව හිමි නිලානී රත්නායක, යොවුන් ඔලිම්පික් පදක්කම් දිනාගත් පාරමී වසන්තී හා මීටර් 2000 බාධක දිවීමේ කාන්තා ආසියානු ලෝකඩ පදක්කම දිනාගත් අශ්මිකා හේරත් මෙම මලල ක්‍රීඩා ව්‍යාපෘතිය වෙනුවෙන් තෝරාගෙන ඇති අතර අරුණ දර්ශන, පසිඳු කොඩිකාර හා අවිශ්ක සංදේශ් මීටර් 400 සහය දිවීමේ ක්‍රීඩකයන් ලෙස හඳුනාගෙන ඇත. අනෙක් සහය දිවීමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ලබන මස 22 කොළඹ සුගතදාස ක්‍රීඩාංගණයේදී ආරම්භ වන ශ්‍රී ලංකා කනිෂ්ඨ මලල ක්‍රීඩා තේරීම් තරගාවලිය අවසානයේ නම් කිරීමට නියමිතය.

මෙම නව වැඩ සටහන සඳහා වයස අවුරුදු 20ත් 24ත් අතර ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට වැඩි අවස්ථාවක් ලබාදීමට ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමය අපේක්ෂා කරයි. එම වයස් සීමාවෙන් එපිට සිටින එකම ක්‍රීඩිකාව නිලානී රත්නායක පමණි. ඇය මෙම වැඩ සටහනට ඇතුළත් කිරීමට ආසන්නතම හේතුව වන්නේ මීටර් 3000 බාධක දිවීමේ කාන්තා ඉසව්වෙන් ලෝකයෙන්ම දැනට 30 වැනි ස්ථානයේ සිටින ක්‍රීඩිකාව බැවිනි. ලබන වසරේ පැවැත්වෙන ටෝකියෝ ඔලිම්පික් උලෙළට මීටර් 3000 බාධක දිවීමේ කාන්තා ඉසව්වෙන් ක්‍රීඩිකාවන් 45ක් තෝරා ගැනීමට නියමිත බැවින් ඇය එම උලෙළට ශ්‍රී ලංකාව නියෝජනය කිරීමේ වැඩි අවස්ථා ඇත.

එක් අවස්ථාවකදී ඇය මීටර් 3000 බාධක දිවීමේ කාන්තා ඉසව්වෙන් ලෝකයේ 25 වැනි තැනට පත් වූ ක්‍රීඩිකාව වන අතර ලෝක ආරක්ෂක සේවා මලල ක්‍රීඩා තරගාවලියේ 5වැනි ස්ථානයට පත්වෙමින් ප්‍රබල දස්කම් දැක්වූවාය. එමෙන්ම කටාර් ආසියානු මලල ක්‍රීඩා ශූරතාවලියේදී පදක්කම පෙනි පෙනී තරග අවසානයට මීටර් කිහිපයක් තිබියදී ඇද වැටීමෙන් පදක්කම අහිමිවී ගියාය.

සහාය දිවීමේ කණ්ඩායම් ද සැලකිය යුතු දස්කම් දක්වා ඇති හෙයින් මෙම වැඩ සටහනට තෝරා ගෙන ඇති අතර පින්ලන්තයේ ලෝක කනිෂ්ඨ මලල ක්‍රීඩා ශූරතාවලියේදී අවසන් මහා තරගයට එක්වීම හා 2018 ආසියානු ශූරතාවලියේදී පදක්කමක් දිනා ගැනීම සැලකිල්ලට ගෙන ඇත.

# රාජස්තාන් පළමු පරාජය අත්විඳී

ජොෆ්රා ආචර් ප්‍රමුඛ පන්දු යවන්නන් කල්කටා නයිට් රයිඩර්ස් පිලේ ඉනිම ලකුණු 174කට සීමා කිරීමට සමත් වූවත් සිය පිතිකරුවන්ට ලකුණු අතරට පිවිසීමට නොහැකිවීමෙන් මෙවර අයිපීඑල් තරගාවලියේ පළමු පරාජය අත්විඳීමට රාජස්තාන් රෝයල්ස් පිලට සිදු විය.

ඩුබායි නුවර පෙරේදා රාත්‍රී පැවැති මේ තරගයේ කාසියේ වාසිය දිනූ රාජස්තාන් රෝයල්ස් පිලේ ඇරියුමෙන් පළමුව පන්දුවට පහර දුන් කල්කටා පිල නියමිත ඕවර 20 අවසානයේ කඩුලු 6ක් දැවී රැස් කළේ ලකුණු 174ක් පමණි. එහෙත් කල්කටා පන්දු යවන්නන්ගේ ආක්‍රමණශීලී පන්දු යැවීම හමුවේ පිළිතුරු ඉනිම ක්‍රීඩා කළ රාජස්තාන් රෝයල්ස් පිලට ඕවර 20 අවසානයේ රැස් කිරීමට හැකි වූයේ කඩුලු 9කට ලකුණු 137ක් පමණි.

ඒ අනුව ලකුණු 37ක ජයක් ලැබූ කල්කටා පිල ප්‍රසාද ලකුණු සටහනේ 7 වැනි තැන සිට දෙවැනි තැනට පත් වීමට සමත් විය.

## පැරිස් තරග බිමෙන්

# සෙරීනා ඉවතට

ප්‍රංශ විවෘත ටෙනිස් ශූරතා ත්‍රිත්වයක් දිනා සිටින අමෙරිකාවේ සුපිරි ක්‍රීඩිකා සෙරීනා විලියම්ස් පාදයේ ආබාධයක් හේතුවෙන් දෙවැනි වටයට සහභාගි නොවී තරගාවලියෙන් ඉවත් වූවාය.

පසුගිය 27 වැනිදා පැරිසියේදී ආරම්භ වූ මේ තරගාවලියේ පළමු වටයේදී සිය රටෙහිම ප්‍රතිවාදී ක්‍රීඩිකා ක්‍රිස්ටීන් ආන් පරාජය කරමින් දෙවැනි වටයට පිවිසි සෙරීනා බෙල්ජියමේ කිරිලෝවා පිරොන්කෝවා සමඟ තරග වැදීමට නියමිතව තිබුණත්, කලක් තිස්සේ වේදනා විඳිමින් සිටින ඇගේ පාදයේ ආබාධය නිසා තරගාවලියෙන් ඉවත්වූ යේ ප්‍රතිවාදී ක්‍රීඩිකාවට ජයග්‍රහණය පිරිනමමිනි.

වසර දෙකක කාලයක් පුරා ලොව වැඩිම ග්‍රෑන්ඩ් ස්ලෑම් ටෙනිස් ශූරතා දිනා ගත් ක්‍රීඩිකාවගේ වාර්තාව සම කිරීමේ අරමුණින් ක්‍රීඩා කරමින් සිටින 39 හැවිරිදි සෙරීනාට මෙවර ද එම අවස්ථාව අහිමි විය.

'මම හිතන්නේ මට සති 6ක් පමණ විවේක ගැනීමට සිදු වේවි. අමෙරිකානු විවෘත තරගාවලියට මම ක්‍රීඩා කළෙත් මේ ආබාධය දරාගෙනයි ' තරගාවලියෙන් ඉවත් වීමෙන් පසු ඇය මාධ්‍යයට පැවැසුවාය.

'මම හිතන්නේ නෑ මේ වසරේදි මම තවත් තරගාවලියකට ක්‍රීඩා කිරීමට හැකි වේවි කියලා.' ඇය එසේ ද කීවාය.

වසර 2002, 2013 සහ 2015දී ප්‍රංශ විවෘත ටෙනිස් කිරුළ දිනූ සෙරීනා වර්තමානයේ ලෝක කාන්තා ටෙනිස් ශ්‍රේණිගත කිරීම්වල 9 වැනි ස්ථානයේ පසුවන්නීය.







## 42 වන ඔබ්සවර් - මොබිටෙල්

### වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව - 2020

ඔබේ ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයාට / ක්‍රීඩිකාවට මනාපය පළ කර ඔහුව / ඇයව වසරේ ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව කිරුළ දක්වා රැගෙන යන්න.

☐ **වඩාත්ම ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/2020 වයස අවු. 19 න් පහළ "පළමු, දෙවන සහ තෙවන කාණ්ඩ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරඟ වදින ක්‍රිකට් ක්‍රීඩකයින්, මනාප ලැබීමට සුදුසු වේ.

☐ **වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩිකාව 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/20 වයස අවු. 19 න් පහළ "සමස්ත ලංකා අංශයේ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරඟ වදින ක්‍රිකට් ක්‍රීඩිකාවන් මනාප ලැබීමට සුදුසු වේ.

ඔබේ ක්‍රීඩකයා : ....................

අංශය: පළමු කාණ්ඩය ☐ දෙවන කාණ්ඩය ☐ තෙවන කාණ්ඩය ☐

සමස්ත ලංකා ක්‍රීඩිකාව: ....................

**(එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ)**

පාසල : ....................

ඔබේ නම : ....................

ලිපිනය : ....................

ජංගම දුරකථන අංකය : ....................

SUNDAY OBSERVER

vote.schoolcricketer.lk වෙත පිවිසීමෙන්ද ඔබගේ මනාපය ප්‍රකාශ කළ හැක.

**කූපන්පත් එවා සතිපතා ත්‍යාග දිනාගන්න.**

**ප්‍රථම ත්‍යාගය** : Mobitel 4G Wi-Fi router **දෙවන ත්‍යාගය** : රු. 2,500/-
**තෙවන ත්‍යාගය** : රු. 1,500/- **හතරවන ත්‍යාගය** : රු. 1,000/-

42 වන ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව නම් කිරීමේ තරඟාවලිය දැන් ආරම්භ කර ඇත. සම්පූර්ණ කරනලද ඉහත කූපනය ක්‍රීඩා සංස්කාරක, සන්ඩේ ඔබ්සවර්, ලේක්හවුස්, කොළඹ 10 වෙත තැපැල් කරන්න.

**කොන්දේසි :**

1) එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ.
2) ලේක්හවුස් හෝ මොබිටෙල් ආයතනයේ සේවක / සේවිකාවන්ගේ දූ දරුවන්ට තරගයට සහභාගි විය නොහැක.
3) ජයග්‍රහණය කරනු ලබන අයට මුදල් / කුසලාන හා සහතිකපත් හිමි වේ. සෑම කූපනයකම එක් ක්‍රීඩකයෙකු පමණක් නම් කළ හැකි අතර, එය එක් තරඟ වාරයක් සඳහා පමණක් වලංගු වේ. තරඟාවලියේ අවසාන තීරණය සන්ඩේ ඔබ්සවර් ක්‍රීඩා සංස්කාරක සතු වේ.

**දිනය** 2020-10-03 **අංකය** 30





# එන්.එම්. පෙරේරා ක්‍රීඩාගාරය රාත්‍රී 9 දක්වා විවෘතයි

**ආරියරත්න ගනේගොඩ**
**මැදකොළඹ සමූහ**

ආචාර්ය එන්.එම්.පෙරේරා ක්‍රීඩාගාරය පෙරවරු 8.00 සිට රාත්‍රී 9.00 දක්වා විවෘත කර තරුණ පිරිසට වැඩි අවස්ථාවක් සලසා දෙන ලෙස කොළඹ මහ නගරසභා නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා වික්‍රමසිංහ මහත්මිය කළ ඉල්ලීමකට පුරපතිනි රෝසි සේනානායක මහත්මිය අනුමැතිය ලබා දුන්නාය.

# මන්චි ජාතික වොලිබොල් ශූරතාවලිය 16 දා ඇරඹේ




සිලෝන් බිස්කට්ස් සමාගමේ අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී නලීන් කරුණාරත්න මහතා තරගාවලියේ අනුග්‍රාහකත්වය ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ සභාපති, පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කථානායක රංජිත් සියඹලාපිටිය මහතා වෙත පිරිනැමූ අයුරු. වොලිබෝල් සම්මේලනයේ ලේකම් ඒ.එස්. නාලක, භාණ්ඩාගාරික තුෂාර පෙරේරා, සිලෝන් බිස්කට් සමාගමේ රොමේෂ් ජයතිලක සහ ජානක බොතේජු මහත්වරු ද මෙහි වෙති. ඡායාරූපය - රංජිත් අසංක

## ආධුනික තරගාවලියේදී ස්ථිර පදිංචිකරුවන්ට වැඩි අවස්ථාවක්

**නිරෝෂාන් ප්‍රියංකර**

ශ්‍රී ලංකා වොලිබොල් සම්මේලනය සිලෝන් බිස්කට් සමාගමේ මන්චි අනුග්‍රහයෙන් සංවිධාන කරන 'මන්චි ජාතික වොලිබොල් ශූරතාවලිය' මේ මස 16 වැනිදා ආරම්භ වෙයි.

මේ ශූරතාවලියට මන්චි අනුග්‍රහය දෙන 13 වන අවස්ථාව මෙයයි. තරගාවලිය පිළිබඳ මාධ්‍ය දැනුවත් කිරීමේ හමුව සහ අනුග්‍රාහකත්වය පිරිනැමීම පෙරේද කොළඹ ටාජ් සමුද්‍ර හෝටලයේදී සිදු කෙරිණි.

මෙහිදී අදහස් දැක්වූ නියෝජ්‍ය කථානායක සහ ශ්‍රී ලංකා වොලිබොල් සම්මේලනයේ සභාපති රංජිත් සියඹලාපිටිය මහතා කියා සිටියේ පසුගිය කාලය දෙස බැලීමේදී වොලිබොල් ක්‍රීඩාව ගැන මේ වසරේ සතුටට පත් විය හැකි බවයි.

ලෝක ශ්‍රේණිගත කිරීම්වල ඉදිරියට ඒමට හැකිවීම සහ සම්මේලනයක් ලෙස කලක් තිස්සේ පැවැති සිහිනයක් සැබෑ කර ගැනීමට හැකි වීම ඊට හේතු වූ බව ද ඒ මහතා කීය.

"ලෝකයේ රටවල් 222ක් වොලිබෝල් ක්‍රීඩා කරනවා. මීට වසර 9කට පමණ පෙර ශ්‍රී ලංකාව ඒ අතරේ 112 වැනි ස්ථානයේ පසු වුණා. වසර තුනකට පෙර අප ක්‍රීඩා භාර ගනිද්දී 70 වැනි ස්ථානයේ සිටි ශ්‍රී ලංකාව 60 වැනි ස්ථානය දක්වා ඉදිරියට ගෙන ඒමට හැකිවීම පැහැදිලි ජයග්‍රහණයක්." යැයි කී සියඹලාපිටිය මහතා වසර 13ක් පුරා ජාතික තරගාවලියට පූර්ණ සහයෝගය දීමෙන් මන්චි ආයතනය ද මෙහි කොටස්කරුවන් වූ බව ද පැවැසීය.

එමෙන්ම කොරෝනා වසංගතය හමුවේ ආර්ථිකයට දැඩි බලපෑම් එල්ල වී තිබියදී මේ වසරේ තරගාවලි පැවැත්වීමට මන්චි ආයතනය සහයෝගය ලබාදීම අගය කළ යුතු බව ද ඒ මහතා කියා සිටියේය.

ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතා විසින් සම්මේලනයට ගෘහස්ථ ක්‍රීඩාංගණයක අයිතිය පිරිනැමීම පිළිබඳ අදහස් දැක්වූ සියඹලාපිටිය මහතා "මෙරට වොලිබෝල් ක්‍රීඩකයන්ගෙන් 95%ක් එළිමහනේ පුහුණුවීම් කරන්නේ. ඒත් ලොව ජය ගැනීමට යැමේදී මේ ක්‍රීඩකයන් පුහුණු කිරීම දැඩි අභියෝගයක් වුණා. ඒ රටේ ජාතික ක්‍රීඩාව වන වොලිබෝල් ක්‍රීඩාවට සම්මේලනය සතුව ගෘහස්ථ ක්‍රීඩාගාරයක් නැති වීම නිසා. ඊට ඉඩමක් සොයමින් සිටියදී වත්මන් ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතා සමග පැවැති පළමු සාකච්ඡාවෙන්ම එතුමා අපට ගාල්ලෙන් අංග සම්පූර්ණ ක්‍රීඩාංගණයක් දුන්නා. ඒ ගැන එතුමාට ස්තුතිවන්ත වෙනවා." යැයි පැවැසීය.

ජාතික ශූරතාවලිය මෙවරත් කාන්තා/පිරිමි සුපර් ලීග් සහ ආධුනික ලෙස කොටස් දෙකකින් සමන්විතව පැවැත්වේ.

මෙරට ආයතන වශයෙන් ප්‍රබල පිරිමි කණ්ඩායම් 8ක් සහ කාන්තා කණ්ඩායම් 6ක් සුපිර් ලීග් තරගාවලියට එක් වෙයි. පිරිමි තරගාවලියට පසුගිය වසරේ ආධුනික ශූරයන් වූ ඕෂන් ලංකා ආයතනය එක්ව ඇති අතර, කාන්තා තරගාවලිය පසුගිය වසරේ ආධුනික අවසන් තරගයට සුදුසුකම් ලැබූ හයිඩ්‍රාමනී සහ මහැස්වැව රතනපාල කණ්ඩායම් එක්ව සිටී.

ඒ අනුව ශ්‍රී ලංකා යුද හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය කාන්තා පිරිමි දෙඅංශයෙන්ම තරග වදින අතර, ජාතික තරුණ සේවා සභාව, ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය, ශ්‍රී ලංකා පොලීසිය සහ ඕෂන් ලංකා පිරිමි තරගාවලියටත්, හයිඩ්‍රාමනී ආයතනය සහ මහැස්වැව ක්‍රීඩා සමාජය කාන්තා තරගාවලියටත් එක් වෙයි.

ආධුනික තරගාවලියට අයැදුම්පත් පත් බාර ගැනීම මේ මස 15 වැනිදා අවසන් වන අතර, තරගාවලිය 16 ද ආරම්භ වෙයි. දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වෙන මූලික තරග නොවැම්බර් 15 අවසන් වන අතර, එහි ජයග්‍රාහකයන් ජාතික තරගාවලියට සුදුසුකම් ලබයි. එම තරග නොවැම්බර් 21-22 දිනවල පැවැත්වෙයි. දිස්ත්‍රික් ක්‍රීඩකයන්ට වැඩි අවස්ථාවක් දීමේ අරමුණින් මෙවර ආධුනික තරගාවලියේ නීති සංශෝධනය කිරීමට වොලිබෝල් සම්මේලනය කටයුතු කර ඇත. ඒ අනුව දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචි ක්‍රීඩකයන් 9 දෙනෙකු කණ්ඩායමට එක් විය යුතු අතර, පිටතින් කණ්ඩායමට එක් විය හැක්කේ 5 දෙනකුට පමණි.

මේ සුපර් ලීග් සහ ආධුනික තරග ගාල්ලේදී පැවැත්වෙන අතර, අවසන් තරග නොවැම්බර් 28 මහරගම තරුණ සේවා සභා ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පැවැත්වීමට නියමිතය.

කෙසේ වෙතත් වොලිබොල් සම්මේලනයේ ලේකම් ඒ.එස්. නාලක මහතා පැවැසුවේ අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් අවසන් තරග පැවැත්වෙන බැවින් දිනය සහ ස්ථානය වෙනස් විය හැකි බවයි.

සිලොන් බිස්කට්ස් සමාගමේ අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී නලීන් කරුණාරත්න මහතා ද මෙහිදී අදහස් දැක්වීය.

2020 ඔක්තෝබර් 02 සිකුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

# දිසත
දස අත ම එක තැන

■ බී.එම්. විජේසූරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ

## වෙළෙඳ සල්වලින් දේපල සොරාගත් කල්ලියක 5ක් දැලේ

දිවයිනේ විවිධ පොලිස් වසම්වල සැරිසරමින් නිම් ඇදුම්, ලිහිසි තෙල් සහ සාප්පු බඩු අලෙවි කරනා ස්ථාන බිඳ රුපියල් ලක්ෂ සියයකට අධික දේපල සොරාගත් හෙරොයින් පානයට ඇබ්බැහිව සිටින සංවිධානාත්මක අපරාධ කල්ලියක සාමාජිකයන් පස් දෙනකු අනුරාධපුර කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ ඒකක තුනෙහි ස්ථානාධිපතිවරයා ඇතුළු නිලධාරින් මගින් අත්අඩංගුවට ගෙන තිබේ.

හෙරොයින් ග්‍රෑම් දාහතරක් ළඟ තබා ගෙන සිටියදි පසුගියදා මිහින්තලය පොලීසිය මගින් අත්අඩංගුවට ගත් සැකකරුවන් තිදෙනකු පිළිබඳ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කේ. එල්. ගීගනගේ මහතාගේ උපදෙස් මත අනුරාධපුර කොට්ඨාස අපරාධ විමර්ශන අංශය මීට පෙර සිට සිදුකළ විමර්ශනවලට අනුව ඔවුන් අපරාධ කල්ලියක් බව තහවුරු කරගෙන තිබු අතර මිහින්තලය පොලීසිය ඔවුන් අත්අඩංගුවට ගැනීමෙන් පසුව ඒකක තුනේ නිලධාරින් සිදුකළ විමර්ශනවලදි සැකකරුවන් සිදුකළ සොරකම් විස්සකට අධික ප්‍රමාණයක් පොලීසිය අනාවරණය කරගෙන ඊට සම්බන්ධවූ තවත් සැකකරුවන් දෙදෙනකු අත්අඩංගුවට ගෙන තිබිණි.

■ වජිර පුජිත ගුණවර්ධන - තෙලිජ්ජවිල සමූහ



## අත්හැර දමා තිබූ දැරංගල බෙහෙත් ශාලාව අලුත්වැඩියා කරයි

දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රදේශයේ අසරණ ජනතාවට පිළිසරණක් වූ දැරංගල ජනපදයේ තුන්වැනි පියවරේ පිහිටි රජයේ බෙහෙත් ශාලාව පසු ගිය සමයේ අත්හැර දමා තිබූ අතර ජනපදවාසීන් මේ හේතුවෙන් බලවත් පීඩාවට පත්විය. මේ තත්වය නිසා රෝගී ජනතාවට වෛද්‍ය ප්‍රතිකාර සඳහා සැතපුම් පහළොවක් පමණ දුර ගෙවා මොරවක හෝ අකුරැස්ස රජයේ රෝහල් වෙත යෑමට සිදුවිය. පසුගියදා මාතර දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී කාර්යාලයේ තාක්ෂණික නිලධාරින් සමඟ අත්හැර දමා ඇති වෛද්‍ය මධ්‍යස්ථානයේ නිරීක්ෂණය කිරීමට එක්වූ මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වීරසුමන වීරසිංහ මහතා එම වෛද්‍ය මධ්‍යස්ථානය කඩිනමින් පිළිසකර කිරීමට තීන්දු කෙළේය. මේ අවස්ථාවට පිටබැද්දර ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජගත් අබේවික්‍රම මහතා ද සහභාගි විය.

■ ඩබ්ලිව්. විදානපතිරණ - ඇඹිලිපිටිය සංචාරක

## කෘතගුණ පූජා පින්කම මේ මස 6-7 දිනවල

අනුබුදු මිහිදු මහරහතුන් වහන්සේ සහ අනගාරික ධර්මපාලතුමාගේ ගුණ සිහි කිරීම උදෙසා කෘතගුණ පූජා නමින් පින්කමක් ඇඹිලිපිටිය 97 1/2 බෝධිමළුව විහාරස්ථානයේ දී මේ මස 6 -7 දෙදින නියෝජ්‍ය ඇමැති ජානක වක්කුඹුර මහතාගේ සහභාගීත්වයෙන් සිදු කෙරේ.

මේ පින්කම බෝධිමළුව විහාරාධිපති බුළුතොට විජිත හිමියන්ගේ අනුශාසනා පරිදි ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් ප්‍රසංග උදයකාන්ත මහතාගේ මගපෙන්වීම යටතේ සමෘද්ධි ප්‍රජාමූල බැංකුව මගින් හා විහාරස්ථ දායක සභාව සහ විහාරස්ථ ධර්ම විජය පදනම, ප්‍රදේශයේ ස්වේච්ඡා සංවිධාන හා පරිත්‍යාගශීලීන් ද එක්ව සංවිධාන කර ඇත.

6 දින සවස බෝධිපූජාව සහ රාත්‍රි 7.00 ට විචිත්‍ර ධර්ම දේශක ආචාර්ය මාවරලේ භද්දිය හිමියෝ සිදුකරති. 7 වනදින දහවල් පනස් නමකට අධික මහා සංඝරත්නය විෂයයෙහි සපිරිකර සංඝගත දක්ෂිණාවකි.

■ සනත් ගමගේ - ලුණම සමූහ

## තහනම් දැල්වලින් මාළු ඇල්ලූ 3ක් කොටු වෙති

වීරවිල ජලාශයේ නීති විරෝධි ලෙස බලපත්‍ර නොමැතිව තහනම් කරන ලද දැල් යොදා මසුන් ඇල්ලීමේ නිරත වී සිටි පුද්ගලයින් තුන් දෙනෙක් අත්අඩංගුවට ගත් බව හම්බන්තොට දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ත නිලධාරී අරුණජිත් ගයාන් චන්ද්‍රසේන මහතා කීය. අභ්‍යයන්තර ජලාශවල භාවිතය තහනම් කරන ලද වටකරන හෝ ඇදගෙන යනු ලබන කවර දැලක් බලපත්‍රයක් නොමැතිව මසුන් ඇල්ලීමේ වරද යටතේ මේ සැකකරුවන් තිදෙනා අත්අඩංගුවට ගෙන ඇත.

■ සමන් විජය බණ්ඩාර - මාවනැල්ල විශේෂ



## පාළු පාරකදී රියැදුරුට මිරිස් කුඩු ගසා ත්‍රිරෝද රිය උස්සලා

## සැකකාර අඹුසැමි යුවළ රක්ෂිත බන්ධනාගාරයට

ත්‍රිරෝද රථයකින් කුලී ගමනක් යන මුවාවෙන් පාළු මාර්ගයක ත්‍රිරෝද රථ රියැදුරාට මිරිස් කුඩු ගසා කැපුම් තුවාල සිදු කර ත්‍රිරෝද රථය රැගෙන පලා ගොස් ප්‍රදේශවාසීන්ට සහ පොලීසියට කොටු වූ යුවළක් මේ මස 13 දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට මාවනැල්ල මහෙස්ත්‍රාත් උපුල් රාජකරුණා මහතා පසුගියදා (29) නියෝග කර ඇත.

හෙම්මාතගම නගරයේ බස්නැවතුම ඉදිරිපිට ඇති කුලී ත්‍රිරෝද රථයක් ලබා ගෙන හෙම්මාතගම නගරයට නුදුරින් ඇති අල්පිටිය සිංහරාජ ගම්මානය දෙසට කුලී ගමනක් ගොස් එම මාර්ගයේ අතුරු මාර්ගයක් සහිත පාළු ස්ථානයකදී ත්‍රිරෝද රථ රියැදුරාට මිරිස් කුඩු ගසා එම කුලී ගමන ගිය යුවළ එක්ව ත්‍රිරෝද රථ රියැදුරාට තියුණු ආයුධයකින් කැපුම් කිහිපයක් ද සිදු කර තිබිණි.

තුවාල ලැබූ ත්‍රිරෝද රථ රියැදුරු වූ 55 හැවිරිදි තිදරු පියකු වන හෙම්මාතගම ගිනිහප්පිටියේ පදිංචි එම්.ජේ.එම්. නජබුදීන් යන අය මෙසේ කීය.

යුවළක් ඇවිත් මට කුලී ගමනක් යන්න කතා කළා. ඇල්පිටියට ගිහින් සිංහරාජ ගම්මානය පැත්තට තමයි කුලී ගමන ගියේ. එම මාර්ගයේ ටික දුරක් ගිහින් කොන්ක්‍රීට් අතුරන ලද මාර්ගයක යමු කියලා මට ඒ අය කිවා. ටික දුරක් එම කොන්ක්‍රීට් පාරේ යද්දි පාර අවසන් වුණා. මා එතනින් එහාට යන්න බැරි නිසා ත්‍රීවිල් එකේ රිවස් ජියර් එක දාන්න එක් පැත්තකට පහත් වුණා.

එම අවස්ථාවේ කුලි ගමන ගිය කපල් එකේ පිරිමි පුද්ගලයා මාගේ බෙල්ල අල්ලා තද කළා. මම බෙල්ල ගලවා ගන්න පොරබැද්දා. ඒ වේලාවේ තියුණු ආයුධයකින් මාගේ පිටුපසින් කැපුවා එතකොට කමිසයද කැපුණා. පිටට සහ තවත් කිහිප තැනක සුළු තුවාල සිදු වුණා. ඒ අවස්ථාවේ මට මිරිස් කුඩු ගැසුවා. ත්‍රීවීල් එකෙන් බැහැලා පොරබැදුවා. ත්‍රීවිල් එක බේරාගෙන පණත් බේරාගෙන එන්න. ඒ පොරබදින විට කාන්තාව මාගේ හිසට මොකක් හරි එකකින් ගැසුවා. මා ඒ ගැසුවාට පස්සේ ටිකක් පැත්තකට ගියා. ඒ අවස්ථාවේ ත්‍රීවිල් එක අරන් ඔවුන් එම ස්ථානයෙන් පලා ගියා. මා ත්‍රීවිල් එක පස්සේ දුවගෙන එනකොට එම ප්‍රදේශයේ ගම්වැසියෙක් මාගේ ශබ්දයට පාරට ඇවිත් ඇයි කියලා අහලා එයා ගමේ අයට කිවාට පස්සේ වැන් එකක හිටපු තරුණයන් පිරිසක් තමයි පන්නාගෙන ගිහින් ත්‍රීවිල් එක සහ මේ මංකොල්ල කෑමට එක්වූ ජෝඩුව අල්ලාගෙන පොලීසියට භාර දුන්නේ.

■ එස්.පී. විජේරත්න - කටුගස්තොට සමූහ

## ‘රේඩා’ මල් ප්‍රදර්ශනයෙන්...





මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය (රේඩා) විසින් සංවිධාන කරනු ලැබූ මල් ප්‍රදර්ශනය හා අලෙවි සල මේ දිනවල ගැටඹේ ක්‍රීඩාංගණයේදී පැවැත්වේ.

මේ ප්‍රදර්ශනය විවෘත කිරීමේ අවස්ථාවට පැමිණි මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ උදයන කිරිදිගොඩ මහතා අදහස් දක්වමින් පවසා සිටියේ ප්‍රදර්ශනය පැවැත්වීමට පැමිණ සිටින්නේ සියයට අනූවක්ම කාන්තාවන් වන බැවින් ඔවුන්ගේ දෑතේ ශක්තියෙන් අලුත් ලොවකට රට ගෙන යන්න හැකියාව පවතින බවය. එමෙන්ම ඔවුන් විසින් තමන්ගේ පවුලේ ආර්ථික තත්වය දිරිමත් කරන්න කරන දායකත්වය මෙම ප්‍රදර්ශනය තුළින් මනාව පැහැදිලි වෙන බවද හෙතෙම කීය.

■ කේ. විජේසිරි නිශ්ශංක - කරල්ලියද්ද සමූහ

## කඳුරට සේවයෙන් ළමා දින වැඩසටහනක්

ලෝක ළමා දිනය නිමිත්තෙන් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ කඳුරට සේවයෙන් සජීවී ළමා ගුවන් විදුලි වැඩසටනක් මාතලේ බලකඩුව කිඩ්ස් ළමා දිවා සුරකුම් පෙර පාසල් බිමෙහි සිට මේ මස 4වැනි දින පෙරවරු 10 සිටපැය දෙකක් පුරා ගුවනට මුසු කෙරේ.

මේ වැඩ සටහන කඳුරට සේවයේ ප්‍රවිණ නිවේදක ප්‍රින්ස් නිශාන්ත හේරත් මහතා විසින් ගෙන එනු ලබයි.

ලෝක ළමා දිනය නිමිත්තෙන් පැවැත්වෙන මෙම ළමා ගුවන් විදුලි වැඩසටහනට දරුවන් රැසක් සහාභාගි වන අතර එහිදි ගීත ගායනා ඇතුළු වැසටහන් රැසක් පැවැත්වේ.

■ එස්.පී. විජේරත්න - කටුගස්තොට සමූහ

## මල්ටි රයිස් කුකුරයක් හැදූ උසස් බාලිකාවේ උත්තරා



මධ්‍යම පළාතේ පාසල් තුලින් බිහිවූ නව නිපයුම්කරුවන්ගේ නිර්මාණ ගණනාවක් පසුගියදා නිමාවට පත්වු INNEX-2020 මධ්‍යම පළාත් කර්මාන්ත හා සංචාරක වෙළෙඳ ප්‍රදර්ශනයේදී එළි දැක්විණි.

මෙහිදි මහනුවර උසස් බාලිකා විදුහලේ 10 වසරේ ඉගෙනුම ලබන උත්තරා මැදගොඩ සිසුවිය සහල් වර්ග දෙකක් එකවර පිස ගැනීමට හැකිවන ආකාරයට නිර්මාණය කර තිබුණු මල්ටි රයිස් කුකරය ප්‍රදර්ශනය නැරඹීමට පැමිණි බොහෝ දෙනාගේ අවධානයට පාත්‍ර විය.

ඇය විසින් එම මල්ටි රයිස් කුකුරය නිපදවන්න යොමුවී තිබුණේ ඇගේ පියා දියවැඩියා රෝගයකු වන බැවින් ඔහුට කෑම සඳහා රතු සහල් බත් හා නිවසේ අනිත් අයට කෑම සඳහා වෙනත් සහල් වර්ගයක් පිළියෙළ කිරීමට වෙන වෙනම රයිස් කුකුරය පාවිච්චි කිරීම වියදම් අධික කටයුත්තක් මෙන්ම වැඩි වේලාවක ගතවන ක්‍රියාවක් බව අවබෝධ කරගෙනය.ඇය ඉන්පසු එකවර සහල් වර්ග දෙකක් පිස ගැනීමට හැකිවන අයුරින් සරල ක්‍රමයක් භාවිතා කරමින් මේ මල්ටි රයිස් කුකුරය නිර්මාණය කර තිබේ. එය බලශක්ති අර්බුදයටද පිළියමක් බව උත්තරා සිසුවිය පවසයි. මේ නිර්මාණය සැකසීම සඳහා ඇයට වැය වී ඇත්තේ රුපියල් 700ක පමණ සුළු මුදලකි.

උත්තරා සිසුවියගේ මේ නිර්මාණය 2019 වසරේ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය මගින් පවත්වන ලද කනිෂ්ඨ නව නිපැයුම් තරගයේදී ප්‍රථම ස්ථානය දිනා ගෙන ඇති අතර එම ආයතනය විසින්ම පවත්වනු ලැබූ බල ශක්ති අර්බුදයට විසඳුම් තරගාවලියෙන්ද ප්‍රථම ස්ථානය හිමිකරගෙන රන් පදක්කම් දෙකෙක් දිනා ගැනීමට සමත් වූවාය. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පසුගිය 26 වැනිදා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදි පැවැති සිසු ඇගයීම් උත්සවයේදී උත්තරා සිසුවියට ශිෂ්‍යත්වයක්ද ලබා දී තිබේ.

■ කේ.ඒ. මෛත්‍රීපාල - දමන සමූහ

## හිඟුරාණ මෙත්තානන්ද මාර්ගය සංවර්ධනයට



සපිරි ගමක් ජනතා සහභාගිත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ දමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් හිඟුරාණ 14 කණුව හෙළගම්පුර ග්‍රාමයට පිවිසෙන මෙත්තානන්ද මාර්ගයේ වෙල්යාය අසළ මාර්ගය කොන්ක්‍රීට් කර ජනතා අයිතියට පත් කිරීම පසුගියදා සිදුකෙරිණි.

මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය මගින් මේ සඳහා වැය කළ මුදල රුපියල් ලක්ෂ පහකි.

■ ආර්.ඤාණදාස - අම්බලන්ගොඩ සමූහ



## කැපූඇළට බලු කරදර

බළපිටිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී බල ප්‍රදේශයට අයත් කැපූඇළ ගමේ පදිංචිකරුවන් සිව් දෙනකු පසුගිය සතිය ඇතුළත අයාලේ යන සුනඛයකු සපා කෑම නිසා එම ප්‍රදේශවාසීන් ඉහත් බියකින් පසුවන බව කැපූඇළ පදිංචිකරුවකු වන සුනිල් පැස්කුවල් මහතා දිනමිණට පැවැසුවේය.

තමාගේ බිරිය නිවෙසේ මුළුතැන් ගෙයි සිටියදී එතැනට කඩා වැදුණු සුනඛයකු බිරියගේ අත පය සපා කා තමා සුරතලයට ඇති කරන සුනඛයා සහ බළලා ද සපා කා පැන ගිය බවද සුනිල් මහතා වැඩි දුරටත් කීය. දැනට තම ගමේ සිව් දෙනකු මේ සුනඛයා විසින් සපා කා ඇති බවද ඒ මහතා සඳහන් කළේය.

■ පී.පී.ගුණතිලක - ගලේවෙල මධ්‍යම සමූහ

## ගලේවෙල මත්ද්‍රව්‍ය වැටලීම්වලින් 22 දෙනෙක් අත්අඩංගුවට

ගලේවෙල පොලීසියේ දූෂණ මර්දන අංශයේ නිලධාරීන් විසින් පසුගිය 21 වැනි දින සිට 26 දක්වා සතියක කාලයක් තුළදී සිදුකරන ලද වැටලීම් වලදී නීති විරෝධී මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වැටලීම් 22ක් සිදුකර සැකකරුවන් 22ක් අත්අඩංගුවට ගත් බව පොලීසිය පවසයි.

ඒ අනුව හෙරොයින් මත්ද්‍රව්‍ය නඩු 3ක්ද, ගංජා නඩු 11ක් ද, නීති විරෝධී මත්ද්‍රව්‍ය නඩු 8ක්ද ලබාගෙන ඇත. මේ අනුව හෙරොයින් මත්ද්‍රව්‍ය ළඟ තබාගැනීමේ වරදට වරදකරුවන් වූ පුද්ගලයන්ට රුපියල් 10,000 බැගින් ද ගංජා සන්තකයේ තබාගෙන සිටි පුද්ගලයන්ට රුපියල් 6,000 බැගින් ද මහෙස්ත්‍රාත්වරයා විසින් දඩ නියම කරන ලදි. නීතිවිරෝධී මත්පැන් නඩුවල සැකකරුවන් ඇප මත මුදාහැර ඇති අතර එම නඩු ඉදිරියේදී විභාග කිරීමට නියමිත ය.

■ පී.පී.පී.සුගතදාස - තිහගොඩ සමූහ

## අපවිත්‍ර ලෙස ආහාර ගබඩා කළාට විසිදහසක් දඩ

මිනිස් පරිභෝජනයට නුසුදුසු ලෙස හා සනිපාරක්ෂාවට අහිතකර ලෙස ආහාර ද්‍රව්‍ය ගබඩාකර තැබීම හා හෝටලයේ මුලුතැන් ගෙය කැළි කසළ සහිතව, ප්‍රජා සෞඛ්‍යයට ඉතාමත් අහිතකර ලෙස පවත්වාගෙන යාම ආදී චෝදනාවලට වරදකරුවූ වෙළෙන්ඳකුට මාතර අතිරේක මහේස්ත්‍රාත් හා අතිරේක දිසා විනිසුරු චම්පික රාජපක්ෂ මහතා විසින් රුපියල් විසිදහසක් (20000.00) දඩ ගසන ලදී.

මාතර මහ නගරසභා බලප්‍රදේශයේ ආපනශාලා හිමියකු මෙම නඩුවේ වරදකරු විය.

සෞඛ්‍ය බලධාරීන්ට ජනතාව ගෙනෙන ලද තොරතුරු මත අදාළ ස්ථානය පරික්ෂා කරන ලද අතර, එහිදී හෝටලයේ මුලුතැන් ගෙය අප ද්‍රව්‍ය වලින් පිරී තිබූ අතර, වම්බටු මෝජු මුද්‍රිත කඩදාසි මත ගබඩාකර තිබීම සොයාගෙන ඇත.

වැටලීමේදී අත්අඩුවට ගනු ලැබූ මුද්‍රිත කඩදාසි මත ගබඩාකර තිබූ වමුබටු මෝජු, නඩු භාණ්ඩ වශයෙන් සෞඛ්‍ය බලධාරීහු අධිකරණයට ඉදිරිපත්කර ඇත.

මාතර මහ නගර සභා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය පරික්ෂක ජේ.පී. අබේවික්‍රම හා ධම්මික විදාන පතිරණ නිලධාරීන් සැකකරුට එරෙහිව මාතර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා තිබිණි.

■ එන්.පී. රාජදොරේ - රත්නපුර විශේෂ

## රත්නපුර කිරුම් මිනුම් ප්‍රමිති අංශයෙන් 48කට නඩු

රත්නපුර දිස්ත්‍රික් කිරුම් මිනුම් ප්‍රමිති ඒකකය මගින් පසුගිය දෙදිනක් තුළ ඇඹිලිපිටිය ප්‍රදේශයේ කරන ලද වැටලීම්වලින් පාරිභෝගික නීති උල්ලංගනය කළ වෙළෙඳුන් 48 දෙනකු අත්අඩංගුවට ගෙන ඔවුන්ට විරුද්ධව නඩු පවරා ඇත.

රත්නපුර දිස්ත්‍රික් ලේකම් මාලනී ලොකුපෝතාගම මහත්මියගේ උපදෙස් මත රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිහිටුවා ඇති කිරුම් මිනුම් ප්‍රමිති ශාඛාවේ සහකාර අධිකාරී දිල්රුක් පට්ටියවෙල මහතාගේ මෙහෙයවීමෙන් ඇඹිලිපිටිය සහ කොලොන්න ප්‍රදේශවල පොදු වෙළඳසල් දෙකේ සිදුකරන ලද වැටලීම් මගින් 2020 වර්ෂය සඳහා මුද්‍රා නොතැබූ තරාදි පාවිච්චි කළ වෙළෙඳුන් 27ක් , බර අඩු පාන් විකුණු වෙළෙඳුන් 9ක් හා අනුමතියකින් තොරව කිරුම් මිනුම් උපකරණ භාවිතා කළ 12 දෙනකුද අත්අඩංගුවට ගෙන තිබේ.

දිනමිණ දසත - දස අත ම එක තැන

■ ජායාරූප - රත්නපුර - ලසන්ත නිරෝෂන්

# රත්නපුර පළාත් අධ්‍යාපන ගොඩනැගිල්ල ජනතා අයිතියට





රත්නපුර ගැටන්ගම පිහිටි සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නව තෙමහල් ගොඩනැගිල්ල ) සබරගමු පළාත් ආණ්ඩුකාර ටිකිරි කොබ්බෑකඩුව මහතා අතින් ජනතා අයිතියට පත් කෙරිණි.

මේ සඳහා සබරගමු පළාත් සභාව සහ ලෝක බැංකුව විසින් රුපියල් ලක්ෂ 480ක් වැය කර ඇත.

මෙදින කොරෝනා උවදුරින් රටත් ලෝකවාසීනුත් ආරක්ෂා කිරීම සඳහා සර්ව රාත්‍රික පිරිත් දේශනයක් පැවැත්විණි.

මෙම අවස්ථාවට ශ්‍රීපාදස්ථානාධිපති බෙංගමුවේ ධම්මදින්න නාහිමි, මහාචාර්ය කෝන්ගස්තැන්නේ ආනන්ද නාහිමි සමග සබරගමු පළාත් සභාවේ ප්‍රධාන ලේකම් රංජනී ජයකොඩි, ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් ප්‍රභාත් උදාකර, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සේපාල කුරුප්පුආරච්චි, අධ්‍යක්ෂ නෙවිල් කුමාරගේ, ආණ්ඩුකාර පෞද්ගලික ලේකම් මංජුලා ඉදිගහවෙල, පළාත් පුස්තකාල සභාපතිනි වත්සලා ජනාදරී යන මහත්ම මහත්මීහු පිරිසක් සහභාගි වූහ.

■ පී.මද්දුමගේ - මාවරල සමූහ

## වගා කළ කහ හොරෙන් ගලවන ජවාරමක්

කහ හිගය සමග වගා කළ කහ හොරට ගලවාගෙන යන පිරිස් ගම්බදව සිටින බව ප්‍රදේශවාසීහු පවසති.

කුරුඳු, තේ වැනි ප්‍රධන වගාවන් අතර ඇති සුළු භූමි ප්‍රමාණයන්හි කහ වගාව සිදු කිරීමට ගම්බද ජනතාව විශාල උනන්දුවක් දැක්වීම නිසා සෑම නිවෙසකම පොඩි ඉඩ කඩක හෝ කහ වගා කර තිබේ.

කහ කිලෝ ග්‍රෑම් එකක් රුපියල් 4000 ක පමණ ඉහළ මිලකට වෙළෙඳ පොළ තුළ අලෙවි කෙරේ. මේ නිසා කහ වගාවන් හොරෙන් ගලවා කහ අල රැගෙන යන අය පිට පළාත් වලට ගෙන ගොස් රහසේ අලෙවි කිරීමටද කටයුතු කරන බවද බොහෝ දෙනා පවසති.

■ ඩී.එස් ගුණතිලක - ඌව වෙල්ලස්ස විශේෂ

## බෙහෙත් කොටන තුවක්කු 3ක් දැලේ

බිබිල, ඇතිමලේ සහ සියඹලාණ්ඩුව පොලිස් බල ප්‍රදේශවල සිදුකළ වැටලීම් වලදී බෙහෙත් කොටන තුවක්කු තුනක් සමග ගොවීන් තිදෙනකු පොලීසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇත.

බිබිල-කනුල්වෙල, ඇතිමලේ-බෝකොටුව, සියඹලාණ්ඩුව-ඉහළපිටිය යන ප්‍රදේශ වල පදිංචිකරුවන් තිදෙනකු බෙහෙත් කොටන තුවක්කු සමග මෙලෙස අත්අඩංගුවට ගෙන තිබේ. වගාවන් වන සතුන්ගෙන් ආරක්ෂා කිරීමට මෙම බෙහෙත් කොටන තුවක්කු සකස් කර ඇති බව පරීක්ෂණවලදී අනාවරණයවී තිබේ.

සැකකරුවන් සහ නඩු භාණ්ඩ බිබිල සහ සියඹලාණ්ඩුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත.

■ පී.පී. ගුණතිලක - ගලේවෙල මධ්‍යම සමූහ

## සතිපොළ අවට මත්ස්‍ය අපද්‍රව්‍ය

ගලේවෙල නගරය තුළ මසුන් අලෙවි කරන ඇතැම් වෙළෙඳුන් එම අපද්‍රව්‍ය සතිපොළ හා ඒ අවට දැමීම නිසා බරපතළ පාරිසරක ගැටලු ඇති වී තිබෙන බව නගරවාසීහු පවසති. විශේෂයෙන් නගරය හරහා ගලායන කලුගල ඇළට මෙම අපද්‍රව්‍ය දමා ඇති අතර සති පොළ වටා ඇති ආරක්ෂිත වැටේ කම්බි කපා ඊට ඇතුල්වී මෙම අපද්‍රව්‍ය දමා ඇති බව ඔවුහු පවසති.

එම අපද්‍රව්‍ය සුනඛයන් හා කපුටන් විසින් තැනින් තැන ගෙනගොස් දැමීම හේතුවෙන් දැඩි දුර්ගන්ධයක් ඇති වී ඇති බවත්, මැස්සන්ගේ තෝතැන්නක් බවට අදාළ ප්‍රදේශය පත්වී ඇති බවත් ඔවුහු පෙන්වා දෙති. මේනිසා තමන් හා තම දරුපවුල්වල සෞඛ්‍යට දැඩි තර්ජන එල්ලවී ඇති නිසා කඩිනමින් මේ සඳහා දැඩි ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ඔවුහු ප්‍රාදේශීය සභා බලධාරීන්ගෙන් ඉල්ලා සිටිති.

■ සිරි අබයසිරි - මාතලේ මධ්‍යම සමුහ




රජය විසින් රුපියල් ලක්ෂ ගණනක් වැය කර මාතලේ මන්දණ්ඩාවෙල පිහිල්ල මාර්ගයේ නව පාලමක් ඉදි කළත් එම පාලම මාර්ගයකට සම්බන්ධ නොවන බැවින් එම පාලමෙන් කිසිදු පුද්ගලයකුට ප්‍රයෝජණයක් ගත නොහැකිවී තිබේ.

මාතලේ නගරයේ යම් වාහන තදබදක් පැවතුනහොත් අතුරු මාර්ගයක් ලෙස භාවිතා කිරීමට හා නගරයේ සිට හරස්ගම ඉහළ හරස්ගම ඇතුළු ගම්මාන රැසකට පහසුවෙන් ගමන් කළ හැකි කෙටි මාර්ගක් ලෙස සංවර්ධනය කිරීමේ අරමුණින් මෙම පාලම ඉදි කර ඇත.

නමුත් පාලමේ ඉදිකිරීම් සිදු කර මාස ගණනක් ගතවුවත් පාලමෙන් එගොඩ වී හරස්ගම මාර්ගයට සම්බන්ධ කිරීමට කටයුතු නොකිරීමෙන් මෙම ගැටළුකාරී තත්ත්වය උද්ගත වී තිබේ.

වහාම බලධාරීන්ගේ අවධානය යොමු කර මීටර් 500ක් පමණ ඉතිරි මාර්ගය සංවර්ධනය කර දෙන ලෙස බලධාරීන්ගෙන් ඉල්ලා සිටින බව එම ප්‍රදේශවාසීහු පැවසුහ.

■ නන්දසිරි වැලිගමගේ - ගාල්ල දිසා සමුහ

# දකුණේ අවිධිමත් රජයේ ඉඩම් භුක්ති විඳි 10,000කට බලපත්

දකුණු පළාත තුළ විධිමත් ලේඛනයක් රහිතව රජයේ ඉඩම් භුක්ති විඳිනන් 10000ක් සඳහා මාස තුනක් ඇතුළත එම ඉඩම් සඳහා බලපත්‍ර ලබාදීමට කටයුතු කරන බව දකුණු පළාත් ඉඩම් කොමසාරිස් ටී.ජී සරත් කුමාර මහතා පවසයි.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නියෝගය මත මෙම ඉඩම් සඳහා බලපත්‍ර ලබාදීමේ කටයුතු කඩිනම් කොට ඇති බවද පළාත් ඉඩම් කොමසාරිස්වරයා පැවසීය. අවශේෂ කැළය සහිත රජයේ ඉඩම්වල විධිමත් ලේඛණයක් රහිතව භුක්ති විඳින අයගේ ඉඩම් සඳහා මෙම බලපත්‍ර ලබාදීමට නියමිතව ඇත.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ එවැනි භුක්තිකරුවන් 4000ක් මාතර දිස්ත්‍රික්කයේ භුක්තිකරුවන් 3000ක් හා ගාල්ල දිස්ත්‍රික්කයේ භුක්තිකරුවන් 3000ක් සඳහා බලපත්‍ර ලබාදීමට කටයුතු කරන බවද පළාත් ඉඩම් කොමසාරිස්වරයා සඳහන් කළේය.

මේ පිළිබඳ තවදුරටත් අදහස් දක්වමින් දකුණු පළාත් ඉඩම් කොමසාරිස් ටී.ජී සරත් කුමාර මහතා මෙසේද කිවේය. ඇතැම් අවස්ථාවලදී දීමනා පත්‍ර ඇති ඉඩම්වල අනවසර පදිංචිකරුවන් ඉන්නවා. ඒ බලපත්‍රය අවලංගුකරලා තමයි දෙන්න වෙන්නේ. ඒවා එකවරම කරන්න බැහැ.

බලපත්‍ර ලබාදෙන ඉඩම් කැබලි 10000න් 2000ක් පමණ විදේශ රටවලින් ආනයනය කරණු ලබන කෘෂිභෝග වගා කිරීමට සැලසුම් කොට තිබෙනවා. දැනට භුක්ති විඳින ස්ථිර භෝග නැති ඉඩම් කැබලිවල තමයි කහ, කවුපි, මුංඇට වැනි කෘෂිකාර්මික භෝග වගා කිරීමට සැලසුම් කොට තියෙන්නේ. 5/2001හා 2/.2006 චක්‍රලේඛන අවලංගු විමෙන් පසු ඉඩම් විශාල ප්‍රමාණයක් ප්‍රාදේශිය ලේකම්වරු යටතට පත්වෙනවා. ප්‍රාදේශිය ලේකම්වරු ඉඩම් නිලධාරීන් හා ජනපද නිලධාරීන් දැනුවත් කොට බලපත්‍ර ලබාදීමේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කර ඇති බවද දකුණු පළාත් ඉඩම් කොමසාරිස්වරයා පැවසීය.

■ සි.කේ. වික්‍රම - ගලහ සමූහ

## මත් කුඩු ගැටුමේදී අයකුට කැති පහර

පසුගියදා දෙල්තොට නගරයේදී මත් කුඩු සම්බන්ධයෙන් දෙපිරිසක් අතර ඇතිවූ ගැටුමකදී විසි කැත්තකින් එල්ල වූ පහරකින් කැපුම් තුවාල ලැබූ පුද්ගලයකු ප්‍රතිකාර සඳහා දෙල්තොට රෝහලට ඇතුළත් කර ඇත.

දෙල්තොට පල්ලේගම පදිංචි වෙනියා නැමති අනවර්ත නාමයෙන් හඳුන්වන වයස අවුරුදු පනස් තුනක් වන පුද්ගලයකුගෙන් මත් කුඩු මිලදී ගත් බාබු නැමැති තරුණයකු එම මත්කුඩු තම මිතුරන් සමග පානය කිරීමට යාමේදී ඒවා මත්කුඩු නොවන ව්‍යාජ ලෙස සැකසූ වෙනත් කුඩු වගයක් බවට සැක පහළ වී ඇත.

ඒ අනුව බාබු නැවත පැමිණ ඒ බව වෙනියාගෙන් විමසීමේදී වෙනියා හා බාබු ගේ කණ්ඩායම් දෙක අතර ඇතිවූ ගැටුමේදී එක් අයෙකු අතින් එල්ල වූ විසි කැති පහරකින් හිසෙහි කැපුම් තුවාල සිදුවී තිබේ.

සිද්ධිය සම්බන්ධයෙන් වෙනියා බාබු හා අවුරුදු විසි හත විසි අට හා විසි නවය වයස් කාණ්ඩ වල මුස්ලිම් තරුණින් දෙදෙනකු හා දෙමළ තරුණයකු සමග පස් දෙනකු අත්අඩංගුවට ගෙන ඇත.

ඒ සමග ඔවුන් අත තිබූ විසි කැත්ත හා කඩුවකට සමාන යකඩ පට්ටමක්ද ගලහ පොලීසිය මගින් අත් අඩංගුවට ගෙන ඇත. සැකකරුවන් මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය.

ගලහ පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරික්ෂක ලලිත් මහගෙදර මහතා ඇතුළු කණ්ඩායමක් සිද්ධිය සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ පවත්වනු ලබයි.

■ වෝල්ටර් දයාරත්න - අනුරාධපුර දිසා විශේෂ

## දරුවන්ට සාධාරණයක් කරන්න

2019 වර්ෂයේ (අ.පො.ස) සා.පෙළ සාමාන අන්දමින් සමත් දරුවන්ට අනුරාධපුර කැකිරාව අධ්‍යාපන කොට්ඨාසයේ තිබ්බටුවැව මහ විද්‍යාලයේ විදුහල්පතිවරයා එම දරුවන්ට විදුහලේ දොරටු වසා දමා තිබීමෙන් දරුවන්ට සිදුව ඇති අධ්‍යාපනික අසාධාරණකම් පිළිබද දරුවන් හා දෙමාපියන් වෙනුවෙන් හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රිවරයකු වන නිමල් පින්සිරි ගොඩගන්දෙනිය මහතා ජනාධිපතිතුමා වෙතට සාධාරණය ඉටුකර දෙන ලෙසට ලිඛිතව ඉල්ලීමක් කර ඇත.

■ නවරත්න සමරතුංග - දමන විශේෂ

## අඩු ආදායම් පවුල් 25කට නිවාස තනන්න මුදල්



අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කීපයක පසුගිය සතියක පමණ කාලයක් සංචාරය කළ නැගෙනහිර පළාත් ආණ්ඩුකාර අනුරාධා යහම්පත් මහත්මිය කෝමාරිකා වගා ව්‍යාපෘති රැසක් ආරම්භ කිරීමට පියවර ගනු ලැබූ අතර අඩු ආදායම් ලබන දුප්පත් පවුල් 25ක් වෙනුවෙන් නිවාස තනා ගැනීමට නිවාස ණය ලබාදීමට පියවර ගෙන තිබිණි.

ඒ අනුව එම නිවාස ණය ලාභීන්ට අම්පාර දිසාලේකම් කාර්යාලයේදී චෙක් පත් ප්‍රදානය කෙරිණි.

මෙම අවස්ථාවට නැගෙනහිර පළාත් ආණ්ඩුකාරතුමිය සහ අම්පාර මහ දිසාපති ඩී.එම්.එල්.බණ්ඩාරනායක ආණ්ඩුකාරවරියගේ ලේකම් සහ නැගෙනහිර පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරියේ සභාපති එස්.ඩී.චාමර නිලංක ආණ්ඩුකාරවරියගේ ලේකම් මදනායක පළාත් නිවාස අධිකාරියේ අධ්‍යක්ෂවරුන් ඇතුළු පිරිසක් සහභාගි වූහ.

■ ජී.ඒස්. තැලිගම - කිරිඳිවැල සමූහ.

## අසරණ-වියපත් පිරිසට සරණ වන ආදර්ශවත් රණවිරුවෙක්

### පිනට පිහිට වෙන්න ඔබටත් පුළුවන්

දෙනෙත් අන්ධභාවයට පත්වූ මව්වරු නොමිලේ රැක බලාගන්නා ශ්‍රී ලංකා යුධ හමුදාවේ සේවය කරන වීර රණවිරුවකුගේ උතුම් පුණ්‍ය කර්මයක් සිදුකෙරෙන මධ්‍යස්ථානයක් කිරිඳිවැල මයිලවලාන ග්‍රාමයේ ආරම්භ කර ඇත.

මෙහි සියලු පහසුකම් සහිතව ඇඳන්, ඇඳ ඇතිරිලි, රෙදිපිළි ද සහිතව 20 දෙනකුට ජිවිතාන්තය දක්වා නේවාසිකව සිටිය හැක. මෙහි කිසිම මුදලක් අය නොකිරීම විශේෂත්වයක් වන අතර රැකබලා ගැනීමට පාලිකාවක් ද මෙහි නේවාසිකව සිටී. රෝගි වු විට ප්‍රතිකාර ලබා දිම හා ආහාර සැපයීම ද කරන අතර කැමති කෙනකුට දින වෙන්කර ඒ පුණ්‍යකර්මයට දායක විය හැකිය.

මෙම රණවිරුවාට හිමිව තිබූ ඉඩම් කැබැල්ලක මෙම නිවස සාදා ඇත. ඔහු දරුවන් දෙදෙනකුගේ පියෙකි. තවමත් රාජකාරියේ යෙදී සිටින ඔහු දීර්ඝ කාලයක් තුළ කරගෙන යමින් සිටින සේවාව අගය කරමින් මුළු දිවයිනටම සාම විනිසුරු, ඇතුළු ගෞරව සම්මාන රැසකින් පිදුම් ලැබූ මොහු ජිවන් ප්‍රසාද් ලියනගේ නම් වු ඔහු රණවිරුවෙකි.

රට පුරා බොහෝ ප්‍රදේශවල නැතිබැරි අය සඳහා නිවාස සදාදීම, නැතිබැරි අය සඳහා වියළි ආහාර ද්‍රව්‍ය ලබා දීම පමණක් නොව මේ වන විට ආබාධිත ඕනෑම කෙනෙකුට රෝදපුටු ලබා දීම සිදුකරන අතර මේ වන විට දහස් ගණනකට රෝද පුටු බෙදා දිම කර ඇත. මේ වන විටත් දොම්පෙ ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ වේරහැර ග්‍රාමයේ දිළිඳු පවුලකට නිවෙසක් සාදා දීමේ කාර්යයෙහි මොහු යෙදී සිටී. මෙම කර්තව්‍ය සඳහා විදෙස් රටක වැඩවසන හිමිනමක් පූර්ණ අනුග්‍රහය ලබා දී ඇත.



මෙම වැඩිහිටියන් සඳහා ඉදිවු මෙම නිවස ආරම්භ කර මාස 3ක පමණ කාලයක් ගතවන අවස්ථාවේ ඒ වෙනුවෙන් පසුගියදා අන්ධ 100 දෙනකු මෙම ස්ථානයට කැඳවා ඔවුන් සඳහා දහවල් ආහාරපාන ලබා දීම මෙන්ම ඔවුන්ගේ කුසලතා එළිදැක්වීම සඳහා දහවල් කාලයේ පැදුරු සාජ්ජයක් පැවැත්වීමට ද කටයුතු යොදා තිබිණි. මෙම කර්තව්‍යයන්හිදී ලියනගේ මහතාගේ බිරිඳ දක්වන සහය ඉතාම අගය කළ යුතුය.

මෙයට ඔබටද සහාය දැක්විය හැකිබව මොහු පවසා සිටී.දුරකතන අංකය -077 -8344494

■ දයාරත්න බණ්ඩාර - කෑගල්ල දිස්ත්‍රික් සමූහ

## වැසිකිළියට ඉබි යතුරු ඇයි?




කෑගල්ල ප්‍රධාන බස් නැවතුමේ ඇති වැසිකිළි පද්ධතිය මේවන විට ඉබි යතුරු දමා වසා ඇත. එහි වැඩ කරන සේවකයා මෙහි ටෙන්ඩරය ලබාගෙන ඇත්තේ මාසයකට රුපියල් දස දහසක් (10000/=) ගෙවීමේ පොරොන්දුව මතය. වැසිකිළි පද්ධතිය කොරෝනා රෝගය පැවැති වකවානුව තුළ වසා දමා තිබුණත් එම කාලවල හිග මුදල් වන රුපියල් හැත්තෑ දහසක් (70000/=) ගෙවන ලෙසට කෑගල්ල නගර සභාව ඔහුට දන්වා ඇත.

එම මුදල් ඔහුට ගෙවීමට නොමැති නිසා වැසිකිළි පද්ධතිය වසා දැමූ බව පවසයි. මේ පිළිබඳ කෑගල්ල නගර සභාවේ ලේකම් මහතාගෙන් විමසූ විට ඔහු පැවසූයේ එවන් සිද්ධියක් නොදන්න බවයි. මේනිසා තම අවශ්‍යතා ඉටුකර ගැනීමට නොහැකි තත්ත්වයක් උදාවී ඇත.

■ කේ. කෝට්ටගේ - වලස්මුල්ල විශේෂ

# ජාතික ආධුනිකත්ව පුහුණු මැඳුර ජරාවාස වෙලා



ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ වලස්මුල්ල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය 1991 වර්ෂයේ විවෘත කරන ලද්දකි. අද වන විට මෙම ගොඩනැගිල්ල ජරාවාස වෙමින් පවතී. වැස්සට තෙමෙන අවස්ථාවලදී විදුලිය කාන්දු වන අවස්ථා ද ඇත.

වඩු, මේසන්, මෝටර් කාර්මික පාඨමාලා දැනට වසා දමා ඇත. එයට හේතුව ළමුන්ට අනාරක්ෂිත බව නිසා ආධුනිකයින්ගේ හිඟතාවයයි. ජරාවාස වී ඇති ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම කඹ ඇදිල්ලකට ලක් වී ඇත. එයට හේතුව භූමිය හා ගොඩනැගිල්ල වීරකැටිය ප්‍රාදේශීය

සභාව සතුවීමය. එම නිසා ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමට ප්‍රාදේශීය සභාව නයිටා ආයතනයට පවරා නොදීමයි.

නයිටා ආයතනය පවසන්නේ ප්‍රාදේශීය සභාව සතු දේපළක් අප ආයතනයෙන් අලුත්වැඩියා කිරීමට නීතිමය බාධාවක් පවතින බවයි. එසේ කිරීමට නම් එම දේපළ නයිටා ආයතනයට පවරා දිය යුතුය. ආයතන දෙකේ කඹ ඇදිල්ල නිසා දහස්

ගණනකගේ නෙත් මං විවර කළ මෙම ආයතනයට කණ කොකා හඬා ඇත.

■ එස්. දීයගහගේ දකුණු පළාත් සංචාරක

# වැල්හේන්ගොඩ සිඟිති පෙර පාසලේ පොළක්

අහංගම වැල්හේන්ගොඩ සිඟිති පෙර පාසලේ දරුවන්ගේ සිඟිති පොළක් ඉකුත්දා (30) එම පෙර පාසල් භූමියේදී පැවැත්විණි. පෙර පාසලේ දරුවන් තිස් පස් දෙනෙක් මෙම සිඟිති පොළට සහභාගි වූහ. එම පෙර පාසලේ ප්‍රධාන ගුරුතුමිය වන කුසුම් සේනානායක මහත්මියගේ උපදෙස් පරිදි සිඟිති පොළ සංවිධානය කර තිබිණි. දරුවන් සිඟිති පොළට සහභාගි වී සිටි අයුරු.



■ නන්දසිරි වැලිගමගේ - ගාල්ල දිසා සමූහ

# රටේ සිදු වන ළමා අපචාරවලින් 50%ක්ම වාර්තා වෙන්නේ නෑ

අප රටේ සිදු වන ළමා අපචාරවලින් සියයට 50ක් පමණ වාර්තා නොවන බැව් ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහලේ අධිකරණ වෛද්‍ය අංශයේ ප්‍රධානි විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරි රෝහාන් රුවන්පුර මහතා පවසයි. අප රටේ පමණක් නොව ලෝකයේ සෙසු රටවලද ළමා අපචාර සම්බන්ධයෙන් දැකිය හැක්කේ මෙම තත්ත්වය බවද විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා සඳහන් කළේය.

මේ පිළිබඳ අදහස් දක්වමින් විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරි රෝහාන් රුවන්පුර මහතා මෙසේද කිවේය.

'ළමා අපචාර සිද්ධිවලදී අධිකරණ වෛද්‍යවරු සහභාගි වන්නේ ස්වාධීන විමර්ශකයන් වශයෙන්. ළමා අපචාර සම්බන්ධව පොලීසියට හා ළමා ආරක්ෂක අධිකාරිය වෙත වාර්තා වුණාට පසු තමයි අපිට යොමු කරන්නේ. ළමා අපචාර සියයට 50ක් පමණ බලධාරීන්ට වාර්තා වන්නේ නැහැ. එක තමයි තියෙන ලොකුම ප්‍රශ්නය. අනික් කාරණය තමයි.

ගොඩක් අපචාර සිද්ධීන් දූෂණය දක්වාම යන්නේ නැහැ. කාලයක් ගිහින් තමයි වාර්තා වෙන්නේ. එවැනි අවස්ථාවලදී කිසිදු භෞතික ලක්ෂණයක් නැහැ. අපචාරයක් වුණා කියලා අධිකරණ විද්‍යාත්මකව කියන්න.

ළමා අපචාර පවුලේ කෙනකුගේ සිට ඥාතින් අසල්වාසින් හිතවතුන්ගෙන් වෙන්න පුළුවන්. පිටස්තරයකුගෙන් බරපතළ අපචාරයක් වුණොත් වාර්තා වෙනවා. අපචාරකරු ළමයා දන්න අයෙක්. නමුත් ඇතම් ළමුන් තොරතුරු වසන් කරනවා.

ඒ විතරක් නෙවෙයි අපචාරවලට ලක්වන ඇතැම් දරුවන්ගේ මවුපියන් ඒ තොරතුරු වසන් කරනවා. අපේ සංස්කෘතියක් එක්ක එවා හෙළිවෙනවාට මවුපියන් කැමැති නැහැ. දරුවා සමාජයෙන් කොන්වේවි කියලා.

අපි විසින් කරපු පරීක්ෂණවලදී අනාවරණය වෙලා තියෙනවා ළමා අපචාරවලට ගොදුරුවන දරුවන්ගෙන් වැඩි පිරිසක් ලිංගිකව ක්‍රියාශීලිදරුවන් කියලා. ඒ දරුවන් අපචාරකරුට ඉතා පහසුවෙන් අපචාර සඳහා ගොදුරුකරගන්න පුළුවන් හෝමෝන ක්‍රියාකාරිත්වයත් එක්ක ළමුන්ගේ ඒ ආශාවන් ටික ටික වර්ධනය වෙනවා. ලිංගික අධ්‍යාපනයෙන් කරන්නේ. මොන නීති දැම්මත් සිරුරේ ඇති වන ජීව විද්‍යාත්මක ක්‍රියාවලිය නතර කරන්න බැහැ. වයස අවුරුදු 12, 14 වන විට ළමුන්ට ලිංගික ආශාවන් ඇති වෙනවා. ලිංගික අධ්‍යාපනය තුළින් ළමුන්ට පැහැදිලි කරලා දෙනවා මොකක්ද මේ වෙන්නේ කියලා. ලිංගික අධ්‍යාපනය ගැන ළමුන් දැනුවත් කළ යුතුයි. විද්‍යාත්මක තත්ත්වය දරුවන්ට කියා දිය යුතුයි.

ළමා ආරක්ෂක අධිකාරියේ සභාපති මහාචාර්ය මුදිත විදානපතිරණ මහතාගෙන් ළමා අපචාර සම්බන්ධව අප කළ විමසුමකදී මෙසේ කිවේය.

ළමා අපචාර වැඩිවෙලා නැහැ. ළමුන්ට සිදු වන කෲරත්වය තමයි වැඩිවෙලා තියෙන්නේ. 2019 වර්ෂයේ ළමා අපචාර සම්බන්ධව 8,558ක් පැමිණිලි ලැබී තිබුණා. නමුත් මේ වර්ෂයේ අගෝස්තු මාසය වෙනකම් ලැබිලා තියෙන්නේ පැමිණිලි 4,471යි. ඉකුත් වසරට වඩා ළමා අපචාර සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි සංඛ්‍යාත්මක අඩුයි. නමුත් කෲරත්වය වැඩිවෙලා තියෙන්නේ. යැයිද මහාචාර්ය මුදිත විදානපතිරණ මහතා සඳහන් කළේය.

■ බලන්ගොඩ සම්පත් ප්‍රියනන්දන

# කල්තොට සතිපොළෙන් රියැදුරන්ට හරි වදයක්



බළන්ගොඩ කල්තොට කතරගම ප්‍රධාන මාර්ගයේ කිරිමැටිතැන්න ප්‍රදේශයේ මාර්ගයේ එක් පැත්තක පවත්වාගෙන යන බළන්ගොඩ ප්‍රදේශීය සභාව මගින් පාලනය වන සතිපොළ හේතුවෙන් එම මාර්ගය භාවිත කරන රියැදුරන් ඇතුළු ජනතාව අපහසුතාවට පත් වෙන බව ඔවුහු සඳහන් කරති.

අවුවෙන් වැස්සෙන් කරදරයක් නොමැතිව නිදහසේ වෙළෙඳාම සිදු කර ගැනීම සඳහා සුදුසු ස්ථානයක් වෙන්කර දෙන්නේ නම් තමන්ට මෙන්ම ජනතාවටද එය පහසු බව වෙළෙඳුන්ගෙන් කළ විමසීමකදී පැවසීය.

අප මේ සම්බන්ධයෙන් බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති සුනිල් ප්‍රේමසිරි මහතාගෙන් විමසීමක් කළ අතර එහිදී ඒ මහතා මෙසේ කීය

"මෙම සතිපොළ මාර්ගය අයිනේ පවත්වාගෙන යෑම හේතුවෙන් මාර්ගය භාවිත කරන රියැදුරන්, ජනතාව සහ වෙළෙන්දන් අපහසුවයට පත්වෙන බව ඇත්ත. නමුත් මෙම සතිපොළ පැවැත්වෙන්නේ සතියකට එක දිනයයි. ඒ නිසා ප්‍රදේශයේ ජනතාවට අත්‍යවශ්‍ය සතිපොළක් බවට මේ සතිපොළ දැන් පත්වෙලා තිබෙනවා.

මෙම සතිපොළ පවත්වාගෙන යෑම සඳහා මේ ආසන්නයේ සුදුසු ඉඩමක් වෙන්කිරීම සඳහා සියලුම කටයුතු මම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට කළා. නමුත් 2015 වර්ෂයේ ආණ්ඩු වෙනස් වීමත් සමග එය එහෙන්මම නතර වුණා. නැවත මේ කිරිමැටිතැන්න ප්‍රදේශයේ ඉඩමක් හඳුනාගෙන තිබෙනවා. ඒ ඉඩම වෙන්කර ගැනීමේ කටයුතු මේ දිනවල සිදු කරගෙන යනවා. ඉන්පසු අවශ්‍ය මුදල් ප්‍රතිපාදන රජය මගින් වෙන්කරගෙන එම ස්ථානයේ සතිපොළ සඳහා පහසුකම් ලබා දෙන්න පුළුවන්" යැයි ඒ මහතා වැඩිදුරටත් පැවැසීය.

■ ජී.අයි.ආර්. ගරුසිංහ - වැල්ලවාය විශේෂ

# කොස්ලන්ද - බෙරගල පාරේ වැඩ අවසන් වන්නේ කවදා ද?





දියවින්නේ ඒ ශ්‍රේණියේ සිව්වැනි මාර්ගය ලෙසින් හඳුන්වන කොළඹ මඩකළපුව මාර්ගයේ සංවර්ධන නොකළ වැල්ලවාය කොස්ලන්ද බෙරගල දක්වා වූ කිලෝමීටර 35ක මාර්ගයේ කොටසේ වැඩ අවසන් වන්නේ කවදාදැයි පළාත්වාසීහු විමසති.

මෙම මාර්ගය කලක සිට දැඩිලෙස අබලන් වී ඇති අතර කලකට පෙර ජනතාව අතර ඉතාමත් ජනප්‍රිය මාර්ගයක්ව පැවතිණි. දෛනිකව විශාල පිරිසක් මෙම මාර්ගය ප්‍රයෝජනයට ගන්නා අතර භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගැනේ.

කන්ද උඩරට එළවළු පලතුරු ඇතුළු ආහාර ද්‍රව්‍ය මෙන් විවිධ රජයේ පෞද්ගලික ආයතන කරා යන සේවක පිරිස් පාසල් දරුවන් දහස් ගණනක් දිනපතා මෙම මාර්ගය ප්‍රයෝජනයට ගන්නා අතර මාර්ගයේ ඇති අබලන්තාව හේතුවෙන් ඔවුහු දැඩි ලෙස අසරණ වී සිටිති.

මේ සම්බන්ධයෙන් අදහස් දක්වන පළාත්වාසීහු පිරිසක් මෙසේ කියා සිටියහ.

ලංකාවේ හැම පාරක්ම හැදෙනවා. ගම්වල අතුරුපාරවල් පවා කාපට් අතරනවා. ඒත් මේ පාරට බාලගිරිදෝසේ වගේ අද නෙවෙයි හෙට හැමදාමත් ඔය කතාව විතකරයි පාලකයෝ කිව්වේ.

අපි වත්මන් ජනාධිපතිතුමාට කියන්නේ මේ පාරේ කිලෝමීටර් 35 හදලා ජනතාවගේ ප්‍රධාන ප්‍රවාහන අවශ්‍යතාව සම්පූර්ණ කරලා දෙන්න මැදිහත්වෙන්න කියලා. පාර හරියට නැති නිසා තමයි මේ නගරයක්වත් දියුණුවක් දකින්න නැත්තේ. 2015 වසරේ මේ පාරේ වැඩ ආරම්භ කළේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්තයා. එතුමාගේ පරාජයෙන් පස්සේ යහපාලන ආණ්ඩුව පාරේ වැඩ නතර කළා. ඒ වෙනකොට පාලම් පහක් හැදුවා කිලොමීටර් දෙකක් පමණ කාපට් ඇතිරීම කළා. එතනින් එහාට පහුගිය අවුරුදු පහේ කිසිම සංවර්ධනයක් වුණේ නෑ.

මේ පාර පවුල් දහස් ගණනක් දෛනිකව ප්‍රයෝජනයට ගන්නා උඩරට දකුණ යාකරන පාරක්. ඒවගේම කොළඹ ඉඳලා මඩකළපුව දක්වා යන ප්‍රධාන මාර්ගය. උඩරට එළවළු ටික ගෙනියන්නේ මේ පාරේ. ලංකාවේ පළාත් පහක සුන්දරත්වය දකින්න පුළුවන් පාරක්. දියලුම දිය ඇල්ල තියෙන්නෙත් මේ පාරේ.

■ නන්දසිරි වැලිගමගේ - ගාල්ල දිසා සමූහ

# මෙත්සිරි ද සිල්වාට සිංහ සම්මාන ත්‍රිත්වය



ගාල්ල මහ නගර සභාවේ හිටපු නගරාධිපතිවරයකු හා වර්තමානයේ එහි නාගරික මන්ත්‍රිවරයකු වූ මෙත්සිරි ද සිල්වා මහතාට සිංහ සේවයට ලද සම්මාන ත්‍රිත්වය මෙවර හිමිවිය.

ගාලුපුර සෙන්ට්‍රල් සිංහ සමාජයේ සාමාජික සිංහයකු ලෙසත්, දිස්ත්‍රික් කැබිනට් නිලධාරියකු සේම " Honorary committee chairperson " ලෙසත් 2019/2020 සිංහ වර්ෂයේදී සිදුකරන ලද දිස්ත්‍රික් ව්‍යාපෘතියක් වූ " සිහ ගුරු ඇගයුම 2019 " සහ " කොවිඩ් 19 හේතුවෙන් අසරණ වූ ජනතාවට වියළි ආහාර ලබා දීමේ මානුෂීය මෙහෙවර " උදෙසාත් මෙම සම්මානය මෙසේ හිමි වී ඇත.

2019/2020 සිංහාධිපති සිංහ කුමුදු කිත්සිරි සහ 2020/2021 සිංහාධිපති සිංහ අජිත් ලියනගේ මැතිතුමන්ලාගේ සුරතින් මෙම විශේෂ ඇගයීම් තිළිණය ප්‍රදානය කරනු ලැබිණි.

■ ඩබ්ලිව් .පී.ධර්මසේන - මාතර සමූහ

# නිවෙස තුළ මිය ගිය පුද්ගලයාගේ මරණය මිනීමැරුමක්

හක්මන උඩුපීල්ලගොඩ නිවෙසක් තුළ මියගොස් සිටි 60 හැවිරිදි පුද්ගලයාගේ මරණය මිනීමැරුමක් බවට හෙළි වී ඇත. නිවෙස තුළ තනියම ජීවත් වූ සමරසිංහ ගුණසේකර ලියනගේ ආරියරත්න යන 60 හැවිරිදි මෙම පුද්ගලයා පසුගියදා (23) නිවෙස තුළම මියගොස් ප්‍රදේශයේ ඇතිව තිබූ දුර්ගන්ධය අනුව මෙම පුද්ලයාගේ සිරුර පසුගියදා (26) ඔහුගේ සහෝදරයකු විසින් සොයාගෙන තිබිණි.

මෙම සිරුර බෙහෙවින් නරක් වී තිබූ අතර මොහුගේ නිවෙසේ දොරවල් පිටතින් ඉබි යතුරු දමා තිබියදී සැකයට බඳුන් වී ඇත. හක්මන හදිසි මරණ පරීක්ෂකවරයාගේ නියෝගය පරිදි පසුගියදා (28) පශ්චාත් මරණ පරීක්ෂණය පැවත්විණි.

ඒ අනුව මෙය හිස මහතට පතිතවූ මොට ප්‍රහාරයක් හේතුවෙන් මොලයට සිදුවූ හානිවලින් සිදුවූ මරණයක් බව අධිකරණ වාර්තාවේ සඳහන් වේ. හක්මන පොලීසිය නිවෙස පරීක්ෂා කිරීමේදී තැන තැන විසිරී තිබූ බෝතල් කටු කිහිපයක් සහ නිවෙස තුළ ලේ පැල්ලම් කිහිපයක් තිබෙන අයුරු දැක ඇත. සිද්ධිය පිළිබඳව දෙයියන්දර මහෙස්ත්‍රාත්වරයා පරීක්ෂණයක් පැවැත් වූ අතර සිද්ධියේ සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට හක්මන පොලීසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

■ ඒ.ඒ.එල්. ඩයස් - මාතලේ දිස්ත්‍රික් සමූහ

# හත්වැනි වරටත් කසිප්පු පෙරූ සැකකරුට දඩ

හත්වැනි වරටත් කසිප්පු ජාවාරමේ යෙදුණු පුද්ගලයකු දඹුල්ල පොලීසිය විසින් සිදුකරන ලද වැටලීමකදී කසිප්පු බෝතල් 15ක් සමග පසුගියදා අත්අඩංගුවට ගෙන දඹුල්ල දිසා/මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත්කරන ලදි.

මෙහිදී පොලීසිය අධිකරණය ඉදිරියේ කියාසිටියේ සැකකරු ප්‍රදේශයේ ප්‍රධාන පෙළේ කසිප්පු ජාවාරම්කරුවකු බවය. මොහු මීට පෙරද මෙවැනිම චෝදනාවන් සඳහා අධිකරණයෙන් හය වතාවක්ම දඬුවම් ලබාඇති බව ද පොලීසිය වැඩිදුරටත් සඳහන් කළේය.

අනතුරුව විත්තිකරු චෝදනාවට වරද පිළිගත් බැවින් මහෙස්ත්‍රාත් අයි.එම්.එස්.බී. ඉලංගසිංහ මහතා විසින් ඔහුට රුපියල් එකොළොස්දහසක දඩයක් ගෙවීමට නියෝග කළේය.

■ පී.පී.පී. සුගතදාස - තිහගොඩ සමූහ

# මාර්ග අනතුරක් සිදු කළ විත්තිකරුට දඩ සහ ඇප

මාර්ග නීති උල්ලංඝනය කරමින් අධික වේගයෙන් කැබ් රථයක් පදවා වෙනත් වාහන 5ක් අනතුරට ලක් කිරීම, ත්‍රිරෝද රථ රියැදුරකුගේ මරණය සිදු කිරීම සහ තවත් පුද්ගලයකුට බරපතළ තුවාල සිදු කිරීමේ චෝදනා යටතේ පොලීසිය විසින් අත්අඩංගුවට ගනු ලැබූ සැකකරුවකු මාතර අතිරේක මහෙස්ත්‍රාත් හා අතිරේක දිසා විනිසුරු ඩී.කේ. පරණලියනගේ මහතා වෙත ඉදිරිපත් කිරීමෙන් පසු විත්තිකරුට රුපියල් දසදහසක මුදල් ඇපයක් සහ රුපියල් ලක්ෂ 01 බැගින් ශරීර ඇප දෙකක් තබන ලෙස නියෝග කළේ ය.

■ ඩී.එස්. ගුණතිලක - ඌව වෙල්ලස්ස විශේෂ

# පෞද්ගලික බසයේ ඩිකියේ එළු මස්

අම්පාර සිට ගාල්ල දක්වා ධාවනය වෙමින් තිබූ පෞද්ගලික බස් රථයක් පසුගියදා (29) මොනරාගල බස් නැවතුම්පොළේදී පරීක්ෂා කිරීමේදී ඝාතනය කරන ලද එළුවන් නවදෙනකු මොනරාගල පොලීසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇත.

බස් රථයේ කොන්දොස්තරවරයා විසින් මොනරාගල පොලීසියට කරන ලද දැනුම්දීමක් අනුව මොනරාගල බස් නැවතුම්පොළේදී බස් රථය පරීක්ෂා කිරීමේදී ඩිකියේ තිබූ ඉටි කවරවලට දමන ලද එළුවන් නව දෙනා සොයාගෙන තිබේ.



# දේශවංශය

දේශයේ පාලන මාවත




# මතභේද මැද සේදී ගිය වමේ බලය

**සමසමාජ පක්ෂය තුළ දෙස් විදෙස්හි කීර්තියට එන්.එම්, කොල්වින්, ලෙස්ලි, විවියන්, බර්නාඩ් සොයිසා වැනි දේශපාලනඥයන් දේශපාලන රංගපීඨයෙන් සමු ගැනීමේ අඩුව පිරිමසාලීම සඳහා දෙවන පෙළ නායකත්වයක් නොතිබීම පක්ෂයේ කඩාවැටීමට ප්‍රබල හේතුවකි.**

1935 වැනි ඈත යුගයක පිහිටුවන ලද ලංකා සමසමාජ පක්ෂය මේ වන විට ඛේදනීය අයුරින් වඳ වී යෑමකට ලක් වීම දේශපාලන ලෝකය තුළ සාකච්ඡාවට බඳුන් වී තිබේ. ලෙස්ලි ගුණවර්ධන, ආචාර්ය එන්.එම්.පෙරේරා, පිලිප් ගුණවර්ධන, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා හා රොබට් ගුණවර්ධන වැනි කෘතහස්ත දේශපාලන නායකයන් නවීන දේශපාලන දර්ශනයක් මත ලසසප ආරම්භ කරන ලදී. සසපයට ගුරු වූයේ රුසියානු විප්ලවීය නායකයෙකු මෙන්ම රතු හමුදාවේ ද නායකත්වය දැරූ ලියොන් ට්‍රොට්ස්කි දේශපාලන බුද්ධිමතාගේ දේශපාලන දර්ශනයයි. වැඩිකලක් නොගොස්ම සමසමාජය විවිධ මතවාදී කරුණු මත පුපුරා යන්නට විය. 1940 දී වෛද්‍ය එස්.ඒ. වික්‍රමසිංහ, එම්. ජී. මැන්ඩිස්, පීටර් කේනමන් සහ වෛත්‍යලිංගම් පක්ෂයෙන් නෙරපාහරින ලදී. මාක්ස්වාදයේ පියා වශයෙන් ප්‍රකට පිලිප් ගුණවර්ධන ද පක්ෂයෙන් ඉවත්ව විප්ලවකාරී සමසමාජ පක්ෂය පිහිටුවා 1956දී මහජන එක්සත් පෙරමුණට එකතු විය. ඉන් පසු 1964දී දෙවෙනි පිපිරීම සිදු විය. එහිදී එඩ්මන් සමරක්කොඩි, මෙරිල් ප්‍රනාන්දු, වී. කරාලසිංගම් සහ බාලා තම්පෝ පක්ෂය හැර ලසසප (විප්ලවකාරී) පිහිටුවා ගත්හ. ලසසප තරුණ සංගම් නායක වාසුදේව නානායක්කාර 1977දී පක්ෂය හැර ගොස් නව ලසසපය ආරම්භ කළේය. ශ්‍රීලනිපක්ෂය සමඟ සන්ධානගත වීමට එරෙහිව 1982දී අනිල් මුණසිංහ, ජී.ඊ.එච්. පෙරේරා සහ විල්ප්‍රඩ් සේනානායක ද පක්ෂයෙන් ඉවත් වී වෙනත් පක්ෂයක් පිහිටුවූහ. මෙලෙස වරින් වර දේශපාලන කුණාටුවලට අසු වූ ලසසපය, කෙසේ හෝ හිස ඔසවා සිටි අතර, පසු කලකදී එන්.එම්, කොල්වින්, ලෙස්ලි සහ බර්නාඩ්ගේ අභාවයන් නිසා පක්ෂයේ කොඳුනාරටිය කැඩී ගියේය. ඔවුන්ගේ උසස් දේශපාලන පරිචය හා පෞරුෂත්වය පක්ෂයේ පැවැත්මට මහත් රුකුලක් වූවා නිසැකය. ප්‍රථම පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකයකු වූයේ ඇන්.ඇම්.ය. වාර්ෂික අයවැය විවාදයේදී හෝ වෙනයම් අතිශය වැදගත් විවාදයකදී කිසිදු පොතකට හෝ සටනකට යොමු නොවී එක එල්ලේ පාර්ලිමේන්තුව තුළ කරනු ලබන ව්‍යක්ත දේශන ලංකා දේශපාලන ඉතිහාසයේ මැනවින් සනිටුහන් වී තිබේ. ලසසප 1947 මැතිවරණයේදී ආසන 10ක් හා 1970දී 19ක් දිනාගැනීමට සමත් විය. ඉතිහාසය පුරා අධිරාජ්‍ය විරෝධී සහ කම්කරු සටන් උදෙසා ඇප කැප වී සිටි ලසසප 1953 හර්තාලයේ දී රට තුළ මහත් ප්‍රසිද්ධියට පත් විය. කම්කරු සටන්වලදී මෙන්ම දේශපාලන රැස්වීම්වලදී, හයිඩ්පිටිය, ගෝල්ෆේස්, ප්‍රයිස්පාක්, නිව් ටවුන් හෝල් සහ ඕවල් ක්‍රීඩාංගණය ඔවුන්ගේ යුද පිටියයි. දස දහස් ගණනින් රැස් වූ සටන්කාමී කම්කරුවන්ගේ ජය භූමිය එය විය. 1950, 1960 දශක ලසසපයේ ස්වර්ණමය යුගය විය.

අධිරාජ්‍ය විරෝධී සටන්වල පෙරමුණ ගැනීම, මැලේරියා වසංගතයේදී සතරකෝරළේ දුගී දුප්පත් අසරණ ජනතාවට පිහිට වීම, සමාජ ප්‍රගතිය, නොමිලේ සෞඛ්‍ය සේවය, ජීවන මට්ටම ඉහළ දැමීම, බැංකු සහ ඉඩම් ජනසතු කිරීම, ඉඩම් ප්‍රතිසංස්කරණ වැනි ප්‍රගතිශීලී කටයුතුවල ඔවුහු පෙරමුණගෙන සටන් කළහ. ඔවුන් දේශපාලන රංග පීඨයේ නොසිටින්නට සමහර විට රට අන්තවාදී මඟක් ඔස්සේ ගමන්කරමින් ජනතා සූරාකෑම උග්‍රවන්නට ද තිබුණි.

මෙවන් ප්‍රෞඪ ඉතිහාසයක් හිමි ලසසප සහ කොප වර්තමානයේ දේශපාලන බෙලිහීනත්වයකට පත් වූයේ ඇයි ද යන්න ගමේ ගොඩේ ජීවත් වන සාමාන්‍ය මිනිසුන් වශයෙන් විමසා බැලීම වටී.

ලසසප පිහිටුවන ලද්දේ බ්‍රිතාන්‍යයේ ප්‍රසිද්ධ විශ්වවිද්‍යාලවල උසස් අධ්‍යාපනය නිම කර මාක්ස් - ලෙනින් විප්ලවීය අදහස් කරපින්නාගෙන සිටි දේශීය උගත් තරුණ පිරිසක් විසිනි. එන්.එම්. ලන්ඩන් ආර්ථික විද්‍යා නිකේතනයේ මහාචාර්ය හැරල්ඩ් ලැස්කි යටතේ දේශපාලන හා ආර්ථික විද්‍යාව හැදෑරූ උසස් බුද්ධිමතෙකි. ඉන්දීය වාම දේශපාලනයේ පතාක යෝධයකු වූ වී.කේ (කුන්ජි) ක්‍රිෂ්ණ මෙනන් ඔවුන්ගේ සමකාලිකයෙකි. බ්‍රිතාන්‍යයේ ලිබරල් අධ්‍යාපනය ලත් ඔවුහු පාර්ලිමේන්තු ක්‍රමය ප්‍රතික්ෂේප නොකළහ. ලසසපයේ සාර්ව භෞමික (Cosmopolitan) ප්‍රවේශය මෙන්ම උග්‍ර චාරවාදී (IDEOLOGICAL PURITANISM)_ ප්‍රතිපත්ති හිස මත තබාගෙන ක්‍රියා කිරීම නිසා රට වැසියා සහ පක්ෂය අතර දුරස්ථභාවය හටගැනීම පක්ෂයේ පිරිහීමට එක් හේතුවකි. ලසසප මෙන් නොව එජාපය සහ ශ්‍රීලනිපය යන දෙකම දේශීයත්වය මත ගොඩ නැගුණු පක්ෂයන්ය. ගමේ ස්කෝලෙ මහත්තයට හෝ වෙද මහත්මයාට එම පක්ෂවලට විශේෂයෙන් ශ්‍රීලනිපය දේශපාලනයට පහසුවෙන් සම්බන්ධවීමට හැකිවිණි. ඔවුනට පැටිකිරිය පරීක්ෂා කිරීමක් (POLITICAL VETTING) හෝ පක්ෂයේ ආධුනිකත්ව කාලයකට භාජනය වීමක් නොවීය. ලසසප මුල්කාලවලදී එංගලන්තයේ කම්කරු පක්ෂය හා වෘත්තීය සමිති ව්‍යාපාරය තුළින් මහත් ආභාසයක් ලැබීය.

කම්කරු පන්තිය වැලඳගත් ල.ස.ස.ප.යට රටේ බහුතරය වූ ගොවි ජනතාව අමතක විය. ඔවුන් අතරට ප්‍රවේශ වීමක් නොවූ තරම්ය. ගොවි ජනතාව සමඟ අත්වැල් බැඳගෙන ඉදිරියට යාම වෙනුවට කොළඹ වරායේ කම්කරුවන් පමණක් කේන්ද්‍රය කරගැනීම පක්ෂයට සිදු වූ බලවත් පාඩුවකි. පසු කලෙකදී ශ්‍රීලනිපය සහ එජාප දේශපාලන නායකකාරකාදීන් සුපුරුදු පරිදි මේස් බැනියමක් ඇඳ, සරම කැසපට කවමින් වප්මඟුල්වලට සහභාගි වූ අවස්ථා පුවත්පත්වල මුල් පිටුවේ පළ විණි.

ඔවුහු එහිදී කිසිදු පැකිළීමකින් තොරව ගොවීන් විසින් පිළියෙල කරන ලද බත අනුභව කළහ. මේ පාලකයින් හා පාලිතයින් අතර, අනිවාර්යෙන්ම තිබිය යුතු සංස්කෘතික බැම්මකි.

පක්ෂයට සාමාජිකයන් බඳවා ගැනීමේදී ලස්සප අනුගමනය කළේ දැඩි කඨෝර ක්‍රියා මාර්ගයකි. සාමාජිකත්වය අපේක්ෂිත අයදුම්කරුවන් ප්‍රදේශයේ වෘත්තිය සමිති, තරුණ සහ කාන්තා සංවිධානවල ක්‍රියාකාරීන් වීම අත්‍යවශ්‍යය. ස්ථිර සාමාජිකත්වය ලැබීමට පෙර මාස කීපයක් ආධුනික කාලයක් සම්පූර්ණ කිරීම අවශ්‍ය බවක් ද කියැවේ. අනිකුත් දේශපාලන පක්ෂවල සාමාජිකත්වය ලබාගැනීමේ ක්‍රියාමාර්ග සරල හා ලිහිල්ව පවතිද්දී මෙබඳු යල් පැනගිය ක්‍රම මගින් පක්ෂයට තරුණයන් බඳවා ගැනීම උගහට විය.

1956 බණ්ඩාරනායකගේ සංස්කෘතික විප්ලවය විසින් සිදු කරන ලද පොදු ජන උදාව සහ සංස්කෘතික පුනරුදය සාම්ප්‍රදායික වාමාංශික පක්ෂවලට බලවත් පහරක් විය. 1956 කෝපාවිෂ්ට දරුවන් (ANGRY CHILDREN OF 56) අතුරින් පැන නැඟී 1971වාමවාදී තරුණ නැඟිටීම "ගහෙන් වැටුන මිනිසාට ගොනා ඇන්නා" බඳු විය. එම තරුණ පිරිස්වලට සමීපතම ආදර්ශය වූයේ කියුබානු විප්ලවවාදී චේ ගුවේරා සහ ජනාධිපති ෆිදෙල් කස්ත්‍රෝය. මාඕගේ චීන විප්ලවය, ඉන්දීය ජාතික කොන්ග්‍රසය වැනි රටේ මහජනතාව තොගපිටින් ආකර්ෂණය කරගත් අවස්ථා දෙස ආපසු හැරී බලන විට සසසප සහ කොප ජනතාව ආකර්ෂණය කරගැනීමට බෙහෙවින් අසමත් වූ බව පැහැදිලිය.

1970 සමගි පෙරමුණ රජයේ ල.ස.ස.ප. නායකයන් විසින් නිර්මාණය කරන ලද 1972 ජන රජ ව්‍යවස්ථාව වෙතින් රාජ්‍ය සේවයේ සහ අධිකරණයේ ස්වාධීනත්වය නැති කිරීමට එරෙහිව උගත් ස්වාධීන පිරිස් මහත්සේ උරණ වූහ. ල.ස.ස.ප. තුළ දෙස් විදෙස් හි කීර්තියට එන්. එම්, කොල්වින්, ලෙස්ලි, විවියන්, බර්නාඩ් සොයිසා වැනි දේශපාලනඥයන් දේශපාලන රංගපීඨයෙන් සමු ගැනීමේ අඩුව පිරිමසාලීම සඳහා දෙවන පෙළ නායකත්වයක් නොතිබීම පක්ෂයේ කඩාවැටීමට ප්‍රබල හේතුවකි. 1971 සහ 1988 /89 ජවිපයේ තරුණ නැගිටීම රට තුළ එක්තරා හැරවීමේ ලක්ෂ්‍යයක් වූවා නිසැකය. මෙම උගත්, බුද්ධිමත් තරුණ පිරිස ල.ස.ස.ප. හෝ කොප වෙත ඇදීයනවා වෙනුවට අන්‍ය මඟක් ගැනීම එම පක්ෂවල අනාගතයට හෙනහුරා ලැබුවා වැනිය.


1885දී ඉංග්‍රීසි ජාතික ඩක්ටේවියන් හියුම් විසින් ආරම්භ කරන ලද ඉන්දීය කොන්ග්‍රස් පක්ෂය නේරු -ඉන්දිරා - රජීව් යුග සාර්ථක ලෙස පසු කර රජීව් පුත් රාහුල් ගාන්ධිගේ නායකත්වය යටතේ වැඩිකලක් නොගොස්ම පිරිහීමකට ලක් වී සිටී. පසුගිය මහ මැතිවරණයේදී මෙරට එක්සත් ජාතික පක්ෂයට අත් වූ ඉරණම ඛේදජනකය.

කිසියම් දේශපාලන පක්ෂයක් ජනතාව සමගම සිටිනතාක් එහි පැවැත්ම ස්ථිරය. පක්ෂය හා ජනතාව අතර පරතරය වැඩි වත්ම පක්ෂයේ දිරායෑම වැළැක්විය නොහැකිය.

ලසසප සහ කොපය යළි හිස ඔසවා සක්‍රිය දේශපාලනයට ප්‍රවේශ වීමේ කිසිදු ලකුණක් පේනතෙක් මානයේ හෝ නැත.

**කේ.ඩී.එම්. කිත්තන්පහුව**

# විප්ලවවාදියාගේ අවසන් මොහොත




කියුබානු විප්ලවයට පණ දුන් අසහාය විප්ලවාදියා චේ ගුවේරාගේ ජීවිතය පිළිබඳ ලොව පුරා ජනතාව ඇති තරම් කියවන්නට ඇත. ඔහු තරම් කතාබහට ලක් වූ වෙනත් විප්ලවාදියකු ද නැති තරම්ය. 1967 ඔක්තෝබරයේ 9 වැනිදා බොලීවියාවේදී ඝාතනයට ලක් වූ මේ ආජෙන්ටිනා ජාතිකයා කවුරුත් කියන්නේ විප්ලව කරන්නටම උපන්නකු බවය. අවුරුදු 39ක් වැනි කෙටි කාලයකින් ජීවිතය හැර යෑමට සිදු වූයේ ද ඔහු තුළ තිබූ විප්ලව පිපාසය හේතුවෙනි. ඔහුගේ ඉරණම තීන්දු වූයේ බොලීවියාවේ විප්ලවයට නායකත්වය දෙමින් සිටියදීය. චේ ගේ ජීවිත කතාව ලොව පුරා අතිශය ජනප්‍රිය අප දානයක් වූවත් ඔහුගේ අවසන් හෝරාවේ සිදු වූ බොහෝ කරුණු ලොවට රහසක් වී තිබිණි. ඔහුගේ ඝාතනයෙන් දශක පහකට පසු එය ලොවට අනාවරණය කරනු ලැබුවේ චේ අත්අඩංගුවට ගත් බොලීවියානු හමුදාවේ එවකට සිටි කපිතාන් ගැරී ප්‍රාඩෝ සොලමන් ය.

දකුණුදිග බොලීවියාවේ යූරෝ පළාතට අයත් විශාල වනාන්තරයකදී චේ අල්ලා ගත්තේ කපිතාන් නායකත්වය දුන් හමුදා කණ්ඩායමකි. ඔහු ඝාතනය කරනු ලැබුවේ පැය විසිහතරක් යාමටත් පෙරය. පසුකලෙක බොලීවියානු යුද හමුදාවේ ජෙනරාල් ධුරය දක්වා ඉහළටම ගිය ගැරී ප්‍රාඩෝ මීට වසර දෙකකට පෙර චේ ගේ අවසන් පැය කිහිපය ගැන ලොවට හෙළි කළේ එතෙක් කාලයක් සඟවා සිටි රහස මෙලොවින් සමුගැනීමට පෙර ලොවට හෙළි කළ යුතු බවට තීරණය කිරීම නිසාය.

'ඔක්තෝබර් 8 වැනිදා මගේ සෙබළුන් ගල් පර්වතවලින් හා ගස්වැල්වලින් පිරුණු යූරෝ පළාතේ මෙහෙයුම් කටයුතුවලයි නිතරවී සිටියේ. එදා 1.00ට විතර ඔවුන් කෑගැසුවා පුද්ගලයන් දෙදෙනෙක් අල්ලා ගත් බව කියමින්. ඔවුන් දැකීමට මම මීටර් 20ක් විතර ඉහළට ඔවුන් වෙත දිව ගියා. ඉන් එක් පුද්ගලයෙක් කියා සිටියා ඔහුගේ නම චේ ගුවේරා කියලා. අනිත් පුද්ගලයා විලී කියලයි කිව්වේ.'

'ඒ වෙද්දී රජයට එරෙහි අරගලයට චේ ගුවේරා නමින් පුද්ගලයන් සිවුදෙනකු පමණ එක්වී සිටි බවයි අපිට වාර්තාවෙලා තිබුණේ. ඒ නිසා මට ඔහු හරියටම හඳුනාගැනීමට සිදු වී තිබුණා. ඔබේ දකුණත පෙන්වන්න කියා මා ඔහුට කිව්වා. මොකද මට වාර්තා වුණු තොරතුරුවලට අනුව චේගේ දකුණතේ තුවාල කැළලක් තිබෙනවා. සැබැවින්ම ඒ තුවාල කැළල ඔහුගේ දකුණතේ තිබුණා. නමුත් ඡායාරූපවල අපි දැකලා තිබුණු ආකාරයේ රූපයක් නෙවෙයි ඔහුට තිබුණේ. ඔහුගේ මුහුණ ඉතා දුක්ඛිත පෙනුමක් ගත්තා. කිලිටි, දුර්ගන්ධය හමන ඇඳුමින් සැරසී සිටියා. ඔහු මාස ගණනාවක් තිස්සේ වනාන්තරයේ සැරිසැරූ බවක් පෙනෙන්නට තිබුණා. දිගට වැවුණු හිසකේ ඉතා අපිරිසුදුයි. ඒ වගේම ඒවා ගැට ගැසී තිබුණා. ඔහුගේ දිගට වැවුණු රැවුළ පෙනුණේ පඳුරක් වගෙයි. ඔහු බොත්තම් නැති නිල් පැහැති කබායක් හැඳ සිටියා. ඔහුගේ හිස්වැස්ම අපවිත්‍ර වී තිබුණා. ඔහු සපත්තු පැලඳ සිටියේ නෑ. ඔහුගේ දෙපා සතුන් සමග පොරබැදිමෙන් තුවාල වී තිබුණා. ඔහු පැලඳ සිටි මේස් අපිළිවෙළයි එකක් නිල්පාටයි. අනික රතු පාටයි. මහපාරේ සිඟමන් යදින්නන්ගේ පෙනුමක් සැබැවින්ම ඔහුට තිබුණේ. ඔහු අත ඇලුමිනියම් භාජනයක් තිබුණා. එහි බිත්තර 6ක්. ඒ කියන්නේ ඔහු ගම්වැසියන් සමග ගැවැසී ඇති බවයි.'

'චේ ගේ දකුණු පාදයේ කලවා පෙදෙස තුවාල වී තිබුණා. එය මගේ සෙබළුන් තැබූ වෙඩි පහරකින් ඇති වූ තුවාලයක්. ඔහු සම්පූර්ණයෙන්ම අධෛර්යට පත් වී තිබූ බවක් පෙනුණා. ඔහුගේ සගයන් සියලුදෙනාම වගේ ඒ වෙද්දි මියගොස් තිබූ නිසා චේ සිටියේ නොසතුටකිනුයි. මේ තමාගේ අවසානය බව ඔහුට දැනෙන්නට ඇති. '

'මේක තමයි අවසානය කැප්ටන්..'මම ඔහුට එසේ කිව්වා.

'දැන් ඔබ අපේ සිරකරුවෙක්..'

'ඔහු මගෙන් වතුර ඉල්ලා සිටියා. ඔහු අත ප්ලාස්ටික් වතුර බෝතලයක් තිබුණත් එය පාවිච්චි කිරීමට මම ඉඩ දුන්නේ නෑ. මේ මිනිසා වස පානය කොට ජීවිතය නැති කරගනීවි කියා මට බයක් දැනුණා. ඒ නිසා මා මගේ වතුර බෝතලයෙන් ඔහුට බීමට දුන්නා. මා සතු සිගරට් කිහිපයකුත් දුන්නා. ඔහු සතුව තිබූ සියලු දේ මා සන්තකයට ගත්තා. එහි ඔහුගේ දිනපොත් කිහිපයක් සමග මුදලුත් තිබුණා. ඔහු අත පිස්තෝලයක් තිබුණත් එහි උණ්ඩ තිබුණේ නෑ. ඒ කියන්නේ ඔහු ඒ මොහොතේ නිරායුධවයි සිටියේ.'

චේ සතුව රොලැක්ස් වර්ගයේ අත් ඔරලෝසු දෙකක් තිබුණා. ඉන් එකක් ඔහු පැලඳ සිටි අතර අනික තිබුණේ ඔහුගේ සාක්කුවේ. එය ඊට දින කිහිපයකට පෙර මියගිය ඔහුගේ ගරිල්ලා සගයකුගේ බව ඔහු මට කිව්වා. ඒවා ෆිදෙල් කැස්ත්‍රෝ තමාට හා තම සගයන්ට සමුගැනීමේ තෑගි හැටියට දුන් ඒවා බවයි කිව්වේ.'

එදින පස්වරුවේ 5ට පමණ මා මගේ හමුදා ප්‍රධානින්ට චේ අල්ලා ගත් බව වාර්තා කළා. තුවාල ලැබූ චේ ඇතුළු සිරකරුවන් ලා හිගුවේරා වෙත ගෙන ගියා. එය වනාන්තරයට කිලෝමීටර් 2ක් ඈතින් පිහිටා තිබූ ස්ථානයක්. අපි රාත්‍රිය ගත කළේ එහිදියි. එය නිවාස 20ක් පමණ ඇති කුඩා ගම්මානයක්.

චේට ඇවිදීමට නොහැකි නිසා මගේ සෙබළුන් ඔහු වාරු කරගෙන රැගෙන ගියා. සිරකරුවන් රැගෙන යෑමට අප අසලට පැමිණ සිටි ගැමියන් අපට උදව් කළා. ගරිල්ලා සටන්කාමීන් සමග යුද වැදුණු අපිට නිරන්තරයෙන්ම ගැමියන්ගේ උදව් උපකාර ලැබුණා. ඔවුන් විශ්වාස කළා අපි අපේ රට සටන්කාමීන්ගෙන් බේරා ගැනීමට යුද්ධ කළ බවට.

එදා රාත්‍රියේ අප ඒ ගම්මානයේ කුඩා පාසලක චේ ඇතුළු සිරකරුවන් රඳවා තැබුවා. එක් පන්ති කාමරයක විලී සහ මියගිය අනිත් සටන්කාමීන්ගේ සිරුරු තැබුවා. චේ වෙනත් කාමරයකයි තැබුවේ. සිරකරුවන් දෙදෙනාටම අපි ආහාර පාන ලබාදුන්නා. අල සහ බත්. කෝපි සහ සිගරට් පවා දුන්නා. මා නිදි වර්ජිතවයි සිටියේ. රාත්‍රියේදී අවස්ථා අටකදී පමණ මා චේ සමග කතා කරන්නට උත්සාහ කළා. ඔහුට වුවමනා වුණේ මීළඟට සිදුවන්නේ කුමක්දැයි දැනගැනීමටයි. ඔහු සියලු තොරතුරු අපෙන් සඟවන්න උත්සාහ කළා. කිසිවකු පාවා නොදීමට තරම් පරිස්සම් වුණා.

අපි දෙදෙනාම ඒ මොහොතේ උදා වී ඇති තත්ත්වය අවබෝධ කරගැනීමටයි උත්සාහ කළේ.

'ඇයි ඔබ බොලීවියාවට ආවේ..?' මා ඔහුගෙන් විමසා සිටියා.

ඔහු පිළිතුරු දුන්නේ නෑ.

'ඔබ ඇයි මෙහේ ආවේ..?' මා නැවතත් අසා සිටියා.

'මේක මගේ තීරණයක් විතරක් නෙවෙයි. ඉහළින් ගත්තු තීරණයක් නිසයි මං මෙහේ ආවේ.' ඔහු කියා සිටියා.

'ඉහළින්..ඒ කියන්නේ ෆිදෙල් ද..? මා අසා සිටියා.

අපි දෙන්නා කියුබානු විප්ලවය ගැන කතා කළා.

'ඔබ අමෙරිකානුවන්ගෙන් පුහුණුව ලැබූ කෙනෙක්.' ඔහු කිව්වා.

'ඔව්... ඔබ රුසියාවෙන් පුහුණුව ලැබූ කෙනෙක්.' මා කිව්වා.

'අපි දෙන්නම ලොව බලවතුන්ගේ රූකඩ..' එසේ මා කී දෙයට ඔහු එකඟ වුණා.

පසුදින අංක අටේ සේනාංකයේ අණදෙන නිලධාරී කර්නල් සෙන්ටිනෝ හෙලිකොප්ටරයක් මගින් පැමිණ සිටියා. මා ඔහුට වාර්තාවක් සමග චේ ඇතුළු සිරකරුවන් දෙදෙනා බාර දුන්නා. සෙන්ටිනෝ සමග සී.අයි.ඒ. නියෝජිත ෆීලික්ස් රොඩ්රිගස් පැමිණ සිටියා.

එදින මා ලා හිගුවේරා ගම්මානයෙන් පිටත්ව ගියේ තවත් ගරිල්ලා සටන්කාමින් පිරිසක් සොයන මෙහෙයුමකටයි. චේ මියගොස් ඇති බව දැනගත්තේ සටන්කාමීන් පිරිසක් අල්ලාගෙන නැවත පැමිණීමෙන් පසුවයි.

ඔහු මරා දැමූ බව මගේ සේනාංකයේ අණදෙන නිලධාරී මේජර් අයෝරෝවා මට දන්වා සිටියා. එදින පස්වරු 1.30ට පමණ චේ ගේ සිරුර හෙලිකොප්ටරයක් මගින් රැගෙන ගියා. එය තමා අවසන් වතාවට මා ඔහු දුටුවේ. චේට වෙඩි තබා තිබුණේ මරියෝ ටෙරාන් විසිනුයි. ඒ සිදුවීම පසුව ඔහු මට විස්තර කළා.

එවකට බොලීවියානු ජනාධිපතිවරයා චේ මරා දමන ලෙස නියෝග කිරීමෙන් පසුව ඒ සඳහා සෙබළකු තෝරාගැනීමට සිදු වී තිබූ බවයි ටෙරාන් කීවේ. කර්නල් සෙන්ටිනෝගේ නියෝගයකට අනුව ටෙරාන් සහ තවත් සෙබළකු තෝරාගෙන තිබුණා. සෙබළුන් දෙදෙනා පාසල් කාමර දෙකට යවා තිබුණා. ටෙරාන් ගියේ චේ සිටි කාමරයටයි. අනිකා ගියේ විලී සිටි කාමරයටයි.

ඔවුන්ගේ වෙඩි තැබීම ඉතා වේගයෙන් සිදුවූවක්. ටෙරාන් මට කීවේ එක් වෙඩි පහරකින්ම චේගේ ප්‍රාණය නිරුද්ධ වූ බවයි. චේ එලෙස මෙලොව හැරගියේ කිසිම කතාවකින් තොරවයි. කිසිම සමුගැනීමකින් තොරවයි.

**ෆවුස් මොහොමඩ්**

# අතට ආ නායකකම එපා කී බණ්ඩා



අපි සාමාන්‍යයෙන් දකින්නේ සිංහ හම් පොරවා ගත් බැටලුවන්. නමුත් අර ඉන්නේ බැටලු හම පොරවාගත් සිංහයෙක්.

එක්තරා යුගයක ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව දෙසින් ඇසුණු කතාවකි ඒ. මේ වර්ණනාව සුවිශේෂී අන්දමේ වර්ණනාවකි. ඒ මක්නිසාද මෙය ආණ්ඩු පක්ෂයේ අගමැතිවරයා විසින් විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් උදෙසා කළ වර්ණනාවක් වීමයි. එක්දහස් නවසිය පනස් ගණන්වල එක්තරා පාර්ලිමේන්තු වාරයකදී ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිවරයා විසින් එවකට විපක්ෂයේ මන්ත්‍රීවරයෙක්ව වර්ණනාවට පාත්‍ර කළේ නියම සිංහයෙක් කියාය. එසේ වර්ණනාවට පත් වූයේ අන් කිසිවෙක් නොව එවකට පාර්ලිමේන්තුවේ විපක්ෂය නියෝජනය කළ එජාප මන්ත්‍රී එම්. ඩී. බණ්ඩාය. පෙරළිකාරී චරිතයක් ලෙස මෙන්ම නිර්භීත, කෙළින් වැඩ කරන, අවංක ගති පැවතුම් ඇති නායකයෙකු ලෙස ප්‍රකට එම්. ඩී. බණ්ඩා අතීත ලාංකේය දේශපාලනයේ සුවිශේෂී වැදගත් චරිතයකි.

එම්. ඩී. බණ්ඩා උපත ලැබුවේ 1914 මාර්තු 09 වනදාය. පන්නෙලිය ගමේ පාසලෙන්, කොළඹ නාලන්දා විදුහලෙන් සහ මහනුවර අන්තෝනි විදුහලෙන් පාසල් අධ්‍යාපනය ලැබූ ඔහු ලංකා විශ්වවිද්‍යාලයෙන් උපාධිය ලබා කලක් ආදායම් පාලක නිලධාරියෙක් (ඩී. ආර්. ඕ.) ලෙස සේවය කළේය. ඒ අන්දමින් රජයේ සේවයේ නියුතුව සිටි එම්. ඩී. බණ්ඩා, දේශපාලනයට පිවිසෙන්නේ 1943 වසරේදීය. 1943 වසරේදී නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් ද 1947, 1952 සහ 1956 වසරවලදී මතුරට ආසනයෙන් ද 1960 මාර්තු සහ ජූලි මැතිවරණවලින් හඟුරන්කෙතින් ද 1965 දී පොල්ගහවෙලින් ද ආදි ලෙස විවිධ ප්‍රදේශවලින් මැතිවරණයන්ට ඉදිරිපත් වන ඔහු ඒවායින් ජය ගැනීමට සමත් විය. නමුත් 1970 වසරේ මැතිවරණයෙන් පරාජයට පත් වූ එම්. ඩී. බණ්ඩා මහතා මැතිවරණ ප්‍රතිඵල නිකුත් වූ වහාම තම නිල නිවෙස සහ නිල රථය රජයට බාර දී සිය ඇඳුම් බෑගයකට දමාගෙන, කොළඹ කොටුව දුම්රිය ස්ථානයෙන් තුන්වැනි පන්තියේ ටිකට් පත්‍රයක් ලබාගෙන දුම්රියෙන් පොල්ගහවෙලට යෑමට තරම් සරල පුද්ගලයෙක් විය.

1952 වසරේ අධ්‍යාපන ඇමැතිවරයා ලෙසත්, 1960 වසරේ දී ආහාර සහ වෙළෙඳ ඇමැති ලෙසත්, 1965 වසරේදී කෘෂිකර්ම සහ ආහාර ඇමැති ලෙසත් එම්. ඩී. බණ්ඩා මහතා කටයුතු කරනු ලැබීය. පාර්ලිමේන්තුවේදී මෙන්ම මැතිවරණ වේදිකාවලදී පවා එම්. ඩී. බණ්ඩාගේ කතාබහ ඉතාම සංවර විය. ඔහු පක්ෂ විපක්ෂ කිසිවෙකුටත් අපහාස කරමින් කතා කළේ නැත. ඩඩ්ලි සේනානායක මහතා ආරම්භ කළ වගා සංග්‍රාම වැඩපිළිවෙළට කෘෂිකර්ම සහ ආහාර අමාත්‍ය ධුරය දරමින් එම්. ඩී. බණ්ඩා මහතා කළ සේවාව අපරිමිතය.

දිනක් එම්. ඩී. බණ්ඩාගේ පුතෙක් රෝගාතුරව රෝහලකදී සැත්කමකට භාජනය විය. එහිදී එම්. ඩී. බණ්ඩා මහතා සැත්කම කළ වෛද්‍යවරයාට අදාළ ගාස්තුව ගෙවීමට සූදානම් විය. එහිදී වෛද්‍යවරයා සිදු කළ ප්‍රකාශය තුළින් එම්. ඩී. බණ්ඩාගේ චරිතවත් දේශපාලනය මැනවින් පෙනී යයි.

ඔබ වැනි විශිෂ්ට, නිහතමානී, විනීත දේශපාලකයකුගෙන් ගාස්තු අය කිරීම තම වෛද්‍ය වෘත්තියට කරන අගෞරවයක් යනුවෙන් වෛද්‍යවරයා පවසා සිටියේය. ඒ එම්. ඩී. බණ්ඩාගේ චරිතයට සමාජයෙන් ලැබුණු ගෞරව සහතිකයයි. 1970 දී ඩඩ්ලි සේනානායක මහතාගේ පරාජයෙන් පසුව එජාප නායකත්වයේ වෙනසක් සිදු කළ යුතුව තිබුණි. එහිදී එක්සත් ජාතික පක්ෂයේ නායකත්වයට එම්. ඩී. බණ්ඩාගේ නම ද යෝජනා විය. එවකට ඔහු පක්ෂයේ උප සභාපතිවරුන් දෙදෙනාගෙන් එක් අයෙක් විය. එම්. ඩී. බණ්ඩා මහතාට එම නායකත්වය රන් පළඟානක තබා පිරිනැමුණු අතර, පක්ෂයේ ඔහු සමඟ සම තනතුරේ සිටි අනෙක් උප සභාපති සමඟ තිබූ තරගයෙන් ඔහුට ජය හිමි විය. තමාට හිමි වූ පක්ෂ නායකත්වය තමා සමඟ තරග කළ තමා හා සම තනතුරේ සිටි උප සභාපතිවරයාට පිරිනමා එම්. ඩී. බණ්ඩා ඉන් ඉවත් වූයේ බලලෝභී දේශපාලනයක් තමන්ට නොතිබූ නිසාමය. ඔහු සමඟ නායකත්වයට තරග කළ සම උප සභාපතිවරයා වූයේ, පසුකලෙක රටේ නායකත්වයට පත් වූ ජේ. ආර්. ජයවර්ධන මහතාය.

එම්. ඩී. බණ්ඩා මහතා දේශපාලනයට ප්‍රවේශ වීමට පෙර රජයේ ඩී. ආර්. ඕ. තනතුරක් දැරූ රාජ්‍ය සේවකයෙක් විය. එවක දෙවන ලෝක යුද්ධ සමය වූ බැවින් අපේ රටේ ද දරුණු ආහාර හිඟයක් පැවතුණි. එහිදී එම්. ඩී. බණ්ඩා මහතා ගැමියන්ට සහ වතු කම්කරුවන්ට මඤ්ඤොක්කා දඬු බෙදා දුන්නේ ආහාර හිඟයට මුහුණ දීමට ජනතාව පුරුදු කරවීමටය. එම නිසාම ආහාර හිඟයෙන් ලද පීඩාව මඟහරවා ගත් ගැමියන් අතර එම්. ඩී. බණ්ඩා මහතාව බණ්ඩා පුතා යන නමින් ප්‍රචලිත විය. වතු දෙමළ ජනයා ඔහුව හැඳින්වූයේ කෙලෙංගු දොරේ නැතිනම් අල මහත්තයා ලෙසිනි. අධිරාජ්‍යවාදී යුගයේ ලක්දිව පැවති රාජකාරී ක්‍රමයට එම්. ඩී. බණ්ඩා සහමුලින්ම විරෝධය පළ කළේය. ඩී. ආර්. ඕ. තනතුර දැරූ හෙතෙම ළඟට රාජකාරියක් කරවා ගැනීමට පැමිණෙන ගැමියන් පඬුරු, තෑගි ආදිය රැගෙන ආ විට ඔහු ඒවා ප්‍රතික්ෂේප කර නියමිත කාර්යය කරවා දුන්නේය. එම්. ඩී. බණ්ඩා කෙතරම් නිවැරදිව කටයුතු කළත් දිනක් මහජන රැස්වීමකදී ඔහුගෙන් නිසි සේවයක් නොලැබෙන බව පවසමින් සුදු ඒජන්තවරයෙක් සහ දේශපාලකයෙක් විවේචන නඟන්නට වූහ. එහිදී මහත් සේ කම්පාවට පත් වූ එම්. ඩී. බණ්ඩා මහතා තම තනතුරු සියල්ල අතහැර දමා ගෙදර ආවේය. බණ්ඩාරනායක මහතා කෙළින් වැඩ කරන නියම සිංහයෙක් යැයි එම්. ඩී. බණ්ඩා මන්ත්‍රීවරයාව පාර්ලිමේන්තුවේදී වර්ණනා කිරීමට එම කාරණාවද හේතු විය.

එදා මහජන රැස්වීමේදී තමා විවේචනය කළ මන්ත්‍රීවරයා අල්ලස් චෝදනාවකට ලක්ව ධුරයෙන් පහ කර තිබූ නිසා නුවරඑළිය දිසාවට අතුරු මැතිවරණයක් කැඳවා තිබුණි. ජනතාවගේ ඉල්ලීම අනුව ඒ සඳහා ඉදිරිපත් වීමට එම්. ඩී. බණ්ඩාට අවස්ථාව හිමි විය. එහිදී පළාතේ ප්‍රබලයෙක් පරාජයට පත් කරමින් එම්. ඩී. බණ්ඩා මහතා ජයග්‍රහණය කළේ සිංහල, දෙමළ ඡන්ද සියල්ලම පාහේ නො අඩුව ලබා ගනිමිනි. එහෙත් එම්. ඩී. බණ්ඩාගේ ආධාරකරුවන් තමන්ගේ ඡන්ද දායකයින්ට ඡන්ද දමන්නට නොදී මඟ අවහිර කළේ යැයි එම්. ඩී. ට විරුද්ධව මැතිවරණයට ඉදිරිපත් වූ ප්‍රදේශයේ බලවතා විසින් ඡන්ද පෙත්සමක් ඉදිරිපත් කරන්නට විය. එහිදී ඉදිරිපත් වූ නඩු විභාගයෙන් එම්. ඩී. බණ්ඩා පරාජයට පත් වීම නිසා මන්ත්‍රී අසුන ඔහුට අහිමි විය. තමාගේ නීතිඥවරයා, නඩුව සඳහා ලබා දුන් උපදෙස් තුළින් තමන්ගේ පාක්ෂිකයන්ට හානි වන බව සලකා නීතිඥවරයාගේ බසට එම්. ඩී. බණ්ඩා එකඟ නොවීම, නඩුවේ පරාජයට හේතු විය. එම පරාජය ගණනකට නොගත් එම්. ඩී. බණ්ඩා එම කාලය තුළදී නීතිය උගත්තේය. ඉන්පසුව 1947 වසරේ මහ මැතිවරණයෙන් මතුරට ආසනයෙන් ඉදිරිපත්ව ඔහු ජයග්‍රහණය කරනු ලැබීය. නොයෙකුත් බාධා මැද, ඔහු සිය ගමන නොනවත්වාම ගමන් කළේ 1952 සහ 1956 යන මැතිවරණවලින්ද මතුරට ආසනයෙන්ම පිට පිට ජයග්‍රහණය කරමිනි. 1956 වසරේ එජාපය මන්ත්‍රී ධුර 8 කට සීමා වී අන්ත පරාජයට පත් වෙද්දී එම්. ඩී. බණ්ඩාට ද පත් වූ මන්ත්‍රීන් 8 දෙනා අතරට පැමිණීමට ජනතා මනාපය හිමි විය.

1974 වසරේදී එම්. ඩී. බණ්ඩා මහතා මෙලොවින් සමුගත් අතර ඔහුගේ ආදාහන උත්සවය ඇමතූ ජේ. ආර්. ජයවර්ධන මහතා තම හිතවතා පිළිබඳ මෙසේ සඳහන් කළේය.

"එදා පක්ෂ නායකත්වය ගන්න හොඳටම සුදුසුකම් තිබ්බේ එම්. ඩී. බණ්ඩාට. ඒ වෙනකොට පක්ෂයේ ජ්‍යෙෂ්ඨයා ඔහු. ඒත් එම්. ඩී. පක්ෂයේ විධායක කමිටුවේදී තමන්ට ලැබුණු නායකත්වය ප්‍රතික්ෂේප කරලා ඒ වෙනුවට මගේ නම යෝජනා කළා. තමන්ගේ අතට ආපු නායකත්වය බාර නොගෙන අනුන්ගේ අතකට දෙන මිනිස්සු හරිම විරලයි."

පසිඳු මිහිරාන් රැටියල





නල හමුදා කඳවු

මහ රෑ කඩා

වෙඩි හුවමාරුවේදී 9 ක් මරු

# තරුණ පෙළ අවි එසවූයේ පීඩනයට එරෙහිව ද?


එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතාගේ ඝාතනයෙන් පසු මෙරට අග්‍රාමාත්‍ය තනතුරට පත් වූයේ ඔහුගේ බිරිය වූ සිරිමා ආර්.ඩී. බණ්ඩාරනායක මැතිනිය යි. ඇය ලොව පළමු අගමැතිනිය වූවා ය. මේ වනවිට ලෝක ප්‍රවණතාව වූ කලී සමාජවාදයේ නැගිටීමයි. නිර්ධන පන්තිය විසින් රාජ්‍ය බලය අල්ලා ගැනීමේ ලෝක ව්‍යාප්ත මෙහෙයුම ඇරඹී තිබුණි. පැවති පාලන ක්‍රමයන් පරදවා සමාජවාදී පාලනයක් පිහිටුවීමට රුසියාව, නැගෙනහිර යුරෝපයේ රටවල් සමත් වී තිබිණි. වියට්නාමය ඇමෙරිකානු ආක්‍රමණිකයන්ට විරුද්ධව සටන් කොට ජයග්‍රහණයකොට තිබිණි. මේ අතර පැරණි වමේ ව්‍යාපාරයන් සියල්ල ශ්‍රී ලංකා රජයට සහාය දීම සඳහා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය සමඟ එක් වී සිටියේ ය. එමෙන් ම ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂය ද චීන පිල සහ රුසියානු පිල වශයෙන් කොටස් දෙකකට පැහැදිලි ව කැඩී බිඳී ගොස් තිබිණි. රෝහණ විජේවීර නියෝජනය කළේ 'චීන' පිල ය. ඔහුගේ මැදිහත්වීමෙන් 1965 මැයි මස 14වැනි දින ජනතා විමුක්ති පෙරමුණ ඇරඹීම සඳහා කළ සාකච්ඡාවක් අනුව එම පක්ෂය ඇරඹිණි. පළමුව රහසිගත සංවිධානයක් ලෙස ද පසුව දේශපාලන ප්‍රවාහයට එක් වූ සංවිධානයක් ලෙස ද ජවිපෙ පෙනී සිටියේ ය.


ඒ වන විට රට තුළ ජනගහනයේ වර්ධනයක් සහ ජන ව්‍යාප්තියේ ද වර්ධනයක් ඇති වී තිබිණි. සාම්ප්‍රදායික තේ,පොල්, රබර් අපනයනයෙන් ආදායම් ඉපයූ රටක් විය. 70 වන විට තරමක් දුරට සංචාරක ව්‍යාපාරයේ ද නැඟීමක් තිබිණ ද ආර්ථිකයේ පීඩනය ජනතාවට තදින් ම දැනී තිබිණි. විරැකියාව, ගොවි ජනතාවගේ ගැටලු, ඉඩම් ගැටලු ආදිය මෙන් ම වැඩකරන ජනතාවගේ සාක්කුවට දැඩි ලෙස දැනෙන යුගයක් බවට පත් වී තිබුණි. අපේක්ෂාභංගත්වයට පත් තාරුණ්‍යයේ වර්ධනයක් දක්නට ලැබුණු අතර ඒ තුළ ජනතා විමුක්ති පෙරමුණ වටා උගත්, නූගත්, බාල, මහළු සියල්ලන්ගේ ආකර්ශනය දිනා ගන්නට ජනතා විමුක්ති පෙරමුණට හැකි විය. මේ සඳහා වැඩි දායකත්වයක් ලබා දී තිබුණේ පහළ මධ්‍යම පාන්තික වෘත්තිකයන් බැව් මහාචාර්ය ගණනාථ ඔබේසේකරගේ පර්යේෂණයකින් හෙළි ව ඇති බව ත් සිංහල බෞද්ධ ග්‍රාමීය පසුබිමකින් යුත් පහළ මධ්‍යම පන්තියට අයත් තාරුණ්‍යය මේ සඳහා දායකත්වය වැඩි වශයෙන් ලබා දී ඇති බව ත් මහාචාර්ය ගාමිණී සමරනායකයෝ පවසති.

1971 කැරැල්ල, තරුණ නැගිටීම, ජනතා නැගිටීම වශයෙන් විවිධ නම්වලින් හඳුන්වන මෙම තත්ත්වයට ලෝක ප්‍රවණතාවයේ උණුසුම මෙන් ම වමේ පක්ෂවල පැවති ප්‍රතිගාමී බව ද ඍජුලෙස බලපෑ බැව් කිව යුතු ය. ඉහත කාරණාව 'කැරැල්ලක්, තරුණ නැගිටීමක් හෝ ජනතා නැගිටීමක්' ලෙස හැඳින්වුව ද 'අපි පහරදීමේ සූදානමක හිටියේ නැහැ. නමුත් ඉදිරිය දෙස බලා ආයුධ එකතු කළා.' යනුවෙන් දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය විසින් පසුව සඳහන්කොට තිබිණි. නමුත් 71 න් පසු ජනතා විමුක්ති පෙරමුණෙන් ඉවත් වූ අය පැවසූයේ 'පහර දීමට සූදානමක සිටි බව' ය. කෙසේ වෙතත් එය අවස්ථානුකූල ව පැනනැගුණක් ද නොඑසේ නම් දීර්ඝ කාලීන ව සැලසුම්කොට සිදුකළ පහරදීමක් ද යන්න පිළිබඳ ස්ථිර නිගමනයකට පැමිණීම උගහට ය. කෙසේ වෙතත් මෙම කැරැල්ල මැඩලීමට රාජ්‍ය වශයෙන් රුසියාව වැනි සමාජවාදය ස්ථාපිත කළ රටවල් පවා පැවති රජයට සහාය දැක් වූ බැව් ප්‍රසිද්ධ ය. ඒ සඳහා අවශ්‍ය මූල්‍යමය මෙන් ම ආයුධ සහ පුහුණුව ද එම රටවලින් ලැබුණු බැව් කියැවේ. ඔහුට අනුව කුලය නමැති සාධකය ද මේ සඳහා ඍජුව බලපෑ බැව් පැවසේ.

කෙසේ වෙතත් 71 මහ නඩුවේ චූදිතයෙකු වූ පියසිරි කුලරත්න මහතා පසුව පවසා තිබුණේ එය එක් රැයකින් පවතින ආණ්ඩුවකට පහර දී ජයග්‍රහණය කිරීමට යත්න දැරූ සිහිනයක් ලෙසට ය. ඒ පිළිබඳ ඔහු විසින් රචිත 'තක්සලාවක් වූ සිපිරි ගෙය' කෘතියෙහි සඳහන් කොට තිබේ. සුප්‍රසිද්ධ සෝවියට් විප්ලවයේ 'අවුරෝරා නෞකාවට' පහරදීමෙන් ඇරඹි පළමු වෙඩි මුරයට සමාන පළමු වෙඩි හඬ නැගෙන්නේ ලංකාවේ වැල්ලවායෙනි.

**ජනතා විමුක්ති පෙරමුණේ දෙවැනි අසාර්ථක කැරැල්ල වූයේ 1988-89 කැරැල්ල යි. 71 කැරැල්ලෙන් පසු ව ජනතාවට සිරිමාවෝ ආණ්ඩුව තිත්ත විය. ජනතාවට ඉඟුරු දී මිරිස් ගන්නවා හැරෙන්නට පිළිතුරක් ද නොවුණි. 77 මැතිවරණයෙන් බලයට පත්වන්නේ ජේ.ආර්.ජයවර්ධන මහතා ය. ඔහු 78 ව්‍යවස්ථාව මඟින් විධායක බලතල ද සියතට ගත්තේ ය. 1983 ජූලි කලබලය ඇති වන්නේ මේ අතරතුර ය. ඒ සම්බන්ධව සිදු කළ පක්ෂ තහනම් කිරීම් ආදිය තවත් කැරැල්ලකට අත වැනී ය. ඉන් අනතුරුව 1987 ඉන්දු ලංකා ගිවිසුම අනුව ඉන්දීය සාමසාධක හමුදාව ලංකාවට පැමිණීම කැරැල්ලේ ගින්නට පිදුරු දැමීමක් විය.**





එහෙත් වැල්ලවායේ වෙඩිමුරයෙන් සිදු වූයේ කැරැල්ල මර්දනය සඳහා සූදානම් වීමට පැවති රජයට කල් වේලා ලැබීම යි. කෙසේ වෙතත් 1971 අප්‍රේල් 05වැනි දින රාත්‍රියේ දිවයිනේ පොලිස් ස්ථාන 100කට පමණ ආයුධ සන්නද්ධ පහරදීම් ඇරඹිණි. ගම්බද පොලිස් ස්ථාන 05ක් ඉන් අල්ලා ගනු ලැබූ අතර ස්ථාන 44ක් ආරක්ෂක හේතූන් මත අත්හැර දමන ලදී. එය ක්‍රියාත්මක වූයේ කෑගල්ල, ගාල්ල, අනුරාධපුර, කුරුණෑගල, පොලොන්නරුව, මාතර, අම්පාර හා මොණරාගල දිස්ත්‍රික්කවල පමණි. ඇඹිලිපිටිය, මහව, දෙණියාය, හොරොව්පතාන සහ වරකාපොල නගර පමණක් තම යටතට ගැනීමට කැරලි කරුවන්ට හැකි විය. කෙසේ වෙතත් සති 03ක් වැනි කෙටි කාලයක් තුළ කැරැල්ල පරාජය කිරීමට ආණ්ඩුවට හැකි විය. රජයේ වාර්තාවලට අනුව 1200ක් පමණ ඉන් මිය ගොස් ඇති බැව් පැවසුණ ද එය 5000ක් පමණ බැව් මහාචාර්ය ගාමිණී සමරනායක සිය ලිපියක පවසයි.

71න් පසු රටේ ආර්ථිකය, කලාව, සාහිත්‍ය වැනි අංශයන්හි සුවිශාල පරිවර්තනයක් සිදු වූ බැව් කිව යුතු ම ය. විශේෂයෙන් ම සිනමාව, වේදිකාව වැනි අංශයන්හි ධර්මසිරි බණ්ඩාරනායක, ධර්මසේන පතිරාජ වැනි දැවැන්තයන්ගේ ආගමනය සිදු වූයේ ඉන් පසුව ය. දයාසේන ගුණසිංහ, ධර්මසිරි රාජපක්ෂ ආදී කවීහු බිහි වූහ. කැරැල්ල තුළ සිදු නොවුණු මානසික වහල්භාවයෙන් මිදීමේ නව්‍ය චින්තනය සාහිත්‍ය, කලාව තුළින් මතු වීම 71න් පසු සිදු වූ බැව් පිළිගත යුත්තකි.

ජනතා විමුක්ති පෙරමුණේ දෙවැනි අසාර්ථක කැරැල්ල වූයේ 1988-89 කැරැල්ල යි. 71 කැරැල්ලෙන් පසු ව ජනතාවට සිරිමාවෝ ආණ්ඩුව තිත්ත විය. ජනතාවට ඉඟුරු දී මිරිස් ගන්නවා හැරෙන්නට පිළිතුරක් ද නොවිණි. 77 මැතිවරණයෙන් බලයට පත් වන්නේ ජේ.ආර්. ජයවර්ධන මහතා ය. ඔහු 78 ව්‍යවස්ථාව මඟින් විධායක බලතල ද සියතට ගත්තේ ය. 1983 ජූලි කලබලය ඇති වන්නේ මේ අතරතුර ය. ඒ සම්බන්ධව සිදු කළ පක්ෂ තහනම් කිරීම් ආදිය තවත් කැරැල්ලකට අත වැනී ය. ඉන් අනතුරු ව 1987 ඉන්දු ලංකා ගිවිසුම අනුව ඉන්දීය සාමසාධක හමුදාව ලංකාවට පැමිණීම කැරැල්ලේ ගින්නට පිදුරු දැමීමක් විය. ඒ අනුව දෙවැනි කැරැල්ලෙහි කෙටි කාලීන පරමාර්ථ ලෙස අතර ඉන්දු-ලංකා ගිවිසුම අහෝසි කිරීම, ඉන්දීය සාමසාධක හමුදාව ඉවත් කිරීම, පළාත් සභා ක්‍රමය අහෝසි කිරීම, නව ජනාධිපතිවරණ සහ මහමැතිවරණ පැවැත්වීම, නීත්‍යනුකූල නොවන හමුදා විසුරුවා හැරීම ආදිය දැක්විය හැකි ය.

හමුදාවලට පහර දීම, පොලිස් ස්ථානවලට පහර දීම, බැංකු සහ පරිපාලන ආයතන අකර්මන්‍ය කිරීම, දේපළවලට ද අලාභහානි වීම, සිදු විය. පහරදීමට අමතර ව මහජන පෙළපාළි සහ උද්ඝෝෂණ ද අතරින් පතර ක්‍රියාත්මක විය. මේ උද්ඝෝෂණ සඳහා පාසල් සිසුන් ද යොදා ගැනීම සම්බන්ධ ව ජ.වි.පෙට චෝදනා එල්ල විය. පළමු කැරැල්ල හා සංසන්දනයේ දී දෙවැන්න වඩාත් සංවිධානය වූවකි; ව්‍යාප්ති වූවකි. උතුරු මැද, මධ්‍යම හා බස්නාහිර පළාත්වල මෙය වැඩි වශයෙන් ව්‍යාප්ත විය. ආණ්ඩු බලය යොදවා එම ජනතා නැගිටීම ද මැඬලන්නට ආණ්ඩුවට හැකි විය. 30 000කට අධික ජවිපෙ ක්‍රියාකාරීහු පිරිසක් සහ ආරක්ෂක අංශයන්හි, පොලිසියේ ඇතුළු සාමාන්‍ය ජනතාව ද ඉන් මරණයට පත් වූහ. ජ.වි.පෙ නායක රෝහණ විජේවීරයන් ද මරණයට පත්වන්නේ මෙහි දී ය. මෑත කාලයේ ජීවිතයෙන් සමුගත් හිටපු ජ.වි.පෙ නායක සෝමවංශ අමරසිංහ මහතා හැරෙන්නට අනෙකුත් සියලු දේශපාලන මණ්ඩල සාමාජිකයෝ ද මරණයට පත් වූහ. දෙවැනි නැගිටීමේ අවසන එසේ සිදු විය.

මෑත ලංකා ඉතිහාසයේ ජනතා නැගිටීම් ලෙස පැහැදිලිව ම දැක්විය හැකි අවස්ථා දෙකක් අපට පාඩම් ඉතිරි කොට ජයග්‍රහණයකින් තොර ව නිමා විය.

ගයාන් පීරිස්



# පැලැස්තර වෙනුවට අලුත් ව්‍යවස්ථාවක්

අපට ගැලපෙන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක් වෙත යොමු වෙමින් ඇත. මීට අවුරුදු හතරකට පෙර ගෙනා ආ දහ නවවන ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරමින් විසිවන ව්‍යවස්ථා සංශෝධනයක් කෙරෙහි ආණ්ඩුවේ අවධානය යොමුව තිබේ. මෙම ව්‍යවස්ථා සංශෝධනය අන්තර් කාලීන සංශෝධනයක් වන අතර අනාගතයේ දී පූර්ණ ව්‍යවස්ථාවක් ගෙන ඒමට ආණ්ඩුව සූදානම් වෙමින් සිටී.

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් නිදහස ලැබීමෙන් අනතුරුව ශ්‍රී ලංකාව මේ වන විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා තුනක් අත්හදා බලා ඇති අතර අලුතින් නව ව්‍යවස්ථාවක් නීතිගත කෙරුණ හොත් එය වසර හැට අටක් වැනි කෙටි කාල පරාසයක් ඇතුළත ක්‍රියාවට නැංවෙන සිව් වැන්න වීමෙන් එය රට තුළ පමණක් නොව ලෝකයේ ද අවධානය යොමුවන කරුණක් වනු ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු කුමක්ද? යන්න සම්බන්ධයෙන් විවිධ වචනවලින් ඉදිරිපත් කෙරුණ විශ්ලේෂණ රාශියක් ඇති අතර එම සියල්ල මගින් ගම්‍ය කෙරෙන පොදු තේරුමක් වන්නේ එය රාජ්‍යයක 'මූලික නීතිය' වන බවයි.

ජේආර් ජයවර්ධන ජනාධිපතිවරයා 1978 දී හඳුන්වා දුන් ව්‍යවස්ථාව මගින් ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපති ක්‍රමයක් නිර්මාණය කෙරිණ

ජේආර් ජයවර්ධන ජනාධිපතිවරයා 1978 දී හඳුන්වා දුන් ව්‍යවස්ථාව මගින් ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපති ක්‍රමයක් නිර්මාණය කෙරිණ

රාජ්‍යයක මූලික නීතිය හැටියට දැනටමත් අප විසින් හඳුනා ගනු ලැබ ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක ස්ථිර පැවැත්ම සහ එය අඛණ්ඩව සංශෝධනය කිරීම කෙරෙහි එහි ප්‍රභවය ප්‍රබල බලපෑමක් ඇති කරයි.

ඉන්දියාවේ විවිධ භාෂා කතාකරන, විවිධ ආගම් අදහන සමස්ත වාර්ගික සහ සංස්කෘතික කණ්ඩායම් එකට බැඳ තබන හුයක මට්ටමින් සූත්‍රගත කිරීමට ආචාර්ය අම්බෙට්කාර් ප්‍රමුඛ ඉන්දීය ව්‍යවස්ථා සම්පාදකයෝ සමත් වූහ. ඉන්දියාවේ විවිධ ජාතීන් එක්ව බැඳ තබා ගැනීමට මෙම ව්‍යවස්ථා සංශෝධනය විශාල පිටිවහලක් සපයයි.

වත්මන් ඉන්දීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මේ වන විට සංශෝධන රාශියකට භාජනය කරනු ලැබුණත් එහි මූලික ව්‍යුහාත්මක ආකෘතිය තවත් ශක්තිමත් වෙමින් පවතිනවා මිස එහි ලිහී යෑමක් පෙන්නුම් නොකරයි.

තුලනාත්මකව බලන විට එම අත්දැකීම් මගින් පෙන්නුම් කෙරෙන්නේ ශ්‍රී ලාංකේය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා උපතේ පටන්ම පෙන්නුම් කරන අම්හිරි විජාතික ප්‍රභවයද?

දැනටමත් දහනව වතාවක් ව්‍යවස්ථාව සංශෝධනය වීමට මෙම ව්‍යවස්ථාවේ ඇති අසාර්ථක භාවය හේතු වූයේ ද යන්න අවධානය යොමු කළ යුතු දෙයකි.

නව ව්‍යවස්ථාව මගින් අනාගත පරපුරේ අයිතීන් සුරක්ෂිත කෙරේවිද යන්න සලකා බැලිය යුතුය.

සමාජීය වුවවමනා ඉක්මවා යමින් හුදු 'බලය' පිළිබඳ ආකර්ෂණය මගින් ඕපපාතික මට්ටමින් ස්ථාපනය කරනු ලැබුණ නීති පද්ධතියක් ද යන්න සලකා බැලිය යුතුය.

ශ්‍රී ලංකාවට ඩොමීනියන් තත්වය ප්‍රදානය කිරීමත් සමඟ ඊට අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පද්ධතියක් ද 'පරිත්‍යාග කිරීමට' බ්‍රිතාන්‍ය පාලකයෝ නොමසුරු වූහ.

එහෙත් තම අසල්වැසියා වන ඉන්දියාව අනුව යමින් එම ඩොමීනියන් බැඳීම කෙළවර කොට ස්වයං ආණ්ඩුක්‍රමයක් නිර්මාණය කර ගැනීමේ ජාතික අභිලාෂයක් කරා සමීප වීමට නිදහස් ලංකාවේ පාලකයන් අසමත් වූ අතර එවැනි පරිවර්තනයක් සිදු වන්නේ 1972 වසරේදීය. එය අගය කළ යුතු දෙයක් වුවද එහිද අඩුපාඩු තිබිණි. සීමිත කම් මැද පවා මෙරට ජනරජයක් බවට පත් වීම මෙමගින් සිදු වූ අතිමහත් සේවයකි.

ආරම්භයේ දීම එය ශ්‍රී ලංකාවේ දකුණේ සිංහල ප්‍රධාන දේශපාලන බලවේගවල පවා අභියෝගයට ලක් වූ අතර විශේෂයෙන්ම එය දමිළ සුළු ජනයාගේ ආශීර්වාදය නොලද්දේ ඔවුන්ට රැකවරණයක් හැටියට සැලකුණ 1947 සෝල්බරි ව්‍යවස්ථාවේ 29 වැනි සුප්‍රකට වගන්තිය, දෙවැනි මන්ත්‍රී මණ්ඩල ව්‍යවස්ථාදායක ආකෘතිය මෙන්ම නාමකරණයෙන් සීමිත මන්ත්‍රීවරුන් සංඛ්‍යාවක් පත් කිරීමට තිබුණ අවසරය අහෝසි කරනු ලැබීම හේතුවෙනි. එහෙත් සෝල්බරි ව්‍යවස්ථාව තුළ සුළු ජාතික ප්‍රජාව කෙරෙහි තිබූ සුළු රැකවරණය පවා අහිමිව ගොස් ඇතැයි යන්න එදා සිටි සෙසු ජන කණ්ඩායම් නායකයන්ගේ අදහස විය.

එහෙත් වාදවිවාද මැද ස්ථාපිත කෙරුණු මෙම ව්‍යවස්ථාව අවුරුදු හයක් යන විට අහෝසි වන තැනට කටයුතු සයෙදිණි. යාන්තමින් අවුරුදු හයක් ආයු විඳ බිලිඳු වියේදීම අභාවප්‍රාප්ත කෙරුණ එම ව්‍යවස්ථාවේ අනුප්‍රාප්තිකයා වන දැනට තිස් හත් වන වියේ පසුවෙන වත්මන් 'ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත්' ඉන් පෙර ව්‍යවස්ථාවේ චරිත ලක්ෂණය වන අනාගමිකවාදයට පිටුපෑම එලෙසින්ම දායාද කරනු ලැබ ඇත.

1972 සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ද්වය මගින් පුරවැසි අයිතිය සහතික කරනු ලැබීමක් හැටියට හුවා දක්වමින් 'මූලික අයිතිවාසිකම් ප්‍රකාශනයක්' මූලික නීතියේ අංගයක් හැටියට නීතිගත කරනු ලැබුණ නමුත් ඒවා අලංකාර සැරසිල්ලක මට්ටමින් එහාට නොගිය බවයි රාජ්‍යය තුළ ප්‍රතිෂ්ඨාපනය කරනු ලැබුණ වෙනත් අණපනත් මගින් පෙන්නුම් කෙරුණේ.

මේ අනුව අනාගමිකවාදයට පිටු පෑ වේගයෙන්ම ජාතික රාජ්‍ය සභාවේ බලය හරහා දේශපාලන විධායකය අසීමිත බලාධිකාරියක තත්වයකට ඔසවා තබනු ලැබීම මගින් 1972 ව්‍යවස්ථාවද, ජනාධිපති පදවියේ අසීමිත බලය පාර්ලිමේන්තුව සහ අධිකරණයට ඉහළින් ස්ථාපනය කරනු ලැබීම මගින් 1978 ව්‍යවස්ථාවද ප්‍රජාතාන්ත්‍රික රාමුවෙන් බොහෝ දුරට ඈත් වූ අතර එම ප්‍රජාතන්ත්‍ර විරෝධී ස්වභාවය කදිම ලෙස නිරූපණය කෙරුණේ එම දෙපාර්ශවයම මහජන අනුමැතියෙන් තොරව ඔවුන්ට පැවරුන පාලන කාලය දීර්ඝ කර ගනු ලැබීමෙනි.

බලය බෙදා හැරීම යන කරුණ 1972 සහ 1978 ව්‍යවස්ථාවේ අවධානය යොමු කර නොතිබිණි.

1972 ව්‍යවස්ථාවේ නිර්මාතෘවරුන් සිය ව්‍යවස්ථා රාමුවට කිසිදු ලෙසකින් ඇතුළත් නොවූ තේරුමක් නොමැති දිසා දේශපාලන අධිකාරියක්ද 1978 ව්‍යවස්ථාවේ නිර්මාතෘවරයා ඉන් එහාට යමින් ඉන්දියාවේ බලපෑම මත පළාත් සභා ක්‍රමයක් ව්‍යවස්ථා ගත කරනු ලැබීමටද පියවර ගනු ලැබුණත් එයද අදත් පවතින්නේ කවර බලයක් ඒවාට පැවරිය යුතුද යන විවාදාත්මක මට්ටමෙහිය.

සිය ප්‍රදේශවලට බලය විමධ්‍යගත කෙරෙන දේශපාලන විසඳුමක් උතුරේ දෙමළ ජනතාව ඉල්ලා සිටිති.

එම අර්ථයෙන් ගත් විට අප ලුහුඬින් සාකච්ඡාවට ගත් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා යුගලයත් ප්‍රජාතන්ත්‍රවාදය ඉල්ලා සිටින දේශපාලන සමාජයකට අවශ්‍ය සාධාරණය ඉටු නොකිරීමේ ඵලය තවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක් දෙසට සමාජය තල්ලු කිරීමයි.

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා පිළිබද අවධානය යොමු කිරීම ඒ ගැන කතා කිරීම පහසු කරුණක් වුවද සැමට සරිලන සහ සියල්ලන් සෑහීමකට පත් වන ආකාරයේ ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම දුෂ්කර කාර්යයකි.

◣ උදිත ගුණවර්ධන



උඩකැන්දවල සිරි සරණංකර හිමි

# ඉන්දියාවේ නිදහස වෙනුවෙන්

# සිරබත් කෑ අපේ හාමුදුරුවෝ

උඩකැන්දවල සිරි සරණංකර හිමි අධිරාජ්‍ය විරෝධී සටනේදී සිරභාරයට පත් වීම් කිහිපයක්ම සිදුවිය.

උන්වහන්සේ මෙරට අධිරාජ්‍ය විරෝධී අරගලයටත් ඉන්දියාවේ අධිරාජ්‍ය විරෝධී අරගලයටත් එක සේ දායකත්වය දැක්වූ හිමිනමකි. ලෝක සාමයටත් ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයටත් විශිෂ්ට උන්වහන්සේ ඉටු කළහ.

දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ මහතාට උඩකන්දවල සරණංකර හිමි මුල්වරට මුණ ගැසී ඇත්තේ 1929 ඉන්දියාවේ ශාන්ති නිකේතනයේදීය. එකල බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයට විරුද්ධව ඉන්දියාවේ සිට සටනක් ගෙන ගිය උන්වහන්සේගේ මේ හමුවීම පසුව ලංකාවේදී ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂය බිහිවීම තරම් මිත්‍රත්වය දැඩි විය. උන්වහන්සේ අනගාරික ධර්මපාල තුමා, රවින්ද්‍රනාත් තාගෝර් තුමා, මහත්මා ගාන්ධි, ජවහර්ලාල් නේරු, සුභාෂ් චන්ද්‍ර බෝස් ගෙන් උන්වහන්සේ ලැබූ පන්නරයෙන් ජීවිතය හැඩගස්වා ගත්තේය.

1966 නොවැම්බර් 13 උන්වහන්සේ අපවත් විය. 1902 ජනවාරි 07දින සත්කෝරළයේ හිරියාලයේ උඩකැන්දවල උපන් රංබණ්ඩා ගිහි නම විය. වයස අවුරුදු දෙකේදී මව මිය යන අතර පුංචි අම්මා ඔහුට දැඩි සේ ආදරය දැක්වීය. වයස අවුරුදු 13 පැවිදි බිමට ඇතුළත් විය.

උන්වහන්සේ දොරණාගොඩ සදානන්ද පිරිවෙනේ ශිෂ්‍ය හිමිනමක් ලෙස ඉගෙනුම ලබන කාලයේ පටන් සිංහල ජාතිය පත්‍රයට ලිපි ලිව්වේය. සිංහල ජාතිය පත්‍රයේ ප්‍රධාන කර්තෘ පියදාස සිරිසේන මහතා සමඟ මිත්‍ර විය. වරක් උඩරට රදලයන්ගෙන් සාමාන්‍ය දුප්පත් මිනිසුන්ට ලැබුණු කරදර ගැන ලිපියක් සිංහල ජාතිය පුවත්පතට ලිව්වේය. එකල සිංහල ජාතිය පුවත්පත ලංකාව පුරා ප්‍රසිද්ධම පුවත්පතකි.


එදා බොහෝ දෙනා රැකියා ලබා ගැනීමට ඉගෙනීමේ නිරත වූ අතර සරණංකර හිමිට වුවමනා වූයේ මෙරට පාලනය කළ අධිරාජ්‍යවාදීන්ට මෙන්ම ඔවුන්ගේ ගැත්තන්ව සිටි දේශද්‍රෝහීන්ට විරුද්ධව සටනක් කිරීමට අවබෝධයක් ලබා ගත හැකි මහජනයා අතරට ගොස් ඔවුන් උසි ගැන්වීමට හැකි අධ්‍යාපනයක් ලැබීමටයි.

1921 දිනට පුවත්පතක අනගාරික ධර්මපාල තුමා ලියන ලද ලිපියක් කියවීමෙන් සරණංකර හිමි එමඟින් දඹදිව ධර්ම ප්‍රචාරයට කුඩා ස්වාමීන් වහන්සේලා දසනමක් අවශ්‍ය බව පවසා තිබීම දැක ගත්තේය. පළමු පස් අවුරුදු අධ්‍යාපනය ඉන්දියාවේ ශාන්ති නිකේතනයේ දී දෙන බවත් අනගාරික ධර්මපාලතුමා එහි සඳහන් කර තිබුණි. එය දැක සරණංකර හිමි ඉන්දියාවට ගොස් අධ්‍යාපනය ලැබීමට සිහින දුටුවේය. අනගාරික ධර්මපාලතුමාට ලිපියක් ලියුවේය. අනගාරික ධර්මපාලතුමාගෙන් දින තුනකට පසු පිළිතුරු ලැබිණි. ධර්මපාලතුමා පදිංචිව සිටි කොල්ලුපිටියේ ඇලෝ ඇව්නිවු නිවෙසට පැමිණ හමුවන ලෙස එහි සඳහන්ව තිබුණි. හිමි අනගාරික ධර්මපාලතුමාගේ නිවෙසට ගොස් ඔහු හමු විය. තමාට ලැබුණු ලිපිය අනගාරික ධර්මපාලතුමාට ඉදිරිපත් කළේය. ලියමන බලා සිනහවක් පළ කළ අනගාරික ධර්මපාලතුමා සිංහල ජාතියේ අර ලොකු ලිපි ලියන පුංචි හාමුදුරුවෝ වහන්සේ ඔබදැයි ඇසීය. ඒවා ඔබ නමින් ලියා දෙන්නේ කවුදැයි ඇසීය. ඒවා ලියන්නේ කවුරුවත් නොවෙයි මම මයි යැයි උන්වහන්සේ පිළිතුරු දුනි. අනගාරික ධර්මපාලතුමා හිමිගෙන් වයස හා ගම පන්සල ගුරු හිමියන් ගැන විස්තර ඇසුවේය. හොඳයි තමුන්නාන්සේ දඹදිව එක්ක යන්නම්. නමුත් තව අවුරුදු කිහිපයකින් තව අවුරුදු කිහිපයකට පස්සේ සූදානම් වන්න යැයි උන්වහන්සේට පැවසීය. ඔබ වහන්සේගේ වයස අඩුයි. දැඩි කනගාටුවට පත් හිමි නිහඬ විය. ධර්මපාලතුමා නැවතත් හිමිගෙන් ධම්මපදයෙන් ගාථා කිහිපයක් හා ලංකා ඉතිහාසය ගැන ප්‍රශ්න කිහිපයක් විමසීය. ඒවාට පිළිතුරු දුන් හිමියෝ දුම්රියෙන් පැමිණීමට මුදල් කොහෙන්ද යැයි විමසීය. මුදල් ළඟ තබාගෙන සිටින බව අසා දැනගත් ධර්මපාලතුමා හිමිට ඒ ගැන දොස් පැවරීය. පැය භාගයක් වැඩි කාලයක් පමණ ධර්මපාලතුමා හිමිට එක එක දේ ගැන දේශනා කළේය. මේ වෙලාවේ පැමිණි එක්තරා මහලු කාන්තාවක් දන් වේලාව පැමිණ ඇතැයි පවසා හිමි ගේ ඇතුළට එක්ක ගෙන යයි. ධර්මපාලතුමා ද උන්වහන්සේට දන් වළඳන ලෙස ඉල්ලීය. ඒ මහලු ස්ත්‍රිය දන් පිළිගන්නන ගමන් ඔබ වහන්සේ පැමිණියේ කුමකටදැයි විමසීය. උන් වහන්සේ එම වියපත් කතට සියලු විස්තර පැවසීය. එවිට වියපත් කාන්තාවට ඔබවහන්සේ දඹදිව යන්න ඔය තරම් කැමැත්තක් දක්වන්නේ මන්දැයි විමසීය. එම ගෙදර වගකිවයුතු තැනැත්තියක් යැයි සිතා හිමි ධර්මපාලතුමාට කියා තමන් වහන්සේගේ ගමන පිළියල කරදෙන මෙන් උන්වහන්සේ ඉල්ලීය. තවත් දන් පිළිගන්වන ගමන් උන්වහන්සේ ඔහු ධර්මපාලතුමාගේ නෑයෙක්දැයි විමසීය. ඔවු මම ධර්මපාලතුමාගේ ළඟම නෑයෙක් යැයි ඇය පැවසීය. මම තමයි එතුමාගේ මව් යැයි ඇය පිළිතුරු දුන්නාය. උන්වහන්සේ මල්ලිකා හේවාවිතාරණ උපාසිකාව ගැන අසා ඇති මුත් කිසිවිටකදී ඇය දැක නැත. ඇය හඳුනා ගැනීමට ලැබීම ගැන උන්වහන්සේ බෙහෙවින්ම සතුටට පත් විය.

පුංචි සරණංකර හිමි සමඟ ධර්මපාලතුමා වෙත ගිය ඇය මේ පුංචි හාමුදුරුවොත් දඹදිව එක්ක යන්නැයි ඉල්ලා සිටියේය. ඔව් අම්මා කියනව නම් පොඩි උන්නාන්සේත් දඹදිව එක්ක යන්නන් යැයි ධර්මපාලතුමා පැවසීය.

ධර්මපාලතුමා හිමිට ශාන්ති නිකේතනයේ වසර 5 ක අධ්‍යාපනයට අවශ්‍ය වියදම් දැරීමට හොනලුලු රටේ ධනවත් කතක් වූ පොස්ටර් මැතිනිය විසින් රුපියල් ලක්ෂයක් අරමුදලක් ධර්මපාලතුමා නමින් බැංකුවේ තැම්පත් කර තිබුණි. හිමි ශාන්ති නිකේතනයේ ඉගෙනගන්නා කාලයේ වියදම් කළේ එම මැතිනියගේ අරමුදලිනි.

1921 මැයි මස ඉන්දියාවට ගිය හිමි ශාන්ති නිකේතනයේ ඉගෙනීම් කටයුතු ආරම්භ කළේය. හොඳට බෙංගාලි භාෂාවද කතා කිරීමට හැකි වන සේ අධ්‍යාපනය ලැබීය. වංග භාෂාවෙන් එතුමා ප්‍රසිද්ධ දේශන පැවැත්වීය. ඉගෙනීමට වඩා උන්වහන්සේ දේශපාලනයට හාජාතික වැඩවලට කාලය යෙදවන්න විය. ඉංග්‍රීසි පාලකයන්ට හිමි ගැන අප්‍රසාදයක් ඇති විය. ශාන්ති නිකේතනයේ ඉගෙන ගන්නා අතරතුර වරින්වර ලංකාවේ පුවත්පත් වලට ලිපි ලිව්වේය. පියදාස සිරිසේන මහතාගේ සිංහල ජාතිය, වික්‍රමආරච්චි මහතාගේ ස්වදේශ මිත්‍රයා පුවත්පත් වල හිමිගේ ලිපි නිතර පල විය. දිනමිණ පුවත්පතේ ඉන්දියානු ලිපිය නමින් ලිපි මාලාවක්ද පල විය. ස්වරාජ්‍ය නමැති පුවත්පතටද සතිපතා ලිපි ලිව්වේය. 1925 වන විට ඉංග්‍රීසි පාලනයට විරුද්ධව ස්වරාජ්‍ය පුවත්පත ඇතුළු පුවත්පත්වලට උන්වහන්සේ ඉන්දියාවේ සිට ලිපි සැපයීය. එකල ඉන්දියාවේ සිටි අධිරාජ්‍ය විරෝධී ත්‍රස්තවාදී නායකයන් හිමි දැන හැඳුනුම්කමක් ඇති කර ගත්තේය. ඉන්දීය ත්‍රස්ත නායකයන් සමඟ සාකච්ඡා කර එවැනි කණ්ඩායමක් ලංකාවේ ඇති කිරීමට අදහස් කර ගෙන සිටියේය.



FIVE SHOTS FIRED AT GOVERNOR

CALCUTTA OUTRAGE

SIR STANLEY JACKSON'S NARROW ESCAPE

GIRL ASSAILANT ARRESTED

A girl graduate of Calcutta University fired five shots from close range at Sir Stanley Jackson, Governor of Bengal, while he was addressing the Convocation of the University on Saturday.

The Governor, who was not injured, owed his escape to his own marvellous coolness and to the fact that the Vice-Chancellor of the University promptly grappled with ...

බෙංගාලි ආණ්ඩුකාර ශ්‍රීමත් ස්ටැන්ලි ජැක්සන්



GIRL, WOULD-BE ASSASSIN, GETS NINE YEARS IN INDIA

Calcutta, Feb. 15 (AP).—Bina Das, Indian girl student who was accused of attempting to shoot Sir Stanley Jackson, British governor, on Feb. 6, was sentenced today to nine years' imprisonment at hard labor by a special tribunal.

The girl pleaded guilty to a charge of attempted murder. She received the sentence calmly.

"I fired on the governor, impelled by love for my country, which is repressed," she said. "I sought only a way to death by offering myself at my country's feet and thus end my suffering. I invite the attention of all to the situation created by the measures of the government. This can upset even a frail woman like myself, brought up in all the best traditions of Indian womanhood.

"I can assure all that I have no personal feeling against the governor. As a man he is as good as my father, but as governor of Bengal he represents a system which has kept enslaved 300,000,000 men and women of my country."

FIVE SHOTS FIRED AT GOVERNOR

CALCUTTA OUTRAGE

SIR STANLEY JACKSON'S NARROW ESCAPE

GIRL ASSAILANT ARRESTED

A girl graduate of Calcutta University fired five shots from close range at Sir Stanley Jackson, Governor of Bengal, while he was addressing the Convocation of the University on Saturday.

The Governor, who was not injured, owed his escape to his own marvellous coolness and to the fact that the Vice-Chancellor of the University promptly grappled with the assailant.

PROFESSOR WOUNDED

CALCUTTA, Saturday.

Sir Stanley Jackson, Governor of Bengal, better known as the Hon. F. S. Jackson (or "Jacker," the famous Yorkshire and all-England cricket captain), had a narrow escape from death this morning, when five shots were fired at him from close range by a girl student as he was addressing the Convocation of the University.

බීනාදාස් ගේ වෙඩි තැබීමෙන් බෙංගාලි ආණ්ඩුකාර ශ්‍රීමත් ස්ටැන්ලි ජැක්සන් නූලෙන් බේරෙයි.

නැගෙනහිර බෙංගාලයේ දේශප්‍රේමී කණ්ඩායමක් විසින් චිතගොං නුවර අවි ආයුධ ගබඩාවක් අල්ලාගෙන බ්‍රිතාන්‍යයට විරුද්ධව මේ සමයේ උග්‍ර සටනක් ගෙන ගියේය. ඉගෙනුම ලබන මේ ව්‍යාපාරයේ තරුණ ශිෂ්‍ය ශිෂ්‍යාවන් හිමි සමඟ සමීප ඇසුරක් පැවැත්වීය. චිටගං යනු ඉන්දියාවේ බෞද්ධයන් බහුතරයක් සිටින ප්‍රදේශයකි. හිමි කල්කටාව හරහා 1930දී චිතගොං ප්‍රදේශයට ගොස් එහි දේශප්‍රේමී කැරළි නායකයන් හමුවිය.

1931 වන විට සරණංකර හිමි ශාන්ති නිකේතන අධ්‍යාපනය අවසන් කර කල්කටාවේ සිටි කොලිජිය නම් අධ්‍යාපන ආයතනයට ඉගෙනුම සඳහා ඇතුළත් විය.

එහි ජනප්‍රිය චරිතයක් වූ හිමි ශිෂ්‍ය සංගමයේ සභාපති පදවියට සිසුන්ගේ ඡන්දයෙන් පත් විය. මේ කාලයේ ඉන්දියාවේ දේශපාලන තත්ත්වය උණුසුම් වෙමින් පැවතුණි. බෙංගාලයේ ජන නායකයෝ සියල්ල හිර භාරයට ගෙන තිබුණි. අධිරාජ්‍ය විරෝධී සටන ඉහළින්ම තිබුණේ මේ බෙංගාල ප්‍රදේශයේය.

මේ දිනවල විණාදාස් නම් තරුණියක විසින් බී.ඒ. උපාධි පිළිගැනීම සඳහා විශ්වවිද්‍යාලයට ගොස් ඒ උපාධි ප්‍රදානෝත්සවයේදී බෙංගාල ආණ්ඩුකාරවරයාට වෙඩි තැබීය. ඇය එහි ගියේ කල්කටාවේ ප්‍රසිද්ධ ක්‍රිස්තියානි විද්‍යාලයක ආචාර්යවරියක සමඟය. උපාධි ප්‍රදානෝත්සවයේදී පිස්තෝලයක් සමඟ ඉදිරියට ගිය ඇය ආණ්ඩුකාරවරයාට වෙඩි කිහිපයක් තැබුවේය.

මේ සිද්ධියේ සැකකරුවකු බවට උඩකැන්දවල සරණංකර හිමි පත් විය. 1932 මාර්තු 23 හිමිගේ නවාතැනට පැමිණ පොලිසිය හිමිගේ කුටිය පරීක්ෂාවට ලක් කළේය. බිත්තිවල ඇති සිදුරුද පරික්ෂා කර බැලීය එහෙත්. ආයුධ කිසිවක් කුටියේ තිබී හමු නොවෙයි. නමුත් සිංහල ලිපිලේඛන ද රැගෙන හිමි ද කැටුව පොලිසිය රැගෙන යයි. එහිදී පොලිසිය විසින් උන්වහන්සේගෙන් වැඩි දුරටත් ප්‍රශ්න කරනු ලැබිය.

මේ සිද්ධිය ගැන සරණංකර හිමි සිය ස්වයං ලිඛිත අපදානය වූ සටනක සටහන් පොතේ 107 හා108 පිටුවල මේසේ සඳහන් කරයි. මේ ගැන එම පොතේ පිටු දෙකක් පුරා දීර්ඝ ව සටහන් කර තිබේ.

බෙංගාලි ආණ්ඩුකාර වරයාට වෙඩිතැබ්ම ගැන බිනා විණාදාස් පිළිබදව මකරන්ඩ් පරන්ජාපේ විසින් රචිත ඇගේ මතක සටහන් වල මෙසේ සඳහන් කරයි

"පසුගිය සම්මේලන දිනයේදී සරසවි සෙනෙට් මන්දිරයේදී මම ආණ්ඩුකාරවරයාට වෙඩි තැබූ බව මම පිළිගනිමි. ඒ සඳහා මම සම්පූර්ණයෙන්ම වගකිව යුතුයි. මගේ පරමාර්ථය වූයේ මැරීමයි, මට මැරෙන්නට සිදු වුව හොත්, එය උදාර ලෙස කිරීමට මට අවශ්‍ය විය, මගේ රට එහි අසීමිත ලැජ්ජාවට හා නිමක් නැති දුක් ගැහැටවලට නිරන්තරයෙන් යටත් කර තබා ඇති මෙම ඒකාධිපති පාලන ක්‍රමයට එරෙහිව සටන් කරමි, මර්දනය කරනු ලබන මගේ රට කෙරෙහි මා තුළ ඇති ආදරය නිසා මම ආණ්ඩුකාරවරයාට වෙඩි තැබුවෙමි. මගේ රට වෙනුවෙන් මා උත්සාහ කළේ මගේ ස්වභාවයටත් විශාල ප්‍රචණ්ඩත්වයකි."

1947 දී ඇය නිදහස් සටන්කාමියකු වූ ජෝතිෂ් හව්මික් සමඟ විවාහ වූ නමුත් නිදහස ලැබෙන තෙක් ඇගේ ක්‍රියාකාරිත්වය නතර කළේ නැත.

ඇගේ ස්වාමිපුරුෂයාගේ මරණයෙන් පසු ඇය කල්කටාවෙන් පිටත්ව ගියේ රිෂිකේෂ් හි පිහිටි ආරාමයකය.

ඉන් පසුව ඇය ගුරු රැකියාවක් කර ඇති බව පැවසේ. ඇගේ අවසන් වසරවලදී පවා රජය නිදහස් සටන්කරුවන් සඳහා දුන් විශ්‍රාම වැටුප භාර ගැනීම ප්‍රතික්ෂේප කළාය.

ඇගේ අවසානය විශේෂයෙන් අවාසනාවන්ත විය. ප්‍රවීණ නිදහස් සටන්කාමියෙකු වන මහාචාර්ය සත්‍යවර්තා ගොෂ් ලිපියක ඇගේ දරුණු මරණය ගැන ලියයි.

ඔහු මෙසේ පවසයි. "ඇය සිය ජීවිතය අවසන් කළේ පාර අයිනේය. මළ සිරුර අර්ධ වශයෙන් දිරාපත් විය. එය පසුකර ගිය පිරිස විසින් සොයා ගන්නා ලදී. පොලිසියට දන්වා ඇති අතර ඇගේ අනන්‍යතාව තීරණය කිරීමට ඔවුන්ට මාසයක් ගත විය. ඇයගේ සෑම දෙයක්ම කැප කළේ ස්වාධීන ඉන්දියාවක් වෙනුවෙනි.

◣ නන්දික බැද්දේගම

දේශවංශය

සංස්කරණය - උදිත ගුණවර්ධන

දේශවංශය ගැන ඔබේ අදහස් අපට කියන්න

"දේශවංශය" දිනමිණ ලේක් හවුස්, අංක 35, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.

deshawanshaya@lakehouse.lk

දිනමිණ The Dinamina

# ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

## ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

### අධ්‍යාපන අමාත්‍යාංශය

| | |
|---|---|
| **ණය අංකය හා ශීර්ෂය** | 3699 - SRI : විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය |
| **කොන්ත්‍රාත් අංකය හා ශීර්ෂය** | STHRD / RJ-SW1/: ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය සඳහා මෘදුකාංග සැපයීම, ගෙනැවිත් භාරදීම, ස්ථාපනය හා වින්‍යාසගත කිරීම පිළිබඳ ප්‍රසම්පාදනය. |
| **ලංසු ඉදිරිපත් කිරීම සඳහා වන අවසාන දිනය හා වේලාව** | 2020.10.29 දින 14.00 පැය (ශ්‍රී ලංකා වේලාව) |

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ආසියානු සංවර්ධන බැංකුව (ADB) වෙතින් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතියේ (STHRD ව්‍යාපෘතිය) පිරිවැය අරභයා US ඩොලර් මිලියන 145 ට සමාන ණය මුදලක් ලැබී ඇති අතර, එම ණය මුදලින් කොටසක් ඉහත නම සඳහන් කොන්ත්‍රාත්තුව යටතේ ගෙවීම් සිදු කිරීම සඳහා යොදා ගැනීමට අපේක්ෂා කෙරේ. ආසියානු සංවර්ධන බැංකුවේ යෝග්‍යතාපූර්ණ ප්‍රභව රටවල්වල ලංසුකරුවන් සඳහා මෙම ලංසුකරණය විවෘතව පවතී.

02. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතියේ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ගැණුම්කරු) වෙනුවෙන් විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් "ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාල තාක්ෂණ පීඨය සඳහා මෘදුකාංග සැපයීම ගෙනැවිත් භාරදීම, ස්ථාපනය හා වින්‍යාසගත කිරීම" ("භාණ්ඩ") පිළිබඳ ප්‍රසම්පාදනය සඳහා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය සඳහා මෘදුකාංග සැපයීම, ගෙනැවිත් භාරදීම, ස්ථාපනය හා වින්‍යාසගත කිරීම මෙම ප්‍රසම්පාදනයට අඩංගු වේ. මෙම ප්‍රසම්පාදනය නිමා කිරීමේ කාල සීමාව ගිවිසුම් අත්සන් කළ දිනයේ සිට දින 120 කි.

03. මෙම ලංසුකරණයට සහභාගී වීම සඳහා ලංසුකරුවන් සතුව පහත සඳහන් ප්‍රධාන සුදුසුකම් තිබිය යුතුය.

| ප්‍රසම්පාදන ලොට් අංක හා විස්තරය | 6 වන වගන්තියේ විස්තර කොට ඇති සැපයුම් විෂය පථයට සමාන ස්වභාවය හා සංකීර්ණත්වයෙන් යුත් එක් කොන්ත්‍රාත්තුවක් සඳහා පහත සඳහන් වටිනාකමින් යුත් අවම වශයෙන් කොන්ත්‍රාත් දෙකක් පසුගිය වසර තුන ඇතුළත ප්‍රධාන සැපයුම්කරු ලෙස සාර්ථකව නිම කර තිබීම. | පසුගිය වසර තුන තුළ නිමා කළ හෝ ක්‍රියාත්මක වෙමින් පවතින කොන්ත්‍රාත්තු සඳහා ලංසුකරු වෙත ලැබුණු සම්පූර්ණ ගෙවීම් ලෙස ගණනය කළ පහත සඳහන් වාර්ෂික පිරිවැටුමේ අවම සාමාන්‍ය තිබිය යුතුය. |
|---|---|---|
| ලොට් 1 – විදුලි මෘදුකාංග | 18,000,000.00 | 44,000,000.00 |
| ලොට් 2 – නිර්මාණ සැලසුම් මෘදුකාංග | 9,000,000.00 | 22,000,000.00 |
| ලොට් 3 – සංඛ්‍යාන මෘදුකාංග | 2,200,000.00 | 5,500,000.00 |
| ලොට් 4 – සංස්කරණ මෘදුකාංග | 2,600,000.00 | 6,600,000.00 |
| ලොට් 5 – ග්‍රැෆික් නිර්මාණ සැලසුම් මෘදුකාංග | 4,100,000.00 | 10,300,300.00 |
| ලොට් 6 – දත්තසමුදය කළමනාකරණ මෘදුකාංග | 2,600,000.00 | 6,600,000.00 |

04. ආසියානු සංවර්ධන බැංකුවේ භාණ්ඩ ප්‍රසම්පාදනය සඳහා වන තනි අදියර – තනි කවර පරිපාටිය අනුව විවෘත තරගකාරී ලංසුකරණය මෙහෙයවනු ලබන අතර, ලංසු ලිපිලේඛනවල විස්තර කොට ඇති පරිදි යෝග්‍යතාපූර්ණ රටවල්වල සියලුම ලංසුකරුවන් සඳහා විවෘතව පවතී.

05. වැඩිදුර තොරතුරු ලබාගැනීමට හා ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලීමට ලංසුකරුවන් පහත සඳහන් අයවලුන් හා සම්බන්ධ විය යුතුය.

**ජ්‍යෙෂ්ඨ ප්‍රසම්පාදන නිලධාරී,**
**ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය,**
**විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය,**
**තාක්ෂණ පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ, ශ්‍රී ලංකාව.**

**ZIP කේතය** : 50300
**දුරකථනය** : 0714477898
**ෆැක්ස්** : 025-2266228
**ඊමේල්** : sporj-sthrd@mohe.gov.lk

06. ආපසු ගෙවනු නොලබන ශ්‍රී.ලං.රු. 7,500/= (ශ්‍රී ලංකා රුපියල් හත් දහස් පන්සියයක් පමණයි) ක ගාස්තුවක් මුදලින් හෝ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ STHRD ව්‍යාපෘතියේ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ නමින් බැංකු අණකරයක් හෝ මිහින්තලේ ලංකා බැංකු ශාඛාවේ පවත්වාගෙන යනු ලබන ගිණුම් අංක 83804379 වෙත තැන්පත් කිරීමෙන් (එක් ලංසු ලිපිලේඛන කට්ටලයක් සඳහා) අනතුරුව **"ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ තාක්ෂණ වේද පීඨය සඳහා මෘදුකාංග සැපයීම, ගෙනැවිත් භාරදීම, ස්ථාපනය හා වින්‍යාසගත කිරීම පිළිබඳ ප්‍රසම්පාදනය STHRD/RJ-SW1"** සඳහා ලංසු ලිපිලේඛන ඉල්ලමින් ඉහත සඳහන් ලිපිනය වෙත යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් ලිඛිත අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන මිලදී ගත හැකිය. 2020.10.28 වෙනි දින 15.00 පැය දක්වා සතියේ දිනවල ලංසු ලිපිලේඛන නිකුත් කරනු ලැබේ. තැපෑලේදී නැතිවීම හෝ ප්‍රමාදවීම පිළිබඳව වගකියනු නොලැබේ.

07. ලංසු ලිපිලේඛනයේ විස්තර කොට ඇති පරිදි වූ ලංසු ඇපකරයක් සමග ඔබේ ලංසුව **2020.10.29 වෙනි දින** 14.00 පැයට හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ගෙනැවිත් භාරදිය යුතුය.

**නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය,**
**STHRD ව්‍යාපෘතිය, පීඨාධිපති කාර්යාලය,**
**තාක්ෂණ පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,**
**මිහින්තලේ, ශ්‍රී ලංකාව.**

- සම්පූර්ණ කරන ලද ලංසු, මුල් පිටපත හා අනු පිටපත ලෙස පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. මුල් පිටපත හා අනු පිටපත වෙන් වෙන් වශයෙන් මුද්‍රා තබන ලද කවරවල බහා **"මුල් පිටපත"** හා **"අනු පිටපත"** ලෙස අදාළ පරිදි සඳහන් කළ යුතුය. ඉන් පසුව කවර දෙක නැවත තනි කවරයක බහා මුද්‍රා තබා අදාළ කොන්ත්‍රාත් හැඳුනුම් අංකය කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.
- පූර්ණ ලංසු රැස්වීම, **2020.10.14 දින පෙ.ව.** 10.00 ට ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ අධ්‍යක්ෂ මණ්ඩල කාමරයේදී පැවැත්වේ.

08. ලංසු භාර ගැනීමේ අවසාන වේලාව ඉක්මවූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,**
**මිහින්තලේ, ශ්‍රී ලංකාව.**
**ZIP කේතය : 50300**
**දිනය : 2020.09.30**

## මහජන අදහස් හා යෝජනා සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති කෙටුම්පත්

01. ගෑස් සිලින්ඩර – සිලින්ඩරය සහ කපාට නිමවූ ද්‍රව්‍යය සමග අන්තර්ගත වායුව සමග ඇති අනුකූලතාවය සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර කෙටුම් පත පළමු කොටස : ලෝහමය ද්‍රව්‍යය
**(ISO 11114: Part 1)**

02. ගෑස් සිලින්ඩර – සිලින්ඩරය සහ කපාට නිමවූ ද්‍රව්‍යය සමග අන්තර්ගත වායුව සමග ඇති අනුකූලතාවය සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර කෙටුම් පත දෙවන කොටස : ලෝහමය නොවන ද්‍රව්‍යය
**(ISO 11114: Part 2)**

03. ගෑස් සිලින්ඩර –පාරිභාෂික වචන සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර කෙටුම් පත
**ISO 10286: 2015**

04. ගෑස් සිලින්ඩර – විනාශකාරී නොවන පරීක්ෂණ සිදු කරන පුද්ගලයන්ගේ සුදුසුකම් සහතික කිරීම සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර කෙටුම් පත
**(ISO 9712: 2012)**

05. ගෑස් සිලින්ඩර – සිලින්ඩර කපාට – එකවතාවක් සිදුකරන පරීක්ෂණ සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර කෙටුම්පත
**(ISO 10297: 2014)**

06. ප්‍රස්ථාරික සංකේත සහ අනතුරු හඟවන සංඥා සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර කෙටුම් පත
පළමු කොටස – අනතුරු හඟවන සංඥා සහ අනතුරු හඟවන සළකුණු සඳහා යොදා ගන්නා සැලසුම් මූලධර්ම
**(ISO 3864-1: 2011)**

07. ප්‍රස්ථාරික සංකේත – අනතුරු හඟවන වර්ණ සහ සංඥා සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර කෙටුම් පත
දෙවන කොටස – භාණ්ඩ සඳහා යොදා ගන්නා ආරක්ෂිත ලේබලය සඳහා වන සැලසුම් මූලධර්ම
**(ISO 3864-2: 2016)**

08. ප්‍රස්ථාරික සංකේත – අනතුරු හඟවන වර්ණ සහ සංඥා සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර කෙටුම් පත
තුන්වන කොටස – ආරක්ෂිත සැලසුම් සඳහා යොදවන සැලසුම් මූලධර්ම
**(ISO 3864-3: 2016)**

09. ප්‍රස්ථාරික සංකේත – අනතුරු හඟවන වර්ණ සහ සංඥා සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර කෙටුම් පත
හතරවන කොටස – අනතුරු හඟවන සංඥා වල වර්ණවල තීව්‍රතාවය
**(ISO 3864-4: 2016)**

10. ප්‍රස්ථාරික සංකේත – අනතුරු හඟවන වර්ණ සහ සංඥා – අනුමැතිය ලද ආරක්ෂිත සංඥා සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර කෙටුම් පත
**(ISO 7010: 2011)**

11. ප්‍රස්ථාරික සංකේත – අනතුරු හඟවන වර්ණ සහ සංඥා – මාර්ග විධි අනුගමනය සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර කෙටුම් පත
**(ISO 16069: 2017)**

12. අභ්‍යන්තර දහන ඩීසල් එන්ජිමේ වකැටි කසුවෙහි ස්නේහක සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර කෙටුම් පත
**SLS 1373** (පළමු ප්‍රතිශෝධනය)

13. අභ්‍යන්තර දහන පෙට්‍රල් එන්ජිමේ වකැටි කසුවෙහි ස්නේහක සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර කෙටුම් පත
**SLS 1374** (පළමු ප්‍රතිශෝධනය)

14. ගියර ස්නේහක (අතිශය පීඩන ගියර තෙල්) සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර කෙටුම් පත
**SLS 1396** (පළමු ප්‍රතිශෝධනය)

15. සිව් පහර චක්‍ර පෙට්‍රල් එන්ජිමේ ස්නේහක සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර කෙටුම් පත
**SLS 1409** (පළමු ප්‍රතිශෝධනය)

16. ද්වි පහර චක්‍ර පෙට්‍රල් එන්ජිමේ ස්නේහක සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර කෙටුම් පත
**SLS 1446** (පළමු ප්‍රතිශෝධනය)

17. ගෘහාශ්‍රිත සහ ඒ සමාන විදුලි උපකරණ – ප්‍රවේසම් අවශ්‍යතා – විදුලි වැටවල් වල ශක්ත්‍යාපන සඳහා විශේෂිත අවශ්‍යතා සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර කෙටුම් පත
**(IEC 60335-2-76**

18. පරිණාමක, ප්‍රතික්‍රියාකාරක, විදුලි සැපයුම් සහ සම්බන්ධක වල ආරක්ෂණය පළමු කොටස : සාමාන්‍ය අවශ්‍යතා සහ පරීක්ෂණ සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර කෙටුම් පත
**(IEC 61558-1)**

19. පරිණාමක, ප්‍රතික්‍රියාකාරක, විදුලි සැපයුම් සහ සම්බන්ධක වල ආරක්ෂණය දෙවන කොටස : රැවුල බෑමේ උපකරණ සඳහා භාවිතවන පරිණාමක, විදුලිබල සැපයුම් ඒකකවල විශේෂිත අවශ්‍යතා සහ පරීක්ෂණ සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර කෙටුම් පත
**(IEC 61558-2-5)**

20. රේඛීය ප්‍රතිදීප්ත පහන් නැවත සකස් කිරීම සඳහා නිර්මාණය කර ඇති ද්වි–ආවරණ ආලෝක විමෝචක දියොඩ ලාම්පු – ආරක්ෂිත පිරිවිතර සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර කෙටුම් පත
**(IEC 62776)**

21. වාහන සඳහා භාවිතා කරන ආරක්ෂිත හිස්ආවරණ (helmets) සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර කෙටුම් පත
**SLS 517** (දෙවන ප්‍රතිශෝධනය)

ඉහත සඳහන් ප්‍රමිති කෙටුම්පත්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් මහජන හා අනෙකුත් උද්යෝගී අංශවල අදහස් හා යෝජනා සඳහා මෙයින් ඉදිරිපත් කර ඇත.

මෙම කෙටුම්පත් ශ්‍රී ලංකා ප්‍රමිතියක් ලෙස අනුමත කිරීමට ප්‍රථම ලැබෙන අදහස්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අදාළ කමිටු මගින් සලකා බලා අවසාන සංශෝධනය කරනු ලැබේ.

ඉහත සඳහන් අංක 12,13,14,15,16 සහ 21 කෙටුම් පත් අවශ්‍ය අයට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ප්‍රලේඛන හා තොරතුරු අංශයෙන් ලබා ගත හැකි අතර, www.slsi.lk වෙබ් අඩවියෙන් ද ලබා ගත හැක. අනෙකුත් කෙටුම්පත් මෙම ආයතනයේ පුස්තකාලයෙන් මිල දී ගත හැක.

සියලුම විවේචන 2020.12.02 දින හෝ ඊට ප්‍රථම මා වෙත ලැබෙන්නට සලස්වන්න.

**අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය,**
**අංක 17, වික්ටෝරියා පෙදෙස,**
**ඇල්විටිගල මාවත,**
**කොළඹ 08.**
**දුරකථන** : 011-2671567 - 72
**ඊමේල්** : dg@slsi.lk

**ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය**
**වෙළඳ අමාත්‍යාංශය**

# බිංගිරිය ප්‍රාදේශීය සභාව

## සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2021

මෙහි දැක්වෙන පහත සඳහන් භාණ්ඩ හා සේවා 2021 වර්ෂය තුළදී සැපයීම සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි කිරීම පිණිස පිළිගත් නිෂ්පාදකයන්ගෙන්, සැපයුම්කරුවන්ගෙන් හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### උපලේඛනය 01

❖ **භාණ්ඩ හා සේවා සැපයීම**

01. ආහාරපාන වර්ග සැපයීම
02. ඇඟිලි සලකුණු යන්ත්‍ර මිලදී ගැනීම
03. උළු සැපයීම
04. කායවර්ධන (ජිම්) උපකරණ සැපයීම
05. කාර්යාලයීය උපකරණ ලී බඩු, ප්ලාස්ටික්, වානේ ගෘහ භාණ්ඩ සැපයීම
06. කෘමිනාශක, වල් නාශක හා පොහොර වර්ග සැපයීම
07. ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීම
08. ගඩොල් සැපයීම
09. තාර සැපයීම
10. ද්‍රව වර්ග සැපයීම
11. පරණ පුවත්පත් විකිණීම
12. පරිගණක / පරිගණක දෘඩාංග සහ ටෝනර් වර්ග සැපයීම
13. පානීය ජලය සැපයීම
14. පෙර පාසල් උපකරණ
15. මල් පෝච්චි හා පැළ සැපයුම්කරුවන්
16. වාහන අමතර කොටස් සැපයීම
17. වාහන හා යන්ත්‍රෝපකරණ සැපයීම
18. වැලි, පස්, බොරළු සැපයීම
19. විදුලි උපකරණ හා වීථි පහන් උපකරණ සැපයීම
20. සත්ත්ව සැපයුම්කරුවන්
21. සියලුම කාර්යාලීය ලිපිද්‍රව්‍ය, මුද්‍රිත ලිපි ද්‍රව්‍ය පෝරම හා ලේඛන සැපයීම
22. සියලුම මුද්‍රණ කටයුතු සිදු කිරීම
23. සියලුම වර්ගයේ ටයර්, ටියුබ් හා බැටරි සැපයීම
24. සියලුම වර්ගයේ හාඩ්වෙයාර් බඩු සැපයීම
25. සෞඛ්‍ය හා සනීපාරක්ෂක උපකරණ සැපයීම
26. හියුම් පයිප්ප, බ්ලොක් ගල්, කුට්ටි ගල්, කම්බි කණු සැපයීම

❖ **වෙනත් සේවාවන්**

27. අනතුරුදායක ගස් කපා හෙලීමේ කටයුතු
28. අන්තර්ජාල සම්බන්ධතා අලුත්වැඩියාව
29. ඇඟිලි සලකුණු යන්ත්‍ර අලුත්වැඩියාව
30. ඉඩම් මැණුම් කටයුතු
31. උත්සව අවස්ථාවන් සඳහා ආහාරපාන සැපයීම හා කේටරින් සේවා
32. කායවර්ධන උපකරණ අලුත්වැඩියාව
33. කාර්යාලයීය උපකරණ අලුත්වැඩියාව
34. කුලී පදනම මත ප්‍රවාහන පහසුකම් ලබාදීම
35. ගස් කපන යන්ත්‍ර විසි ගහන මැෂින් අලුත්වැඩියාව
36. ඡායා පිටපත් යන්ත්‍ර අලුත්වැඩියාව
37. ජලනල පද්ධති ඉදිකිරීම් හා නඩත්තු කටයුතු
38. ඩිජිටල් මුද්‍රණය / නාම පුවරු / බැනර් ඇඳීම / සමරු පලක සැකසීම
39. නීති කටයුතු සඳහා නීති උපදේශකයන් / භාෂා පරිවර්තකයින්
40. පරිගණක යන්ත්‍ර අලුත්වැඩියාව
41. පාවිච්චි කළ පුවත්පත්, හිස් බෝතල්, පරණ යකඩ මිලදී ගැනීම
42. පැස්සුම්කරුවන් / වඩු කාර්මිකයින් / පෙදරේරුවන්
43. පුවත්පත් සැපයීම
44. වාහන අලුත්වැඩියා කිරීම
45. වාහන සේවා සැපයීම
46. වීදුරු දෙරවල් අලුත්වැඩියා කිරීම
47. සියලුම කම්මල් වැඩ කටයුතු සිදු කර ගැනීම
48. සියලුම වර්ගයේ ටයර් නැවත පිරවීම
49. සී.සී.ටී.වී. කැමරා සවිකිරීම හා අලුත්වැඩියාව
50. ස්වයංක්‍රීය වීදුරු දෙරවල් හා සාමාන්‍ය වීදුරු දෙරවල් සවි කිරීම හා අලුත්වැඩියා කිරීම
51. ෆැක්ස් යන්ත්‍ර අලුත්වැඩියාව

### උපලේඛන - 02

❖ **ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්**

| | කොන්ත්‍රාත්කරුවන් | ලියාපදිංචි ගාස්තුව (රු.) |
|---|---|---|
| 01 | රු. 100,000.00 අඩු කර්මාන්ත | 1,000.00 |
| 02 | රු. 100,000.00 සිට 250,000.00 දක්වා | 2,000.00 |
| 03 | රු. 250,000.00 සිට 500,000.00 දක්වා | 2,500.00 |
| 04 | රු. 500,000.00 සිට 1,000,000.00 දක්වා | 3,000.00 |
| 05 | රු. 1,000,000.00 ට වැඩි | 3,500.00 |

එක් එක් භාණ්ඩ වර්ග හා සේවාවන් වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් පහත සඳහන් ආදර්ශ අයදුම් පත්‍රයට අනුව සකස් කර ගත් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. අංක 1 සිට 51 හා දක්වා වූ අයිතමයන් සඳහා ලියාපදිංචි ගාස්තු ලෙස රු. 1,000/- ගෙවිය යුතුය.

භාණ්ඩ හා සේවාවන් සැපයීම හා කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වීමට අදහස් කරන ආයතන හා පුද්ගලයින් අයදුම්පත තමන් ලබා ඇති සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කරන ලියකියවිලි හා ලියාපදිංචි ගාස්තු සඳහා මුදලින් හෝ, **ලේකම්, බිංගිරිය ප්‍රාදේශීය සභාව** නමින් චෙක්පතක් සමග 2020.11.02 දින ප.ව. 2.00 ට පෙර **ලේකම්, බිංගිරිය ප්‍රාදේශීය සභාව, බිංගිරිය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. සැලකිය යුතුයි. මුදල් ඇණවුම් භාරගනු නොලැබේ. එසේ එවන මුදල් ඇණවුම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ "**සැපයුම් කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2021**" යනුවෙන් සඳහන් කර එවන්න.

ලියාපදිංචි වූ අයගෙන් මිල ගණන් කැඳවා අදාළ සැපයුම් සේවා හා වැඩ ඉටුකර ගැනීමට ක්‍රියාකරන අතර, අවශ්‍ය වූ විටෙක ඉන් පරිබාහිරවද කටයුතු කිරීමේ අයිතිය බිංගිරිය ප්‍රාදේශීය සභාව සතු වේ. වැඩි විස්තර කාර්යාල වේලාවන් තුළදී විමසා දැන ගත හැකිය.

**දු. ක. 0322245888/89**
**2020/10/02**
**බිංගිරිය ප්‍රාදේශීය සභාව**

..........................................................
**සභාපති,**
**බිංගිරිය ප්‍රාදේශීය සභාව**

### උපලේඛනය - 03

#### 2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

01. ලියාපදිංචි වීමට අවශ්‍ය
    අංකය : ..........................................
    අයිතමය : ..........................................
02. ඉල්ලුම්කරුවන්ගේ නම : ..........................................
    (ආයතනයේ නම)
03. ලිපිනය : ..........................................
04. i. දුරකථන අංකය : ..........................................
    ii. ෆැක්ස් අංකය : ..........................................
    iii. ඊමේල් අංකය : ..........................................
    iv. වෙබ් ලිපිනය : ..........................................
05. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය : ..........................................
06. වැට් ලියාපදිංචි කිරීමේ අංකය : ..........................................
07. නිෂ්පාදන සමාගමක්ද : ..........................................
    ආනයනය කරන ආයතනයක්ද
    බෙදා හැරීමේ ආයතනයක්ද : ..........................................
08. ණය කාල සීමාව : ..........................................

මම / අප විසින් සපයා ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. ලියාපදිංචි ගාස්තු වශයෙන් රු. .................. ක් .................................... සඳහා .......................... දින .................. .......................... අංක දරන චෙක්පත මේ සමග ඇත.

..........................................
අයදුම්කරුගේ අත්සන

නම ..........................................
ලිපිනය ..........................................
තනතුර ..........................................
දිනය ..........................................

# දැන්වීමයි

2021 වර්ෂය සඳහා හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම්ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

❖ **අයදුම්පත් නිකුත් කරන අවසාන දිනය - 2020.11.30**

❖ **ඇදුම්පත් භාරගන්නා අවසාන දිනය - 2020.12.04**

අයදුම්පත්‍ර හා උපදෙස් පත්‍රිකාව තැපැල් මගින් ගෙන්වා ගැනීමට අවශ්‍ය වේනම් පහත ලිපිනයට රු. 20.0 ක මුද්දර ඇලවී ලියුම් කවරයක් තැපැල් මගින් එවා ලබාගත හැකිය.

**"සභාපති, ප්‍රාදේශීය සභාව, හොරොව්පොතාන"**

වැඩිදුර විස්තර සඳහා 025-2278442 යන දුරකථන අංකයට අමතා ලබාගත හැක.

**ඩබ්.එම්.සී.යූ. විජයරත්න,**
**සභාපති,**
**ප්‍රාදේශීය සභාව,**
**හොරොව්පොතාන.**

2020.09.24




# ප්‍රසම්පාදන දැන්වීම

## ඌව පළාත් සභාව

## නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය

ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් කර්මාන්ත ඉටුකිරීම සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) හා අදාළ ක්ෂේත්‍රයේ ලියාපදිංචිය සහිත සුදුසුකම් ලත් කොන්ත්‍රාත්කරුවන් හා ඉදිකිරීම් ආයතන අතුරින් 2020.10.26 දක්වා තරගකාරී ලංසු කැඳවීමේ පදනම මත මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

| අනු අංකය | කොන්ත්‍රාත් අංකය | කර්මාන්තයේ නම | සිවිල් වැඩ වටිනාකම (රු.මි.) (වැට් රහිත) | ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අවශ්‍ය CIDA ශ්‍රේණිය | ආපසු ගෙවන ලංසු සුරක්ෂණ මුදල (මුදලින් ගෙවන්නේනම්) (රු.) | ඉදිකිරීම් කාල පරාසය (දින ගණන) | ලංසු ලියවිලි ගාස්තු මුදල (රු.) | ලංසුපත් නිකුත් කරන කාර්යාලය |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | DCS/ CBG/2020/ 02/01 | ඌව පළාත් රාජ්‍ය නිලධාරීන් සඳහා පස් මහල් නිල නිවාස ගොඩනැගිල්ලක් ඉදිකිරීම (ඉතිරි වැඩ නිම කිරීම) | 70.62 | C4 | 353,500.00 | 365 | 15,000.00 | පළාත් ගොඩනැගිලි අධ්‍යක්ෂ කාර්යාලය |
| 2 | DCS/ PSSP/2020/ 02/01 | ඇතිමලේ ප්‍රාදේශීය රෝහලේ ප්‍රාථමික සත්කාර ඒකකයේ බාහිර රෝගී අංශය නවීකරණය කිරීම. | 27.74 | C5 හා C4 | 139,000.00 | 270 | 5,000.00 | |
| 3 | DCS/ PSSP/2020/ 02/02 | පිටකුඹුර ප්‍රාදේශීය රෝහලේ ප්‍රාථමික සත්කාර ඒකකය (වාට්ටු ගොඩනැගිල්ල) නවීකරණය කිරීම. | 23.77 | C6 හා C5 | 119,000.00 | 270 | 5,000.00 | |
| 4 | DCS/ PSSP/2020/ 02/03 | ගොඩිගමුව ප්‍රාදේශීය රෝහලේ ප්‍රාථමික සත්කාර ඒකකය ( බාහිර රෝගී අංශය) නවීකරණය කිරීම | 19.14 | C6 හා C5 | 95,750.00 | 270 | 5,000.00 | |
| 5 | DCS/ PSSP/2020/ 02/04 | දියතලාව මූලික රෝහලේ වාට්ටු අංක 2 අලුත්වැඩියා කිරීම | 14.26 | C6 හා C5 | 71,500.00 | 270 | 5,000.00 | |
| 6 | DCS/ CBG /2020/ 02/02 | ඌව පළාත් ගොඩනැගිලි අධ්‍යක්ෂ කාර්යාලයේ රැස්වීම් ශාලාව ඉදිකිරීම. | 13.44 | C6 හා C5 | 67,500.00 | 180 | 5,000.00 | |

02. ප්‍රසම්පාදන ක්‍රමය
    - අංක 1 යටතේ සඳහන් කර්මාන්තය ජාතික තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමය (National Competitive Bidding) මගින් ප්‍රසම්පාදනය සිදු කරනු ලැබේ.
    - අංක 2 සිට අංක 6 දක්වා වන කර්මාන්ත ජාතික තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමය මගින් ලංසු කැඳවනු ලබන අතර, මෙම කර්මාන්තවල මුළු ඇස්තමේන්තු පිරිවැය රුපියල් මිලියන 50 ඉක්ම නොයන බැවින් මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 4/2016 (ii) අනුව කොන්ත්‍රාත්කරුවන්ගේ පළාත් ප්‍රමුඛතාවය හා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි ලියාපදිංචි ශ්‍රේණියේ ප්‍රමුඛත්වය ලංසු ඇගයීමේදී සැලකිල්ලට ගනු ලැබේ.
03. ඉහත වගුවේ සඳහන් සීඩා ශ්‍රේණිය (CIDA) හා අදාල ක්ෂේත්‍රයේ ලියාපදිංචිය සහිත අසාධු ලේඛන ගත කිරීම සඳහා නිර්දේශ නොවූ , සාර්ථක හා යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන් ලංසු ප්‍රදානය සඳහා සුදුසුකම් ලබති.
04. ලංසු ඇගයීමේදී පහත සඳහන් සුදුසුකම් සලකා බලනු ලැබේ.
    i. පසුගිය වසර පහ තුළ සිවිල් වැඩ වටිනාකමින් 60%ක් හෝ ඊට සමාන එක් කර්මාන්තයක් ඉටුකර ඇති පළපුරුද්ද.
    ii. පසුගිය වසර පහ තුළ ඉහත ඉදිකිරීමේ සිවිල් වැඩ වලට සමානව පවත්වාගෙන ගිය සාමාන්‍ය පිරිවැටුම.
    iii. මූල්‍යමය හැකියාව.
    iv. දැනට කර ගෙන යන වැඩ වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය
05. ලංසු වටිනාකම රුපියල් මිලියන 05ක් හෝ ඊට වැඩි අගයක් සහිත කර්මාන්ත සඳහා 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත යටතේ ලියාපදිංචි විය යුතු අතර, ලංසු සමග එම ලියාපදිංචි සහතිකය හෝ එය තහවුරු කළ හැකි ලේඛන ඉදිරිපත් කළ යුතුය. එම ලියාපදිංචි සහතිකය හෝ එය තහවුරු කළ හැකි ලේඛන ලංසු සමග ඉදිරිපත් කර නොමැතිවීම ලංසු ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වේ.
06. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට ඉහත වගුවේ සඳහන් කාර්යාල වෙත ලිඛිත ඉල්ලුම්පතක් ඉදිරිපත් කිරීමෙන් ප්‍රසම්පාදන ආකෘතිපත් වල සම්පූර්ණ ඉංග්‍රීසි භාෂාමය පිටපතක් 2020.10.02 සිට 2020.10.23 දින දක්වා කාර්යාල වේලාවන් තුළදී ඉහත වගුවේ සඳහන් පරිදි ලංසු ලියවිලි ගාස්තුව ගෙවීමෙන් පසු ලබා ගත හැකි අතර, අයකිරීමකින් තොරව පරීක්ෂා කළ හැක.
07. ලංසු සුරක්ෂණය මුදලින් **නොගෙවන්නේ නම්** ලංසු සමග ලංසු බැඳුම්කරයක් අමුණා එවිය යුතුය. ලංසු බැඳුම්කරයක් ඉදිරිපත් කරන්නේ නම්,ලංසු සුරක්ෂණය සඳහා වගුවේ සඳහන් ලංසු සුරක්ෂණ මුදල මෙන් දෙගුණයක් වටිනාකමින් යුත් ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමත කළ **වාණිජ බැංකුවකින්** ලබාගත් **කොන්දේසි රහිතව** ඉල්ලූවිට ගෙවනු ලබන බැංකු ඇපකරයක් මගින් පමණක් ඉදිරිපත් කළ යුතුය. ලංසු ඇපකරය 2021.02.26 වෙනි දින දක්වා වලංගු විය යුතුය.
08. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු පිටපත් දෙකකින් යුතුව අදාළ ප්‍රසම්පාදන කමිටුව වෙත 2020.10.26 වන දින ප.ව. 2.00 ට පෙර ඉදිරිපත් කළ යුතු අතර, ලංසුපත් වල මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර වෙන් වෙන්ව කවර දෙකක බහා එම කවර දෙක එක් ලිපි කවරයක බහා, ඉහළ වම් කෙළවරේ අදාළ කර්මාන්තයේ නම සඳහන් කර මුද්‍රා තබා, සභාපති , ප්‍රසම්පාදන කමිටුව , නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය, පිංඅරාව, බදුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ එම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදුකළ යුතු අතර, ප්‍රමාද වී ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
09. අනු පිටපත, මුල් පිටපතේ සෑම පිටුවකම සහතික කරන ලද ඡායාස්ථ පිටපතක් විය යුතුය
10. අදාළ වැඩි විස්තර, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයට අයත් 055 - 2222218 , ගොඩනැගිලි අධ්‍යක්ෂ කාර්යාලයට අයත් 055-2229629, මොණරාගල ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලයට අයත් 055-2276038, බදුල්ල ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලයට අයත් 055-2224753, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලයට අයත් 057-2222025 හා බිබිල ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලයට අයත් 055-2265317 යන දුරකථන අංක වලින් ලබා ගත හැක.
11. ලංසු වලංගු කාලය 2021.01.26 වෙනි දින දක්වා විය යුතුය.
12. 2020.10.26 දින ප.ව. 2.00 ට බදුල්ල, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයේදී ලංසු විවෘත කරන අතර, එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයින්ට සහභාගි විය හැක.
13. ලංසු කැඳවීම සම්බන්ධ පූර්ව ලංසු රැස්වීමක් (Pre Bid Meeting), 2020.10.12 දින පෙ.ව.10.00 ට බදුල්ල, පිංඅරාව, පළාත් ගොඩනැගිලි අධ්‍යක්ෂ කාර්යාලයේදී පැවැත්වෙන අතර, එහිදී අපේක්ෂිත ලංසුකරුවන්ට ව්‍යාපෘති අවශ්‍යතා සම්බන්ධව පැහැදිලි කිරීම් ඉල්ලා සිටිය හැක. තවද අවශ්‍ය නම් වැඩ බිම් සංචාරයක්ද පිළියෙල කළ හැක.
14. ලද ලංසු අතරින් යෝග්‍ය ලංසුවක් පිළිගැනීම හෝ සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය ප්‍රසම්පාදන මණ්ඩලය සතුවන අතර, ප්‍රසම්පාදන මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

**සභාපති - ප්‍රසම්පාදන මණ්ඩලය,**
**නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය,**
**පිංඅරාව, බදුල්ල.**
**දු.ක / ෆැක්ස් අංකය - 055-2222218,**
**ඊ.මේල්- dcsengupc@gmail.com**
**දිනය : 2020.09.29**

# මහජන බැංකුව

## උකස් වෙන්දේසිය

රත්නපුර ප්‍රාදේශිකයට අයත් පහත සඳහන් ශාඛාවන් හා සේවා මධ්‍යස්ථානවල 2019.02.28 දින දක්වා උකස් කරන ලදුව පහත උපලේඛනයේ සඳහන් දිනයන් දක්වා බේරා නොගත් උකස් භාණ්ඩ, පහත දක්වා ඇති දිනයන්හි හා ස්ථානයේ පෙ.ව. 9.00 ට ආරම්භකර වෙන්දේසි කරනු ලබන බව මෙයින් දන්වමු.

| ශාඛාව | සේවා මධ්‍යස්ථානය | පහත දින දක්වා බේරා ගනු නොලබන උකස් භාණ්ඩ | වෙන්දේසි දිනය | වෙන්දේසි ස්ථානය |
|---|---|---|---|---|
| බලන්ගොඩ | පඹහින්න | 2020.10.26 | 2020.10.27<br>2020.10.28 | මහජන බැංකුව, රත්නපුර නගර (කුඩුගල්වත්ත) ශාඛාවේ පළමු මහල |
| | වැලිගෙපොළ | | | |
| පැල්මඩුල්ල | ඕපනායක | | | |
| කල්තොට | වේලිඔය | | | |
| ඇඹිලිපිටිය | පදලංගල | | | |
| | කොළොන්න | | | |
| | සෙවණගල | | | |
| උඩවලව | – | | | |
| පල්ලෙබැද්ද | – | | | |
| ඇහැළියගොඩ | ඇහැළියගොඩ | | | |
| කුරුවිට | – | | | |
| කිරිඇල්ල | අයගම | | | |
| රත්නපුර | රත්නපුර නව නගර | | | |
| රක්වාන | – | | | |
| ගොඩකවෙල | – | | | |
| කහවත්ත | – | | | |
| රත්නපුර නගර | වේවැල්වත්ත | | | |
| නිවිතිගල | කරවිට | | | |
| කලවාන | – | | | |

ඉහත පරිදි පැවැත්වීමට නියමිත මෙම වෙන්දේසිය නැවත දැන්වීමකින් තොරව බැංකුවේ අභිමතය පරිදි අවලංගු කිරීම හෝ කල් දැමීම, ඒකාබද්ධකර පැවැත්වීම හෝ යන මෙයින් යම් කටයුත්තක් වුවද සිදු කිරීමේ අයිතිය බැංකුව සතුව ඇත.

**ප්‍රාදේශීය කළමනාකාර**
**මහජන බැංකුව,**
**ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, නවනගරය, රත්නපුර.**

මහජන බැංකුව PEOPLE'S BANK
www.peoplesbank.lk
AA+ (lka) Fitch Rating, AA- Brand Finance Rating

# මහජන බැංකුව

## කුරුණෑගල ප්‍රාදේශිකය

## බේරා නොගත් උකස් භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

මහජන බැංකුවේ පහත සඳහන් ශාඛාවන් හා සේවා මධ්‍යස්ථාන වෙත 2019-08-31 (අවුරුද්දක් සඳහා උකස් තැබූ) දින ගනුදෙනු අවසානය දක්වා උකස් කරන ලදුව සඳහන් කර ඇති දින තෙක් බේරා නොගත් රන් භාණ්ඩ පහත දක්වා ඇති දිනයන්හි හා ස්ථානයන්හිදී පෙ.ව. 9.00 ට ආරම්භ කර, ප්‍රසිද්ධ වෙන්දේසියේ අලෙවි කරනු ලබන බව මෙයින් දන්වමු.

| ශාඛාව | සේවා මධ්‍යස්ථානය | පහත දින දක්වා බේරා නොගත් භාණ්ඩ | වෙන්දේසි දිනය | වෙන්දේසි ස්ථානය |
|---|---|---|---|---|
| කුරුණෑගල | රෝහල් ඒකකය<br>නගර සභා ඒකකය | 2020-11-20 | 2020-11-21 සහ 2020-11-22 | කුරුණෑගල |
| පොල්ගහවෙල | ගොඩවෙල | | | පොල්ගහවෙල |
| මාකඳුර | පත්තල | | | මාකඳුර |
| රිදීගම | පානගමුව, දෙඩම්ගස්ලන්ද | | | රිදීගම |
| ඇතුගල්පුර | හිරිපිටිය මල්ලවපිටිය | | | ඇතුගල්පුර |
| මැල්සිරිපුර | – | 2020-11-27 | 2020-11-28 සහ 2020-11-29 | මැල්සිරිපුර |
| කුලියාපිටිය | දුම්මලසූරිය<br>උඩුබද්දව<br>බිහල්පොල<br>කඳතේගෙදර | | | කුලියාපිටිය |
| මහව | නාගොල්ලාගම | | | මහව |
| නාරම්මල | කටුපොත | | | නාරම්මල |
| ගිරිඋල්ල | බම්මන්න,<br>දඹදෙණිය | | | ගිරිඋල්ල |
| නිකවැරටිය | නිකවැරටිය<br>රස්නායකපුර<br>ගිරිල්ල | | | නිකවැරටිය |
| හෙට්ටිපොල | බණ්ඩාරකොස්වත්ත | | | හෙට්ටිපොල |
| අලව්ව | බෝයවලාන | | | අලව්ව |
| වාරියපොල | මාස්පොත | 2020-12-04 | 2020-12-05 සහ 2020-12-06 | වාරියපොල |
| බිංගිරිය | වීරපොකුණ | | | බිංගිරිය |
| ගල්ගමුව | අඹන්පොල | | | ගල්ගමුව |
| මාවතගම | පරගහදෙනිය | | | මාවතගම |
| ඉබ්බාගමුව | කුඹුක්ගැටේ | 2020-12-11 | 2020-12-12 සහ 2020-12-13 | ඉබ්බාගමුව |
| මලියදේව | මලියදේව වීදිය<br>පිදුරුවැල්ල | | | මලියදේව |
| පොතුහැර | මතව | | | පොතුහැර |
| කොබෙයිගනේ | බොරළුවැව | | | කොබෙයිගනේ |

ඉහත දක්වා ඇති පරිදි පැවැත්වීමට නියමිත මෙම වෙන්දේසිය නැවත දැනුම්දීමකින් තොරව බැංකුවේ අභිමතය පරිදි අවලංගු කිරීම, කල් දැමීම හෝ ඒකාබද්ධ කර පැවැත්වීමේ අයිතිය බැංකුව සතුය.

**ප්‍රාදේශීය කළමනාකාර,**
**මහජන බැංකුව,**
**ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,**
**නො. 03, වත්හිමි පාර, කුරුණෑගල**

මහජන බැංකුව PEOPLE'S BANK
www.peoplesbank.lk
AA+ (lka) Fitch Rating, AA- Brand Finance Rating

# මහජන බැංකුව

## කොළඹ පිටත ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය

## බේරා නොගත් උකස් රන් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මහජන බැංකුවේ පහත දැක්වෙන ශාඛාවන්හි / සේවා මධ්‍යස්ථානයන්හි 2019-03-31 දින දක්වා උකස් කරන ලදුව ඒ ඒ ශාඛාවන් ඉදිරියෙන් දැක්වෙන දිනයන්ට බේරා නොගත් රන් භාණ්ඩ මෙම නිවේදනයේ දක්වා ඇති පරිශ්‍රයන්හි දී පහත සඳහන් දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

| ශාඛාව සහ සේවා මධ්‍යස්ථානය | පහත දැක්වෙන දිනයට බේරා නොගත් | වෙන්දේසිය පැවැත්වෙන දිනය | වෙන්දේසිය පැවැත්වෙන ස්ථානය |
|---|---|---|---|
| **හෝමාගම**<br>හෝමාගම නගර සේ. ම.<br>පාදුක්ක සේ. ම/ මීගොඩ සේ.ම.<br>ගොඩගම සේ. ම.<br>යුධ හමුදා රෙ. මූ. - පනාගොඩ සේ.ම. | 2020-10-30 | 2020-10-31<br>2020-11-01 | හෝමාගම ශාඛාව |
| **බත්තරමුල්ල**<br>තලවතුගොඩ සේ. ම.<br>මාලබේ සේ.ම. / හෝකන්දර සේ.ම.<br>විදේශ සේවා කාර්යාංශය සේ.ම. | 2020-10-30 | 2020-10-31<br>2020-11-01 | බත්තරමුල්ල ශාඛාව |
| **දෙහිවල**<br>අත්තිඩිය සේ. ම.<br>නැදිමාල සේ.ම. | 2020-11-06 | 2020-11-07<br>2020-11-08 | දෙහිවල ශාඛාව |
| **ගල්කිස්ස** | | | |
| **රත්මලාන**<br>රත්මලාන ආර්ථික සේ. ම. | | | |
| **හංවැල්ල**<br>හංවැල්ල නගර සේ. ම.<br>කහහේන සේ.ම. | 2020-11-06 | 2020-11-07<br>2020-11-08 | හංවැල්ල ශාඛාව |
| **කඩුවෙල**<br>නවගමුව සේ. ම.<br>බණ්ඩාරවත්ත සේ.ම. | | | |
| **කොලොන්නාව**<br>වැල්ලම්පිටිය සේ. ම. | 2020-11-20 | 2020-11-21<br>2020-11-22 | කොට්කාවත්ත ශාඛාව |
| **කොට්කාවත්ත**<br>ගොතටුව සේ. ම.<br>මුල්ලේරියාව නව නගර සේ.ම. | | | |
| **පිළියන්දල**<br>පිළියන්දල නගර සේ. ම. | 2020-11-20 | 2020-11-21<br>2020-11-22 | කැස්බෑව ශාඛාව |
| **කැස්බෑව**<br>කහතුඩුව සේ. ම. | | | |
| **අවිස්සාවේල්ල**<br>කොස්ගම සේ. ම.<br>තල්දූව සේ. ම. | 2020-11-27 | 2020-11-28 | අවිස්සාවේල්ල ශාඛාව |
| **බොරලැස්ගමුව** | 2020-11-27 | 2020-11-28 | දෙහිවල ගාලු පාර ශාඛාව |
| **දෙහිවල ගාලුපාර**<br>කළුබෝවිල සේ.ම. | | | |
| **මොරටුව**<br>රාවතාවත්ත සේ. ම.<br>කටුකුරුන්ද සේ. ම. | 2020-12-04 | 2020-12-05<br>2020-12-06 | මොරටුව ශාඛාව |
| **මොරටුමුල්ල**<br>පුවක්අරඹ සේ. ම. | | | |
| **කටුබැද්ද**<br>සොයිසාපුර සේ. ම. | | | |
| **නුගේගොඩ නගර**<br>කොහුවල සේ. ම. | 2020-12-04 | 2020-12-05<br>2020-12-06 | ගංගොඩවිල ශාඛාව |
| **ගංගොඩවිල**<br>දෙල්කඳ සේ. ම/ ජයවර්ධනපුර සේ. ම. | | | |
| **මහරගම**<br>පන්නිපිටිය සේ. ම.<br>පමුණුව සේ.ම. | | | |
| **නුගේගොඩ**<br>ඇඹුල්දෙණිය සේ. ම. / නාවල සේ.ම.<br>චැපල් පාර සේ. ම. / වැලිකඩ සේ. ම. | 2020-12-11 | 2020-12-12<br>2020-12-13 | නුගේගොඩ ශාඛාව |
| **පිටකෝට්ටේ ශාඛාව**<br>ඇතුල්කෝට්ටේ සේ.ම.<br>තලපත්පිටිය සේ. ම. | | | |
| **කෝට්ටාව**<br>අතුරුගිරිය සේ.ම.<br>මත්තේගොඩ සේ. ම. | 2020-12-11 | 2020-12-12<br>2020-12-13 | කෝට්ටාව ශාඛාව |

උක්ත උකස් වෙන්දේසි කිරීම් දැන්වීමකින් තොරව, අවලංගු කිරීම, කල්දැමීම, ස්ථානය වෙනස් කිරීම හෝ ඒකාබද්ධ කිරීමේ අයිතිය මහජන බැංකුව සතුය.

**සහකාර සාමාන්‍යාධිකාරිණී,**
**(කොළඹ පිටත) මහජන බැංකුව,**
**අංක 177A, හයිලෙවල් පාර, නුගේගොඩ.**
**දුරකථන අංක : 2812260 / 2854189**

මහජන බැංකුව PEOPLE'S BANK
www.peoplesbank.lk
AA+ (lka) Fitch Rating, AA- Brand Finance Rating

# මහජන බැංකුව

## බේරා නොගත් උකස් භාණ්ඩ (ස්වර්ණාභරණ) වෙන්දේසියයි.

මහජන බැංකුවේ ගාල්ල ප්‍රාදේශිකයට අයත් පහත සඳහන් ශාඛා සහ සේවා මධ්‍යස්ථානයන්හි 2019-01-31 දින දක්වා උකස් කරන ලදුව, මෙතෙක් බේරා නොගත් උකස් භාණ්ඩ 2020-10-17 දිනයෙහි අපගේ ගාල්ල කොටුව ශාඛා පරිශ්‍රයේදී පෙ.ව. 9.00 ට ආරම්භ කර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙමු.

| ශාඛා අංකය | ශාඛාව සහ උකස් මධ්‍යස්ථානය | බේරාගත හැකි අවසන් දිනය | වෙන්දේසි දිනය | වෙන්දේසිය පැවැත්වෙන ස්ථානය |
|---|---|---|---|---|
| 035 | අම්බලන්ගොඩ ශාඛාව | 2020-10-15 | 2020-10-17 | ගාල්ල කොටුව ශාඛා පරිශ්‍රයේදී |
| 549 | අම්බලන්ගොඩ මහවීදිය සේවා මධ: | | | |
| 560 | වතුගෙදර සේවා මධ්‍යස්ථානය | | | |
| 154 | බලපිටිය ශාඛාව | | | |
| 889 | කොස්ගොඩ සේවා මධ්‍යස්ථානය | | | |
| 197 | ඌරගස්මංහන්දිය ශාඛාව | | | |
| 234 | බටපොළ ශාඛාව | | | |
| 937 | මීටියාගොඩ සේවා මධ්‍යස්ථානය | | | |
| 013 | ගාල්ල කොටුව ශාඛාව | | | |
| 420 | ගිංතොට සේවා මධ්‍යස්ථානය | | | |
| 520 | වංචාවල සේවා මධ්‍යස්ථානය | | | |
| 987 | පෙට්ටිගලවත්ත සේවා මධ්‍යස්ථානය | | | |
| 169 | ගාල්ල මහවීදිය ශාඛාව | | | |
| 587 | පින්නදූව සේවා මධ්‍යස්ථානය | | | |
| 404 | කලුවැල්ල සේවා මධ්‍යස්ථානය | | | |
| 188 | අහංගම ශාඛාව | | | |
| 329 | කොග්ගල ශාඛාව | | | |
| 136 | හික්කඩුව ශාඛාව | | | |
| 469 | රත්ගම සේවා මධ්‍යස්ථානය | | | |
| 561 | ගෝනාපීනුවල සේවා මධ්‍යස්ථානය | | | |
| 748 | කුමාරකන්ද සේවා මධ්‍යස්ථානය | | | |
| 087 | බද්දේගම | | | |
| 073 | ඇල්පිටිය ශාඛාව | | | |
| 441 | පිටිගල සේවා මධ්‍යස්ථානය | | | |
| 869 | කුරුඳුගහහැතැක්ම සේවා මධ්‍යස්ථානය | | | |
| 444 | කරන්දෙණිය සේවා මධ්‍යස්ථානය | | | |
| 131 | උඩුගම ශාඛාව | | | |
| 442 | නෙළුව සේවා මධ්‍යස්ථානය | | | |
| 343 | කරාපිටිය ශාඛාව | | | |
| 272 | තල්ගස්වල ශාඛාව | | | |
| 522 | නාගොඩ සේවා මධ්‍යස්ථානය | | | |
| 325 | වඳුරඹ ශාඛාව | | | |
| 247 | ඉමදූව ශාඛාව | | | |
| 424 | යක්කලමුල්ල සේවා මධ්‍යස්ථානය | | | |
| 980 | බෝගහගොඩ සේවා මධ්‍යස්ථානය | | | |

මෙම වෙන්දේසිය නැවත දැනුම් දීමකින් තොරව බැංකුවේ අභිමතය පරිදි අවලංගු කිරීම හෝ කල් දැමීම හෝ ඒකාබද්ධ කර පැවැත්වීම හෝ යන කවර කටයුත්තක් වුවද සිදු කිරීමේ අයිතිය බැංකුව සතුව ඇත.

**ප්‍රාදේශීය කළමනාකරු,**
**මහජන බැංකුව,**
**ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය - ගාල්ල.**

මහජන බැංකුව PEOPLE'S BANK
www.peoplesbank.lk
AA+ (lka) Fitch Rating, AA- Brand Finance Rating

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## පාසල්වලට සිසුන් තෝරාගැනීමට හා ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට 5 ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය - 2020

කාල සටහන

| දිනය | විෂය | වේලාව |
|---|---|---|
| 2020 ඔක්තෝබර් 11 ඉරිදා | **I වන ප්‍රශ්න පත්‍රය**<br>(වරණ තුනකින් සමන්විත බහුවරණ ප්‍රශ්න 40 කි) | **පැය 0930 - 1030**<br>කාලය - පැය එකයි |
| | **II වන ප්‍රශ්න පත්‍රය**<br>(බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 60 කි) | **පැය 1100 - 1215**<br>කාලය - පැය එකයි මිනිත්තු 15 |

උක්ත විභාගය 2020 ඔක්තෝබර් මස 11 වන ඉරිදා දින දිවයින පුරා පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම විභාගය සඳහා අයදුම්පත් ඉදිරිපත් කර ඇති පාසල් දරුවන් සඳහා මෙවර ප්‍රථම වරට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කර ඇත.

මෙම විභාග ප්‍රවේශ පත්‍රයෙහි විභාග අංකය හා අයදුම්කරු විභාගයට පෙනී සිටිය යුතු විභාග මධ්‍යස්ථානය සඳහන් කර ඇත. මෙවර විභාගයේ සිට සියලුම විභාග අපේක්ෂකයින් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අනුමත කරන ලද ජාතික ශිෂ්‍ය අනන්‍යතාව දක්වා ඇති අතර, ඉදිරියේදී දරුවාගේ අධ්‍යාපනික තොරතුරු ඇතුළත් කිරීම සඳහා මෙම කේතය වැදගත්වන හෙයින් එම කේතය සහිත කොටස වෙන් කර දෙමාපියන් විසින් සුරක්ෂිතව තබා ගත යුතුය.

මෙම විභාගය සඳහා අයදුම් කළ සියලු විභාග අපේක්ෂකයින්ගේ විභාග ප්‍රවේශ පත්‍රය හා පැමිණීමේ ලේඛන අදාළ පාසලේ විදුහල්පති වෙත තැපැල් මගින් යවා ඇත. මෙතෙක් එම ලේඛන ලැබී නොමැති විදුහල්පතිවරුන් විසින් තම පාසලේ අංකය, පාසලේ නම, ලිපිනය සහ අයදුම්කරුවන්ගේ විස්තර සහිතව මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම් කළ මුද්‍රිත පිටපත සමගින් මෙම දෙපාර්තමේන්තුවේ පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාවට වහාම පැමිණ නැවත පිටපතක් ලබාගත යුතු වේ.

මෙම විභාගයට පෙනී සිටින දරුවන් සඳහා නිකුත් කර ඇති ප්‍රවේශපත්‍රය විභාගයට පෙනී සිටීම සඳහා අනිවාර්ය නොවන බව කරුණාවෙන් සලකන්න. යම් අයදුම්කරුවකු ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අවස්ථාවකදී පාසලෙන් ලබාදෙන පැමිණීමේ ලේඛන අනුව අයදුම්කරුගේ අනන්‍යතාව තහවුරු කොටගෙන විභාගය සඳහා පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

**විමසීම් :**

| | |
|---|---|
| **දුරකථන අංක** | **011-2784208, 2784537, 2786616<br>011-2786200, 2784201, 2785202** |
| **ක්ෂණික දුරකථන අංකය** | **1911** |
| **ෆැක්ස් අංකය** | **011-2784422** |
| **තැපැල් ලිපිනය** | **විභාග කොමසාරිස් ජනරාල්<br>පාසල් විභාග සංවිධාන ශාඛාව<br>ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව<br>පැලවත්ත, බත්තරමුල්ල.** |

**බී. සනත් පූජිත**
**විභාග කොමසාරිස් ජනරාල්**

6/5/ශිෂ්‍යත්ව/2020
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**පැලවත්ත, බත්තරමුල්ල.**
2020.09.25

# ලංසු කැඳවීම

## ඉඩම් අමාත්‍යාංශය
## ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

# වාර්ෂික අවශ්‍යතා ප්‍රසම්පාදනය - 2020

## ලංසු අංකය - SD/1/2020

1. මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙනුවෙන් ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් පහත ලැයිස්තුගත භාණ්ඩ ප්‍රසම්පාදනය සඳහා නිෂ්පාදකවරුන්, නිෂ්පාදකවරුන්ගේ බලයලත් නියෝජිතවරුන් වෙතින් මුද්‍රා සහිත ලංසු ඉදිරිපත් කිරීම සඳහා කරනු ලබන ආරාධනයයි.

| අයිතම අංකය | අයිතමය | ප්‍රමාණය | ලංසු සුරක්ෂණය (රු.) |
|---|---|---|---|
| 01 | ලැප්ටොප් පරිගණක | 137 | 205,500.00 |

2. ලංසු කැඳවීම ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ පටිපාටිය මත සිදු කෙරේ.
3. ඒ සඳහා උනන්දුවක් දක්වන ලංසු තබන්නන්, සර්වේයර් ජනරාල් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී (ප්‍රසම්පාදන හා සැපයීම්) වෙතින් වැඩිදුර තොරතුරු ලබා ගත යුතු අතර, පහත සඳහන් ලිපිනයේදී කාර්යාල වේලාවන් තුළ ලංසු කැඳවීමේ ලිපිලේඛන පරීක්ෂා කළ හැකිය.
4. ඉංග්‍රීසි භාෂාවෙන් ඇති ලංසු කැඳවීමේ සම්පූර්ණ ලේඛන කට්ටලයක්, පහත සඳහන් ලිපිනයට අයදුම්පතක් හා **රුපියල් දහස (රු.1,000.00) ක නැවත නොගෙවන මුදලින් කරනු ලබන ගෙවීම් මත 2020.10.15 වන දින ප.ව. 3.00 දක්වා වූ කාර්යාල වේලාවන් තුළ ලංසු තබන්නන්ට මිලදී ගත හැකිය.**
5. පූර්ව ලංසු රැස්වීම **2020.10.12 දින පෙ.ව.** 10.30 ට සර්වේයර් ජනරාල් කාර්යාල නව ශ්‍රවණාගාරයේදී පැවැත්වීමට සූදානම් කර තිබේ.
6. පිටපත් දෙකකින් සකස් කරන ලද ලංසු පත්‍ර ඇතුළත් කරන ලද කවරයේ වම් කෙළවරෙහි **"ලැප්ටොප් පරිගණක සඳහා මිල ගණන් කැඳවීම - 2020"** ලෙස සඳහන් කර ලංසු අඩංගු මුද්‍රා තැබූ ලිපි කවර **2020.10.16 දින ප.ව. 02.00** ට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. **2020.10.16 දින ප.ව. 02.05** ට පහත සඳහන් ලිපිනයේදී ලංසු තබන්නන් සහ/ හෝ ඔවුන්ගේ නියෝජිතයන් ලෙස සහභාගී වීමට තෝරා ගත් පුද්ගලයන් ඉදිරියේදී ලංසු විවෘත කරනු ලැබේ. සියලුම ලංසු ඉහත උපලේඛනයේ සඳහන් කරනු ලබන ලංසු සුරැකුම් ගාස්තුවලින්ද සමන්විත විය යුතුය.
7. ලිපිනය: **ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී ( ප්‍රසම්පාදන හා සැපයීම්), සර්වේයර් ජනරාල් කාර්යාලය, නො: 150, කිරුළ පාර, කොළඹ 05. දුරකථන/ ෆැක්ස් : 0112 -368106**
8. ලංසු ලේඛන පිළිබඳ වෙනත් පැහැදිලි කිරීම් සඳහා ඉල්ලීම් 2020.10.09 දින මධ්‍යහ්න 12.00 ට පෙර ඉදිරිපත් කළ යුතුය.
9. මිලදී ගැනීමේ ඇනවුම ලැබී සති හයක් (06) තුළ අදාළ භාණ්ඩ ලබා දිය යුතුය.

**සර්වේයර් ජනරාල්,**
**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**නො : 150, කිරුළ පාර සර්වේයර් ජනරාල් කාර්යාලය,**
**කොළඹ 05.**
2020.10.02

# ප්‍රසම්පාදන දැන්වීම

## ජාතික විගණන කාර්යාලය
## ආපනශාලා සේවා සඳහා මිල ගණන් කැඳවීම
## 2020/2021 වර්ෂය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ලේ පිහිටි ජාතික විගණන කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි ආපනශාලා සේවා සඳහා ලියාපදිංචි හා පළපුරුදු ආයතන හා පුද්ගලයන් වෙතින් ජාතික විගණන කාර්යාල ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති විසින් මුද්‍රා තබන ලද මිල කියුම්පත් භාරගනු ලබන අතර, එකී මිල කියුම්පත් භාර ගැනීම 2020 ඔක්තෝබර් 16 දින ප.ව. 2.00 ට අවසන් කරනු ලැබේ.

රු. 500.00 ක් වූ ආපසු නොගෙවන ප්‍රසම්පාදන ගාස්තුවක් හා රු. 2,500.00 ක් වූ ආපසු ගෙවනු ලබන ප්‍රසම්පාදන තැන්පත් මුදලක් ගෙවා 2020 ඔක්තෝබර් 02 දින සිට 2020 ඔක්තෝබර් 14 දින දක්වා ඕනෑම වැඩ කරන දිනයක පෙ.ව. 9.00 සිට ප.ව. 2.30 දක්වා කාලය තුළ බත්තරමුල්ලේ පිහිටි ජාතික විගණන කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරීවරයා වෙතින් ලබාගත හැකි ආකෘතිපත්‍ර මගින් මිල කියුම් ඉදිරිපත් කළ යුතුය.

මුද්‍රා තැබූ මිල කියුම්, මිල කියුම් භාර ගැනීමේ වේලාව අවසන් වීමට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ ජාතික විගණන කාර්යාලයේ පළමු මහලේ 101 කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට හැකිය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි **"ආපනශාලා සේවා සඳහා මිල කියුම්- ජාතික විගණන කාර්යාලය"** යන්න සඳහන් කළ යුතුය.

වැඩිමනත් විස්තර සඳහා කරුණාකර අංක 011-2887017 දරන දුරකථනය ඔස්සේ ප්‍රධාන ගණකාධිකාරී අමතන්න.

**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**ජාතික විගණන කාර්යාලය,**
**අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල.**
**2020 ඔක්තෝබර් 02 වන දින**

# ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

## 2021 වසර සඳහා දේශීය සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම
## (බී/43/2020)

පහත සඳහන් සැපයුම් සහ සේවාවන් සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලියාපදිංචි වීමට අපේක්ෂිත අයදුම්කරුවන් හට එම අයදුම්පත් 30.10.2020 දින 1500 පැය දක්වා (පැය 0900 - 1215 දක්වාත් පැය 12.45 - 1500 පමණි) අප කාර්යාලයෙන් ලබාගත හැකි අතර www.ceypetco.gov.lk දරන ආයතනික වෙබ් අඩවිය මගින් ද බාගත කර හැක.

**ඒ : සැපයුම්**

01. වායු සමීකරණ යන්ත්‍ර සහ උපාංග
02. බැටරි (වාහන සඳහා / ආරෝපනය කළ හැකි)
03. ඇඳ ඇතිරිලි, කොට්ටා උර, ටී - ෂර්ට්, අත්පිස්නා, වාහන ඔප දැමීමේ රෙදි (Polishing Cloths), කපු වැරලි (Cotton Waste)
04. පරිගණක යන්ත්‍ර ආශ්‍රිත උපකරණ (ටෝනර්, කාට්රිජ්, සීඩී, රිබන් සහ වෙනත්)
05. පරිගණක ජාලගත කිරීමේ උපකරණ
06. පරිගණක ආශ්‍රිත උපාංග (ප්‍රින්ටර්, ස්කෑනර්, යූ.පී.එස්. සහ වෙනත්)
07. කාඩ් බෝඩ් ඇසුරුම්
08. විදුලි හා ඉලෙක්ට්‍රොනික් උපකරණ (රූපවාහිනී, විදුලි පංකා, විදුලි කේතල්, ගණක යන්ත්‍ර, කැමරා සහ වෙනත්)
09. විදුලි හා ඉලෙක්ට්‍රොනික අයිතම හා උපාංග (ස්විච්, බල්බ්, වයර් සහ වෙනත්)
10. සාමාන්‍ය ඉදිකිරීම් ද්‍රව්‍ය (ඇණ, මුරිච්චි, ජී.අයි. පයිප්ප, යකඩ තහඩු, පීවීසී පයිප්ප හා උපාංග වෙනත්)
11. සැහැල්ලු යන්ත්‍ර සූත්‍ර සහ ආයුධ
12. කාර්යාලයීය උපකරණ (යතුරු ලියන, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, අත්පිටපත් යන්ත්‍ර සහ වෙනත්)
13. කාර්යාලයීය ගෘහ භාණ්ඩ (වානේ / දැව)
14. කාර්යාලයීය ලිපි ද්‍රව්‍ය (පෑන්, පැන්සල්, ලිපි කවර, කඩදාසි සහ වෙනත්)
15. තීන්ත වර්ග (සියලු තීන්ත වර්ග, තිනර් සහ වෙනත්)
16. පුද්ගල ආරක්ෂක හා ප්‍රවේසම් උපකරණ
17. බටහිර ඖෂධ වර්ග
18. ප්ලාස්ටික් ඇසුරුම් (Poly Cans) / පොලිතින් බෑග් (Poly Bags) සහ පොලිතින් බෑග් මුද්‍රණ කටයුතු
19. මුද්‍රණ කටයුතු
20. සපත්තු (Safety Shoes, Pump Shoes, Work Boots, Gum Boots, Sandal etc.)
21. ආරක්ෂක නිල ඇඳුම් (හිස් වැසුම් වර්ග, බඳපටි, බැජ් වෙනත්)
22. ටයර් සහ ටියුබ්

**බී : වැඩ / සේවාවන්**

01. ගොඩනැගිලි, පිවිසුම් මාර්ග සහ අංගන ඉදිකිරීම් හා අලුත්වැඩියාව, ඉන්ධන පිරවුම්හල් වල පරණ යකඩ තඩාග ඉවත් කිරීම, අලුත්වැඩියාව, තඩාග ස්ථාපනය කිරීම, නළ එලීම හා රුපියල් මිලියන 02 (දෙක) ට අඩු වටිනාකමැති අනෙකුත් සිවිල් ඉංජිනේරුමය වැඩ කටයුතු
02. වාහන අලුත්වැඩියාව හා නඩත්තුව
(කාර්මික, විදුලි, පින්තාරු සහ ටින්කරින්, වායු සමීකරණ, සීට් කවර දැමීම සහ අප්හෝස්ට්‍රි වැඩ, වීල් එලයින්මන්ට්)*
03. සියලුම වර්ග වලට අයත් වාහන සේවා කිරීම. (පූර්ණ / අර්ධ)*
04. ඇළුමිනියම් පිරිසැකසුම් වැඩ. (දොර / ජනෙල් සහ සිවිලිම්)
05. ඉඩම් සහ ගොඩනැගිලි වල මිනුම් කටයුතු
06. මධ්‍යම වායුසමීකරණ පද්ධතිවල සේවා කටයුතු
07. ස්පිලිට් වර්ගයේ වායුසමීකරණ පද්ධතිවල සේවා කටයුතු
08. භූමි අලංකරණ කටයුතු / ඉන්ටලොක් වර්ගයේ ඇතිරුම් ගල් ඇතිරීම
09. පරිගණක සහ පරිගණක මුද්‍රණ යන්ත්‍ර අලුත්වැඩියාව සහ සේවා කටයුතු

**"සැපයීම්" සඳහා අයදුම්පත්**

"සැපයීම්" සඳහා අයදුම්පත් ආපසු නොගෙවනු ලබන රු. 300.00 ක මුදලක් (රු. 277.78 + 8% එකතු කළ අගය මත බද්ද) ගෙවා ඒ සමග කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මගින් අප කාර්යාලයෙන් ලබා ගත හැක. එක් වර්ගයකට වඩා ලියාපදිංචි වීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් එම සෑම අමතර වර්ගයක් සඳහා රු. 300.00 (රු. 277.78 + 8% එකතු කළ අගය මත බද්ද) ක අමතර ගෙවීමක් කළ යුතුය.

(මෙම "සැපයීම්" සඳහා ද්‍රව්‍ය නිෂ්පාදකයින්, නියෝජිතයින් හෝ ගබඩාකරුවන් පමණක් ලියාපදිංචි කර ගන්නා බව කාරුණිකව සලකන්න)

**"වැඩ /සේවා " සඳහා අයදුම්පත්**

"වැඩ / සේවා" සඳහා අයදුම්පත් ආපසු නොගෙවනු ලබන රු. 300.00 ක් (රු. 277.78 + 8% එකතු කළ අගය මත බද්ද) ගෙවා ඒ සමග කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මගින් අප කාර්යාලයෙන් ලබාගත හැක.

ගරාජ් සහ වාහන සේවා ආයතන (බී 2, 3) යන අංශ සඳහා ලියාපදිංචි වීමේදී බස්නාහිර පළාතෙහි ලියාපදිංචි ගරාජ් / සේවා ආයතන හිමියන් පමණක් සේවා සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි කර ගනු ලැබේ.

"සැපයීම්" සහ "සේවා" සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමට නොහැකි වන සහ පවරන ලද "සැපයීම්" සහ "සේවා" හරියාකාරව ඉටු කිරීමට නොහැකි වන පාර්ශවයන්ගේ ලියාපදිංචිය අහෝසිවීමට ඉඩ ඇති බව කරුණාවෙන් සලකන්න.

"සැපයීම්" සහ "සේවා" සඳහා ගෙවීම් කිරීමේ කාලය දින තිහ (30) කි.

2020 වසර සඳහා ලියාපදිංචි වී ඇති ආයතනද 2021 වසර සඳහා නැවත ලියාපදිංචි විය යුතුය. "සැපයීම්" සහ "සේවා" සඳහා මිල ගණන් කැඳවීම ලියාපදිංචි ආයතන වලින් සිදු කරන අතර, අවශ්‍ය අවස්ථාවන්හිදී ලියාපදිංචි නොවන ආයතනවලින් ද මිල ගණන් කැඳවීමේ අයිතිය සංස්ථාව සතුවනු ඇත.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් කොමසාරිස්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් වැට් බදු ගෙවීම සඳහා ඉදිරිපත් කරන ලද ලිපිය ද සමග 30.10.2020 දින 1620 පැයට හෝ ඊට පෙර පළමු මහල, නො. 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09 හි පිහිටි ප්‍රසම්පාදන හා ගබඩා කාර්යාංශයට ලැබිය යුතුය.

ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පැහැදිලි කර ගැනීමට වෙනත් කරුණු ඇතොත් දුරකථන අංක 011-5455331-9 සහ (ෆැක්ස්) 011-5455424 මගින් මා අමතන්න.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව වෙනුවට**
**කළමනාකාර (ප්‍රසම්පාදන හා ගබඩා),**
**පළමු මහල,**
**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,**
**නො. 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,**
**කොළඹ 09.**

www.adz.lk
it's what you want

ලුහුඬු දැන්වීම්

රැකී රක්ෂා

325

ඇබෑර්තු

විවිධ

වැඩිහිටි හිමිනමකට උපස්ථායක සේවය සඳහා සැදැහැසිත් ඇති අයෙකු ඕනෑ. හැට වයස් නොඉක්ම වූ පවුල් බරින් නිදහස් විශ්‍රාමිකයෙකු ඉතා සුදුසුය. මාසික වැටුප රු. 20,000/- අමතන්න. 0112697295, 071-8263503

059985

නිවාස හා ඉඩම්

621

ගේ දෙර ඉඩකඩම්

මහනුවර දිස්ත්‍රික්කය

විකිණීමට

ගම්පොල - ඉඩම් විකිණීමට ඇත. පර්චස් 50, P.D. පැල්පොල මාවතෙන් හැරී, පූජාගොඩ වත්තේ පිහිටි නැසීගිය R. S. පැල්පොල මහතාට අයත් ඉඩම්. අතිරේකව, පර්චස් 50 බිම් කොටස් දෙකක්ද ළඟදීම ලබාගත හැකිය. රන්ජිත් පැල්පොල, 011-2821504, 0773251404

059465

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ දැනුම් දීමයි.

**සමාගමේ නම :**
එම්බීසිස් (පීවීටී) එල්ටීඩී

**ලියාපදිංචි අංකය : PV 00200902**

**ලියාපදිංචි ලිපිනය :**
නො. 114/7, හයිලෙවල් පාර, කොට්ටාව, පන්නිපිටිය.

**සමාගමේ ලේකම්,**
**රෝෂන් රෆායල්**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට කරන දැන්වීමයි

සමාගමේ නම :
**ගින්ස් හෝල්ඩිංස් (පීවීටී) එල්ටීඩී**
සමාගමේ අංකය : පීවී 00228225,
සංස්ථාපිත දිනය : 2020.09.29,
ලියාපදිංචි ලිපිනය :
නො. 7-1/1, නාගස් හන්දිය, ගාලු පාර, කළුතර උතුර, කළුතර.
සමාගම් ලේකම්

BE BETTER INFORMED!



News you can trust now free on your mobile phone.

Dinamina · Daily News · Thinakaran

VISIT
apps.lakehouse.lk

DOWNLOAD TODAY!

AVAILABLE AT

LAKE HOUSE

# මීගහකිවුල ප්‍රාදේශීය සභාව

## ප්‍රසම්පාදන දැන්වීම - සතිපොළ බදු දීම

මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් පහත උපලේඛන අංක 02 හි දැක්වෙන සතිපොළවල් 2021 ජනවාරි මස 01 වන දින සිට 2021 දෙසැම්බර් මස 31 වන දින දක්වා වර්ෂයක කාල සීමාව තුළ පොළ බදු අය කිරීමේ අයිතිය පැවරීම සඳහා ලංසුපත් කැඳවනු ලැබේ. ප්‍රසම්පාදන කැඳවීමේ පෝරම 2020.10.02 දින පෙ.ව. 9.00 සිට 2020.10.16 දින පෙ.ව. 11.00 දක්වා මා විසින් ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී නිකුත් කරනු ලැබේ.

1. ප්‍රසම්පාදන ඉල්ලුම්පත් සම්පූර්ණ කර 2020.10.16 දින ප.ව. 12.00 ට ප්‍රථම "මුල් පිටපත" හා "අනු පිටපත" යනුවෙන් නම් කොට වෙන වෙනම කුඩා ලියුම් කවර දෙකක දමා එම කවර දෙකම ලොකු කවරයක් තුළට දමා එම කවරය මුද්‍ර තබා නියමිත පරිදි සම්පූර්ණ කරන ලද ප්‍රසම්පාදන ලංසුපත් **"සභාපති ප්‍රසම්පාදන මණ්ඩලය ප්‍රාදේශීය සභාව, මීගහකිවුල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය හැකි අතර, නැතහොත් මීගහකිවුල ප්‍රාදේශීය සභා කාර්යාලීය ප්‍රසම්පාදන පෙට්ටියට අතින් ගෙනවිත් බහාලිය හැකිය. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ලංසුපත් බහාලන ලිපි කවරයේ වම්පස කෙළවරේ අදාළ **"සතිපොළේ නම සඳහන් කර ප්‍රසම්පාදන ඉල්ලුම්පත්"** යනුවෙන් සඳහන් කළ යුතුය. ප්‍රසම්පාදන විවෘත කිරීම 2020.10.16 වන දින ප.ව. 2.30 ට මීගහකිවුල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී සිදු කරනු ලබයි.

02. බදුල්ල දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකරුවන්ට හා ලියාපදිංචි සමිතිවලට පමණක් ප්‍රසම්පාදන ලංසුපත් ඉදිරිපත් කළ හැකිය. එමෙන්ම ස්වකීය අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හා පදිංචිය තහවුරු කිරීම සඳහා මෑතකදී ලබා ගත් ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරී සහතිකය ඉදිරිපත් කළ යුතුය.

03. වැඩි විස්තර කාර්යාලීය දිනයන් හි පෙ.ව.9.00 සිට ප.ව. 3.00 දක්වා සභා ලේකම්ගෙන් විමසා දැන ගත හැකිය. (දුරකථන අංකය - 055-2245775) ප්‍රසම්පාදන ලංසු විවෘත කරන අවස්ථාවේ දී ඉල්ලුම්කරු හෝ ඔහුගෙන් ලිඛිතව බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය. ඉහත ප්‍රසම්පාදන සඳහා ඉදිරිපත් කරනු ලබන වැඩිම ලංසු මුදල ලබා දීමට කටයුතු කිරීම පිළිබඳව අවසන් තීරණය ගැනීම හෝ අදාළ නියමයන්ට අනුකූල නොවන ප්‍රසම්පාදනයක් ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ අයිතිය මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන මණ්ඩලය සතු වේ.

### උපලේඛන අංක - 01

| | |
|---|---|
| **ටෙන්ඩර්පත් නිකුත් කිරීම** | 2020.10.02 වන දින පෙ.ව. 9.00 සිට 2020.10.16 පෙ.ව. 11.00 දක්වා |
| **ටෙන්ඩර්පත් භාර ගැනීම** | 2020.10.16 දින ප.ව. 12.00 දක්වා |
| **ටෙන්ඩර්පත් විවෘත කිරීම** | 2020.10.16 දින ප.ව. 2.30 ට |

### උපලේඛන අංක - 02

| සතිපොළේ නම | අවම ලංසු මුදල | | ආපසු නොගෙවන ටෙන්ඩර් පෝරම ගාස්තු (රු) | ආපසු ගෙවන තැන්පතු (රු) |
|---|---|---|---|---|
| | වාර්ෂිකව | මාසිකව | | |
| මීගහකිවුල සතිපොළ | 2,555,000.00 | 212,916.66 | 8,000.00 | 60,000.00 |
| කරමැටිය සතිපොළ | 187,200.00 | 15,600.00 | 3,000.00 | 18,000.00 |
| තල්දෙන සතිපොළ | 128,160.00 | 10,680.00 | 3,000.00 | 13,000.00 |
| පිටමාරුව සතිපොළ | 110,000.00 | 9,166.66 | 3,000.00 | 13,000.00 |
| මීගහකිවුල පොදු පහසුතා මධ්‍යස්ථානය | 203,500.00 | 16,958.33 | 4,000.00 | 20,000.00 |

**2020.09.28**
**මීගහකිවුල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී,**

**එස්.එම්.එල්.එච්. ජයවර්ධන**
**සභාපති**
**ප්‍රාදේශීය සභාව, මීගහකිවුල**

# ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්

**2021 වසර සඳහා වාර්ෂික දිනපොත් සහ දින දර්ශන මුද්‍රණය හා සැපයීම සඳහා සැපයුම්කරුවන් තේරීම සඳහා කෙරෙන ලංසු කැඳවීමයි.**

(Bid Ref: SLIC/MKT/001/2020)

- ඉතා ඉහළ ප්‍රමිතියකින් යුත් දිනපොත් සහ දින දර්ශන, සිය ආයතනය තුල මුද්‍රණය කිරීම සහ සැපයීම සඳහා අවශ්‍ය සියළු පහසුකම් ලංසුකරු සතු විය යුතු අතර ශ්‍රී ලංකා රජයේ ලියාපදිංචි වී ඇති ව්‍යාපාරික සැපයුම්කරුවෙකු විය යුතුය.
- ලංසු පත්‍රිකා ලබාගැනීම සඳහා ආයතනයේ ව්‍යාපාර ලිපි ශීර්ෂයක ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කලයුතු අතර ඒ සමග ලංසුකරුගේ සුදුසුකම් තහවුරු කෙරෙන සාක්ෂි සහ පහත දැක්වෙන නැවත නොගෙවන ගාස්තුවක්ද ගෙවීම කල යුතුය.
  **දිනපොත් සඳහා - රු. 2,000.00, දින දර්ශන සඳහා - රු. 3,000.00, සටහන් පොත් සඳහා රු. 3,000.00, සහ සුභ පැතුම් කාඩ්පත් සඳහා නොමිලේ**
- ලංසු පරීක්ෂාව මුදල් ගෙවීමකින් තොරව සිදුකල හැක.
- ලංසු පත්‍රිකා ලබාගැනීම 2020-10-05 සිට 2020-10-15 අතර සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 9.00 ත් ප.ව. 4.00 ත් අතර වේලාව තුලදී ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ප්‍රධාන කාර්යාලයේ 8 වන මහලේ පිහිටි ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුවෙන් කල හැක.
- ලංසු ඉදිරිපත් කරන්නා විසින් පහත දක්වා ඇති අයුරින් ලංසු බැඳුම්කර (ලංසු විවෘත කරන දින සිට ඉදිරියට) දින 91ක් වලංගු නැවත හැරවිය නොහැකි කොන්දේසි විරහිත හා මුදල් බවට පත්කල හැකි බැඳුම්කර ඉදිරිපත් කල යුතුය.
  **දිනපොත් සඳහා - රු. 75,000.00, දින දර්ශන සඳහා - රු.150,000.00 සහ සටහන් පොත් සඳහා රු. 150,000.00 සහ සුභ පැතුම් කාඩ්පත් - රු. 30,000.00**
- ලංසු ඉදිරිපත් කරන්නා කිසිම ආයතනයක් විසින් අසාදු ලේඛන ගත නොකළ අයකු විය යුතුය. අදාල සියළුම අයිතම සාම්පල පැහැදිලිව නම්කර (පිළිවිතර) වෙනත් ලිපි ගොමුවක (ring box file) බහා ඉදිරිපත් කල යුතුය.
- ආයතනය තුලදී මුද්‍රණය කිරීමේ සියළු පහසුකම් මුද්‍රණකරු සතු විය යුතු අතර ටෙන්ඩරයේ සඳහන් පරිදි අදාල දිනයට අදාල අයිතම සම්පූර්ණ කර භාරදීමේ හැකියාව සතුවිය යුතුය. කිසිඳු තත්ත්වයක් යටතේ උපකොන්ත්‍රාත්කරුවන් සහභාගී කරගැනීමේ හැකියාවක් නැත.

| S/N | අයිතමය | ප්‍රමාණය |
|---|---|---|
| Job 1 | කළමණාකරණ දිනපොත් (ඇසුරුම් සමග) | 10,632 |
| Job 2 | සටහන් පෙත් | 49,669 |

| S/N | අයිතමය | ප්‍රමාණය |
|---|---|---|
| Job 3 | බිත්ති දින දර්ශන පිටු 6 | 132,472 |
| Job 4 | සුභ පැතුම් කාඩ් (කවරය සමග) | 11,649 |

- ලංසුකරුවන්ට රු.මිලියන 200කට වැඩි වාර්ෂික පිරිවැටුම් සතුවිය යුතු අතර සිව් වර්ණ මුද්‍රණ යන්ත්‍ර 2ක් හෝ ඊට වැඩි ගණනක්, 75කට වැඩි කාර්ය මණ්ඩලයක් සහ අවම වශයෙන් ලොරි 2ක් වත් සතුවිය යුතුය. (පිරිවැටුම්, යන්ත්‍ර, කාර්ය මණ්ඩලය හා ප්‍රවාහන පහසුකම් පිළිබඳව සාක්ෂි ලේඛන ලංසුකරු විසින් ඉදිරිපත් කළ යුතුය.)
- සම්පූර්ණ කර මුද්‍රා තැබූ ලංසුපත් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ප්‍රධාන කාර්යාලයේ 8 වන මහලේ පිහිටි ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුවට 2020 ඔක්තෝබර් 16 වනදා ප.ව. 1.00 ට පෙර භාරදිය යුතුය. ලංසු භාරගැනීම අවසන් වූ පසු ලංසු විවෘත කිරීම සඳහා සහභාගීවන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේදී ලංසු විවෘත කරනු ලැබේ. නියමිත වේලාවෙන් පසු ලැබෙන ලංසු විවෘත නොකරම ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- තෝරාගනු ලබන සැපයුම්කරුවන් විසින් සම්පූර්ණ කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් 10%ක් වන සහ දින 91 ක් වලංගු කොන්දේසි විරහිත නැවත හැරවිය නොහැකි කාර්ය සාධන බැඳුම්කරයක් ඇනවුම ස්ථිර කිරීමෙන් පසුව සති 2ක් ඇතුලත ඉදිරිපත් කල යුතුය.
- ලංසු ඉදිරිපත් කිරීමට පූර්ව රැස්වීමක් 2020 ඔක්තෝබර් 06 වනදා පෙ.ව. 10.00 ට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ප්‍රධාන කාර්යාලයේ 10 වන මහලේ රැස්වීම් කාමරයේදී පැවැත්වීමට නියමිතය.
- සැපයුම්කරු තෝරාගැනීමේ අවසාන තීරණය ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සතුවේ.

**සහකාර සාමාන්‍යාධිකාරී - ප්‍රසම්පාදන සහ දේපළ කළමනාකරණ**
**ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්**
**08 වැනි මහල**
**නො. 21, වොක්ෂෝල් වීදිය**
**කොළඹ 02.**
**දුරකථන අංක - 011-2357964**
Email: deshapriyag@srilankainsurance.com
Web: www.srilankainsurance.com
සමාගම් අංකය - PB - 289

SLIC
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්
පියෙකු මෙන් මවක මෙන්

# මහජන බැංකුව

## බේරා නොගත් උකස් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

"මහජන බැංකුවේ" මොනරාගල ප්‍රාදේශීකයේ පහත දැක්වෙන ශාඛාවල 2019-02-28 දින දක්වා උකස් කරන ලදුව ඒ ඒ ශාඛාවන් ඉදිරියෙන් දැක්වෙන දිනයන්ට බේරා නොගන්නා රන් භාණ්ඩ මෙම නිවේදනයේ දක්වා ඇති පරිශ්‍රයන්හිදී පහත සඳහන් දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

| ශාඛාවේ නම | පහත දැක්වෙන දිනයට බේරා නොගන්නා | වෙන්දේසි පැවැත්වෙන දිනයන් සහ ස්ථානයන් |
|---|---|---|
| මොණරාගල<br>මොණරාගල සේවා මධ්‍යස්ථානය<br>දඹගල්ල සේවා මධ්‍යස්ථානය<br>සියඹලාණ්ඩුව සේවා මධ්‍යස්ථානය<br>බුත්තල<br>ඔක්කම්පිටිය සේවා මධ්‍යස්ථානය | 2020-10-23 | 2020-10-26 / 2020-10-27<br>මොණරාගල ශාඛා පරිශ්‍රයේදී |
| බිබිල<br>මැදගම<br>බඩල්කුඹුර | 2020-10-27 | 2020-10-28 / 2020-10-29<br>බිබිල ශාඛා පරිශ්‍රයේදී |
| වැල්ලවාය<br>ඇතිලිවැව සේවා මධ්‍යස්ථානය<br>කතරගම<br>තණමල්විල<br>හම්බේගමුව සේවා මධ්‍යස්ථානය | 2020-10-30 | 2020-11-02 / 2020-11-03<br>වැල්ලවාය ශාඛා පරිශ්‍රයේදී |

(ඉහත පරිදි පැවැත්වීමට නියමිත මෙම වෙන්දේසි නැවත දැන්වීමකින් තොරව බැංකුවේ අභිමතය පරිදි අවලංගු කිරීම හෝ කල් දැමීම, ඒකාබද්ධ කර පැවැත්වීම හෝ යන මෙයින් ඕනෑම කටයුත්තක් සිදුකිරීමේ අයිතිය බැංකුව සතුව ඇත.)

**ප්‍රාදේශීය කළමනාකරු,**
**මහජන බැංකුව,**
**ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය**
**අංක. 119, වැල්ලවාය පාර,**
**මොනරාගල.**

මහජන බැංකුව PEOPLE'S BANK
www.peoplesbank.lk
AA+ (lka) Fitch Rating, AA - Brand Finance Rating

# රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව

ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

## ලංසු සඳහා ආරාධනයයි

01. රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව (SD & CC) වෙනුවෙන් රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් පහත විස්තර කොට ඇති පරිදි කොළඹ දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති සඳහා යෝග්‍යතා පූර්ණ සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍ර තැබූ ලංසු කැඳවනු ලැබේ.

| Contract No. | Contract Name | Bid Security (Rs. Mn) | Contract Period (Days) |
|---|---|---|---|
| SMS/324 | Cast insitu 1200mm dia. Bored piles for abutment & Piers (by using rotary type drilling method) | 1.25 | 120 Days |
| SMS/325 | Cast insitu 1200mm dia. Bored piles for abutment (by using rotary type drilling method) & piers (by using percussion type drilling method) | | |
| SMS/326 | Installation of Temporary Steel Platform Type-A for construction of piers and removal after construction | 0.25 | Installation 90 Days & Removal 60 Days |
| SMS/327 | Installation of Temporary Steel Platform Type-B for construction of piers and removal after construction | | |

02. පයිලින් වැඩ, ආධාරක දෙකම මත පයිල් 12 කින් සහ කුලුනු 23 ක් මත පයිල් 69 කින් සමන්විතය.

03. වේදිකා නිර්මාණ වැඩට මාස 3 ක් ඇතුළත තාවකාලික ව්‍යුහයක් ස්ථාපනය කිරීම ඇතුළත්වන අතර, වේදිකා ඉදිකිරීම් ආරම්භ කළ පසු මස 7-9 ක් අතර අස්කර ගැනීම ආරම්භ කළ යුතුය. A හා B වර්ගය වේදිකා ව්‍යුහයේ ධාරිතාව මත රඳා පවතී.

04. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය මගින් මෙහෙයවනු ඇත.

05. ලංසුකරු පසුගිය වසර 5 ක කාලය තුළ අඩු තරමින් රුපියල් මිලියන 60 ක වටිනාකමැති සමාන ව්‍යාපෘති එකක් වත් සම්පූර්ණ කර තිබිය යුතුය.

06. අභිලාෂී ලංසුකරුවන්ට මේ පිළිබඳ වැඩිමනත් තොරතුරු, රත්මලාන, බොරුපන පාරේ, අංක 07 හි රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ, සැපයුම් කළමනාකරු වෙතින් (දුරකථන අංක 2607566 / 2632146) ලබාගත හැකි අතර, ලංසුකරණ ලිපි ලේඛන පහත දැක්වෙන කාර්යාලයේදී කාර්යාල වේලාවන් තුළ ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලිය හැකිය.

**නිර්මාණ, සැලසුම් හා නිෂ්පාදන අංශය,**
**රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව,**
**නො. 07, බොරුපන පාර, රත්මලාන.**

07. පූර්ව - ලංසු රැස්වීම රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේදී 2020.10.08 දින 10.00 පැයට පැවැත්වෙන අතර, අවශ්‍ය නම්, වැඩබිම පරීක්ෂා කිරීමට ඒ වහාම පිළියෙල කරදෙනු ඇත.

08. අභිලාෂී ලංසුකරුවන්ට, රත්මලාන, බොරුපන පාර, අංක 07, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ සැපයුම් කළමනාකරු වෙත, 2020.10.05 දින සිට 2020.10.15 දින දක්වා 09.00 පැය හා 15.00 පැය අතර කාලය තුළ ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා එක් එක් කට්ටලයකට ආපසු නොගෙවන රු. 3,500.00 ක (වැට් රහිතව) ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය.

09. ලංසු සමග, 2021.02.12 දින දක්වා වලංගු ලංසු සුරක්ෂණයක් එවිය යුතුය.

10. ලංසු අනු පිටපතකින් යුතුව 2020.10.16 දින 14.00 පැයට හෝ ඊට පෙර රත්මලාන, බොරුපන පාර, අංක 07, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ සැපයුම් කළමනාකරු වෙත ගෙනැවිත් භාර දිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලංසු භාරගන්නා අවසාන වේලාව ඉකුත් වූ වහාම, එම අවස්ථාවට සහභාගිවීමට කැමැති ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී ලංසු විවෘත කෙරෙනු ඇත.

11. ලංසු 2021.01.15 දින දක්වා වලංගු විය යුතුය.

**සභාපති,**
**සංස්ථා ප්‍රසම්පාදන කමිටුව,**
**රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව.**

**අංක 07, බොරුපන පාර,**
**රත්මලාන.**

**"යටිතල පහසුකම් ඉදිකිරීමේ පුරෝගාමියෝ"**

# මහජන බැංකුව

## රන් භාණ්ඩ උකස් වෙන්දේසිය

මහජන බැංකුවේ, කොළඹ දකුණ ප්‍රාදේශිකයට අයත් පහත සඳහන් ශාඛා හා සේවා මධ්‍යස්ථාන වල 2019-06-30 වන දින දක්වා වසරක කාලයකින් බේරා ගැනීමට උකස් තබන ලදුව පහත සඳහන් දිනයන් දක්වා බේරා නොගත් උකස් රන් භාණ්ඩ පහත උපලේඛනයේ දැක්වෙන දිනයන්හි දී හා එහි සඳහන් ස්ථානයන්හිදී පෙ.ව. 9.00 ට ආරම්භකර ප්‍රසිද්ධියේ වෙන්දේසි කරනු ලබන බව මෙයින් දැනුම් දෙමු.

| ශාඛාව | සේවා මධ්‍යස්ථානය | පහත දින දක්වා බේරා නොගත් උකස් භාණ්ඩ | වෙන්දේසි දිනය | වෙන්දේසිය පැවැත්වෙන මහජන බැංකු පරිශ්‍රය |
|---|---|---|---|---|
| බොරැල්ල | සුදුවැල්ල | 2020-11-06 | 2020-11-07 | ස්වර්ණ ජයන්ති |
| ස්වර්ණ ජයන්ති | | | | |
| නාරාහේන්පිට | | | | |
| සුදුවැල්ල | | | | |
| ලිබර්ටි ප්ලාසා | | | | |
| ලකී ප්ලාසා | | | | |
| මූලස්ථාන | | | | |
| රැජින | | | | |
| මරදාන | | | | |
| බම්බලපිටිය | හැව්ලොක් ටවුන් | 2020-11-06 | 2020-11-08 | තිඹිරිගස්යාය |
| මැජෙස්ටික් සිටි | | | | |
| කිරුළපන | | | | |
| වැල්ලවත්ත | | | | |
| කොල්ලුපිටිය සමූ. මන්දිරය | | | | |
| තිඹිරිගස්යාය | කොළඹ විශ්ව විද්‍යාලය | | | |
| හයිඩ් පාර්ක් කෝනර් | කොම්පඤ්ඤ වීදිය | | | |
| පුරහල | වෛද්‍ය විද්‍යාලය | | | |
| යූනියන් පෙදෙස | භාණ්ඩාගාර ඒකකය/ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | | | |

වෙන්දේසියට සහභාගීවන්නන් තම පුද්ගලික හැඳුනුම්පත ද රැගෙන ආ යුතුය. වෙනත් ප්‍රසිද්ධ දැනුම් දීමකින් තොරව මෙම වෙන්දේසි අවලංගු කිරීම, ඒකාබද්ධ කිරීම හෝ කල්දැමීම පිළිබඳ අයිතිය මහජන බැංකුව සතුවේ.

**මහජන බැංකුව,**
**ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කොළඹ දකුණ),**
**අංක 11, ආදිපාද වීදිය, කොළඹ 01.**
**දුරකථන අංක : 0112-327847, 0112-327848.**

**එන්.කේ. විමලසිරි,**
**ප්‍රාදේශීය කළමනාකාර,**
**(කොළඹ දකුණ)**

මහජන බැංකුව PEOPLE'S BANK
www.peoplesbank.lk
AA+ (lka) Fitch Rating, AA - Brand Finance Rating

# 2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

## ආරක්ෂක අමාත්‍යාංශය

01. 2007 ජූලි මස 30 අංක 1508/08 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට යටත්ව, ආරක්ෂක අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධිත පහත සඳහන් ආයතනයන් වෙනුවෙන් 2021 වර්ෂයට ලියාපදිංචි වීම සඳහා ඉදිකිරීම්, අලුත්වැඩියාවන් හා භාණ්ඩ සහ සේවා සැපයීම සඳහා විදේශීය නිෂ්පාදකයින්, අනුමත නියෝජිතවරුන්, දේශීය නිෂ්පාදකයින්, දේශීය සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ උපදේශක ආයතනයන් ගෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

- ආරක්ෂක අමාත්‍යාංශය
- ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
- ශ්‍රී ලංකා නාවික හමුදාව
- ශ්‍රී ලංකා ගුවන් හමුදාව
- රක්නා ආරක්ෂණ ලංකා ලිමිටඩ්
- රාජ්‍ය බුද්ධි සේවය
- ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය
- අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
- සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය
- සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
- වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව
- ආරක්ෂක සේවා පාසල
- ජාතික ශිෂ්‍ය භට බලකාය
- ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය
- ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක අධ්‍යයනය ආයතනය
- ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක විද්‍යායතනය
- රණවිරු සේවා අධිකාරිය
- පුරා විද්‍යා දෙපාර්තමේන්තුව
- ආරක්ෂක හමුදා මූලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතිය

02. **අයදුම්පත්‍ර ලබා ගැනීම**

අ. දේශීය හා විදේශීය අයදුම්කරුවන් හට **2020.09.30 දින සිට 2020.10.28** දින දක්වා පහත සඳහන් වෙබ් අඩවියට පිවිසීමෙන් අයදුම්පත බාගත (Download) හැක.

ආරක්ෂක අමාත්‍යාංශය – **www.defence.lk**

ආ. ලියාපදිංචි වීමට අදාළ ඉල්ලුම්පත් කට්ටලය පිටු 59 කින් පමණ යුක්ත වන අතර, එය පහත සඳහන් කොටස්වලින් සමන්විත වේ.

1. ප්‍රධාන ඉල්ලුම්පත් පෝරමය
2. විදේශීය සැපයුම් ආයතනයේ දත්ත පෝරමය (ඇමුණුම A)
3. උපදෙස් හා කොන්දේසි අඩංගු පත්‍රිකාව
4. පිටු 52 කින් පමණ යුක්ත විස්තරාත්මක කාණ්ඩ ලැයිස්තුව

ඇ. අයදුම්පත ඉදිරිපත් කිරීමේදී පසුගිය වර්ෂයේ විගණනය කරන ලද මූල්‍ය වාර්තාවක් හා පසුගිය වර්ෂයක කාලය පිළිබඳ කාර්යය සාධනය ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ. එසේ විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා භාණ්ඩ හා සේවා සැපයීම් පිළිබඳ කාර්යය සාධන වාර්තාව අයදුම්පත් ඉදිරිපත් කරන අවසාන දිනට පෙර ඉදිරිපත් නොකරන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. **කාණ්ඩ ගාස්තු ගෙවීම**

අ. දේශීය සැපයුම්කරුවෙකුගෙන් එක් කාණ්ඩයක් වෙනුවෙන් අයකරනු ලබන ගාස්තුව **රු. 1800/= කි.**

ආ. විදේශීය සැපයුම්කරුවෙකුගෙන් (දේශීය නියෝජිතයෙකු නොමැති විට) එක් කාණ්ඩයක් වෙනුවෙන් අයකරනු ලබන ගාස්තුව ඇමරිකානු ඩොලර් 18 කි.

ඇ. 2021 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා කාණ්ඩ ගාස්තු ගෙවීම ආරක්ෂක අමාත්‍යාංශයේ ලංකා බැංකුවේ ටැප්‍රොබේන් ශාඛාවේ අංක 7040119 දරන ගිණුමට බැරවන පරිදි ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් ගෙවීම් කළ හැකිය. මුදල් තැන්පත් කිරීමේදී ගිණුම් හිමියාගේ නම ආරක්ෂක ලේකම් යනුවෙන් සඳහන් විය යුතුය.

ඈ. විදේශීය සැපයුම්කරුවන්ද (දේශීය නියෝජිතයකු නොමැති විට) 2021 වර්ෂයට ලියාපදිංචි කිරීමේ කාණ්ඩ ගාස්තු Swift Code භාවිතයෙන් ලංකා බැංකුව වෙත මුදල් ගෙවිය යුතුය.

**Swift No. - BCEYLKLX**
**Branch Code - 747**
**Account No. - 7040119**

ඉ. කාණ්ඩ ගාස්තු ගෙවීමේදී ඉදිරිපත් කරන මුදල් තැන්පතු පත්‍රිකාව අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය. (මුදල් ගෙවූ බවට සහතික කෙරෙන පරිදි)

ඊ. දේශීය සැපයුම්කරුවන් හා විදේශීය සැපයුම්කරුවන් කාණ්ඩ ගාස්තු 2020.09.30 **දින සිට** 2020.10.28 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළදී ගෙවා අවසන් කළ යුතුය. 2020.10.28 දිනට පසුව ගෙවනු ලබන කාණ්ඩ ගාස්තු පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශය වගකියනු නොලැබේ.

04. යම් අයදුම්කරුවෙකු විසින් ගෙවන ලද කාණ්ඩ ගාස්තු නැවත ආපසු ගෙවීමක් සිදු කරනු නොලැබේ. අයදුම්කරුගේ අතපසුවීමකින් හෝ නොසැලකිලිමත් කමින් යම් තොරතුරක් ඉදිරිපත් නොකිරීම, වැරදි කාණ්ඩ ලකුණුකර තිබීම යන හේතුමත අයදුම්පත ප්‍රතික්ෂේප වන අතර, එවැනි අවස්ථාවක වුවද කාණ්ඩ ගාස්තු ආපසු ගෙවීමක් සිදු නොවන බව දන්වනු ලැබේ.

04. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය අදාළ ලිපිලේඛන සමග **2020 ඔක්තෝබර් මස 28 දිනට** හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 2021 වර්ෂය දේශීය/ විදේශීය"** වශයෙන් සඳහන් කළ යුතුය.

**ගණකාධිකාරී (සැපයීම්)**
**ආරක්ෂක අමාත්‍යාංශය,**
**අංක 15/5, බාලදක්ෂ මාවත,**
**කොළඹ 03.**

05. 2021 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සම්බන්ධව අවසන් තීරණය ගැනීමේ අයිතිය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් සතුවේ.

**ලේකම්,**
**ආරක්ෂක අමාත්‍යාංශය.**

# දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව

## 2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

2021 වර්ෂය සඳහා දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව වෙත පහත සඳහන් භාණ්ඩ සැපයීම සඳහා පිළිගත් සැපයුම්කරුවන්, නිෂ්පාදකයින්, ආනයනකරුවන් හා නියෝජිත ආයතන වලින්ද, සේවාවන් සඳහා පිළිගත් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කර ගැනීම සඳහා **2020.10.05 සිට 2020.10.22 දින දක්වා අයදුම්පත් නිකුත් කරනු ලැබේ.**

ලියාපදිංචි වීම සඳහා අදාළ ආයතනයේ ලිපි ශීර්ෂය යටතේ අයදුම්පත්‍ර ඉල්ලීම් කරන ලද ලිපියක් ද රැගෙන කාර්යාල දිනයන්හි පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා කාලය තුළ දෙහිවල, ගල්කිස්ස මහා නගර සභාවේ පළමු මහලේ පිහිටි සැපයුම් අංශය වෙත පැමිණ, එක් අයිතමයක් සඳහා රු. 1,000.00 බැගින් ගෙවීම් කර අයදුම්පත්‍රයක් ලබා ගත හැකිය. වැඩි විස්තර සැපයුම් අංශයෙන්, දුරකථන අංක 011-2721379 මගින් ලබාගත හැක. ලියාපදිංචි වීම සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් 2020.11.05 දිනට පෙර නාගරික කොමසාරිස්, දෙහිවල, ගල්කිස්ස මහා නගර සභාව, දෙහිවල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් යොමු කළ යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 2021"** යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

### ලියාපදිංචි වීම සඳහා කැඳවනු ලබන අයිතමයන් පහත සඳහන් පරිදි වේ

| A | සැපයිය යුතු භාණ්ඩ/උපකරණ/ද්‍රව්‍ය |
|---|---|
| 1 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා |
| 2 | කාර්යාල උපකරණ (පරිගණක සහ උපාංග, මුද්‍රණ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, වේලාව සටහන් කිරීමේ යන්ත්‍ර, ස්කෑන් යන්ත්‍ර, යතුරුලියන, රෝනියෝ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, රූපවාහිනී සහ වීසීඩී/ඩීවීඩී යන්ත්‍ර) |
| 3 | පරිගණක සඳහා ටෝනර්, ඉන්ක්, කාට්‍රිජ්, රිබන් හා ෆැක්ස් යන්ත්‍ර සඳහා අවශ්‍ය ටෝනර් |
| 4 | කැමරා ප්‍රොජෙක්ටර්, ආරක්ෂක කැමරා හා වීඩියෝ උපකරණ |
| 5 | කැනපි |
| 6 | කාර්යාල මේස, පුටු සහ උපකරණ (යකඩ, ප්ලාස්ටික්, දැව හා දැව මිශ්‍ර) |
| 7 | ළමා උද්‍යාන සඳහා ක්‍රීඩා උපකරණ |
| 8 | කායවර්ධන උපකරණ |
| 9 | ක්‍රීඩා භාණ්ඩ |
| 10 | සමරු තිළිණ, පදක්කම්, කුසලාන සහ සමරු ඵලක (කළු ගල් නිර්මාණ ඇතුළුව) |
| 11 | කොඩි, මුළු කොඩි, සැරසිලි ආදිය |
| 12 | තිර රෙදි, මේස රෙදි |
| 13 | වැහි කබා සහ මදුරු දැල් |
| 14 | පාවහන්, ආරක්ෂිත පාවහන් |
| 15 | මසා නිම කළ පෙර පාසල් නිල ඇඳුම් |
| 16 | නිල ඇඳුම් සඳහා රෙදි, ටී ෂටර් සහ නිල ඇඳුම් පළඳනා |
| 17 | පාසැල් ළමුන් සඳහා වතුර බෝතල්, කෑම පෙට්ටි සහ පාසැල් බෑග් |
| 18 | සෞඛ්‍ය උපකරණ, ඉදල්, කොසු, බාල්දි හා කුඩ |
| 19 | කෘමිනාශක, වල්නාශක සහ පලිබෝධනාශක |
| 20 | තණ පිඩලි, කොහු බත්, පොහොර සහ කොම්පෝස්ට් |
| 21 | ජලභීතිකා එන්නත් |
| 22 | මදුරු තෙල් ඉසීමේ යන්ත්‍ර, ධූමායන යන්ත්‍ර වැනි උපකරණ |
| 23 | තණ කොළ කපන යන්ත්‍ර, ගස් කපන යන්ත්‍ර ඇතුළු උද්‍යාන අලංකරණ උපකරණ හා උපාංග |
| 24 | සබන්, පවිත්‍ර කාරක සහ පිරිසිදු කිරීමේ උපකරණ |
| 25 | ජල පවිත්‍රකාරක සහ ජලය පිරිසිදු කිරීමේ උපකරණ |
| 26 | පානීය ජල බෝතල් |
| 27 | විශේෂ අවස්ථා සඳහා උදේ, දිවා, රාත්‍රී ආහාර සැපයීම, කෙටි ආහාර හා අතුරුපස සැපයීම |
| 28 | විදුලි උපකරණ |
| 29 | ගර්භණී මව්වරුන් හා ළදරුවන් සඳහා අවශ්‍ය උපකරණ |
| 30 | වීදුරු කණ්නාඩි (Mirror) සහ වීදුරු (Glass Pad) |
| 31 | පාපිසි සහ පොලිසැග් බෑග් |
| 32 | ගිනි නිවන යන්ත්‍ර සහ උපකරණ, ආරෂක උපකරණ, ඇස් ආවරණ (Goggles) රබර් අත්වැසුම් (Rubber Gloves) |
| 33 | සියලුම දැව වර්ග |
| 34 | උළු, මුදුන් උළු, බොරළු පස්, ගඟේ වැලි, ගඩොල් සහ මුහුදු වැලි |
| 35 | ආර්.සී.සී. පයිප්ප, කොන්ක්‍රීට් චැනල්, සිමෙන්ති ගල්, ආර්.සී.සී. කොන්ක්‍රීට් කණු, කොන්ක්‍රීට් ස්ලැබ් සහ ඉන්ටර්ලොකිං |
| 36 | කළුගල් |
| 37 | සිමෙන්ති |
| 38 | කෝලාස් සහ තාර |
| 39 | යකඩ බඩු සහ ගොඩනැගිලි ද්‍රව්‍ය |
| 40 | පී.වී.සී. කෝටඩ් දැල් |
| 41 | ජලනළ උපකරණ හා උපාංග |
| 42 | ටයිල් |
| 43 | තීන්ත |
| 44 | පාපැදි |
| 45 | ට්‍රැක්ටර් රථ අමතර කොටස් |
| 46 | ටයර් සහ ටියුබ් |
| 47 | වාහන අමතර කොටස් |
| 48 | අත් කරත්ත |
| 49 | වෛද්‍ය උපකරණ |
| 50 | විෂබීජනාශක දියර/ජෙල් (Hand Sanitizer), ශල්‍ය මුඛ ආවරණ (Surgical Mask) සහ අත් ආවරණ (Surgical Gloves) |

| B | සැපයිය යුතු සේවාවන් |
|---|---|
| 1 | මුද්‍රණ කටයුතු සහ පොත් බැඳීම |
| 2 | කාර්යාල උපකරණ (පරිගණක සහ උපාංග, මුද්‍රණ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, වේලාව සටහන් කිරීමේ යන්ත්‍ර, ස්කෑන් යන්ත්‍ර, යතුරුලියන, රෝනියෝ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, රූපවාහිනී සහ වීසීඩී/ඩීවීඩී යන්ත්‍ර) නඩත්තු කිරීම හා අලුත්වැඩියා කිරීම |
| 3 | පරිගණක මෘදුකාංග සංවර්ධනය, ස්ථාපිත කිරීම හා උපදේශනාත්මක සේවා |
| 4 | ඡායාරූප ගැනීම සහ වීඩියෝකරණය |
| 5 | ඩිජිටල් බැනර් සහ ස්ටිකර් මුද්‍රණ කටයුතු |
| 6 | ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට සැපයීම හා ආලෝකකරණය කුලියට සැපයීම |
| 7 | කුලී පදනම මත උත්සව භාණ්ඩ සැපයීම |
| 8 | ක්‍රීඩා උපකරණ හා පෙර පාසැල් උපකරණ අළුත්වැඩියාව හා නඩත්තුව |
| 9 | කායවර්ධන උපකරණ අළුත්වැඩියාව හා නඩත්තුව |
| 10 | ගිනි නිවීමේ පද්ධති, ස්වයංක්‍රීය හා අතින් ක්‍රියාකරන ගිනි සංඥා ක්‍රම නඩත්තු කිරීම |
| 11 | ආරක්ෂක උපකරණ හා ගිනි නිවාරණ උපකරණ අළුත්වැඩියාව |
| 12 | වායුසමන යන්ත්‍ර සපයා සවි කිරීම |
| 13 | ස්පිලිට් මාදිලියේ වායුසමීකරණ යන්ත්‍ර හා ශීතකරණ අලුත්වැඩියාව හා නඩත්තු කිරීම |
| 14 | පරණ පුවත්පත් මිලදී ගැනීම |
| 15 | නිල හැඳුනුම්පත් සකස් කිරීම |
| 16 | නිල ඇඳුම් මසා නිම කිරීම (ඕවරෝල්, ආරක්ෂක අංශයේ නිල ඇඳුම්) |
| 17 | යන්ත්‍ර මගින් සිදු කරන එන්ජින් අලුත්වැඩියා කටයුතු කිරීම. (ස්ලිව් සවි කිරීම, රැක් කැපීම, බෝර් කිරීම හා අනෙකුත් අලුත්වැඩියා කටයුතු ආදිය) |
| 18 | වාහන කුෂන් අලුත්වැඩියාව |
| 19 | වාහන විදුලි උපකරණ අලුත්වැඩියාව (Alternator/ Stator Motor හා අනෙකුත් උපකරණ) |
| 20 | වාහන වායු සමීකරණ අලුත්වැඩියාව |
| 21 | වාහන රේඩියේටර් අලුත්වැඩියාව |
| 22 | ඉන්ජෙක්ටර් පොම්ප අලුත්වැඩියාව |
| 23 | ක්ලච් ප්ලේට්, බ්‍රේක් ලයිනර් ඇලවීම් කටයුතු |
| 24 | සියළු වාහන ටයර් නැවත පිරවීම |
| 25 | ස්පීඩෝ මීටර් අලුත්වැඩියාව |
| 26 | වාහන කේබල් වර්ග අලුත්වැඩියාව |
| 27 | යකඩ තහඩු නැවීමේ හා කැපීමේ කටයුතු |

**ඩබ්.ඒ.ටී. මානෙල්,**
**නාගරික කොමසාරිස්,**
**දෙහිවල, ගල්කිස්ස මහා නගර සභාව,**
**දෙහිවල.**
**2020-09-19**




මෙම සේවාව දැන් දිවයිනපුරා ක්‍රියාත්මකයි.
ලේක්හවුස් සමාජ සත්කාරයකි

# දිවුලපිටිය ප්‍රාදේශීය සභාව

## 2021 වර්ෂයට දේපළ බදු දීම සඳහා ප්‍රසම්පාදන දැන්වීමයි

දිවුලපිටිය ප්‍රාදේශීය සභාවට අයත් මෙහි පහත උපලේඛනයේ සඳහන් මස්කඩ , මාළුකඩ සහ පොදු වැසිකිළිවල වෙළඳ අයිතිය 2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා බදු දීම සඳහා ටෙන්ඩර් මවිසින් භාරගනු ලැබේ.

2. **ටෙන්ඩර්පත් නිකුත් කිරීම - 2020.10.26 දින දක්වා (පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා)**
   **ටෙන්ඩර්පත් භාර ගැනීම - 2020.10.27 දින පෙ.ව. 09.30 දක්වා**
   **ටෙන්ඩර් විවෘත කිරීම - 2020.10.27 දින පෙ.ව.10.00 ට.**
3. පහත උපලේඛනයේ සඳහන් පරිදි ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් පෝරම ගාස්තුව සහ ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප මුදල් දිවුලපිටිය ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයට ගෙවීමෙන් අයදුම්පත් ලබා ගත හැකිය.
4. උපලේඛනයේ සඳහන් අවම ගාස්තුවට අඩුවෙන් ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එවැනි ටෙන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල් සහ ටෙන්ඩර් අයදුම්පත් ලබාගෙන ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ තැන්පත් මුදල් සභාව සතු කරනු ලැබේ.
5. මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් 2020.10.27 දින පෙරවරු 09.30 දක්වා මවිසින් භාරගනු ලැබේ. නියමිත අයදුම්පත් පෝරම ගාස්තු හා ටෙන්ඩර් ඇප තැන්පත් මුදල් දිවුලපිටිය ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයට ගෙවා 2020.10.26 දින දක්වා ලබා ගත හැකිය.
6. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමේදී ඉල්ලුම්කරුවන් විසින් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර තම අනන්‍යතාවය තහවුරු කළ යුතු අතර, මෙයට පෙර ප්‍රාදේශීය සභාවට අයත් දේපළෙහි වෙළඳ අයිතිය බදු ගෙන ගිවිසුම් කඩකර ඇති බදු හිමියන් වෙත අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.
7. ටෙන්ඩර් අයදුම්පත් වෙන වෙනම සම්පූර්ණ කිරීමෙන් පසු **"මුල් පිටපත"** හා **"අනු පිටපත"** වෙන් වෙන්ව කවර දෙකක බහා එම කවරවල පිටුපස **"මුල් පිටපත"** හා **"අනු පිටපත"** යනුවෙන් සඳහන් කර එම කවර දෙකම තවත් ලිපි කවරයක බහා මුද්‍රා තබා එම කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ ටෙන්ඩරයේ නම සඳහන් කර මුද්‍රා තබන ලද ටෙන්ඩර් **"සභාපති, දිවුලපිටිය ප්‍රාදේශීය සභාව, දිවුලපිටිය"** යන ලිපිනයට 2020.10.27 දින පෙ.ව.9.30 ට පෙර දිවුලපිටිය ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ යුතුය.
8. ටෙන්ඩර් විවෘත කිරීම 2020. 10.27 දින පෙ.ව.10.00 ට දිවුලපිටිය ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී සිදුකරනු ලබන අතර, එකී වේලාවට ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ ලිඛිත බලය පවරන ලද නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගී විය හැකිය.
9. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පිළිගත් බව දැනුම් දීමෙන් දින 07 ක් ඇතුළත තමා ඉල්ලුම් කළ මුදලින් 25% ක ආරක්ෂිත ඇප තැන්පත් වශයෙන් සභාවේ තැන්පත් කර බදු ගිවිසුමකට ඇතුළත් විය යුතුය. මීට අමතරව තමා ඉල්ලුම් කරන මුදලින් 75% කට සරිලන දේපළ ඇපයක් තැබිය යුතු ය.
10. ටෙන්ඩර් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම ටෙන්ඩර් කමිටුවේ තීරණය වන අතර, සභාවේ තීරණය අවසාන තීරණය වේ.
11. තවදුරටත් විස්තර අවශ්‍ය වන්නේ නම් දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් දුරකථන අංක වලින් විමසා දැනගත හැකිය.

**ටී.ටී. ඉන්දික ජයසිංහ,**
**සභාපති,**
**දිවුලපිටිය ප්‍රාදේශීය සභාව,දිවුලපිටිය දීය.**
**2020.09.28**

**දුරකථන අංකය - 031 - 2246275**
**ෆැක්ස් අංකය - 031 - 2243865**

### උපලේඛනය

| අනු අංකය | දේපළෙහි ස්වභාවය | 2021 වර්ෂය සඳහා අවම ලංසු මුදල (රු.) | ටෙන්ඩර් ඇප තැන්පත් (ආපසු ගෙවන) රු. | පෝරම ගාස්තු (ආපසු නොගෙවන) රු. |
|---|---|---|---|---|
| 1. | දිවුලපිටිය මාළු කඩ අංක 01 | 30,910.00 | 3,091.00 | 500.00 |
| 2. | දිවුලපිටිය මාළු කඩ අංක 02 | 21,010.00 | 2,101.00 | 500.00 |
| 3. | දිවුලපිටිය මාළු කඩ අංක 03 | 31,000.00 | 3,100.00 | 500.00 |
| 4. | දිවුලපිටිය මස් කඩය | 457,677.00 | 45,767.70 | 500.00 |
| 5. | මරඳගහමුල ඌරුමස් කඩය | 161,425.00 | 16,142.25 | 500.00 |
| 6. | මරඳගහමුල මාළු කඩ අංක 01 | 19,855.00 | 1,985.50 | 500.00 |
| 7. | මරඳගහමුල මාළු කඩ අංක 02 | 19,855.00 | 1,985.50 | 500.00 |
| 8. | මරඳගහමුල මාළු කඩ අංක 03 | 29,755.00 | 2,975.50 | 500.00 |
| 9. | මරඳගහමුල මාළු කඩ අංක 04 | 29,755.00 | 2,975.50 | 500.00 |
| 10. | දිවුලපිටිය සතිපොළ භූමි වැසිකිළිය | 10,000.00 | 1,000.00 | 500.00 |
| 11. | දිවුලපිටිය බස්නැවතුම්පළ පොදු වැසිකිළිය | 10,000.00 | 1,000.00 | 500.00 |
| 12. | තුරුසෙවන පොදු වැසිකිළිය | 10,000.00 | 1,000.00 | 500.00 |
| 13. | කොටදෙනියාව මාළු ලෑලි අංක 01 | 210,000.00 | 21,000.00 | 500.00 |
| 14. | කොටදෙනියාව මාළු ලෑලි අංක 02 | 127,600.00 | 12,760.00 | 500.00 |
| 15. | කොටදෙනියාව කුකුල්මස් කඩය | 158,290.00 | 15,829.00 | 500.00 |
| 16. | කොටදෙනියාව ඌරුමස් කඩය | 181,940.00 | 18,194.00 | 500.00 |
| 17. | කොටදෙනියාව සතිපොළ වැසිකිළිය | 10,000.00 | 1,000.00 | 500.00 |
| 18. | බඩල්ගම මාළු කඩ අංක 01 | 33,220.00 | 3,322.00 | 500.00 |
| 19. | බඩල්ගම මාළු කඩ අංක02 | 23,210.00 | 2,321.00 | 500.00 |
| 20. | බඩල්ගම මාළු කඩ අංක 03 | 21,500.00 | 2,150.00 | 500.00 |
| 21. | බඩල්ගම සතිපොළ වැසිකිළි පද්ධතිය | 10,000.00 | 1,000.00 | 500.00 |
| 22. | බඩල්ගම මස් කඩ අංක 01 | 181,885.00 | 18,188.50 | 500.00 |

### වෙළඳ අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

# කාර්යාල ඉඩ පහසුකම්

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සේවාවන් පවත්වාගෙන යාම සඳහා විදුලිය, නල ජලය සහිත වර්ග අඩි 4000ක ප්‍රමාණයේ ගොඩනැගිලි ඉඩ පහසුකම් ආයතනය ආසන්නයෙන් (කි.මී. 1කට නොවැඩි දුරකින්) දෙවසරක කාල සීමාවකට යටත්ව බද්දට හෝ කුලියට ගැනීමට අවශ්‍යව ඇත.

2020-10-19 දින 1400 පැයට පෙර මුද්‍රා තබන ලද මිළ ගණන් සහිත අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් හෝ අධ්‍යක්ෂ (පරිපාලන) වෙත පැමිණ හෝ භාර දිය යුතුය.

වාහන නවතා තැබීමේ පහසුකම් (වාහන 2ක් හෝ ඊට වැඩි) පවතීනම් ප්‍රමුඛතාවය ලබාදෙන බවද සැලකිය යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
නො. 17, වික්ටෝරියා පෙදෙස
ඇල්විටිගල මාවත
කොළඹ 8

# මහජන බැංකුව

## රන් භාණ්ඩ උකස් වෙන්දේසිය

බදුල්ල ප්‍රාදේශිකයට අයත් පහත සඳහත් ශාඛාවන් සහ සේවා මධ්‍යස්ථානවල 2019.01.15 දින දක්වා උකස් තබන ලදුව, පහත උපලේඛනයේ සඳහන් දිනයන් දක්වා බේරා නොගත් උකස් භාණ්ඩ පහත දක්වා ඇති දිනයන්හි සහ එම ස්ථානයන්හිදී පෙ.ව. 9.00 ට ආරම්භ කොට වෙන්දේසි කරනු ලබන බව මෙයින් දන්වමු.

| | ශාඛාව/ සේවා මධ්‍යස්ථානය | පහත දින දක්වා බේරා නොගත් | වෙන්දේසි දිනය හා ස්ථානය |
|---|---|---|---|
| 01 | හපුතලේ ශාඛාව<br>කොස්ලන්ද ශාඛාව<br>හල්දුම්මුල්ල ශාඛාව<br>දියතලාව ශාඛාව | 2020.10.16 | 2020.10.17 දින<br>හපුතලේ ශාඛා පරිශ්‍රයේදී |
| 02 | බදුල්ල මුතියංගන ශාඛාව<br>බදුල්ල පහළ වීදිය සේවා මධ්‍යස්ථානය<br>බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාල සේවා මධ්‍යස්ථානය<br>ඌව පළාත් සභා සේවා මධ්‍යස්ථානය<br>පස්සර ශාඛාව<br>මඩොල්සිම සේවා මධ්‍යස්ථානය<br>ලුණුගල ශාඛාව | 2020.10.16 | 2020.10.17 දින බදුල්ල – මුතියංගන ශාඛා පරිශ්‍රය |
| 03 | වැලිමඩ ශාඛාව<br>වැලිමඩ නගර සේවා මධ්‍යස්ථානය<br>කැප්පෙටිපොල ශාඛාව<br>ඌවපරණගම ශාඛාව<br>ලුණුවත්ත සේවා මධ්‍යස්ථානය<br>මැදවෙල සේවා මධ්‍යස්ථානය<br>බොරලන්ද ශාඛාව<br>බෝගහකුඹුර සේවා මධ්‍යස්ථානය | 2020.10.17 | 2020.10.18 දින<br>වැලිමඩ ශාඛා පරිශ්‍රය |
| 04 | බදුල්ල ශාඛාව<br>බදුල්ල වෙලේකඩේ සේවා මධ්‍යස්ථානය<br>බදුල්ල බසාර් වීදිය සේවා මධ්‍යස්ථානය | 2020.10.17 | 2020.10.18 දින<br>බදුල්ල ශාඛා පරිශ්‍රය |
| 05 | බණ්ඩාරවෙල ශාඛාව<br>බණ්ඩාරවෙල නගර සේවා මධ්‍යස්ථානය<br>බණ්ඩාරවෙල සිංහගිරි සේවා මධ්‍යස්ථානය<br>පෙරහෙට්ටිය සේවා මධ්‍යස්ථානය<br>බල්ලකෙටුව සේවා මධ්‍යස්ථානය | 2020.10.20 | 2020.10.21<br>බණ්ඩාරවෙල ශාඛා පරිශ්‍රය |
| 06 | හාලිඇල ශාඛාව<br>දෙමෝදර සේවා මධ්‍යස්ථානය<br>ඇටම්පිටිය සේවා මධ්‍යස්ථානය | 2020.10.23 | 2020.10.24 දින<br>බණ්ඩාරවෙල ශාඛා පරිශ්‍රය |
| 07 | ගිරාදුරුකෝට්ටේ ශාඛාව<br>නව මැදගම සේවා මධ්‍යස්ථානය<br>කන්දකැටිය ශාඛාව<br>මීගහකිවුල සේවා මධ්‍යස්ථානය<br>මහියංගනය ශාඛාව | 2020.10.23 | 2020.10.24 දින<br>බදුල්ල ශාඛා පරිශ්‍රය |

ඉහත පරිදි පැවැත්වීමට නියමිත මෙම වෙන්දේසිය නැවත දැනුම් දීමකින් තොරව බැංකුවේ අභිමතය පරිදි අවලංගු කිරීම හෝ කල් දැමීම, ඒකාබද්ධ කොට පැවැත්වීම හෝ යන මේ ඕනෑම කටයුත්තක් සිදු කිරීමේ අයිතිය බැංකුව සතුව ඇත.

**මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,**
**අංක 24, ආර්. එච්. ගුණවර්ධන මාවත,**
**බදුල්ල.**

**ප්‍රාදේශීය කළමනාකාර,**
**(ඩී. එම්. එම්. දිසානායක)**

මහජන බැංකුව PEOPLE'S BANK


සිළුමිණ The Silumina
වට පිට
පල දරන්න - පළ කරන්න
මංගල යෝජනා
දශක ගණනාවක විශ්වසනීය සේවාව...
දැන් වචන 15ක් රු. 560ක් පමණයි...

# කොළඹ මහා නගර සභාව

## ප්‍රසම්පාදන දැන්වීම

කොළඹ මහානගර සභාවේ නාගරික කොමසාරිස්වරයා විසින් පහත සඳහන් **සේවාවන් සහ අයිතම ප්‍රසම්පාදනය** සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රාතැබූ ලංසු කැඳවනු ලැබේ.

| | යොමු අංකය | විස්තරය |
|---|---|---|
| 1. | CPD/01/2565/2020 | වසරක කාලයක් සඳහා අවශ්‍යවන විට මිලදී ගැනීමේ පදනම මත ගොඩනැගිලි ඉදිකිරීම් / උද්‍යාන අලංකරණ අමුද්‍රව්‍ය සහ පලන ලද දර (ගංගා වැලි, ගඩොල්, සිමෙන්ති, ගල්, පස්, තණකොළ පිඩැලි, කොහුකුඩු, දර ආදිය) ප්‍රසම්පාදනය |
| 2. | CPD/08/1670/2020 | මහජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුව බටහිර බෙහෙත් සහ අමුද්‍රව්‍ය ප්‍රසම්පාදනය |
| 3. | CPD/14/2975/2020 | බීටුමන් තොග සහ බැරල් ලෙස ප්‍රවාහනය කිරීම සඳහා ලංසුව |
| 4. | CPD/14/3025/2020 | CRS 1 සහ MC 30 සැපයීම, ප්‍රවාහනය සහ බෑම සඳහා ලංසුව |
| 5. | CPD/15/1156/2020 | ඩෙස්ක්ටොප් පරිගණක 126 ක් ප්‍රසම්පාදනය |
| 6. | CPD/16/3150/2020 | සුදුවැල්ල ප්‍රධාන ගබඩාව, පැරණි පුරහල, නව පුරහල සහ මිලේනියම් සෙන්ටර් සඳහා ජැනිටෝරියල් සේවා සැපයීම |
| 7. | CPD/16/3050/2020 | නගරාධිපති මධ්‍යස්ථානයට ජැනිටෝරියල් සේවා සැපයීම |

ලංසු ලේඛන, ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම මගින් සහ එක් ලේඛනයක් සඳහා රු. 5,400/- ක (බදු සමග) නැවත නොගෙවන ලංසු ලේඛන ගාස්තුවක් මුදලින් ගෙවීම මගින්, 2020 ඔක්තෝබර් 22 වන දින දක්වා රාජකාරී දිනවල පෙ.ව. 9.00 - ප.ව. 3.00 ත් අතර, **"ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලය (ප්‍රසම්පාදන), මධ්‍යම මිලදී ගැනීම් දෙපාර්තමේන්තුව, කොළඹ මහානගර සභාව, කොළඹ 07"** යන ලිපිනයෙන් ලබාගත හැක. 2020 ඔක්තෝබර් 22 වන දින ප.ව. 3.00 න් පසු ලංසු ලේඛන නිකුත් කෙරෙනු නොලැබේ.

නිසිලෙස සම්පූර්ණ කරනලද මුද්‍රාතැබූ ලංසු ලේඛන අනුපිටපත් සමග, 2020 ඔක්තෝබර් 23 වන දින පෙ.ව. 10.00 ට පෙර, කොළඹ 07, පුරහල, නාගරික ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

ලංසු භාරගැනීම 2020 ඔක්තෝබර් 23 වන දින පෙ.ව. 10.00 ට අවසන් වන අතර, ඒවිගසම ලංසු විවෘත කෙරෙනු ලැබේ.

ලංසු කරුවන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසු විවෘත කිරීමේ අවස්ථාව සඳහා සහභාගි විය හැක.

යම් පැහැදිලි කරගැනීමක් අවශ්‍ය වේ නම්, අභිලාෂී ලංසුකරුවන්හට ප්‍රධාන ගණකාධිකාරී (ප්‍රසම්පාදන) වෙතින් දු.ක. 011-2686389, 011-2673173 ඇමතීමෙන් ලබාගත හැක.

**රොෂාණි දිසානායක - නීතිඥ,**
**නාගරික කොමසාරිස්,**
**කොළඹ මහානගර සභාව.**

# දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය

## ප්‍රසම්පාදන දැන්වීමයි

**දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ සිසුන් (පිරිමි) සඳහා නේවාසික පහසුකම් සඳහා සුදුසු ගොඩනැගිල්ලක් කුලියට/බද්දට ගැනීම සඳහා මිල ගණන් කැඳවීම**

කොළඹ විශ්වවිද්‍යාලය, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ (පිරිමි) සිසුන් සඳහා නේවාසික පහසුකම් සඳහා සුදුසු ගොඩනැගිල්ලක් වසරක කාලයක් සඳහා කුලියට/බද්දට ගැනීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ. (ආයතනයේ අවශ්‍යතාවය පරිදි බදු කාලය දීර්ඝ කරනු ඇත.)

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය රාජගිරියේ පිහිටා ඇති බැවින් එම පරිශ්‍රයට ආසන්නව පිහිටි සුදුසු ගොඩනැගිලි සඳහා ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ. අවම වශයෙන් සිසුන් 40 කට ප්‍රමාණවත් ඉඩ පහසුකම් තිබිය යුතුයි.

**ගොඩනැගිල්ලේ තිබිය යුතු මූලික පහසුකම් සහ කොන්දේසි**

| | | | |
|---|---|---|---|
| 01 | නිරවුල් අයිතිය | 05 | භූමිය වටා මනාව ඉදිකළ තාප්පය හෝ ආරක්ෂිත වැටක් |
| 02 | ජලය හා විදුලිය | 06 | උප ශාලාධිපති/ විනයාරක්ෂක නේවාසික පහසුකම් |
| 03 | දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයට පහසුවෙන් ළඟාවීමේ හැකියාව | 07 | විධිමත් ප්‍රවේශ මාර්ගයක් |
| 04 | ප්‍රමාණවත් වැසිකිළි හා නාන කාමර පහසුකම් | | |

මේ සඳහා උනන්දුවක් දක්වන ගොඩනැගිලි හිමියන් හට අදාළ ලංසු පත්‍රිකා ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී කාර්යාලයෙන් ලබාගත හැකි අතර, ඒ සඳහා ආපසු නොගෙවනු ලබන රු 2000.00ක මුදලක් මහජන බැංකුව බොරැල්ල යන ශාඛාවේ අංක 078100192268358 යන ගිණුමට බැරකර එහි කුවිතාන්සිය ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් අදාළ ලංසු පත්‍රිකාව ලබා ගත හැක. අයදුම්පත් නිකුත් කරන කාලසීමාව වනුයේ 2020.10.02 සිට 2020.10.23 දින දක්වා සතියේ දිනයන්හිදී ලබාගත හැක.

ඉහත කොන්දේසි සපුරාලන මිල ගණන් සඳහන් අයදුම් පත්‍ර අදාළ ගොඩනැගිල්ලේ ඡායාරූපයක් සහ ගොඩනැගිල්ලට ප්‍රවේශ විය හැකි ගමන් මාර්ගයක් ඇතුළත් දළ සටහනක් සමග 2020.10.26 වන දින සවස 2.30 ට ප්‍රථමයෙන් ලැබෙන සේ සභාපති ප්‍රසම්පාදන කමිටුව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ යුතුය. අමතර තොරතුරු සඳහා 011-5679709 යන අංකය අමතා ලබා ගත හැක.

මිල ගණන් ඉදිරිපත් කරනු ලබන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ සිසුන් (පිරිමි) සඳහා නේවාසික පහසුකම් සඳහා සුදුසු ගොඩනැගිල්ලක් කුලියට ගැනීම සඳහා මිල ගණන් කැඳවීම -DR/NCB/2020/IIM/01"** යනුවෙන් සටහන් කළ යුතු වේ. 2020.10.26 දින සවස 2.30ට අදාළ මිල ගණන් විවෘත කරන අතර, අයදුම්කරුවන්ට හෝ වෙනත් බලයලත් නියෝජිතයකුට ඒ සඳහා සහභාගී විය හැක.

**අධ්‍යක්ෂ,**
**දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය,**
**කොළඹ විශ්වවිද්‍යාලය,**
**රාජගිරිය.**

2020.10.02

තරුණී
කාලීන දැනුම | මැහුම් | ගෙතුම් | අත්කම් | අතිරේක
දශක පහක් පුරා - කාන්තා නැණ පහන් දැල්වූ
කාන්තා පුවත්පත

# මහනුවර මහා නගර සභාව

## 2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

2021 වර්ෂය සඳහා පහත සඳහන් සැපයුම් හා සේවාවන් සැපයීමට සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි කර ගැනීම පිණිස නිෂ්පාදකයින්ගෙන්, ලියාපදිංචි ආයතනවලින් හෝ පුද්ගලයින්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

**01. සැපයුම්**

01. ආයුර්වේද ඖෂධ වර්ග.
02. බටහිර ඖෂධ වර්ග සහ වෛද්‍ය උපකරණ.
03. ගිනි නිවීමේ උපකරණ (සවිකිරීම් ඇතුළුව).
04. සාමාන්‍ය ගබඩා ද්‍රව්‍ය (යකඩ, ජීඅයි පයිප්ප කම්බි, නාන කාමර හා වැසිකිළි අමතර කොටස් ප්ලාස්ටික් ජල ටැංකි, කොම්පෝස්ට් බැරල්, සෙවිලි ද්‍රව්‍ය).
05. තීන්ත වර්ග සහ ඒ ආශ්‍රිත ද්‍රව්‍ය.
06. සෞඛ්‍ය ආශ්‍රිත උපකරණ (ඉදල්, කොසු, වේවැල් කූඩා, ප්ලාස්ටික් කුණු කූඩා, විම්, හාපික්, සබන් වර්ග, පයිනෝල්, අත්වැසුම්, ආදිය).
07. පාවහන්, සපත්තු මේස් ආදිය.
08. නිල ඇඳුම් සඳහා අවශ්‍ය රෙදි වර්ග සහ ටී ෂර්ට්.
09. ක්‍රීඩා භාණ්ඩ සහ කාය වර්ධන උපකරණ ආදිය.
10. ටයර්, ටයර් ටියුබ් සහ බැටරි (වාහන සඳහා).
11. රථ වාහන අමතර කොටස් (වෑන්, මෝටර් සයිකල්, ට්‍රැක්ටර්, ගල් රෝල් ටිපර්, ත්‍රිවීලර් රථ, බැකෝ ඇතුළු සියලු වාහනවල අලුත් සහ භාවිත කරන ලද අමතර කොටස්).
12. කාර්යාල විදුලි උපකරණ (එකතු කිරීමේ යන්ත්‍ර කේතල් විදුලි පංකා ආදිය).
13. පරිගණක යන්ත්‍ර හා ඒ ආශ්‍රිත උපාංග.
14. කාර්යාල උපකරණ ලී සහ වානේ ගෘහ භාණ්ඩ (රාක්ක, අල්මාරි, මේස, ලිපිගොනු කැබිනට්, ප්ලාස්ටික් පුටු ආදිය).
15. ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර සහ අනු පිටපත් යන්ත්‍ර, බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර ආදිය.
16. විදුලි සේවාවන් සැපයීමට අවශ්‍ය උපාංග (වයර්, ස්විච්, බල්බ්, ප්ලග් ආදිය).
17. කාර්යාලීය ලිපි ද්‍රව්‍ය, පරිගණක, රිබන්, කාට්රිජ්, ටෝනර් ආදිය.
18. මුද්‍රණ කටයුතු (මුද්‍රිත පෝරම සහ පොත්පත්, දින මුද්‍රා, සහ රබර් මුද්‍රා).
19. ගොඩනැගිලි ද්‍රව්‍ය (වැලි, ගල්, මැටල් ආදිය).
20. හියුම් පයිප්ප, කොන්ක්‍රීට් කණු, මායිම් ගල්, සිමෙන්ති බ්ලොක් ගල්, කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන ආදිය.
21. සිමෙන්ති, කොන්ක්‍රීට් පෙර මුසු (Ready Mix), ප්‍රිමික්ස් ආදිය
22. ඉරන ලද දැව (ලෑලි, පරාල ආදිය).
23. ලිහිසි තෙල්.
24. ඉමල්ෂන් තාර.
25. පොහොර සහ රසායනික ද්‍රව්‍ය (රසායනික පොහොර සහ සත්ත්ව පොහොර).
26. ජලය පිරිපහදු කිරීමේ රසායනික ද්‍රව්‍ය (හයිඩ්‍රෝටඩ්ලයිම්, ඇලුමිණියම්, සල්ෆේට්, ක්ලෝරීන්, ටී.සී.එල්. පවුඩර් ආදිය.)
27. ජල පොම්ප සඳහා බෙයාරිං.
28. පීවීසී උපකරණ (ඩී.අයි.ජී.අයි. ජල නළ උපාංග යනාදී භාණ්ඩ සහ අමතර කොටස්).
29. ජල මීටර්, ජල පොම්ප, ජල මෝටර්, ජල පිරිපහදු කිරීමේ විදුලි උපකරණ, ජල පිරිපහදු කිරීමේ පද්ධතියට අවශ්‍ය උපකරණ ආදී භාණ්ඩ සඳහා අවශ්‍ය අමතර කොටස්.
30. පොත්, පුවත්පත්, සඟරා මිලදී ගැනීම.
31. ආරක්ෂිත උපකරණ (කබා, හෙල්මට් ආදිය)
32. උද්‍යාන සඳහා අවශ්‍ය ගස් වර්ග, මල් පැළ සහ තණ පිදලි
33. කැනපි, ටෙන්ට් රෙදි සහ තිර රෙදි ආදිය

**02. සේවාවන්**

34. ජල පොම්ප/ ජල මෝටර්/ ජලය පිරිපහදු කිරීමේ පද්ධතිය අලුත්වැඩියා කිරීම.
35. රෝනියෝ යන්ත්‍ර/ වායුසමීකරණ යන්ත්‍ර/ ෆැක්ස් යන්ත්‍ර අලුත්වැඩියා කිරීම.
36. පරිගණක යන්ත්‍ර සහ මුද්‍රණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම.
37. පුටු විවීම සහ පුටු කුෂන් කිරීම
38. නගර සභාව මගින් පවත්වනු ලබන විශේෂ අවස්ථා ඡායාරූප ගත කිරීම සඳහා ශිල්පීන් ලියාපදිංචි කර ගැනීම.
39. වාහන කුලියට සැපයීම (ට්‍රැක්ටර්/ මගී වාහන/ ටිපර් රථ/ කම්පැක්ටර් රථ/ ගස් කපන යන්ත්‍ර ආදිය)
40. ටයර් නැවත පිරවීම සහ පැරණි ටයර් මිලදී ගැනීම
41. යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ කුලියට සැපයීම.
42. සම්පත් පියස භාණ්ඩ විකිණීම.
43. කැනපි සපයා ගැනීම.
44. වෙනත්.

ඉහත සඳහන් එක් එක් සැපයුම් සහ සේවාවන් සඳහා වෙන් වෙන්ව ලියාපදිංචි වීම සඳහා එක් අයිතමයක් වෙනුවෙන් රු. 1080/- ක් බැගින් බදු ඇතුළත් ගාස්තුවක් අය කරනු ලැබේ. 2020.10.05 සිට 2020.11.05 දින දක්වා රජයේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 2.30 දක්වා අයදුම්පත් නිකුත් කරන අතර, සම්පූර්ණ කරන ලද අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2020.11.13 දිනවේ. අයදුම්පත් ලබාගැනීම සඳහා ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක්, ඉල්ලීමේ ලිපියක් හා වැට් බදු ගෙවන්නේ නම් ඒ සඳහා ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතු වේ.

මුදල් ඇනවුම් එවන්නේ නම් **"නාගරික කොමසාරිස්, මහනුවර"** නමින් 2020.10.29 දින දක්වා පමණක් භාරගනු ලබන අතර, මුදල් ඇණවුම් සමග ඉහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත් **"ගණකාධිකාරී (සැපයුම්), මහා නගර සභාව, මහනුවර"** නමින් 2020.11.13 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය හැකිය.

**සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ කොන්දේසි :**

i. ලියාපදිංචි සැපයුම්කරුවන්ට අමතරව අවශ්‍ය අවස්ථාවලදී වෙනත් මිල ගණන් කැඳවා භාණ්ඩ මිලදී ගැනීමේ බලය මෙම සභාවට / නාගරික කොමසාරිස්ට ඇත.

ii. අවශ්‍ය අවස්ථාවලදී සාම්පල් හා ආකෘති ඉදිරිපත් නොකරන හා ඇණවුම් පරිදි නියමිත වේලාවට, ප්‍රමිතියට සහ උසස් ගුණාත්මක භාණ්ඩ නොසපයන සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව අවලංගු කරනු ලැබිය හැකිය.

iii. භාණ්ඩ සැපයූ දින සිට අවම වශයෙන් දින 45 ක ණය පහසුකම් සැපයුම්කරුවන් විසින් ලබා දිය යුතුය.

iv. සැපයුම්කරුවන්ට අත්තිකාරම් මුදල් ගෙවනු නොලැබේ.

වැඩි විස්තර ගණකාධිකාරී (සැපයුම්) ගේ දුරකථන අංක 081-2232071, 071-8014804 මගින් ලබාගත හැකිය.

**2020.10.02 දින**
**මහා නගර සභාව.**
**මහනුවර.**

**චන්දන තෙන්නකෝන්**
**මහනුවර නාගරික කොමසාරිස්,**

# රත්නපුර මහා නගර සභාව

## යෝජනා කැඳවීම

උපාධිය ලබාගැනීමෙන් පසු අදාළ විෂය ක්ෂේත්‍රයේ වසර තුන (03) ක සේවා පළපුරුද්ද

**වැටුප් කාණ්ඩය :** MM 1-1

**වැටුප් පරිමාණය :** රු. 53,175/- (1,375x10) (1,910x15) 95,575/-

**වයස :** අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### තනතුර : කළමනාකරු (බීජ හා රෝපණ) II ශ්‍රේණිය

**සුදුසුකම් හා පළපුරුද්ද :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උද්භිද විද්‍යා විද්‍යාවේදී උපාධිය / කෘෂිකර්ම උපාධිය

සහ

උපාධිය ලබාගැනීමෙන් පසු අදාළ විෂය ක්ෂේත්‍රයේ වසර තුන (03) ක සේවා පළපුරුද්ද

**වැටුප් කාණ්ඩය :** MM 1-1

**වැටුප් පරිමාණය :** රු. 53,175/- (1,375x10) (1,910x15) 95,575/-

**වයස :** අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### තනතුර : ගණකාධිකාරී (ආදර්ශ පොල් උයන්) II ශ්‍රේණිය

**සුදුසුකම් හා පළපුරුද්ද :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණ උපාධිය / ව්‍යාපාර කළමනාකරණ උපාධිය / රාජ්‍ය පරිපාලනය උපාධිය / කළමනාකරණ උපාධිය / වාණිජවේදී උපාධිය හෝ පිළිගත් වරලත් වෘත්තීය ගණකාධිකාරී ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම (CIMA / ACCA / ICASL etc.) ගණකාධිකරණය පිළිබඳ උසස් තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව සමත්වීම

සහ

උපාධිය ලබාගැනීමෙන් පසු / අදාළ වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු අදාළ විෂය ක්ෂේත්‍රයේ වසර තුන (03) ක සේවා පළපුරුද්ද.

**වැටුප් කාණ්ඩය :** MM 1-1

**වැටුප් පරිමාණය :** රු. 53,175/- (1,375x10) (1,910x15) 95,575/-

**වයස :** අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වෙනත් කොන්දේසි :**

සෑම ඉල්ලුම්කරුවෙක්ම,

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**බඳවා ගන්නා ආකාරය :**

ලිඛිත තරග විභාගයක් / ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මගින්

**අයදුම්පත් :**

- ජීව දත්ත හා අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් විස්තර ඇතුළත් කර එම සුදුසුකම් සනාථ කළ හැකි සහතිකවල පිටපත් සමග අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. තවද දැනටමත් රජයේ / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.
- අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය. එසේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- තනතුරු කිහිපයකට ඉල්ලුම් කරන්නේ නම් එක තනතුරකට එක බැගින් වනසේ අයදුම්පත්‍ර වෙන් වෙන්ව ඉදිරිපත් කළ යුතුය.
- සියලුම අයදුම්පත් 2020.10.16 දින හෝ එදිනට පෙර ලැබෙන සේ **"සභාපති, පොල් වගාකිරීමේ මණ්ඩලය, 9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව අදාළ බඳවා ගැනීමේ බලධාරියා විසින් තීරණය කරනු ඇත. මෙම තනතුර සම්බන්ධයෙන් කරනු ලබන පෞද්ගලික විමසීම් ඒ සඳහා නුසුදුසුකමක් සේ සළකා කටයුතු කරනු ලැබේ.

**සභාපති,**
**පොල් වගාකිරීමේ මණ්ඩලය,**
**9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**

## නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

## පර්යේෂණ සහකාර තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

1979 අංක 53 දරන පනත යටතේ ස්ථාපිත ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම ජාතියේ නවෝත්පාදන හැකියාවන් ප්‍රවර්ධනය කිරීමේ ප්‍රධාන වගකීම් දරන ආයතනය වේ. නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කොමිසම වර්තමානයේ කොමසාරිස්වරයෙකු සහ සහකාර කොමසාරිස්වරුන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ.

කොමිසමේ පුරප්පාඩුව පවතින පර්යේෂණ සහකාර තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### පර්යේෂණ සහකාර (තනතුරු 02)

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් භෞතික / ජීව / ඉංජිනේරු / විද්‍යාවේදී / අලෙවිකරණ / කළමනාකරණ / වාණිජවේදී / ජනසන්නිවේදන උපාධිය

**තනතුරට පැවරෙන කාර්යයන් :**

* නව නිපැයුම්, නව නිර්මාණකරුවන් හඳුනා ගැනීමේ කටයුතු
* නව නිපැයුම් ප්‍රවර්ධනය කිරීමට සහාය වීම හා සම්බන්ධීකරණය
* විවිධ වැඩසටහන් සහ ව්‍යාපෘති සංවිධානය, ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය
* නව නිපැයුම් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ සහාය හා ආයතන සම්බන්ධීකරණය
* තොරතුරු හා දත්ත රැස්කිරීම, විශ්ලේෂණය හා වාර්තා පිළියෙල කිරීම

**වැටුප් පරිමාණය :**

MA 3- 2016 - රු. 32,200 - 10 X 445 - 11 X 660 - 10 X 730 - 5 X 750 - රු. 54,960

(2016.04.25 වන දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 උපලේඛන II අනුව 2020.01.01 වන දින සිට අදාළ වේ. ඒ අනුව, ජීවන වියදම් දීමනාව හා ගැළපුම් දීමනාව සහිතව ආරම්භක වැටුප රු. 36,520.00 හිමි වේ.)

**අමතර ප්‍රතිලාභ :**

සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට පිළිවෙලින් 15% හා 3% දායකත්වයක් ලබා දේ.

**වයස් සීමාව :**

අවුරුදු 22 - 45 ත් අතර විය යුතු වේ.

**සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු දීමේ ක්‍රමය :**

අදාළ අතිරේක අධ්‍යාපන සුදුසුකම්, අදාළ පළපුරුද්ද, වෘත්තීය ප්‍රවීණතා/ වෙනත් සුදුසුකම් සහ සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව මත රඳා පවතී.

තමන් විසින් සකස් කර ගන්නා ලද ජීව දත්ත තොරතුරු සහිත ඉල්ලුම්පත් 2020.10.15 වන දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍රය සමග සියලුම සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතු අතර, අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා හෝ ව්‍යවස්ථාපිත ආයතනවල අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මඟින් සිය අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

**කොමසාරිස්,**
**ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම,**
**අංක 46 & 48,**
**කොටා පාර, කොළඹ 08.**
www.slic.gov.lk, 011-2676645

# අධිකරණ සේවා කොමිෂන් සභාව

## ශ්‍රී ලංකා අධිකරණ සේවයේ පුරප්පාඩු

### ශ්‍රී ලංකා අධිකරණ සේවයේ II පන්තියේ I ශ්‍රේණියේ අධිකරණ නිලධාරී (මහේස්ත්‍රාත්) තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති තැනැත්තන්, සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන 2020.11.06 දින හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

02. වැටුප් ක්‍රමය - රු. 75, 000 - 10 X 1630 - 91,300 (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක. 01/2018 අනුව). අධිකරණ නිලධාරීන්ට හිමි දීමනා වැටුපට අමතරව ගෙවනු ලැබේ.

03. සෑම අයදුම්කරුවෙක්ම -

අ. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

ආ. විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

ඇ. ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

04. සුදුසුකම් :

අ. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු දෙකකට නොඅඩු සේවා කාලයක් ඇති කම්කරු විනිශ්චය සභා සභාපතිවරයකු වීම

හෝ

ආ. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු හතරකට නොඅඩු කාලයක් ක්‍රියාකාරී වෘත්තියෙහි යෙදී සිටින හෝ යෙදී සිටි නීතිඥවරයකු වීම,

හෝ

ඇ. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට යම් අමාත්‍යාංශයක හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක අවුරුදු හතරකට නොඅඩු කාලයක් නීති නිලධරයකු ලෙස සේවය කර ඇති නීතිඥවරයකු වීම,

හෝ

ඈ. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට යම් සමාගමක හෝ බැංකුවක හෝ ආයතනයක නීති නිලධරයකු ලෙස අවුරුදු හතරකට නොඅඩු කාලයක් සේවය කර ඇති සහ එම කාලය තුළ නිරතුරුවම අධිකරණය ඉදිරියේ පෙනී සිටි නීතිඥවරයකු වීම.

05. සියලුම අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එහි ප්‍රතිඵල මත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ.

**සටහන :**

01 අයදුම්පත් ගාස්තුව රුː 4,000/- කි. එම මුදල මහජන බැංකුවේ, වෙල්ල වීදිය ශාඛාවේ පවත්වාගෙන යනු ලබන අංක. 297100199025039 දරන **"ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව"** යන ගිණුමට බැර වන සේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් මුදල් ගෙවා ලබාගත් ලදුපත ලියාපදිංචි තැපැල් මගින් හෝ පෞද්ගලිකව පැමිණ අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයට ලැබීමට සැලැස්වීමෙන් අයදුම්පත් ලබාගත හැක. මුදල් ගෙවීම සඳහා අදාළ ලදුපත සම්පූර්ණ කිරීමේදී ලදුපතේ අදාළ ස්ථානයේ අයදුම්කරුගේ නම සහ ලිපිනය සටහන් කළ යුතුය.

02. ලියාපදිංචි තැපෑලෙන් හෝ අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත පෞද්ගලිකව පැමිණ අයදුම්කරුවන් විසින් සිය අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

03. රජයේ සේවයේ නියුක්තව සිටින නිලධාරීන් සිය අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් පමණක් ඉදිරිපත් කළ යුතුය.

**අයදුම්පත් ලබා ගැනීම සහ ඉදිරිපත් කිරීම සඳහා ලිපිනයː**

**ලේකම්,**
**අධිකරණ සේවා කොමිෂන් සභාව,**
**අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,**
**කොළඹ 12.**

**එච්. සංජීව සෝමරත්න**
**ලේකම්,**
**අධිකරණ සේවා කොමිෂන් සභාව.**

**2020 සැප්තැම්බර් මස 22 වන දින,**
**කොළඹ 12,**
**අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.**

# රැකියා ඇබෑර්තු



---

"ජලය මානව හිමිකමකි - සුවරැකුම අභිමානයකි"

## ජල සම්පාදන අමාත්‍යාංශය

**ලෝක බැංකුව විසින් සහාය සපයනු ලබන, ජල සම්පාදන හා සනීපාරක්ෂක වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (WaSSIP)**

**ණය අංකය : Cr 5685-LK**

### ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කණ්ඩායම සඳහා පුරප්පාඩු

ලෝක බැංකුව විසින් සහාය සපයනු ලබන ජල සම්පාදන හා සනීපාරක්ෂක වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (WaSSIP) පානීය ජල අවශ්‍යතා ලබාදෙන ආයතනවල, ධාරිතාව වැඩිදියුණුකර සංවර්ධනය කරලීම සහ මුලතිව්, කිලිනොච්චි, නුවරඑළිය, කෑගල්ල, රත්නපුර, බදුල්ල සහ මොනරාගල දිස්ත්‍රික්කවල සනීපාරක්ෂකතාව පිළිබඳ පහසුකම් වැඩි වර්ධනය (දියුණු) කරලීම හා නළගත ජල පහසුකම් සේවාවලට ඇති ප්‍රවිෂ්ඨය / ප්‍රවේශය වැඩිදියුණු කරලීම සඳහා සැලසුම්කර නිර්මාණය කරනලද ව්‍යාපෘතියකි.

ජලසම්පාදන යෝජනා ක්‍රම සහ සනීපාරක්ෂක ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු දැනටමත් ආරම්භ කර ඇති අතර, ව්‍යාපෘතිය, එහි 5 වන වසරේ පසුවන අතර, එහි කාර්ය කටයුතුවලින් 77% ක් වන ප්‍රමාණයක් නිමාකර සම්පූර්ණ කර ඇත.

මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, කොළඹ පිහිටුවා ඇති අතර, දිස්ත්‍රික්ක සහාය ඒකක එක එකක් බැගින් එක් එක් දිස්ත්‍රික්කවල පිහිටුවා ඇත. මුළු ව්‍යාපෘති පිරිවැය ඇමරිකන් ඩොලර් මිලියන 183 ක් වනු ඇත.

පහත සඳහන් පුරප්පාඩු සඳහා ලාංකීය පුරවැසියන් වෙතින් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් සතුව පහත සඳහන් අවම සුදුසුකම් තිබිය යුතුය.

#### ඉංජිනේරු සහකාර තනතුර (PS6)

**පිහිටි ස්ථානය :**

දිස්ත්‍රික් ආධාරක ඒකක

**සුදුසුකම් හා පළපුරුද්ද :**

01. තාක්‍ෂණ ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන, තෘතීයික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා (සුදුසුකම්) හි 7 මට්ටමට නොඅඩු නිපුණතා / ප්‍රවීණතා සහතිකයක් ලබා සිටීම

**සහ**

අඩුම තරමින් වසර 3 ක පළපුරුද්ද

**හෝ**

02. තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා (සුදුසුකම්) 6 මට්ටමට නොඅඩු ප්‍රවීණතා / නිපුණතා සහතිකයක් ලබා තිබීම

**සහ**

අඩුම තරමින් වසර 08 ක පළපුරුද්ද

**හෝ**

03. තෘතීයික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා, තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරන ලද, ජාතික වෘත්තීය කුසලතා 5 මට්ටමට නොඅඩු ප්‍රවීනතා / නිපුණතා සහතිකයක් ලබා තිබීම.

**සහ**

අඩුම තරමින් වසර 13 ක පළපුරුද්ද.

ජල සම්පාදන හා සනීපාරක්ෂක කටයුතුවලට අදාළ ක්‍රියාකාරකම්වල පළපුරුද්දක් සහිතවීම අමතර සුදුසුකමක් වනු ඇත.

#### ඉහත සඳහන් තනතුර සඳහා පොදු කොන්දේසි :

**වයස් සීමාව :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 64 ට අඩු විය යුතුය.

**වැටුප් පරිමාණය :**

වැටුප, 2019/01 දරන (MSC) කළමනාකරණ සේවා චක්‍රලේඛය මත පදනම්ව ගෙවනු ලැබේ.

**සේවා කොන්දේසි හා නියමයන් :**

පත්වීම්, සතුටුදායක කාර්ය සාධන ඇගයීම් ක්ෂේත්‍රවලට යටත්ව නැවත අලුත්කරගත හැකිය. මූලික වශයෙන් එක් වසරක කාලසීමාවක් සඳහා වන කොන්ත්‍රාත්තුවේ පදනම මත වනු ඇත. පත්වීමට අදාළව වන සියලු කොන්දේසි 2019/01 දතම දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ කොන්දේසි හා නියමයන්ට අදාළවනු ඇත.

**තෝරාගැනීමේ ක්‍රමවේදය :**

ඉහළම සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම්ව කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවා, එම සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කාර්ය සාධනය මත තෝරාගනු ලබනු ඇත.

සියලු ජීවදත්ත තොරතුරු ප්‍රකාශ (CV) සහිත අයදුම්පත්, අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද හා පෙර සේවාවන් පිළිබඳ සහතික පත්‍රවල පිටපත්ද සමග **2020 ඔක්තෝබර් මස 18 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ** පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි (ලේඛනගත) තැපෑලෙන් එවිය යුතුය.

"අයදුම් කරනු ලබන තනතුර ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කළ යුතුය. රාජ්‍ය / ආයතනික අංශයේ ආයතන / සංවිධාන වල සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ ආයතන / සංවිධානවල ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ජලසම්පාදන හා සනීපාරක්ෂකතා වැඩිදියුණු කිරිමේ ව්‍යාපෘතිය (WaSSIP)**
**අංක 230, E.W. පෙරේරා මාවත,**
**ජුබිලි කණුව, නුගේගොඩ.**

---

## සීමාසහිත පොල්ගහවෙල සමුපකාර ප්‍රාදේශීය ග්‍රාමීය බැංකුව
### කළමනාකරණ සහකාර III තනතුරේ පුරප්පාඩු

ඉහත නම් සඳහන් බැංකුවේ කළමනාකරණ සහකාර III තනතුර සඳහා පොල්ගහවෙල සහ වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ 2020-10-02 දිනට වසර 05 කට වැඩි ස්ථිර පදිංචියක් ඇති වයස අවුරුදු 18-45 ත් අතර ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම 2020-10-31 වැනි දින දක්වා ඉල්ලුම්පත් භාරගනු ලැබේ. (සමුපකාර සේවයේ නියුතු වූවන් සඳහා බඳවා ගැනීමේ උපරිම වයස් සීමාවක් බලපානු නොලැබේ.)

| | |
|---|---|
| තනතුර | - කළමනාකරණ සහකාර 111 |
| මට්ටම | - මෙහෙයුම් |
| සංකේත අංකය | - OL |
| වැටුප් පරිමාණය | - 20,500-320X10-375X10-500X10-32,450 ඒ ශ්‍රේණිය- 1/2015 |
| වයස් සීමාව | - අවු 18 -45 |
| බඳවා ගැනීමේ ක්‍රමවේදය | - සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සමග සම්මුඛ පරීක්ෂණයක් |
| පුරප්පාඩු සංඛ්‍යාව | - 05 |

මෙම තනතුර සඳහා සේවක අර්ථසාධක අරමුදල, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල හා වයඹ පළාත් සමුපකාර සේවක දායක විශ්‍රාම වැටුප් හිමි වේ. මීට අමතරව මාසික දිරිදීමනා, ත්‍රෛමාසික ඉලක්ක දීමනා, පැමිණීමේ දීමනා, වාර්ෂික ප්‍රසාද දීමනා හා අඩු පොලී සේවක ණය පහසුකම් ආදියටද හිමිකම් ඇත.

ඉහත සඳහන් තනතුර සඳහා නියමිත සුදුසුකම් ඇතුළු අනෙකුත් විස්තර සහ ඉල්ලුම්පත් 2020-10-05 සිට 2020-10-27 වැනි දින ප.ව. 3.30 තෙක් පහත නම් සඳහන් අප බැංකු ශාඛා වලින් රු. 300/-ක මුදලක් ගෙවා ලබා ගත හැක. අයදුම්පත සමග සියලුම සහතික ඡායාපිටපත් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2020-10-31 දින වේ.

**බැංකු ශාඛා**

| | |
|---|---|
| 01 පොල්ගහවෙල | 08 නගර ශාඛාව - පොල්ගහවෙල |
| 02 පොතුහැර | 09 තලවත්තේගෙදර |
| 03 කළුගමුව | 10 බන්දව |
| 04 වදකඩ | 11 පිදුරුවැල්ල |
| 05 උහුමීය | 12 කර්මාන්තපුරය |
| 06 මැටිකුඹුර | 13 සුනිලගම |
| 07 වීරඹුගෙදර | 14 උඩපොල |
| | 15 කිතගස්පිටිය |

**සභාපති,**
**සී/ස පොල්ගහවෙල සමුපකාර ප්‍රාදේශීය ග්‍රාමීය බැංකුව,**
**ප්‍රධාන කාර්යාලය,**
**අංක 10. දුටුගැමුණු හන්දිය, කොළඹ පාර, පොල්ගහවෙල.**
**දුඃ අ : 037-2243310, 037-4936900. 037-4947356**
**ඊමේල් :** crrb@sltnet.lk

---

## දැන්වීමයි
## සබරගමුව පළාත් සභාව
### 2021 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

2021 වර්ෂය තුළ සබරගමුව පළාත් සභාවට අයත් ආයතනවලට අවශ්‍ය වන කාර්යාල උපකරණ, ලිපිද්‍රව්‍ය ඇතුළු භාණ්ඩ හා සේවා සැපයීම කළ හැකි රාජ්‍ය සංස්ථා, මණ්ඩල, සංවිධාන, නිෂ්පාදකයින්, සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් හා සමිති සමාගම්වලින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත්, කොන්දේසි හා වැඩි විස්තර **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ), සබරගමුව පළාත් සභාව, නව නගරය, රත්නපුර** යන ලිපිනයට 9"X4" ප්‍රමාණයේ ලිපිනයැති මුද්දර කවරයක් එවීමෙන්, මෙම ආයතනයට පැමිණීමෙන් හෝ පහත සඳහන් වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිවේ. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2020-12-15** දිනට හෝ ඊට ප්‍රථම ඉහත ලිපිනයට එවිය යුතු වේ.

**2020-12-15** දිනෙන් පසුව ඉදිරිපත් කරන ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක **045-2222893/ 045-2231224/ 045-2228099** මගින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ) කාර්යාලය ඇමතීමෙන් ලබාගත හැකිය.

www.sg.gov.lk

**එම්.ඩී. රංජනී ජයකොඩි,**
**ප්‍රධාන ලේකම්,**
**සබරගමුව පළාත් සභාව,**
**නව නගරය, රත්නපුර.**

---

ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

## පුරප්පාඩු
## ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### (01) සංවර්ධන නිලධාරී (පුරප්පාඩු 02)

i. **රැකියා විස්තරය**

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ 2013 අංක 33 දරන පනතින් සම්මත කර ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමට දායක වීම, ඉහත තනතුරුවලට අදාළ රාජකාරී කටයුතු ඉටු කිරීම, එදිනෙදා පරිපාලන කටයුතු පවත්වාගෙන යෑම සඳහා පරිපාලනයට සහාය වීම හා අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන වෙනත් රාජකාරී.

ii. **සුදුසුකම්**

කළමණාකරණය, ගණකාධිකරණය, වාණිජවේදී, සංඛ්‍යානය, සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයන්ගෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබිය යුතුය.

iii. **වැටුප් පරිමාණය**

MA-3-2016 (රු. 32,200/= -10X445-11X660-10X730-5X750 - රු. 54,960/-)

(කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 02/2016 අනුව)

iv. **වයස**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

v. **බඳවා ගැනීමේ ක්‍රමය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

### (02) තාක්ෂණ සහකාර (පුරප්පාඩු 01)

i. **රැකියා විස්තරය**

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතන ගොඩනැගිල්ල යහපැවැත්මෙන් පවත්වාගෙන යෑමට දායක වීම, නියෝජ්‍යායතනයේ ගොඩනැගිලි පරිශ්‍රය යථා පරිදි පවත්වාගැනීමට අවශ්‍ය අලුත්වැඩියා සහ නඩත්තු පිළිබඳ නිරන්තරයෙන් විමර්ශනය කිරීම හා ඒවා පිළිබඳ පාලන අංශය දැනුවත් කිරීම, අවශ්‍ය වන්නා වූ නඩත්තු හා අලුත්වැඩියා නිසිකලට හඳුනාගැනීමටත් ඒවා පිළිසකර කිරීමට යෝග්‍ය විසඳුම් ඉදිරිපත් කිරීම, අවශ්‍ය පරිදි එම නඩත්තු කටයුතු කිරීමට දායක වීම, තාක්ෂණ සහකාර හට තනිව සිදුකළ නොහැකි අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු සඳහා යෝග්‍ය පරිදි බාහිරව එම පිළිසකර කරන ආයතන මගින් මිල විමසුම් ලබාගැනීමටත් ඒවායේ ගුණාත්මකභාවය හා මිල ගණන් සැසඳීමටත් අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදීම, ඉදිකිරීම් මිණුම් ගැනීම හා බිල්පත් පරීක්ෂා කිරීම.

ii. **සුදුසුකම්**

**(අ) බාහිර අයදුම්කරුවන්**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය තාක්ෂණ පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ඉදිකිරීම් තාක්ෂණය හෝ ගොඩනැගිලි තාක්ෂණය පිළිබඳ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

iii. **වැටුප් පරිමාණය**

MA-2-1-2016 (රු. 30,310-10X300-7X350-4X495-20X660 - රු. 50,940/-)

(කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 02/2016 අනුව)

iv. **වයස**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

v. **බඳවා ගැනීමේ ක්‍රමය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

● **පොදු කොන්දේසි**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුයි.

iii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුයි.

● **අර්ථ සාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල**

(අපේක්ෂකයන් විසින් 8% ක් හා ආයතනය විසින් 12% ක් අර්ථ සාධක අරමුදල සඳහා සහ 3% ක් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා ද දායක වනු ඇත.)

❖ අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද අනුව කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්පත්, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.

● **අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රමය**

අයදුම්කරුවන් විසින් සහතිකපත්, චරිත සහතිකවල පිටපත්, ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක ද සමග තම ජීව දත්ත තොරතුරු **2020-10-16** වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය, 363/12. සුගතදාස ස්ටේඩියම් - බ්ලොක් ඩී, ක්‍රීඩා සංකීර්ණ රථගාල පාර, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

❖ එසේ නොවන සහ අයදුම්පත් භාර ගන්නා දිනට පසුව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

❖ රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අය තම අයදුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

❖ අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන ලද තනතුර සඳහන් කළ යුතුය.

❖ මේ පිළිබඳව බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය.**

---


සුබසෙත
සත වෙත සිරිසෙත සලසන සත්පත
පලාඵල | හස්තරේඛා | වාස්තුවිද්‍යා | යෝගවිද්‍යාව | ආයුර්වේද
වෙදකමටද හෙදකමටද - ගුරු කමටද හුරුකමටද
ජ්‍යොතිෂායුර්වේද පන්හිද



අනාගත සිහින සැබෑකර ගැනීමේ එකම මග
මංගල යෝජනා තීරයයි
සිළුමිණ



1950 සිට දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොව ඡායාරූපවල දළ සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.

පුස්තකාලයාධිපති
දුරකථන
(011) 2 242 9491

LAKE HOUSE

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## කැලණිය විශ්වවිද්‍යාලය - යක්කල

### යක්කල, කැලණිය විශ්වවිද්‍යාලයේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනයේ පවත්නා, සිව් මහල් අධ්‍යයන ගොඩනැගිල්ලේ (AC2) ඉතිරි වැඩ (අදියර - 1)

1. යක්කල, කැලණිය විශ්වවිද්‍යාලයේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනයේ අධ්‍යක්ෂ වෙනුවෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින්, පහතින් විස්තර කොට ඇති පරිදි, යක්කල, කැලණිය විශ්වවිද්‍යාලයේ, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනයේ, පවත්නා සිව්මහල් අධ්‍යයන ගොඩනැගිල්ලේ (AC2) ඉතිරි වැඩ (අදියර -1) ඉටුකිරීම සඳහා, මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. එහි ඇස්තමේන්තුගත පිරිවැය දළ වශයෙන් වැට් රහිතව රුපියල් මිලියන 80.00 (වැට් රහිතව රුපියල් මිලියන අසූවක්) වේ.

   අදාළ කාර්යයට පවත්නා සිව් මහල් ගොඩනැගිල්ලේ කොන්ක්‍රීට් වැඩ, පෙදරේරු වැඩ, කපරාරු වැඩ, පින්තාරු වැඩ, ටයිල් වැඩ, ජලරෝධක වැඩ ඇලුමිනියම් වැඩ, ලෝහමය වැඩ, ජලනළ වැඩ, විදුලිමය වැඩ, ගිනි ආරක්ෂණ වැඩ හා වහලයේ වැඩ කොටස් සහිත දෝෂ වගකීම් කාලයේ ඉදිකිරීම් නිම කිරීම් හා නඩත්තු කාර්ය අයත් වේ. අදාළ වැඩ බිම, යක්කල, කැලණිය විශ්වවිද්‍යාලයේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනයේ පිහිටා ඇත. (දළ ගෙබිම ප්‍රමාණය ව. මීටර් 1750 වේ.) සියලුම වැඩ අදාළ වැඩ ආරම්භක දිනයේ සිට ලිත් දින 150 ඇතුළත නිම කළ යුතුය.
2. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.
3. කොන්ත්‍රාත් ප්‍රදානයට සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරුවා අපලේඛන ගත වූ අයකු නොවිය යුතු අතර, සීඩා ආයතනයේ, ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ C4 හෝ ඉහළ ශ්‍රේණිගත ලියාපදිංචිය සතු විය යුතුය.
4. කොන්ත්‍රාත් ප්‍රදානයට සුදුසුකම් ලැබීමට පහත සඳහන් අවශ්‍යතා සපුරාලිය යුතුය.
   - අ) පසුගිය වසර පහ (5) තුළ පවත්වාගත් ඉදිකිරීම් කාර්යයන්හි වාර්ෂික පිරිවැටුමේ සාමාන්‍යය අවම වශයෙන් රුපියල් මිලියන 288.0 (මිලියන දෙසිය අසූඅටක්) (වැට් රහිතව) විය යුතුය.
   - ආ) පසුගිය වසර පහ (5) තුළ පවත්නා ගොඩනැගිල්ලේ අපේක්ෂිත ඉතිරි වැඩවලට, ස්වභාවයෙන්, වටිනාකමින් හා සංකීර්ණතාවයෙන් සමාන (දළ ගෙබිම ප්‍රමාණය 1750m²) අවම වශයෙන් රුපියල් මිලියන 80.00 වටිනාකමින් යුත්, ලිත් දින 150 තුළ නිම කළ හෝ සමානුපාතික කාලයක් තුළ ඉන් ඉහළ වටිනාකමින් යුත් ව්‍යාපෘතියක් ලෙසට අවම වශයෙන් ගොඩනැගිලි 3 ක් ඉදිකිරීමේ පළපුරුද්ද. (මෙම අවශ්‍යතාවයට අනුකූලවීම සඳහන් කරනු ලබන කාර්යය අවම වශයෙන් 70% නිමා කොට තිබිය යුතුය.)
   - ඇ) තිබිය යුතු අවම ද්‍රවශීල වත්කම් සහ / හෝ ණය පහසුකම් ප්‍රමාණය, අනෙකුත් කොන්ත්‍රාත්තුමය බැඳීම් හා මෙම කොන්ත්‍රාත්තුව යටතේ වන යම් අත්තිකාරම් ගෙවීම් හැර රුපියල් මිලියන 48.0 කට (මිලියන හතළිස් අටක්) නොඅඩු විය යුතුය.
5. යක්කල කැලණිය විශ්වවිද්‍යාලයේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී කාර්යාලයේදී රාජකාරී දිනවල, 2020.10.05 දින සිට 2020.10.26 දින දක්වා, 09.00 පැය හා 13.30 පැය අතර, කාලය තුළ, ලංසුලේඛන නොමිලයේ පරීක්ෂා කොට බැලිය හැක.
6. ආපසු ගෙවනු නොලබන ගාස්තු රුපියල් 12,000 ක් (වැට් සහිතව) (රුපියල් දෙලොස් දහසක් පමණයි) ගෙවීමෙන් හා යක්කල කැලණිය විශ්වවිද්‍යාලයේ, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසුලේඛන කට්ටලයක් 2020.10.05 දින සිට 2020.10.26 දින දක්වා ඕනෑම රාජකාරී දිනයකදී 09.00 පැය හා 13.30 පැය අතර, කාලය තුළ මිලදීගත හැක. ගෙවීම් මුදලින්ම කළ යුතු වේ.
7. මුද්‍රා තැබූ ලංසු පිටපතක් සහිතව යක්කල කැලණිය විශ්වවිද්‍යාලයේ, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමෙන් හෝ නියෝජ්‍ය ලේඛකාධිකාරී ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය, යක්කල යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමෙන් හෝ 2020.10.26 දින 14.00 පැයට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලැබී ඇති ලංසු අදාළ භාරගැනීම අවසන් කළ වහාම විවෘත කරනු ලැබේ. ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලය පැවරූ නියෝජිතයන්හට එම අවස්ථාවට පැමිණ සිටිය හැක.
8. ලංසු 2021 .01.26 දින දක්වා (ලංසු විවෘත කළ දින සිට දින 91) වලංගු විය යුතුය.
9. සියලුම ලංසු සමග, රුපියල් 800,000.00 (රුපියල් අට ලක්ෂයක්) වටිනා, සේවායෝජක හට පිළිගත හැකි ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් නිකුත් කළ ලංසු ලේඛනයන්හි II කොටසේ සඳහන් සම්මත ආකෘතියෙන් යුත් 2020.02.23 දින දක්වා වලංගු (ලංසු විවෘත කළ දින සිට දින 119 ක්), කොන්දේසි විරහිත ආපසු හැරවිය නොහැකි හා ඒක්ෂණ ලංසු ඇපකරයක් තිබිය යුතු අතර, මුදලින් ගෙවීමෙන්ද ලබාදිය හැක.
10. මේ සම්බන්ධ පෙර ලංසු හමුවක් 2020.10.13 දින 10.00 පැයට යක්කල කැලණිය විශ්වවිද්‍යාලයේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනයේදී පැවැත්වීමට නියමිතය.
11. වැඩිදුර විස්තර සඳහා, කරුණාකර යක්කල, කැලණිය විශ්වවිද්‍යාලයේ, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී ඇමතිය හැක.

**(දුරකථනය - 0332226618/ 0332226027/ 0332222740/ 0332222748)**

**අධ්‍යක්ෂ, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය,**
**කැලණිය විශ්වවිද්‍යාලය,**
**2020.10.02**




## අත්කර ගැනීමේ පනත
## (460 වැනි පරිච්ඡේදය)
## 7 වැනි වගන්තිය යටතේ දැන්වීම

**මගේ අංකය :** DS/VN/LA.A/THURAKKAPURAM

**ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/5/2018/HA/16**

මහජන කටයුත්තක් සඳහා පහත විස්තර කෙරෙන ඉඩම්වලට අදාළව පැවැත්වීමට නියමිත 9 වැනි වගන්තිය යටතේ පරීක්ෂණය 7 වැනි වගන්තිය යටතේ දැන්වීමක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2166/2 හා 2192/32 දින 2020-03-10 හා 2020-09-09 දරන අති විශේෂ ගැසට් පත්‍රවල පළකර ඇත.

**ලේඛනය**

| | |
|---|---|
| පළාත | : උතුර |
| දිස්ත්‍රික්කය | : යාපනය |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : වලිකාමම් උතුර, තෙල්ලිප්පළේ. |
| ග්‍රාම නිලධාරී කොට්ඨාසය | : තුරික්කාපුරම් (J/229) |
| ගම | : තෙල්ලිප්පළේ නැගෙනහිර |
| ඉඩමේ නම | : දෝදරයි |
| මූලික පිඹුරු අංකය | : පිපියා 2958 |
| කැබලි අංකය | : 01 |
| ප්‍රමාණ. හෙක් | : 0.0497 හෙක්ටයාර් |

වැඩි විස්තර සඳහා ඉහත කී ගැසට් නිවේදනය බලනු මැනවි.

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,**
**වලිකාමම් උතුර,**
**තෙල්ලිප්පළේ.**
**2020-09-25**

**ස. සිවශ්‍රී**
**ප්‍රාදේශීය ලේකම්,**
**වලිකාමම් උතුර,**
**තෙල්ලිප්පළේ.**

## අත්කර ගැනීමේ පනත
## (460 වැනි පරිච්ඡේදය)
## 7 වැනි වගන්තිය යටතේ දැන්වීම

**මගේ අංකය :** DS/VN/LA.A/VITHTHAKAPURAM

**ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/5/2018/HA/15**

මහජන කටයුත්තක් සඳහා පහත විස්තර කෙරෙන ඉඩම්වලට අදාළව පැවැත්වීමට නියමිත 9 වැනි වගන්තිය යටතේ පරීක්ෂණය 7 වැනි වගන්තිය යටතේ දැන්වීමක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2164/57 හා 2192/32 දින 2020-02-28 හා 2020-09-09 දරන අති විශේෂ ගැසට් පත්‍රවල පළකර ඇත.

**ලේඛනය**

| | |
|---|---|
| පළාත | : උතුර |
| දිස්ත්‍රික්කය | : යාපනය |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : වලිකාමම් උතුර, තෙල්ලිප්පළේ. |
| ග්‍රාම නිලධාරී කොට්ඨාසය | : විත්තකපුරම් (J/223) |
| ගම | : තෙල්ලිප්පළේ තිරිත |
| ඉඩමේ නම | : නීලාවත්තයි හා කඩ්ඩුක්කුම්පලයි |
| මූලික පිඹුරු අංකය | : පිපියා 2921 |
| කැබලි අංකය | : 01 |
| ප්‍රමාණ. හෙක්. | : 0.0312 හෙක්ටයාර් |

වැඩි විස්තර සඳහා ඉහත කී ගැසට් නිවේදනය බලනු මැනවි.

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,**
**වලිකාමම් උතුර,**
**තෙල්ලිප්පළේ.**
**2020-09-25**

**ස.සිවශ්‍රී**
**ප්‍රාදේශීය ලේකම්,**
**වලිකාමම් උතුර,**
**තෙල්ලිප්පළේ.**

## ප්‍රසම්පාදන දැන්වීමයි
## බලශක්ති අමාත්‍යාංශය
## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
## බෝට්ටුවක් මිලදීගැනීම සඳහා ලංසු
## B/44/2020

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මගීන් පස්දෙනෙකුට (05) ගමන්කළ හැකි බෝට්ටුවක් මිලදීගැනීම සඳහා පිළිගත් නිෂ්පාදකයින්, ඔවුන්ගේ විදේශ අපනයන නියෝජිතයින් හෝ ඔවුන්ගේ බලයලත් දේශීය නියෝජිතයින් වෙතින් 2020-10-23 වන දින 1400 පැය දක්වා මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අක්වෙරළ පහසුකම් සඳහා ආරක්ෂාව සැපයීමේ නිරත ආරක්ෂක නිලධාරීන්ට ප්‍රවාහන පහසුකම් සැපයීම බෝට්ටුවේ කාර්යයවේ.

2020-10-22 වන දින 0900 පැයත් 1500 පැයත් අතර, කොළඹ 09, ආචාර්ය ඩැනිස්ටර් ද සිල්වා මාවත, නො.609, පළමු මහළ, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, කළමනාකාර කාර්යාලයෙන් (ප්‍රසම්පාදන හා ගබඩා) ලිඛිත ඉල්ලීමක් සහ එක් කට්ටලයක් සඳහා රු. 1,000.00 ක (i.e 925.63 + 8% VAT) නැවත නොගෙවන ගාස්තුවක් ගෙවීම මගින් ලංසු ලේඛන ලබාගත හැක.

ලංසු භාරගැනීම 2020-10-23 දින 14.00 වන පැයට ලංසු භාරගැනීම අවසන් වන අතර ඒ විගසම, ඉහත ලිපිනයේ කළමනාකාර කාර්යාලයේදී (ප්‍රසම්පාදන හා ගබඩා) ලංසු විවෘත කෙරෙනු ලැබේ. ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් හට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී විය හැක.

ලංසු ලියාපදිංචි තැපැල් මාර්ගයෙන් හෝ ඉහත ලිපිනයේ කළමනාකාර කාර්යාලයේ (ප්‍රසම්පාදන හා ගබඩා) තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ගෙනැවිත් බහාලිය යුතුය.

ලංසු ලේඛන පරීක්ෂාව, කළමනාකාර කාර්යාලයේදී (ප්‍රසම්පාදන හා ගබඩා) සිදුකළ හැක. අභිලාෂී ලංසුකරුවන්ට විස්තර ලබාගැනීම සඳහා ලංසු කොන්දේසි සහ පිරිවිතර ඇතුළත් ලංසු ලේඛනය www.ceypetco.gov.lk යන වෙබ් අඩවියෙන් ලබාගත හැක.

යම් පැහැදිලිකරගැනීමක් වෙතොත් කළමනාකාර (ප්‍රසම්පාදන හා ගබඩා) වෙතින්, දු.ක. 5455330 (ෆැක්ස් : 5455424) ලබාගත හැක.

සෑම ලංසුවක්ම, බැංකුවක් හෝ භාණ්ඩාගාරයක් මගින් අනුමත රක්ෂණ සමාගමකින් ලබාගත් රු. 500,000.00 ක් වටිනා ලංසු සුරක්ෂණයක් සමග එවිය යුතුය.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**කළමනාකාර (ප්‍රසම්පාදන හා ගබඩා) භාරේ,**
**ප්‍රසම්පාදන හා ගබඩා අංශය,**
**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,**
**පළමු මහල, ආචාර්ය ඩැනිස්ටර්ද සිල්වා මාවත,**
**කොළඹ 09.**
**දු.ක. 011-5455331, ෆැක්ස් : 011-5455424.**

## රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව
**(ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය)**

## ටෙන්ඩර් දැන්වීමයි

සංස්ථා ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් අයිතම සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

**වර්ගීකරණය : සැපයුම් ද්‍රව්‍ය**

| Tender No. | Item | Bid Security Rs | Qty. |
|---|---|---|---|
| EES/ 173 | Tor Steel & Mild Steel (06,08,10,12,16,20,25,32) (Length : 6m/ 12m) | 1.5 Mn | 1225 MT |
| EES/ 174 | Universal Column – 350mmx 350mmx 106kg/ m x 12mtr Length | 2.4 Mn | 980 Nos |
| | Universal Beam – 350mmx 175mmx 41.2kg/m x 12mtr Length | 1.6 Mn | 1,800 Nos |
| | 175mmx100mmx 19kg/m x 12mtr Length | 230,000/- | 615 Nos |
| EES/ 175 | Hollow Section (Mild Steel) 70mmx50mmx4mmx5.5mtr | 120,000/- | 1,700 Nos |
| EES/ 176<br>EES/ 177<br>EES/ 178 | M.S.Plate<br>8'x4'x 08mm<br>8'x4'x 10mm<br>8'x4'x 12mm | 500,000/-<br>1.0 Mn<br>55,000/- | 1,650 Nos<br>2,810 Nos<br>125 Nos |
| EES/ 180 | G.I.Pipe -50mm dia. M/Dx5.8mtr | 50,000/- | 1,600 Nos |
| EES/ 182 | GI Binding Wire –G18 | 50,000/- | 20 MT |
| EES/ 179 | Grade 8.8, Nut & Bolt M 16x60mm | 5,000/- | 5,600 Nos |
| | Steel Washer-20x30x3mm Thickness | 2,000/- | 11,200 Nos |
| MOS/ 344 | Ready Mix Concrete<br>Grade 40 (20)<br>Grade 30 (20) | 650,000/-<br>350,000/- | 3285 cu.m<br>1840 cu.m |

**වර්ගීකරණය : අලුත්ම යන්ත්‍ර සූත්‍ර සැපයීම**

| Tender No. | Item | Bid Security Rs. | Duration |
|---|---|---|---|
| SMS/303 | Concrete Batching Plant of 0.5m³ (25m³/hr) mixing capacity- Supply & Install | 10,000/- | 12 Months |
| SMS/304 | Concrete Truck Mixer (Capacity 6m³) | 5,000/- | 12 Months |
| SMS/305 | Truck Mounted Concrete Pump car | 5,000/- | 6 Months |
| SMS/306 | Wheel Loader (Shovel Capacity-2.8m³) | 5,000/- | 12 Months |
| SMS/307 | Vibro Hammer (3 Ton) with Generator (Electric Type) | 10,000/- | 4 Months |
| SMS/308 | Crawler Crane 25 ton | 5,000/- | 4 Months |
| SMS/309 | Mobile Crane 25 ton | 5,000/- | 3 Months |
| SMS/310 | Mobile Crane 10 ton | 5,000/- | 6 Months |
| SMS/311 | Boom Truck (Hoisting Capacity- 3 Ton and Tailer capacity- 25 ton and 30ft length) | 5,000/- | 6 Months |
| SMS/312 | Backhoe Loader (Shovel Capacity minimum 1.00m³ and backhoe bucket capacity above 0.14m³) | 5,000/- | 6 Months |
| SMS/313 | Excavator 200 or 320 | 5,000/- | 6 Months |
| SMS/314 | Excavator 120 | 5,000/- | 6 Months |
| SMS/315 | Barge Excavator (Amphibious) 200 or 320 | 5,000/- | 1 Months |
| SMS/316 | Lorry (3 Ton) | 5,000/- | 9 Months |
| SMS/317 | 10 T Vibratory Roller | 5,000/- | 4 Months |
| SMS/318 | 3 cube Tipper | 5,000/- | 4 Months |
| SMS/319 | 125kVA Three Phase Generator | 5,000/- | 9 Months |
| SMS/320 | 250kVA Three Phase Generator | 5,000/- | 12 Months |
| SMS/321 | Double Cab with Driver (Registered within 8 years) | 5,000/- | 9 Months |
| SMS/322 | Van with Driver (Nine – Seater registered within 15 years) | 5,000/- | 9 Months |
| SMS/323 | Crew cab with Driver (Double Wheel, 10.5 feet, 2800) | 5,000/- | 9 Months |

**වර්ගීකරණය : රථවාහන/ යන්ත්‍ර සූත්‍ර කුලියට සැපයීම**

| Tender No. | Item | Bid Security Rs. | Qty. |
|---|---|---|---|
| SDCC/MOS/339/2020 | Concrete Batching Plant of 0.5m³ (25m³ /hr) mixing capacity – Supply & Install | 75,000/- | 01 |
| SDCC/MOS/338/2020 | Concrete Truck Mixer (Capacity 6m³) | 80,000/- | 01 |
| SDCC/MOS/337/2020 | 03 Ton Vibro Hammer with Generatorl (Elect. Type) | 150,000/- | 01 |
| SDCC/MOS/336/2020 | 03 Ton Lorry | 50,000/- | 01 |
| SDCC/MOS/335/2020 | Backhoe Loader | 120,000/- | 01 |
| SDCC/MOS/334/2020 | 03 Cube Tipper | 50,000/- | 01 |
| SDCC/MOS/340/2020 | Double Cab | 240,000/- | 02 |
| SDCC/MOS/341/2020 | Pre – cast wall panel manufacturing machine | 80,000/- | 01 |

1. අවශ්‍ය කරනු ලබන රථ වාහන හා යන්ත්‍ර සූත්‍ර ප්‍රමාණය ලංසු ලේඛනයන්හි සඳහන්ව ඇත.
2. සියලුම රථ වාහන හා යන්ත්‍ර සූත්‍ර අවශ්‍ය කරනුයේ කොළඹ ප්‍රදේශය සඳහා වේ.
3. විස්තරාත්මක සුදුසුකම්, කොන්දේසි හා අවශ්‍යතා ලංසු ලේඛනයන්හි සඳහන්ව ඇත.
4. ද්‍රව්‍යවල ප්‍රමාණයන්, යෝජිත ව්‍යාපෘතියේ පවත්නා තත්ත්වයන් මත වෙනස් විය හැක.
5. ලංසු එක් පැකේජයක්, කිහිපයක් හෝ සියලුම පැකේජ සඳහා ඉදිරිපත් කිරීමේ තෝරා ගැනීම ලංසුකරුවන් සතුවේ. ලංසුකරු විසින්, එම සියලුම ලොට් සඳහා වෙන වෙනම ලංසු ඇපකර ලංසු සමග ඉදිරිපත් කළ යුතුවේ.
6. මේ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වන අතර, ඕනෑම ටෙන්ඩරයක් ඉවත් කිරීමේ අයිතිය ඔවුන් සතුවේ.

එක් එක් ලංසු ලේඛනයක් සඳහා ආපසු ගෙවනු නොලබන ගාස්තු රුපියල් 1,000.00 (වැට් රහිතව) බැගින් ගෙවීමෙන් හා රත්මලාන, බොරුපන පාරේ, අංක 07, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ සැපයුම් කළමනාකරු වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, 2020.10.05 දින සිට 2020.10.15 දින දක්වා 09.00 පැය හා 15.00 පැය අතර, කාලය තුළ උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසුලේඛන කට්ටලයක් මිලදී ගත හැක.

අවශ්‍ය වෙතොත්, අදාළ ලංසු ලේඛන, සාමාන්‍ය රාජකාරී වේලාවන් තුළදී සැපයුම් කළමනාකරු කාර්යාලයේදී නොමිලයේ පරීක්ෂා කොට බැලිය හැක.

ටෙන්ඩර්, සභාපති, සංස්ථා ප්‍රසම්පාදන කමිටුව, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව, අංක 07, බොරුපන පාර, රත්මලාන යන ලිපිනයට යොමු කොට මුද්‍රා තැබූ කවරයක බහා ලියාපදිංචි තැපැලෙන් එවීමෙන් හෝ සැපයුම් කළමනාකරු කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමෙන් ලැබීමට සැලැස්විය යුතුය.

ටෙන්ඩර් භාර ගැනීම **2020.10.16** දින 14.00 පැයට අවසන් කරනු ලැබේ.

ලංසු සමග ඉදිරිපත් කරනු ලබන ලංසු ඇපකර, **2021.02.12 දින දක්වා** වලංගු විය යුතුය.

ලංසු, **2021.01.15** දින දක්වා වලංගු විය යුතුය.

ලංසු බහාලූ අදාළ කවරයෙහි වම් ඉහළ කෙළවරෙහි, අදාළ පරිදි වර්ගීකරණය සඳහන් කළ යුතුය.

වෙනත් අවශ්‍ය විස්තර, සැපයුම් කළමනාකරු වෙතින් ලබාගත හැක.

**දුරකථනය : 2607566/ 2632146**

**ෆැක්ස් : 2638013**

**සභාපති, සංස්ථා ප්‍රසම්පාදන කමිටුව,**
**රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව.**

**අංක 07, බොරුපන පාර, රත්මලාන.**

**"යටිතල පහසුකම් ඉදිකිරීමේ පුරෝගාමියෝ"**

# ප්‍රසම්පාදන දැන්වීමයි

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගම්පහ

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් ඉදිකිරීම් කර්මාන්තය සඳහා 2020.10.23 දින ප.ව. 02.00 දක්වා මුද්‍රා තබනලද ලංසු පත් බාරගනු ලැබේ. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම මෙම කාර්යාලයේදී ලංසු පත් විවෘත කරනු ලැබේ.

**වැඩ විස්තරය** - අඩක් නිමකළ වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීම.

**CIDA ලියාපදිංචිය** - C 3 සහ ඉහළ

**ව්‍යාපෘතිය වෙනුවෙන් ආපසු ගෙවන ලංසු ඇපකරය** - රු. 1,500,000/- ක ලංසු ඇපකරයක් (දින 137 ක් වලංගු)

**ව්‍යාපෘතිය වෙනුවෙන් ආපසු නොගෙවන තැන්පත් මුදල** - රු. 25,000/- (මුදලින් ගෙවිය යුතුය)

ඉල්ලීම් ලිපියක්, ඉදිකිරීම් පුහුණු කිරීම් හා සංවර්ධනය කිරීම් (CIDA) අධිකාරියේ ඉහත සඳහන් ශ්‍රේණියක හෝ ඉහළ ශ්‍රේණියක ලියාපදිංචිය සහ ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමයේ සාමාජිකත්ව සහතිකය ඉදිරිපත් කර ගම්පහ දිස්ත්‍රික් ලේකම් වෙතින් 2020.10.05 දින සිට 2020.10.21 දක්වා සතියේ වැඩ කරන දිනවලදී පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා ලංසු පත් ඉහත සඳහන් ආපසු නොගෙවන මුදල ගෙවා ලබාගත හැක.

සම්පූර්ණ කරනලද ලංසු පත් පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතුය. මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර කාර්යාල වේලාවන්හිදී ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් ඉංජිනේරු වෙතින් දුරකථන අංක 033-2222453 අමතා ලබාගත හැක.

ලංසු පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය බවද කරුණාවෙන් සලකන්න.

**සුනිල් ජයලත්**
**ප්‍රසම්පාදන කමිටුවේ සභාපති,**
**ගම්පහ දිස්ත්‍රික් ලේකම් / දිසාපති**
**ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය.**

**2020.09.29**
**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,**
**ගම්පහ.**

# මහජන බැංකුව

## බේරා නොගත් උකස් භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

මහජන බැංකුවේ පහත සඳහන් ශාඛා සහ ඉතුරුම් හා සේවා මධ්‍යස්ථාන වෙත 2019.05.31 දින දක්වා උකස් කරන ලදුව 2020.10.23 දින දක්වා බේරා නොගත් රන් භාණ්ඩ මෙම නිවේදනයේ දක්වා ඇති දිනයන්හිදී සහ එම පරිශ්‍රයන්හිදී පෙ.ව. 9.00 සිට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

| ශාඛාවේ / ඉතුරුම් හා සේවා මධ්‍යස්ථානයේ නම | පහත දැක්වෙන දිනට බේරා නොගත් භාණ්ඩ | වෙන්දේසි දිනය සහ ස්ථානය |
|---|---|---|
| **පුත්තලම ශාඛාව** ඉතුරුම් හා සේවා මධ්‍යස්ථානය මදුරන්කුලිය | 2020.10.23 | 2020.10.24 සහ 25 පුත්තලම ශාඛා පරිශ්‍රය |
| **කල්පිටිය ශාඛාව** ඉතුරුම් හා සේවා මධ්‍යස්ථානය නොරොච්චෝලේ | | |
| **ආනමඩුව ශාඛාව** ඉතුරුම් හා සේවා මධ්‍යස්ථානය ආඩිගම | | |
| **හලාවත ශාඛාව** ඉතුරුම් හා සේවා මධ්‍යස්ථානය හලාවත ධීවර බැංකුව ආරච්චිකට්ටුව උඩප්පුව | 2020.10.23 | 2020.10.24 සහ 25 හලාවත ශාඛා පරිශ්‍රය |
| **මාදම්පේ ශාඛාව** | | |
| **දන්කොටුව ශාඛාව** | | |
| **මහවැව ශාඛාව** ඉතුරුම් හා සේවා මධ්‍යස්ථානය තොඩුවාව | | |
| **වෙන්නප්පුව ශාඛාව** ඉතුරුම් හා සේවා මධ්‍යස්ථානය බෝලවත්ත ලුනුවිල උල්හිටියාව | 2020.10.23 | 2020.10.24 සහ 25 නාත්තන්ඩිය ශාඛා පරිශ්‍රය |
| **නාත්තන්ඩිය ශාඛාව** ඉතුරුම් හා සේවා මධ්‍යස්ථානය කොට්ටරාමුල්ල වැලිපැන්නගහමුල්ල නාරවිල | | |
| **මාරවිල ශාඛාව** | | |

වෙන්දේසියට සහභාගි වන්නන් තම පුද්ගල හැඳුනුම්පතද රැගෙන ආ යුතුය. වෙනත් ප්‍රසිද්ධ දැනුම් දීමකින් තොරව මෙම වෙන්දේසි අවලංගු කිරීම, ඒකාබද්ධ කිරීම හෝ කල්දැමීම පිළිබඳ අයිතිය මහජන බැංකුව සතු වේ.

**ප්‍රාදේශීය කළමනාකාර**
**මහජන බැංකුව,**
**ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (පුත්තලම),**
**අංක 79, මාරවිල පාර, නාත්තන්ඩිය.**

මහජන බැංකුව PEOPLE'S BANK
www.peoplesbank.lk
AA+ (lka) Fitch Rating, AA - Brand Finance Rating

# සී/ස පොළොන්නරුව විවිධ සේවා සමුපකාර සමිතිය

## රන් භාණ්ඩ වෙන්දේසිය

සීමාසහිත ශ්‍රී ලංකා ග්‍රාමීය බැංකු මහා සංගමයේ ස්වර්ණ ශක්ති රන් ණය සේවාවේ නියෝජිත ලෙස සීමාසහිත පොළොන්නරුව විවිධ සේවා සමුපකාර සමිතියේ ග්‍රාමීය බැංකු ශාඛාවන් වන

**පොළොන්නරුව / පරාක්‍රම සමුද්‍රය / බැදිවැව / සින්න මඩකලපුව / නවනගරය / ගල්ලෑල්ල**

ග්‍රාමීය බැංකු ශාඛාවල 2019.09.31 දක්වා උකස් ගන්නා ලදුව 2020.10.24 දක්වා ගිවිසගත් පරිදි බේරානොගත් රන් භාණ්ඩ 2020.10.24 දින සමිතියේ ප්‍රධාන කාර්යාලයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබයි.

ඉහත සඳහන් වෙන්දේසිය නැවත දැනුම් දීමකින් තොරව අවලංගු කිරීම හෝ දිස්ත්‍රික්කයේ අනෙකුත් සමිති සමග ඒකාබද්ධව වෙන්දේසි කිරීමේ අයිතිය අදාළ සමුපකාර සමිතිය සතු වේ.

**මෙයට,**
**සාමාන්‍යාධිකාරී**
**සී/ස පොළොන්නරුව වි.සේ.ස. සමිතිය,**
**පොළොන්නරුව.**
2020.09.29

# ප්‍රසම්පාදන දැන්වීමයි

## රසායනාගාර උපකරණ මිලදී ගැනීම

### ද සොයිසා කාන්තා රෝහල
### (De Soyza Hospital for Women)

පහත සඳහන් **රසායනාගාර උපකරණ මිලදී ගැනීම** සඳහා කොළඹ 08, ද සොයිසා කාන්තා රෝහලේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් 2020.10.22 දින පෙ.ව. 10.00 දක්වා මුද්‍රා තබන ලද ටෙන්ඩර් භාරගනු ලැබේ.

| | Equipment | Qty |
|---|---|---|
| 01 | Automated Blood Culture System | 01 |
| 02 | Automated Slide Strainer | 01 |
| 03 | Laboratory Refrigerator | 01 |
| 04 | Fully Automated ELIZA Analyzer | 01 |
| 05 | Formalin Fume Concentration Monitor | 01 |
| 06 | Slide Drying Hotplate | 01 |

2020.10.02 දින පෙ.ව. 09.00 සිට 2020.10.21 දින ප.ව. 3.00 දක්වා ද සොයිසා කාන්තා රෝහලේ කාර්යාලයෙන් පහත සඳහන් සුදුසුකම් සපිරීමෙන් පසුව අදාළ ප්‍රසම්පාදන ලියවිලි ලබාගත හැකිය.

01. ඔබගේ ව්‍යාපාරය ලියාපදිංචි කළ සහතිකයේ සහතික කරන ලද පිටපතක් සමග, ද සොයිසා කාන්තා රෝහලේ අධ්‍යක්ෂ වෙත ලිඛිත ඉල්ලීමක් කිරීමෙන්

02. එක් අයිතමයක් සඳහා ආපසු නොගෙවනු ලබන රු. 2,500.00 වටිනාකමක මුදලක්ද, සොයිසා කාන්තා රෝහලේ ගණකාධිකාරී වෙත ගෙවා ලබාගත් රිසිට් පතක් ඉදිරිපත් කිරීමෙන්.

මිල ගණන් ඇතුළත් අදාළ ටෙන්ඩර්පත් 2020.10.22 දින පෙ.ව. 10.00 ට පෙර ලැබෙන සේ සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ද සොයිසා කාන්තා රෝහල, කොළඹ 08 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ මෙම රෝහලේ ගණකාධිකාරී කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලිය හැකිය.

ටෙන්ඩර්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**රසායනාගාර උපකරණ මිලදී ගැනීම**" යන්න සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් කළ වහාම විවෘත කිරීම සිදු කරනු ලබන අතර, එම අවස්ථාවට ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය. මේ පිළිබඳ වැඩි විස්තර ද සොයිසා කාන්තා රෝහලේ කාර්යාලයෙන් ලබාගත හැකිය. දුරකථන අංක 011-2697315 / 011-2696224-26

**අධ්‍යක්ෂ,**
**සභාපති : ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,**
**ද සොයිසා කාන්තා රෝහල,**
**කොළඹ 08.**

# ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්ද විකිණීම - 2021 (නැවත කැඳවීම) - අවලංගු කිරීම

2021 ජනවාරි 01 දින සිට 2021 දෙසැම්බර් 31 දක්වා ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ තනි අයිතිය සඳහා බලපත්‍ර නිකුත් කිරීම පිණිස මවිසින් නැවත ටෙන්ඩර්පත් කැඳවා 2020-09-16 දින පලකර තිබූ පුවත්පත් දැන්වීම මෙමගින් අවලංගු කරන බව දන්වා සිටිමි.

**ඩී.එම්.එන්. දිසානායක,**
**ප්‍රාදේශීය ලේකම්,**
**ලුණුගල.**

**2020 සැප්තැම්බර් මස 30 වැනි දින,**
**ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී.**

# ඇටෝර්නි බලපත්‍ර ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමේ නිවේදනයයි

චීන ජනරජයේ, හොංකොං විශේෂ පරිපාලන කලාපයේ, ප්‍රසිද්ධ නොතාරිස් ඩේවිඩ් ජෝන් ලෝරන්ස් විසින් 2019 අප්‍රේල් මස 23 වන දින සහතික කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, මාබෝල, වත්තල, බංගලාවත්ත, වටරවුම් පාරේ, අංක 41 හි පදිංචි **ෂෙහාන් ඉන්ද්‍රජිත් විතාරණ** යන අය ඔහුගේ සේවයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය භාරදීම හේතු කොට ගෙන ඔහු වෙත ප්‍රදානය කරන ලද 2020 ඔක්තෝබර් මස 01 වන දිනයෙන් ඇටෝර්නි බලපත්‍රය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට, අවලංගු කරන බවත්, ඒ අනුව, එකී ඇටෝනි බලපත්‍රය යටතේ මින්මතුවට කරන යම් කවරම වූ ගනුදෙනුවක් සඳහා මා වගකීමක් නොදරන බවත් චීන ජනරජයේ, හොංකොං සෙන්ට්‍රල්, 18 චේටර් රෝඩ්, ඇලෙක්සැන්ඩ්‍රා හවුස් හි 06 වන මහලේ ලියාපදිංචි ආයතනය වන **එම් ජී එෆ් සෝසින් ෆා ඊස්ට්**, ලිමිටඩ් හි අධ්‍යක්ෂක වන **මයිකල් ඇන්තනි යී** වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

**මයිකල් ඇන්තනි යී.**
**එම් ජී එෆ් සෝසින් ෆා ඊස්ට්, ලිමිටඩ් හි අධ්‍යක්ෂ**

**බලශක්ති අමාත්‍යාංශය**

# ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC)

## දීර්ඝ කිරීමේ දැන්වීමයි

### කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල සැලසුම් කිරීම සඳහා වෘත්තීය ගෘහනිර්මාණ ශිල්පියෙකු තෝරා ගැනීම

B/42/2020

ඉහත ශීර්ෂය සම්බන්ධව මෙම පුවත්පතෙහි පළකරන ලද පුවත්පත් දැන්වීම ප්‍රකාරව එම ලංසුකරණය සඳහා සහභාගිවීමට අපේක්ෂා කළ උනන්දුවක් දක්වන ලද දැනටමත් අදාළ ලංසු ලේඛන ලබාගත් අයවලුන් හා එසේ ලංසු ලේඛන ලබාගැනීමට අපේක්ෂා කරනු ලබන අයවලුන්ගේ අවධානය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) විසින් මෙයින් යොමු කෙරේ. ඒ අනුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙනුවෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සභාපති, විසින් පෙර පළකරන ලද දැන්වීමට පහත සඳහන් සංශෝධන සිදු කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ අනුව, ලංසු භාරගැනීම අවසාන කිරීමට නියමිතව තිබූ **2020-10-02 දින 1400 පැය, 2020-10-09 දින 1400 පැය** ලෙසට දීර්ඝ කොට තිබේ.

ඒ අනුව, ලංසු ලේඛන නිකුත් කිරීමේ අවසාන දිනය **2020-10-08 දින 1500 පැය** ලෙසට වෙනස් කොට ඇත.

පෙර පුවත්පත් දැන්වීමෙහි සඳහන් අනෙකුත් සියලු කොන්දේසි නොවෙනස්ව පවතී.

මේ සම්බන්ධයෙන් යම් අපහසුතාවයක් සිදුවිනි නම් ඒ පිළිබඳව සිය බලවත් කණගාටුව CPC ආයතනය පළකර සිටී.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**කළමනාකරු (ප්‍රසම්පාදන හා ගබඩා) බාරේ,**
**ප්‍රසම්පාදන හා ගබඩා අංශය,**
**01 වන මහල, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,**
**අංක 609, වෛද්‍ය ඩැනිස්ටර් ද සිල්වා මාවත,**
**කොළඹ 09.**

**දුරකථනය - 0094 11 5455331**
**ෆැක්ස් - 0094 11 5455424**